# දෙවැනි කොටස

# දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පිටුව


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 57 |
| 3. | බැංකු විද්‍යා පියෙස | 61 |
| 4. | සන්නිවේදන | 62 |
| 5. | ව්‍යවහාර මුදල් | 64 |
| 6. | දේශීය කටයුතු | 67 |
| 7 | ආර්ථික පර්යේෂණ | 70 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 74 |
| 9. | විනිමය පාලනය | 79 |
| 10. | පහසුකම් කළමනාකරණ | 81 |
| 11. | මූල්‍ය කටයුතු | 82 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 83 |
| 13. | මූල්‍ය අංශ පර්යේෂණ | 85 |
| 14. | අධිපති ලේකම් | 86 |
| 15. | මානව සම්පත් කළමනාකරණ | 86 |
| 16. | තොරතුරු තාක්ෂණ | 93 |
| 17. | අභ්‍යන්තර විගණන | 96 |
| 18. | ජාත්‍යන්තර මෙහෙයුම් | 97 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 99 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 101 |
| 21. | රාජ්‍ය ණය | 102 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 105 |
| 23. | ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු | 108 |
| 24. | ලේකම් දෙපාර්තමේන්තුව | 110 |
| 25. | ආරක්ෂක සේවා | 110 |
| 26. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 111 |
| 27. | සංඛ්‍යාන | 112 |
| 28. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 115 |

## I. ගිණුම්කරණ සහ මූල්‍ය

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**2014 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**
**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එෆ්බී/කේ/සීබීඑස්එල්/1/14/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015 අප්‍රේල් 15 දින |

ගරු මුදල් අමාත්‍යතුමා

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්වලට අනුකූලවීම පිළිබඳව වූ විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය වන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ වගකීම**

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම මුදල් මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ. උචිත පරිදි සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීමේ දී හා යොදා ගැනීමේදී සහ අවස්ථානුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමාතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
**වැඩබලන විගණකාධිපති**


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2014 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | **487,070,771** | 425,676,763 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 5 | **61,495,307** | 94,137,368 |
| විකුණුම් සඳහා වූ ආයෝජන | 5 | **408,189,500** | 357,531,750 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **1,580,237** | 5,670,258 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 7 | **79,816,029** | 85,400,764 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **7,105,914** | 591 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,045,257,758** | 968,417,494 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8 | **124,443,452** | 15,853,513 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 9 | **143,897,971** | 109,167,071 |
| බැංකු සඳහා දෙන ලද ණය | 10 | **1,489,372** | 1,375,396 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **1,912,071** | 1,829,712 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 11 | **41,095** | 41,095 |
| අනිකුත් වත්කම් | 12 | **8,107,914** | 7,326,533 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **279,891,875** | 135,593,320 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,325,149,633** | 1,104,010,814 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 13 | **100,190,635** | 95,601,221 |
| **දේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 14 | **3,620,480** | 3,103,281 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **27,446,864** | 29,027,698 |
| දේපල පිරියත සහ උපකරණ | 15 | **14,686,696** | 14,228,915 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | **306,084** | 35,598 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **146,250,759** | 141,996,713 |
| **මුළු වත්කම්** | | **1,471,400,392** | 1,246,007,527 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 17 | **11,678,483** | 21,504,196 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **19,207,822** | 16,183,282 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 18 | **57,230,304** | 37,301,553 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 19 | **308,011,133** | 422,032,012 |
| අනිකුත් | 20 | **72,146,159** | 47,221,119 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **468,273,901** | 544,242,162 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 21 | **161,009,323** | 148,809,893 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 22 | **311,950** | 416,230 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 23 | **328,252,000** | 84,601,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 24 | **2,209,782** | 2,419,087 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 25 | **8,939,293** | 5,659,718 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **500,722,348** | 241,905,928 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **968,996,249** | 786,148,090 |
| **අනිකුත් බැරකම්** | | | |
| සංසරණයෙහි පවතින මුදල් | 26 | **416,895,362** | 339,770,981 |
| විලම්භිත ප්‍රදාන | 27 | **515** | 1,449 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 43 | **3,599,035** | 4,936,339 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 28 | **197,380** | 243,455 |
| **මුළු අනිකුත් බැරකම්** | | **420,692,292** | 344,952,224 |
| **මුළු බැරකම්** | | **1,389,688,541** | 1,131,100,314 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 35,000,000 |
| සංචිත | 29 | **31,711,851** | 79,907,213 |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය** | | **81,711,851** | 114,907,213 |
| **මුළු බැරකම් සහ හිමිකම් ප්‍රාග්ධනය** | | **1,471,400,392** | 1,246,007,527 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2015 මාර්තු 17 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන් - අධිපති

පී.වී.ලක්ෂ්මන් නන්දසිරි - වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | **31** | **22,221,503** | 18,505,656 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය | | **(7,966,791)** | (27,892,406) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය | | **12,626,457** | 13,389,159 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **26,881,169** | 4,002,409 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | **32** | **(3,103,257)** | (4,447,401) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(3,103,257)** | (4,447,401) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | **(32,266,690)** | (26,758,639) |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | **(8,488,778)** | (27,203,631) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | **31** | **4,616,684** | 14,450,134 |
| පොළී වියදම | **32** | **(17,748,037)** | (2,979,850) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **(13,131,353)** | 11,470,284 |
| අනිකුත් ආදායම් | **33** | **1,367,666** | 2,919,260 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | **(20,252,465)** | (12,814,087) |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | **34** | | |
| - වැටුප් සහ වේතන | | **(3,256,096)** | (3,138,445) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(457,274)** | (447,626) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ අතිරේක දායකත්වය | | **(1,289,040)** | (1,988,525) |
| | | **(5,002,410)** | (5,574,596) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(396,811)** | (365,644) |
| තොග පිරිවැය | | **(1,829,350)** | (1,476,937) |
| සෙමින් චලනය වන විෂයන් සඳහා වෙන් කිරීම් | | **-** | (20,000) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | **35** | **(4,050,858)** | (1,997,048) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(11,279,429)** | (9,434,225) |
| **බදු වලට පෙර ලාභය / (අලාභය)** | | **(31,531,894)** | (22,248,312) |
| රැඳවුම් බද්ද | **36** | **(777,496)** | (2,016,217) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)** | | **(32,309,390)** | (24,264,529) |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2014 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය/(අලාභය) | **(32,309,390)** | (24,264,529) |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභය/(අලාභය) | **9,229,796** | (13,904,065) |
| විකුණු දේපළ පිරියත උපකරණයන්හි ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම් | **-** | (40) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය අනෙකුත් විස්තීරණ ආදායම්වලට මාරු කිරීම් | **1,487,603** | (592,417) |
| මුළු විස්තීරණ ආදායම/(අලාභය) | **(21,591,991)** | (38,761,051) |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිතය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | අනිකුත් සංචිතය (සටහන 29) රු. 000 | සමුච්චිත ලාභ රු. 000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|
| **2013 ජනවාරි 01 දිනට** | 15,000 | 34,985,000 | 5,986,642 | 116,180,695 | 25,296,615 | 182,463,952 |
| ශුද්ධ ලාභය / (ශුද්ධ අලාභය) | - | - | - | - | (24,264,529) | (24,264,529) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වු නිධන්ගත අරමුදලට පැවරීම | - | - | - | 191,428 | (191,428) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 126,315 | (126,315) | - |
| විශ්‍රාම පාරිතෝෂික හා වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල්වලට මාරු කිරීම | - | - | - | 595,490 | (523,602) | 71,888 |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | - | (592,417) | (592,417) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | - | (26,758,632) | 26,758,632 | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | 91,317 | (91,317) | - |
| වෛද්‍ය ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂික සංචිතවලින් අරමුදල් අදාල වගකීම් ගිණුම්වලට මාරු කිරීම | - | - | - | (1,511,789) | - | (1,511,789) |
| විකුණු ස්ථාවර වත්කම්වල ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම | - | - | (40) | 40 | - | - |
| අනෙකුත් විස්තීරණ ආදායම | - | - | - | (13,904,065) | - | (13,904,065) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | (122) | (122) |
| වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයෙන් සමුච්චිත ලාභයට කළ ශුද්ධ මාරු කිරීම | - | - | - | (6,703,951) | 6,703,951 | - |
| 2012 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | (2,355,705) | (2,355,705) |
| 2013 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | (25,000,000) | (25,000,000) |
| **2014 ජනවාරි 01 දිනට** | **15,000** | **34,985,000** | **5,986,602** | **68,306,848** | **5,613,763** | **114,907,213** |
| ශුද්ධ ලාභය / (ශුද්ධ අලාභය) | - | - | - | - | (32,309,390) | (32,309,390) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වු නිධන්ගත අරමුදලට පැවරීම | - | - | - | 212,124 | (212,124) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 1,511,182 | (1,511,182) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | - | 1,487,603 | 1,487,603 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | - | (32,266,690) | 32,266,690 | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | - | (103,198) | (103,198) |
| අනෙකුත් විස්තීරණ ආදායම | - | - | - | 9,229,796 | - | 9,229,796 |
| උකස් අත්තිකාරම් සඳහා වූ ණය ඇපකර යෝජනාවලියට අරමුදල් මාරු කිරීම | - | - | - | (500,000) | 500,000 | - |
| පැරණි පුවත්පත් විකිණීමෙන් ලද ආදායම, භාවිතා කරන ලද මුද්දර විකිණීමෙන් ලද ආදායම සහ පුස්තකාලයෙන් එකතු කරගත් දඩ මුදල් මාරු කිරීම | - | - | - | - | (173) | (173) |
| ශ්‍රී.ලං.ම.බැ. ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා පොදු සංචිතයේ සිට අරමුදල් මාරු කිරීම | - | 15,000,000 | - | (15,000,000) | - | - |
| ශ්‍රී.ලං.ම.බැ. ප්‍රාග්ධනය වර්ධනය කිරීම | 49,985,000 | (49,985,000) | - | - | - | - |
| 2013 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | (3,000,000) | (3,000,000) |
| 2014 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | (8,500,000) | (8,500,000) |
| **2014 දෙසැම්බර් 31 දිනට** | **50,000,000** | **-** | **5,986,602** | **31,493,260** | **(5,768,011)** | **81,711,851** |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **25,984,366** | 21,656,589 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **530,779** | 513,044 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **12,626,457** | 13,389,159 |
| උපලබ්ධි වූ විනිමය වාසිය / (පාඩුව) | | **(553,996)** | (13,638,407) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,360,447** | 1,175,609 |
| | | **39,948,053** | 23,095,994 |
| **වියදම්** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **3,406,299** | 4,681,100 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **15,828,575** | 2,827,328 |
| සේවකයින්ට ගෙවීම් | | **4,729,643** | 3,947,528 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **5,601,065** | 29,596,753 |
| ගෙවන ලද බදු | | **929,097** | 2,016,217 |
| | | **30,494,679** | 43,068,926 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | 37 | **9,453,374** | (19,972,932) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(790,741)** | (858,623) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **1,490,027** | 1,448,949 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **940** | 2,268 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **243,651,000** | 77,586,000 |
| | | **244,351,226** | 78,178,594 |
| **වියදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **31,566,311** | (101,781,795) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(746,122)** | 1,407,072 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(26,570,161)** | (1,510,810) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(375)** | (722) |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩුකිරීමෙන් පසු) | | **1,128,310** | 694,982 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **1,348,440** | 55,585,071 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණයපත් අත්තිකාරම් | | **1,604,003** | 980,109 |
| | | **8,330,406** | (44,626,093) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **236020820** | 122,804,687 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(431,825,813)** | (237,929,416) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **508,950,194** | 259,640,254 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **77,124,381** | 21,710,838 |
| **වියදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 38 | **139,339,459** | (175,136,711) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 39 | **(12,199,430)** | 17,284,956 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **127,140,029** | (157,851,755) |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **(50,015,648)** | 179,562,593 |
| **වියදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **93,842,868** | 59,020,350 |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **173** | 122 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **11,500,000** | 26,350,000 |
| | | **105,343,041** | 85,370,472 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(155,358,689)** | 94,192,121 |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **90,115,505** | 197,023,876 |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **(28,721,497)** | (6,625,246) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **425,676,763** | 235,278,133 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 40 | **487,070,771** | 425,676,763 |

පිටු අංක 07 සිට 56 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන**

## 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්‍ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2015 මාර්තු 17 වැනි දින අනුමත කරන ලදී.

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, රන් සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් පත්‍රයේ පල කර ඇත. ජා.මූ.වා.ප්‍ර. වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල, ඒවායෙහි වර්ගීකරණය සහ එම නිසා අගයන් මෙම මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

#### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

#### 2.2.1 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. මෙම ආයෝජන සම්බන්ධයෙන් සැලකිය යුතු බව හෝ අඛණ්ඩ බව යන කරුණු නිශ්චය කිරීමේ දී යම් විනිශ්චයක් කිරීම අවශ්‍ය වේ.

#### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 43 හි දැක්වේ.

#### 2.2.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාග න්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී නිගමන මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

### 2.3 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකු බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

### 2.3.1 ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ

2014 ජූලි මස අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති (අ.ගි.ප්‍ර.) ආයතනය විසින් ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතියේ අවසාන සංස්කරණය නිකුත් කරන ලද අතර, එමඟින් මූල්‍ය උපකරණ ව්‍යාපෘතීන්හි සියලුම අවධීන් නිරූපණය වන අතර අ.ගි.ප්‍ර. 39: හඳුනාගැනීම හා මිනුම් කිරීම සහ ජා. මූ. වා. ප්‍ර. 9 හි සියලුම පසුගිය සංස්කරණයන් අහෝසි විය. මෙම ප්‍රමිතිය මගින් වර්ගීකරණය සහ මිනුම් කිරීම, හානිකරණය හා ඉදිරි රැකුම් ගිණුම්කරණය සම්බන්ධ නව අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වාර්ෂික කාලච්ඡේදයන් සඳහා ජා.මූ.වා.ප්‍ර. 9 බලපැවැත්වෙන අතර කලින් අදාළ කිරීම වලංගු වේ. අතීතයට බලපාන පරිදි අදාළ කළයුතු නමුත් සන්සන්දනාත්මක තොරතුරු අත්‍යාවශ්‍ය නොවේ. ජා.මූ.වා.ප්‍ර. 9 හි කලින් කළ සංස්කරණයන් (2009, 2010 සහ 2013) කලින් අදාළ කිරීම වලංගු වනුයේ ආරම්භක අදාළ කිරීම 2015 පෙබරවාරි 01 දිනට පෙර සිදුකළේ නම් පමණි. ජා.මූ.වා.ප්‍ර. 9 යොදා ගැනීම බැංකුවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මිනුම් කිරීම සම්බන්ධයෙන් බලපානු ලබන අතර බැංකුවේ මූල්‍ය වගකීම් වර්ගීකරණය හා මිනුම් කිරීම සම්බන්ධයෙන් බල නොපායි.

### 2.3.2 ජා.මූ.වා.ප්‍ර. 14 නියාමන විලම්භිත ගිණුම්

ජා.මූ.වා.ප්‍ර. 14 විසින් සිය කාර්යයන් අනුපාත නියාමනය යටතේ ආයතනයකට ජා.මූ.වා.ප්‍ර. ප්‍රථම වරට අදාල කරගැනීම මත ඇතිවන නියාමන විලම්භිත ගිණුම්හි ශේෂයන් සඳහා බොහොමයක් පවතින ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කිරීමට අවසර ලබා දේ. ජා.මූ.වා.ප්‍ර 14 අදාළ කරගන්නා ආයතන විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම ආයිතමයකින් නියාමන විලම්භිත ගිණුම් පෙන්නුම් කළ යුතු අතර ආදායම් ප්‍රකාශනයේ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වෙනමම අයිතමයකින් එම ගිණුම් ශේෂයන්ගේ වර්තමාන වෙනස්වීම පෙන්විය යුතු ය. ප්‍රමිතිය මගින් ආයතනයේ අනුපාත නියාමනයේ ස්වභාවය සහ සම්බන්ධිත අවදානම පිළිබඳ හෙළිදරව් කිරීම සහ එහි මූල්‍ය ප්‍රකාශන මත එම අනුපාත නියාමනයේ බලපෑම පිළිබඳ හෙළිදරව් කිරීම නියම කර තිබේ. 2016 ජනවාරි 01 දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ජා.මූ.වා.ප්‍ර. 14 බලපැවැත්වේ. මෙම ප්‍රමිතිය යොදාගැනීම තුලින් බැංකුව කෙරෙහි බලපෑමක් ඇති කිරීම අපේක්ෂා නොකරයි.

### 2.3.3. අ.ගි.ප්‍ර. 19 - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්: සේවක දායකත්වයන් ප්‍රමිතියට කරන ලද සංශෝධිතයන්

අ.ගි.ප්‍ර. 19 ට අනුව ආයතනයක් විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණයේදී සේවකයන් හෝ තෙවන පාර්ශ්වයක් විසින් කරන්නා වූ දායකත්වයන් සැලකිල්ලට භාජනය කළ යුතුය. දායක මුදල් සමග සේවය බැඳේ නම් එම දායකත්වයන් සේවා කාලය තුළ ඍණාත්මක ප්‍රතිලාභයක් ලෙස දැක්විය යුතුයි. මෙම සංශෝධනයන් පැහැදිලි කරන පරිදි, දායක මුදල්හි එකතුව සේවා කාලයෙන් ස්වාධීන වන්නේ නම් ආයතනය විසින් එම දායක මුදල් සේවා සපයන ලද කාලය තුළ සේවා පිරිවැයෙන් අඩු කිරීමක් ලෙස හඳුනාගැනීමට අවසර තිබෙන අතර එම දායක මුදල් සේවා කාලය පුරා බෙදාහැරීමක් අවශ්‍ය නොවේ. මෙම සංශෝධනයන් 2014 ජූලි මස 01 වන දින හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ.

### 2.3.4. ජා.මූ.ව. ප්‍ර. 15 - ගනුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදයම

2014 මැයි මස ජා.මූ.ව.ප්‍ර 15 නිකුත් කරන ලද අතර එමගින් ගනුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු වලින් ජනනය වන ආදායම් හඳුනාගැනීමට පස් වැදෑරුම් ආකෘතියක් පිහිටුවන ලදී. ජා.මූ.ව.ප්‍ර. 15 අනුව ආදායම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් ආයතනය හිමිකම් ලබන ප්‍රතිශ්ඨාව අගය කිරීමෙනි. ආදායම් ගිණුම්කරණයට හා හඳුනාගැනීමට ජා.මූ.ව.ප්‍රා. 15 හි මූලධර්ම විසින් වඩාත් ව්‍යුහගත ප්‍රවේශයක් සපයනු ලබයි. මෙම නව ආදායම් ප්‍රමිතිය සියලුම ආයතනවලට අදාලවන අතර දැනට ජා.මූ.ව.ප්‍ර යටතේ පවතින සියලුම ආදායම් හඳුනාගැනීමේ අවශ්‍යතාවය අභිභවනය කරයි. 2017 ජනවාරි 01 වන දිනට හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්වලට ගැලපෙන පරිදි මුළුමනින් හෝ වෙනස් කරන ලද අතීතානුයෝගී ගැලපුමක් අවශ්‍ය වන අතර මුලින් යොදාගැනීමක් සඳහා ද අවසර දේ. බැංකුව විසින් මෙම ප්‍රමිතීන් බලපැවැත්වෙන විට යොදා ගනී. සවිස්තර නිරීක්ෂණයක් සම්පූර්ණ කරන තුරු හෝ මෙම මූල්‍ය ප්‍රකාශනයන් පල කරන දිනය වන විටත් මූල්‍ය බලපෑම් සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ ගනුදෙනු සඳහා භාවිතා වන සහ ඒවා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| | **2014**<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **107.3616** | 116.6709 |
| කැනේඩියානු ඩොලර් 1 | **113.0558** | 122.7324 |
| යුරෝ 1 | **159.2568** | 180.4522 |
| ජපන් යෙන් 1 | **1.0962** | 1.2459 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **189.8640** | 201.3550 |
| ස්ටර්ලින් පවුම් 1 | **204.1803** | 215.5790 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **131.0486** | 130.7530 |
| චීන යුවාන් (අක්වෙරළ) | **21.0483** | 21.5800 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවූන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 3.2 සාධාරණ අගය මිනුම් කිරිම

බැංකුව විසින් මූල්‍ය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ ඉඩම් හා ගොඩනැගිලි ආදී වූ මූල්‍ය

නොවන උපකරණයන් එකී ශේෂපත්‍ර දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 44 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ හවුල්කරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වත්කම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් ලාභදායී වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරනු ලබන්නේ වෙළෙඳපොළ හවුල්කරුවන් ඔවුන් උපරිම ආර්ථික වාසියක් ලබාගැනීම උදෙසා හැසිරෙනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක් හෝ වගකීමක් මිලකිරීමේදී යොදාගන්නා උපකල්පනයන් යොදා ගැනීමෙනි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්ගත කිරීමේ දී වෙළෙඳපොළ හවුල්කරුවන්ගේ වත්කමක් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීම මගින් හෝ උපරිම හා විශිෂ්ට වාසි ලැබෙන ලෙස භාවිතාවේ යොදා ගන්නා වෙනත් වෙළෙඳපොළ හවුල් කරුවකුට විකිණීම මගින් හෝ, ආර්ථික වාසි ජනනය කිරීමේ හැකියාව සලකා බලනු ලබයි.

බැංකුව විසින් සාධාරණ අගයයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරික්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධූරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

මූල්‍ය වාර්තාවන්හි පුනරාවර්තන පදනම මත හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, මෙම ධූරාවලියෙහි මට්ටම් අතර හුවමාරු වීම් සිදුවී ඇත්දැයි බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම්කරණය උදෙසා සමස්තයක් වශයෙන් වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව මෙම වර්ගීකරණය නැවත තක්සේරු කිරීම තුළින් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේ තීරණය කරනු ලබයි.

### 3.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

### 3.3.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, “ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම්” යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය “උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය)” ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත්

විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(අවාසිය)" ලෙස වාර්තා කරනු ලැබේ.

**3.3.2 අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

**3.3.3 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමණාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය සෘණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

**3.3.4 එක් දින වෙනස**

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) ඉක්මනින්ම උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු) ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශණ තුළින් ඉවත්ව ගිය විට පමණක් අදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**3.3.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.3.6 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 37 සහ සටහන් 38 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**3.3.7 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

**3.3.8 නිත්‍ය තැන්පතු පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය මිලදී ගැනුම් පහසුකම). සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව මෙම පහසුකම යටතේ ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම් (පෙර නිත්‍ය ප්‍රතිවිකිණුම් පහසුකම), නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම වේ.

**3.3.9 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**3.3.10 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින් එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

**3.3.11 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

**3.3.12 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ආරම්භයේ දී ප්‍රදානය කළ මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල් අඩුකර, හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

**3.3.13 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**3.3.14 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් මෙම ණය පහසුකම ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මගින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරන ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන් :**

- 2008 වර්ෂයේ සිට ලබාදුන් සේවක ණය සලකා බලන ලදී.
- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.

- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

ණය කළමනාකරණ පද්ධතිය වඩාත් සරල කිරීමේ අභිප්‍රායෙන් මහ බැංකුව විසින් පරිගණක ණය සහ බී කාණ්ඩ ණය යටතේ වූ තවත් ණය වර්ග දෙකක් රුපියල් ලක්ෂ 3 ක ණය සීමාවකට සහ වසර 10 ක නැවත ගෙවීමේ කාලයකටද යටත්ව ඒකාබද්ධ කිරීමකට හා නැවත සැලසුම් කිරීමකට ලක් කොට ඇත. එමගින් ඉහත ප්‍රභේද ත්‍රිත්වය එක් ණය ගැතියකුට අයිති තනි ණයක් ලෙස ඒකාබද්ධ කෙරෙනු ඇත. ඒ අනුව මෙම ප්‍රභේදය යටතේ නව ණය මුදලක් ප්‍රධානය කරන ඕනෑම අවස්ථාවක එකී මුදල සහ හිඟ ණය මුදල් ප්‍රමාණය යන අයිතිමයන් දෙකම නැවත සැලසුම් කිරීමකට ලක් කරනු ඇත.

### 3.3.15 මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### 3.3.16 ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයත් වට්ටම් කළ අගයත් අතර වෙනසය. වත්කමක ධාරණ අගය ඍජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 3.3.17 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

### 3.3.18 විදේශීය මුදල් කාලීන බැරකම්

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

### 3.3.19 මූල්‍ය ඇපකර

මූල්‍ය වාර්තාවලදී මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධාරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදුකරනු ලැබේ.

### 3.3.20 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

## 3.4 අනිකුත් වත්කම් සහ බැරකම්

### 3.4.1 රන්

ජාත්‍යන්තර සංචිතයේ සංයුතිය මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රන්, මෙම සංචිතයේ කොටසක් ලෙස දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන්වල අගය 2014 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 116.99 කි (බෙදා වෙන්කළ හැකි රන් රුපියල් බිලියන 100.19 ක් සහ බෙදා වෙන් කළ නොහැකි රන් රුපියල් බිලියන 16.80 ක් වශයෙන්). මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

### 3.4.2 තොග

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

**3.4.3 දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම් ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේනොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

**3.4.4 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

**3.4.5 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන්කිරීම් පිළිබඳ පසුව අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

**3.4.6 විවිධ වත්කම්**

අනෙකුත් විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**3.4.7 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**3.4.8 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**3.4.9 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**3.4.10 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 43 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**3.4.11 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂිත සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන අගය කිරීම් වර්ෂ තුනකට වරක් බැගින් සිදු කරනු ලැබේ.

**3.4.12 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

**3.4.13 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**3.4.14 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**3.4.15 ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.4.16 බදුකරණය**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. තවද 2013 අංක 06 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත යටතේ සහ 2013 අංක 17 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධිත) පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ මූල්‍ය සේවා සැපයීම මත වන එකතුකළ අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**3.4.17 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන් ද සපුරාලිය යුතුය.

**3.4.17.1 පොළිය**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.4.17.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**3.4.17.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**3.4.18 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා ප්‍රාග්ධන බැඳීම් අයිතම ලෙස හඳුනාගෙන ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

## 5. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්

| | **2014**<br>**රු. 000** | 2013<br>රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **61,495,307** | 94,137,368 |
| විකිණීම සඳහා ඇති ආයෝජන | **408,189,500** | 357,531,750 |
| **එකතුව** | **469,684,807** | 541,669,118 |

## 6. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

අ) පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමේ නිර්දේශ අනුපාතයේ හෝ දර්ශකයේ අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟ වේ.

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු Currency SWAPS | **1,579,560** | **2,758,093** | **285,044,665** | 5,670,258 | 4,703,881 | 360,929,041 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | **630** | **-** | **425,908** | - | 451 | 180,452 |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය විකල්පයන් (Currency Option) | **-** | **16,449,303** | **159,213,437** | - | 11,478,950 | 119,808,712 |
| පොලී අනුපාත හුවමාරු (Interest Rate SWAP) | **47** | **427** | **1,310,486** | - | - | - |
| එකතුව | **1,580,237** | **19,207,822** | **445,994,496** | 5,670,258 | 16,183,282 | 480,918,205 |

ආ) ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විතවනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලිනි. මෙවැනි උපකරණ යොදාග නුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වාගැනීම සඳහා වන අතර, ජාත්‍යන්තර අරමුදල්වලින් පැන නගින්නා වූ සමහර අවදානම් කළමනාකරණය කිරීම මගින් සමපේක්ෂණ චේතනාවක් මත එම උපකරණ විවෘත තත්ත්වයන්හි පවත්වාගෙන ගනුදෙනු කිරීමෙන් ලාභ ඉපයීම නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර, සාධාරණ අගය ධන අගයක් වන විට එය වත්කමක් ලෙසද, සාධාරණ අගය ඍණ අගයක් වන විට එය වගකීමක් ලෙස ද සටහන් කරනු ලබේ.

ඇ) ස්වල්පවශයෙන් වටිනාකම මාරු කිරීම හෝ වටිනාකම මාරු කිරීමකින් තොරව, අන්‍යොන්‍ය ප්‍රතිපාදන හුවමාරු කිරීම මගින් පමණක් ව්‍යුත්පන්න උපකරණයන්ගේ ආරම්භය සිදුවේ. කෙසේ වුවත් නිතර ඉහල තොලන මට්ටමක් ඇති මෙම උපකරණ චංචල උපකරණයන් වේ. ව්‍යුත්පන්න ගිවිසුමක ගැබ්ව ඇති වත්කමක වටිනාකම, අනුපාතය හෝ දර්ශකය සිදුවන්නා වූ සුළු සංචලනයක් මගින් බැංකුවේ ලාභය හෝ අලාභය කෙරෙහි සැලකිය යුතු මට්ටමේ බලපෑමක් සිදු කරයි. අත්පිට ව්‍යුත්පන්න උපකරණයක් මගින් විවෘත තත්වයන් සංවෘත කිරීම සඳහා හුවමාරු වෙළෙඳ පොළක් නොමැති වීම හා සම්බන්ධ අවදානමක් බැංකුව වෙත ඇති කරනු ලැබේ.

ඈ) අදාළ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ තහවුරු කිරීමට ජාත්‍යන්තර සංචිතවල බැංකුවේ වෙළෙඳ අවදානම සමස්ත කළමණාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි. වැඩිදුර තොරතුරු 42 වන සටහනේ දක්වා ඇත.

ඉ) ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපාය මාර්ගයක් ලෙස එළඹුණු හුවමාරු (Swaps) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹෙහි ඉතා වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. හුවමාරු යනු නිශ්චිත පාදක වූ දර්ශකයක එනම් පොලී අනුපාතයක් ලෙස, විදේශ විනිමය අනුපාතයක් ලෙස හෝ ස්කන්ධ දර්ශකයක වෙනස් වීම්වලට අදාලව නිශ්චිත කාල්පනික ප්‍රමාණයනට පදනම්ව කාලයක් පුරාවට පාර්ශවයන් දෙපිරිසක් අතර ගෙවීම් ප්‍රවාහයක් හුවමාරු කරගැනීමට වූ ගිවිසුම් ගත එකඟතාවයකි. විනිමය හුවමාරුවකදී, බැංකුව නිශ්චිත ප්‍රමාණයක් එක මුදල් වර්ගයකින් ගෙවන අතර වෙනත් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් ලබා ගනී.

(ඊ) පොලී අනුපාතික හුවමාරුවකදී විශේෂිත ව්‍යවහාරික මුදලක් සඳහා නිශ්චිත හෝ විචල්‍ය පොලියක් හුවමාරුකර ගැනීමට අදාල ගනුදෙනුකරුවන් එකඟතාවයකට එළැඹේ. නිශ්චිත හෝ විචල්‍ය අනුපාතිකයක් මත පදනම්ව ලබාගන්නා සුදුසු සාම්ප්‍රදායික දින ගණනය ප්‍රධාන කාල්පනික අගයෙන් ගුණකිරීම හරහා ලැබෙන උපචිත සාධකය මත උපචිත පොලිය ලබා ගත හැක.

(උ) පොලී අනුපාතික හුවමාරුවේදී බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට නිශ්චිත අනුපාතිකයක් (හුවමාරු අනුපාතිකය) ගෙවනු ලබන අතර නිර්දේශිත අනුපාතික දර්ශකයක් වන විචල්‍ය අනුපාතිකයක් හිමි වේ. (තෙමසක අන්තර් බැංකු අර්පණ අනුපාතිකය + ආන්තිකය)

### 7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | **1,199,895** | 2,032,177 |
| ජා.මූ.අ. පංගුව | **78,489,778** | 83,240,157 |
| ජා.මූ.අ. තැන්පතුව | **126,356** | 128,430 |
| | **79,816,029** | 85,400,764 |

#### අ) විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා වි.ගැ.හි. හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. වල ඇති විශේෂත්වය ඇති වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

#### ආ) ජා.මූ.අ. පංගුව

ජා.මූ.අ. අරමුදලෙහි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වය යන්නෙහි එක් එක් රටවල පංගුව එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර

ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විදේශ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය.

ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව මගින් බැංකුවේ වත්කම් නියෝජනය කරනු ලබයි. ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 19 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

i.) **ආයකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ ආයකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් ආයකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ මුදල්වලින් ගෙවිය යුතුය.

ii.) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්ද ද පංගුවෙහි සෑම වි.ගැ.හි. මිලියන 0.1 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් බැගින් ද හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.502 ක් ලෙස ස්ථාවර කරන ලදී.

iii.) **මූල්‍යකරණය පිවිසීම** - සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම්වලින් (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව පදනම් වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට ප්‍රවර්තනය වාර්ෂිකව පංගුවෙන් සියයට 200 ක් ද සමුච්චිත වශයෙන් සියයට 600 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

iv.) **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

**ඇ) ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව**

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788.783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව (act as an out right grant) 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

**8. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

**9. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

**10. බැංකුවලට දෙන ලද ණය**

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| සම්බන්ධිත පාර්ශවයන් | **35,243** | 37,377 |
| අනෙකුත් | **486** | 546 |
| සුසහන සුනාමි ණය යෝජනා ක්‍රමය (I සහ II අදියර) | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **48,725** | 104,576 |
| අනෙකුත් | **5,545** | 17,794 |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **598,273** | 1,242,405 |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **117,056** | - |
| අනෙකුත් | **199,241** | - |
| නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **212,798** | - |
| අනෙකුත් | **199,478** | - |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය | | |
| අනෙකුත් | **42,250** | - |
| පිබිදෙන උතුර (අදියර II) | | |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **41,761** | - |
| අනෙකුත් | **15,818** | - |
| අඩුකළා: | | |
| අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වෙන් කිරීම | **(27,302)** | (27,302) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **1,489,372** | 1,375,396 |

අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වෙන් කිරීමේ චලනය

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| ආරම්භක ශේෂය | **27,302** | 27,302 |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම | **-** | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | **27,302** | 27,302 |

## 11. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

(අ) මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ, කාර්මික හෝ වෙනත් ආයතනයක සෘජු සම්බන්ධකම් ඇතිවන පරිදි වෙළෙඳ හෝ වෙනත් කටයුතුවල නිරතවීම හෝ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී වෙනත් බැංකුවල කොටස් මිලදී ගැනීම හෝ මේ යටතේ තහනම් කරනු ලැබේ. කෙසේ වුවද, මුදල් මණ්ඩලයේ මතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ඇරීමට පනත මගින් බලතල පවරා තිබේ.

(i) ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | දරණ ප්‍රතිශතය 2014 | 2013 |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **10.00** | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **19.30** | 19.30 |

(ii) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,845** | 5,845 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මුළු ආයෝජනය | **41,095** | 41,095 |

## 12. අනිකුත් වත්කම්

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **3,430,085** | 2,917,545 |
| කාර්ය මණ්ඩල ණය | | |
| ක්‍රමක්ෂය පිරිවැයට | **3,648,436** | 3,442,454 |
| ණයකරවල ආයෝජන | | |
| ක්‍රමක්ෂය පිරිවැයට | **9,328** | 8,237 |
| | **7,087,850** | 6,368,236 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **1,020,064** | 958,297 |
| | **8,107,914** | 7,326,533 |

ණයකරවල ආයෝජන මගින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම වෙත 1988 දී බැංකුව විසින් ලබා දී තිබූ සහ 2011 දී සම්පූර්ණයෙන්ම කපා හරින ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ලැබුණු ණයකරවල වටිනාකමයි. මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු තවමත් සම්පූර්ණ කර නොමැති අතර ඉතිරි මුදල ඈවර කිරීමෙන් උත්පාදනය වන මුදලින් පියවා ගනු ඇත.
ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව නිකුත් කරනු ලදුව බැංකුව වෙත හිමි වූ රුපියල් මිලියන 10.839 වටිනාකමින් යුත් ණයකර ක්‍රමක්ෂය පිරිවැයට වාර්තා කර ඇත. සුරැකු නොලත් මෙම ණයකර වර්ෂ 10 ක් සඳහා යටත්, නිදහස් කල හැකි හා 5% වාර්ෂික පොළී හිමිකමක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ අනුපාතයන් අතුරින් අඩු අගයට වාර්ෂිකව උපචිත කරයි.

## 13. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. 67(2) වගන්ති ප්‍රකාරව රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙස හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස සෘජුව හෝ වක්‍රව රන් දරා සිටීමට මුදල් මණ්ඩලය ඉඩ ලබා දී ඇත.

## 14. තොග

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **1,675,897** | 2,035,994 |
| සංසරණය සඳහා ඇති කාසි | **1,553,451** | 732,232 |
| මාර්ගස්ථ කාසි | **165,110** | 109,233 |
| මාර්ගස්ථ නෝට්ටු | **231,380** | 233,897 |
| | **3,625,838** | 3,111,356 |
| *අඩුකළා :* සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **3,580,838** | 3,066,356 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **39,331** | 36,776 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **311** | 149 |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **3,620,480** | 3,103,281 |

## 15. දේපළ පිරියත සහ උපකරණ

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 12,332,480 | 1,165,522 | 795,390 | 400,719 | 797,525 | 50,404 | 1,159,869 | **16,701,909** | 16,045,151 |
| එකතු කිරීම් | 875,173 | 72,432 | 28,565 | 99,125 | 49,059 | 1,488 | 945,783 | **2,071,625** | 692,196 |
| අපහරණයන්/මාරු කිරීම් | - | - | (15,926) | (45,369) | (52,870) | - | (1,236,605) | **(1,350,770)** | (35,438) |
| දෙසැම්බර් 31 දිනට අගය | 13,207,653 | 1,237,954 | 808,029 | 454,475 | 793,714 | 51,892 | 869,047 | **17,422,764** | 16,701,909 |
| **ක්ෂය** | | | | | | | | | |
| ජනවාරි 01 දිනට අගය | 298,701 | 594,656 | 568,506 | 289,801 | 690,312 | 31,018 | - | **2,472,994** | 2,132,074 |
| වර්ෂය සඳහා ක්ෂය | 178,687 | 60,775 | 39,940 | 46,037 | 50,797 | 1,550 | - | **377,786** | 355,216 |
| නැවත වර්ග කිරීම | - | - | - | (1,452) | - | - | - | **(1,452)** | - |
| අපහරණයන් | - | - | (15,065) | (45,369) | (52,826) | - | - | **(113,260)** | (14,296) |
| දෙසැම්බර් 31 දිනට අගය | 477,388 | 655,431 | 593,381 | 289,017 | 688,283 | 32,568 | - | **2,736,068** | 2,472,994 |
| ශුද්ධ පොත් අගය | 12,730,265 | 582,523 | 214,648 | 165,458 | 105,431 | 19,324 | 869,047 | **14,686,696** | 14,228,915 |

ඉඩම් සහ ගොඩනැගිලි සඳහා පොත් වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2012 මාර්තු 31 දිනට වරලත් තක්සේරුකරුවකු වන පී.බී. කළුගලගෙදර මහතා විසින් සිදු කරන ලද අතර 2012 අප්‍රේල් 30 දින වාර්තා ගත කර තිබුණි'.

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2014 රු. 000 | ධාරණ අගය 2013 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **5,643,100** | 5,243,100 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **7,002,418** | 6,705,474 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **84,748** | 85,205 |
| | **12,730,266** | 12,033,779 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රුපියල් මිලියන 10,011.913 ක් වේ. (2013 දී එය රුපියල් මිලියන 9,305.235 කි).

තවද, බැංකුව විසින් බ්‍රසීලයේ දේපොළක් 2014 දෙසැම්බර් 18 වන දින රුපියල් මිලියන 122.2 කට මිලට ගෙන ඇත.

## 16. අස්පෘෂ්‍ය වත්කම්

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| **පරිගණක මෘදුකාංග :** | | |
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **638,020** | 614,997 |
| එකතු කිරීම් | **290,657** | 23,023 |
| අපහරණයන් | **(1,655)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **927,022** | 638,020 |
| **ක්‍රමක්ෂය සහ හානිකරණය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **602,422** | 590,844 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **20,136** | 11,578 |
| අපහරණයන් | **(1,620)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **620,938** | 602,422 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **35,598** | 24,153 |
| දෙසැම්බර් 31 දිනට අගය | **306,084** | 35,598 |

## 17. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **11,365,076** | 20,863,380 |
| අනිකුත් විදේශීය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **313,407** | 640,816 |
| | **11,678,483** | 21,504,196 |

## 18. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව එක් සහභාගී රටක් වේ. බංගලාදේශය, ඉරානය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය සහ මියන්මාරය සහ මාලදිවයින එහි අනිකුත් සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල

පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් සියයට 0.03 ක සිට සියයට 0.07 ක් දක්වා වූ පොලියක් ඇ.එ.ජ. ඩොලර් සඳහා ද (2013 දී එය සියයට 0.05 ක් සහ සියයට 0.17 ක් විය) යුරෝ සඳහා සියයට 0.00 ක සිට සියයට 0.12 දක්වා වූ පොලියක් (2013 - සියයට 0.00 සහ සියයට 0.00) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. ශේෂයෙන් අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

## 19. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන | **94,841,815** | 173,416,994 |
| පොලිය දරන ණය - ප්‍රවර්තන | **68,678,555** | 95,379,347 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **75,083,657** | 79,627,890 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **47,039,094** | 48,517,078 |
| පංගු බැරකම් | **22,368,012** | 25,090,703 |
| | **213,169,318** | 248,615,018 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **308,011,133** | 422,032,012 |

අ) 2014 වසරේ පොලිය දරණ ණයවලට, ජා.මූ.අ. වෙතින් ලබාගන්නා ලද හදිසි ආධාර පහසුකම පමණක් ඇතුළත් වේ.

ආ) සම්පස්ථ ණය පහසුකම (SBA) යනු ණය ගනු ලබන රටවල්වල සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු සඳහා වූ නිශ්චිත කොන්දේසිවලට යටත් ව ගෙවුම් ශේෂ කටයුතු මූල්‍ය කරනය සඳහා ලබා දෙනු ලබන තවත් පහසුකමකි. ජා.මූ.අ. විසින් 2009 ජූලි මස වි.ගැ.හි. බිලියන 1.65ක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.6ක) සම්පස්ථ ණය පහසුකමක් ගෙවුම් ශේෂ කටයුතුවලට සහය දීම සඳහා අනුමත කරන ලදී. 2012 ජූලි මස අවසාන වාරිකය හිමිවීමත් සමග සම්පස්ථ ණය පහසුකම 2012 වසර තුළදී සාර්ථකව අවසන් වන ලදී. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 5ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වුනි. මෙම ණය පහසුකම සඳහා අයකරන පොළී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර අනුපාතය යන කොටස් දෙකකින් සමන්විත වේ. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් පොළී අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% තෙක් වන අවස්ථාවකදී ස්ථාවර අනුපාතය වාර්ෂිකව 1% වේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300%ක් ඉක්මන අවස්ථාවකදී වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුවේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.8 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. වි.ගැ.හි. මිලියන 292.83 ක් සහ වි.ගැ.හි. මිලියන 473.69 ක මුදලක් පිළිවෙළින් 2013 සහ 2014 වසරවලදී ආපසු ගෙවන ලද අතර 2014 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශේෂය වි.ගැ.හි. මිලියන 861.25 වේ.

පොළී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | බලපවත්වන පොළී අනුපාතික % | පරිණත වර්ෂය | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන සම්පස්ථ ණය පහසුකම (SBA) | **1.05** | | **68,678,555** | 95,379,347 |
| | | | **68,678,555** | 95,379,347 |
| ප්‍රවර්තන නොවන සම්පස්ථ ණය පහසුකම (SBA) | **1.05** | **2017** | **94,841,815** | 173,416,994 |
| | | | **94,841,815** | 173,416,994 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **163,520,370** | 268,796,341 |

ඇ) **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි) සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන්ට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 7 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. ඇරීම් වැඩි වේ. එහි ශුද්ධ වෙන්කිරීමට සමාන මුදල් සහ එය වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගීවීමේ හේතුවෙන් ජා.මූ.අ., වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කළ හෝ ඇවර කළ අවස්ථාවේ දී ගෙවිය යුතු අනිකුත් යම් මුදලක් වෙතොත් ඒවා ජා.මූ.අ. වෙත ගෙවීමට සාමාජිකයන් බැඳී සිටී.

ඈ) **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්** : මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

ඉ) **පංගු බැරකම**: අංක 7 දරන සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 20. අනිකුත්

| | 2013 රු. 000 | 2012 රු. 000 |
|---|---|---|
| එස්කෝරුව ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය (අ) | **8,017,222** | 29,052,050 |
| EIB/DFCC ගෝලීය ණය II (ආ) | **-** | 36,264 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (ඇ) | **14,046,678** | 15,657,844 |
| DST CDB (ඇ.එ.ජ.) - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (ඈ) | **34,106,960** | - |
| DST විශේෂ ඩොලර් ගිණුම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) | **1,222,595** | - |
| DST CDB (ඇ.එ.ජ.) - ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (ඉ) | **13,104,860** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **1,647,843** | 2,474,961 |
| | **72,146,159** | 47,221,119 |

**(අ) එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය.**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකගතාවක් සඳහා අත්සන් තබන ලදී. මෙම පහසුකම් එකගතාවේ අරමුදල් ප්‍රමුඛතා මාර්ග යන් සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා යොදා ගැනේ. පහසුකම් එකගතාවය අනුව, බැංකුව එස්කෝරු නියෝජිතයා ලෙස පත් කරන ලදී. ඒ අනුව ණය තැන්පත් කිරීම හා එලෙස ලැබෙන මුදල් මාර්ග ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු ගිණුමක් බැංකුවේ විවෘත කරන අතර සහ එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා (චීන සංවර්ධන බැංකුව) හා ණය ගැනුම්කරු (ශ්‍රී ලංකා රජය) යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ණය පහසුකම යටතේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 326 මුදලක් ප්‍රථම වාරිකය ලෙස 2011 ජූනි 29 දින ලැබුණු අතර දෙවන වාරිකය වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 174 ප්‍රමාණය 2011 ඔක්තෝබර් 28 දින ලංකාවට ලැබුණි.

වැය අනුමත නිවේදනය එස්කෝරු නියෝජිතයා වෙත එවීම මගින් ණයහිමියා විසින් එස්කෝරු ගිණුමේ ඇති මුදල් වැය ඉල්ලුම් පත්‍රයේ සඳහන් ගිණුම් වෙත වැය කිරීම සඳහා උපදෙස් ලබාදේ.

ඒ අනුව 2011 ඔක්තෝබර් 18 දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.768 ප්‍රමාණයක් මේ යටතේ ප්‍රථමයෙන් බෙදා හරින ලදී.

චීන සංවර්ධන බැංකුවෙන් ලද වියදම් අනුමැතියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 සහ 2012 වර්ෂයන් තුළ ඇ.එ.ජ. ඩොලර් මිලියන 157.5 ක මුදලක් බෙදා හැර ඇත. එසේම 2012 වර්ෂය අවසානය වන විට එස්කෝරුව ගිණුමේ ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 340.7 කි.

ඇ.එ.ජ. ඩොලර් මිලියන 118.52 ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 161.03 ක මුදලක් පිළිවෙලින් 2013 සහ 2014 වර්ෂයන් හිදී බෙදා හැරීම් කර ඇත. 2014 දෙසැම්බර් මස 31 වන දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 61.177 කි.

**(ආ) EIB/DFCC ගෝලීය ණය II**

යුරෝපීය ආයෝජන බැංකුවෙන් යූරෝ මිලියන 50 ක ණය ගිවිසුම් ප්‍රකාරව ක්ෂුද්‍ර මූල්‍යනය සඳහා ණය ලැබී ඇත. කෙසේ වුවත් පසුව ලද කොටස ඇමරිකානු ඩොලර්වලින් ලැබී ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ ඩොලර් ගිණුමක් පොදු ලෙජරයේ, ගෝලීය EIB/DFCC ගෝලීය ණය II යටතේ DFCC බැංකුවට අරමුදල් රැස් කිරීම සඳහා විවෘත කර ඇත. 2012 පෙබරවාරි 3 වන දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 12.7 ක ණය මුදලක් යුරෝපීය ආයෝජන බැංකුවෙන් ප්‍රථම ඩොලර් වාරිකය ලෙස ගිණුම් අංක 45014 ට ලැබී ඇත. 2012 ජූනි මස 01 වන දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.2 මුදලක් දෙවන වාරිකය ලෙස ලැබුණි. පළමු බෙදාහැරීම 2012 මාර්තු 01 වන දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 4.002 ලෙස ද, තව බෙදාහැරීම් දෙකක් ඇ.එ.ජ. ඩොලර් මිලියන 6.573 හා 2.142 ලෙස 2012 මාර්තු මස 3 දින සිදුකර ඇත. 2012 අගෝස්තු මස 14 වන දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඇ.එ.ජ. ඩොලර් මිලියන 12.343 හා ඇ.එ.ජ. ඩොලර් 6.171 ක වටිනාකමින් යුත් බෙදාහැරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර ඇත. තවත් බෙදාහැරීමක් ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.473 ලෙස 2012 නොවැම්බර් මස 19 දින සිදුකර ඇත. ඒ අනුව 2014 ඔක්තෝම්බර් මස 16 දින ඉතිරි ශේෂය වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.277 ක මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුම් අංක 50516 ට මාරු කරන ලදී.

**(ඇ) මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය**

ඇ.එ.ජ.ඩො. මිලියන 214.2 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය දායකයා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැනුම්කරු) අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුම යටතේ, ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

2012 ජූනි 29 ඇ.එ.ජ. ඩොලර් මිලියන 214.2 ක ණය මුදලක් චීන සංවර්ධන බැංකුවෙන් ලැබී ඇත. 2012 අගෝස්තු 24 දින ප්‍රථම බෙදාහැරීම ලෙස ඇ.එ.ජ. ඩොලර් මිලියන 64.337 ක ගෙවීම් කර ඇත. 2013 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 30.1 ක් බෙදා හැර ඇත.

2014 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 12.564 ක් බෙදා හරින ලද අතර 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩො. මිලියන 107.186 කි.

**(ඈ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු මුදල.**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය දායකයා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැණුම්කරු) අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2014 මාර්තු 28 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් ලැබුණි. 2014 වසර තුළ දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 39.738 ක් බෙදා දී ඇති අතර 2014 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 260.262 කි.

**(ඉ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු මුදල.**

II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක ගිවිසුම 2014 නොවැම්බර් 24 වන දින හිමි විය.

**(ඊ) ශ්‍රී ලංකා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණය**

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපියානු ආයෝජන බැංකුව අතර 2013 නොවැම්බර් 13 වන දින ඇති වූ මූල්‍ය ගිවිසුමකි. මෙම ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තෝරා ගැණිනි. ඒ අනුව, ලැබෙන ණය මුදල් තැන්පත් කිරීමට සහ එම මුදල් ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ පරමාර්ථය ඇතිව පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2014 ඔක්තෝම්බර් 06 වන දින මෙම ගිවිසුම ඇ.එ.ජ. ඩොලර් මිලියන 21.125 ක් ලැබිණි. 2014 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 11.795 ක් බෙදා හැර ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිව ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.329 කි.

## 21. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මේ යටතේ පොළී රහිත, සම්පූර්ණයෙන් ම සුරැකුම් සහිත දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම් යටතේ අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරන හෙළිදරව් කිරීම අවශ්‍යතාවයන් මත තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද මෙම තැන්පතු අදාල ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ පවත්වාගෙන යනු ලබන අතර බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **84,976,155** | 77,899,164 |
| - අනිකුත් | **76,028,176** | 70,906,573 |
| | **161,004,331** | 148,805,737 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **167** | 202 |
| - අනිකුත් | **4,825** | 3,954 |
| | **4,992** | 4,156 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **161,009,323** | 148,809,893 |

## 22. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **166,583** | 27,766 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **145,367** | 388,464 |
| | **311,950** | 416,230 |

රජයේ හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

## 23. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | **321,220,000** | 84,601,000 |
| නිත්‍ය තැන්පතු පහසුකම (සටහන 3.3.8) | **7,032,000** | - |
| | **328,252,000** | 84,601,000 |

මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ හිමිවන බලතල යටතේ විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 24. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරන සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැරට රඳවා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ල.ම.බැ. අර්ථසාධක අරමුදල | **7,431** | 429,932 |
| ශ්‍රී.ල.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය | **635,387** | 600,119 |
| වැන්දඹු/ වැන්දඹු හා අනත්දරු අරමුදල | **155,559** | 1,440 |
| විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් ගෙවිය යුතු | **117,463** | 90,398 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වෙනුවෙන් ගෙවිය යුතු | **1,293,943** | 1,297,198 |
| එකතුව | **2,209,782** | 2,419,087 |

**25. අනෙකුත් ගෙවිය යුතු දෑ**

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| දේශීය පොලී වෙනුවෙන් ගෙවිය යුතු මුදල් | **2,120,819** | 161,223 |
| වෙන්කිරීම් සහ අයකිරීම් | **805,295** | 610,465 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **2,688,215** | 1,880,078 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් | **2,655,909** | 2,335,466 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **669,056** | 672,485 |
| **එකතුව** | **8,939,293** | 5,659,717 |

බැංකුවල අත්හරින ලද දේපලවල වටිනාකමට අදාළව රැස්කරගත් අරමුදල් අනෙකුත් ගෙවියයුතු මුදල්වල ඇතුළත්ව ඇත. මෙය බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළීය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළීය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

**26. සංසරණයේ ඇති මුදල්**

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. අදාල මූල්‍ය ප්‍රකාශන දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| **කාසි** | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,703** | 5,702 |
| සත 5 | **23,247** | 23,245 |
| සත 10 | **39,208** | 39,211 |
| සත 25 | **120,558** | 120,566 |
| සත 50 | **185,564** | 185,798 |
| රුපියල් 1 | **734,733** | 714,252 |
| රුපියල් 2 | **1,048,861** | 1,013,765 |
| රුපියල් 5 | **3,130,691** | 3,035,467 |
| රුපියල් 10 | **2,252,507** | 1,672,674 |
| අනිකුත් සමරු කාසි | **577,523** | 574,663 |
| | **8,122,226** | 7,388,974 |
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,697** | 26,698 |
| රුපියල් 5 | **37,194** | 37,198 |
| රුපියල් 10 | **1,519,817** | 1,638,800 |
| රුපියල් 20 | **4,121,289** | 3,725,554 |
| රුපියල් 50 | **4,273,372** | 4,041,101 |
| රුපියල් 100 | **17,029,514** | 15,332,034 |
| රුපියල් 200 | **132,526** | 138,465 |
| රුපියල් 500 | **28,205,681** | 23,668,137 |
| රුපියල් 1,000 | **127,258,019** | 105,385,676 |
| රුපියල් 2,000 | **67,438,978** | 87,798,698 |
| රුපියල් 5,000 | **158,725,070** | 90,584,665 |
| | **408,773,136** | 332,382,007 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **416,895,362** | 339,770,981 |

**27. විලම්භිත ප්‍රදානයන්**

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **1,449** | 2,389 |
| වර්ෂයතුල ක්‍රමක්ෂය | **(934)** | (940) |
| දෙසැම්බර් 31 දිනට | **515** | 1,449 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

**28. විවිධ බැරකම් හා උපචිතයන්**

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් ධාරණයන්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු, සහ රජයට ගෙවිය යුතු, විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් රැස් කර ගන්නා ලද දඩ මුදල් අන්තර්ගතය.

**29. හිමිකරු ප්‍රාග්ධනය**

**(අ) හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**i.** *ආයක ප්‍රාග්ධනය :* මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

**ii.** *ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිත :* MB/F/22/12/2008 දරණ මුදල් මණ්ඩල තීරණය පරිදි 2008 වර්ෂයේ පොදු සංචිතයෙන් රුපියල් මිලියන 24,985 ක් මාරු කිරීම මගින් මෙම සංචිතය සකසා ඇත. තවද, MB/F/5/17/2012 දරණ මුදල් නීති මණ්ඩල තීරණය පරිදි 2012 මාර්තු මස තුළ රුපියල් බිලියන 10 ක් පොදු සංචිතයෙන් මාරු කර ඇත. 2014 අංක 15 දරන මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වෙනි වගන්තියට අනුව මෙම ගිණුමෙහි ශේෂය ප්‍රාග්ධනය ඉහල නැංවීමට යොදාගෙන ඇත.

**(ආ)ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණ සංචිතය-** ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ පිරියත, හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

**(ඇ)අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ.**

**i.** *ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR)-* ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයක්ය. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම්

ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**ii.** **වෙළඳපල අගය කිරීමේ සංචිතය** - ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලය ලෙසද ජාත්‍යන්තර මුල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම් වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වල වෙළඳපලවල් අතර ඇති වන මිල ඇගැයීමේ ලාභ හෝ අලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල අගය කිරීමේ සංචිතය පිහිටුවන ලදී.

මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

**iii.** **අනෙකුත් සංචිත** - පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකාර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**iv.** **විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල සහ අනුමත රන් ගිණුම්වල ශුද්ධ සාධාරණ අගය/(අලාභය)** විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරැකුම්පත් සහ අනුමත නොවූ රන් ගිණුම් ප්‍රත්‍යාගණනයෙන් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**v.** **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** - තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල් ගොඩනගා ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන සඳහා සීමාකර ඇත.

**vi.** **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බැංකුවේ ආදායම් ඉපැයීමේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා මෙය යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1 ක් මෙම සංචිතයට මාරු කරන ලදී.

**vii.** **තාක්ෂණික අභිවර්ධන සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හෝ නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**viii.** **පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල** - 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.9 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

**ix.** **විශේෂිත ණය ඇප ක්‍රම අරමුදල** - මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රු.මි. 2000 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රු.මි. 1000 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර අදියර II, නැගෙනහිර පළාත තුල ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රු.මි. 1000 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වානිජ බැංකුවලට සහය වීම සඳහා වූ විශේෂිත ණය ඇප ක්‍රමය ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිත | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | විශේෂිත ණය ඇප ක්‍රම සංචිත | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ/ සාධාරණ අගය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය | (214,790,939) | 31,856,435 | 31,845,899 | 105,135,362 | (228,194,740) | 164,227,874 | 686,903,966 | 576,983,857 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| | ශ්‍රී ලංකා රුපියල් | එක්සත් ජනපද ඩොලර් | යූරෝ | ස්ටර්ලිං පවුම් | ජපන් යෙන් | ඕස්ට්‍රේලියානු ඩොලර් |
|---|---|---|---|---|---|---|
| 2014 දෙසැම්බර් 31 දිනට | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | **315,836,566** | **(18,113,664)** | **7,961,856** | **(62,622)** | **5,274,559** | **(6,351,590)** |
| විකුණුම් | **(24,459,676)** | **(304,517,720)** | **5,375,438** | **19,321,868** | **4,875,603** | **29,416** |
| ඉදිරියෙහි වූ හුවමාරු ප්‍රතිගිණුම - ආසන්නම ගනුදෙනුව | **(1,667)** | **-** | **-** | **-** | **-** | **-** |
| ඉදිරි ප්‍රති ගිණුම | **(297,639)** | **-** | **-** | **-** | **-** | **-** |
| 2013 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| මිලදී ගැනුම් | 314,641,828 | 55,095,905 | - | - | - | - |
| විකුණුම් | (2,411,633) | (312,230,195) | (25,277,612) | (29,818,293) | - | - |

2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ අවදානම් නිරාවරණය පහත සඳහන් විය.

| | මුදල් වර්ගය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් රු. 000 | යුරෝ රු. 000 | ජපන් යෙන් රු. 000 | ස්ටර්ලිං පවුම් රු. 000 | විගැහි රු. 000 | ඕස්ට්‍රේලියානු ඩොලර් රු. 000 | අනිකුත් මුදල් රු. 000 | සියළු මුදල් වර්ගවල එකතුව රු. 000 |
| **2013 දෙසැම්බර් 31 දිනට** | | | | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | (55,000,132) | (1,747,078) | 56,010,411 | (16,772,840) | - | 123,785,851 | 319,400,551 | 425,676,763 |
| ලාභ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවි කළ හැකි සුරැකුම්පත් | 180,357,566 | 70,242,132 | 25,488,744 | 75,000,363 | - | 77,770,996 | 22,809,317 | 451,669,118 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6,773 | - | - | - | - | - | 5,663,485 | 5,670,258 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 85,400,764 | - | - | 85,400,764 |
| අනිකුත් ලැබිය යුතු දෑ | - | - | 1 | - | 590 | - | - | 591 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 125,364,207 | 68,495,054 | 81,499,156 | 58,227,523 | 85,401,354 | 201,556,847 | 347,873,353 | 968,417,494 |
| සමානුපාතය | 13% | 7% | 8% | 6% | 9% | 21% | 36% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 29,115 | 9,051,040 | 2,478,696 | 2,397 | 608,315 | 9,334,633 | - | 21,504,196 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,179,409 | - | - | - | - | - | 15,003,873 | 16,183,282 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 37,156,289 | 145,264 | - | - | - | - | - | 37,301,553 |
| ජා.මූ.අ. | - | - | - | - | 422,032,012 | - | - | 422,032,012 |
| අනෙකුත් | 46,530,204 | - | - | - | - | - | 690,915 | 47,221,119 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 84,895,017 | 9,196,304 | 2,478,696 | 2,397 | 422,640,327 | 9,334,633 | 15,694,788 | 544,242,162 |
| සමානුපාතය | 16% | 2% | 0% | 0% | 78% | 2% | 2% | 100% |
| **ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය** | 40,469,190 | 59,298,750 | 79,020,460 | 58,225,126 | (337,238,973) | 192,222,214 | 332,178,565 | 424,175,332 |

## 42.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

| | හය මසක් අඩු රු. 000 | මාස 6 සිට 12 දක්වා රු. 000 | වර්ෂ 1 සිට 2 දක්වා රු. 000 | වර්ෂ 2 සිට 5 දක්වා රු. 000 | වර්ෂ 5 ට වැඩි රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|---|
| 2014 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 487,070,771 | - | - | - | - | 487,070,771 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 61,745,564 | - | - | - | - | 61,745,564 |
| අලෙවි කළ හැකි සුරැකුම්පත් | 36,824,108 | 21,440,653 | 74,839,842 | 186,893,880 | 112,714,585 | 432,713,068 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 10,285,892 | - | - | 126,356 | 69,403,781 | 79,816,029 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 789 | - | - | - | - | 789 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 595,927,124 | 21,440,653 | 74,839,842 | 187,020,236 | 182,118,366 | 1,061,346,221 |
| **දේශීය මුදල් මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 126,146,447 | - | - | - | - | 126,146,447 |
| රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් | 143,897,971 | - | - | - | - | 143,897,971 |
| බැංකු සඳහා දෙන ලද ණය | 397,073 | 343,377 | 337,628 | 545,564 | 1,404 | 1,625,046 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 1,912,071 | - | - | - | - | 1,912,071 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 1,260,219 | 736,309 | 1,319,793 | 2,505,689 | 2,964,554 | 8,786,564 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 273,613,781 | 1,079,686 | 1,657,421 | 3,051,253 | 3,007,053 | 282,409,194 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 869,540,905 | 22,520,339 | 76,497,263 | 190,071,489 | 185,125,419 | 1,343,755,415 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 4,973,823 | 673,045 | 726,957 | 260,896 | 374,477 | 7,009,198 |
| ආසියානු නිශ්කාශන සංගමය | 57,230,304 | - | - | - | - | 57,230,304 |
| ජා.මූ.අ. | 32,704,074 | 35,974,481 | 62,137,740 | 32,704,074 | 144,490,763 | 308,011,132 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් | **71,340,944** | - | - | - | **805,214** | **72,146,158** |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | **166,249,145** | **36,647,526** | **62,864,697** | **32,964,970** | **145,670,454** | **444,396,792** |
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **416,630,260** | - | - | - | - | **416,630,260** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | **311,950** | - | - | - | - | **311,950** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **331,665,172** | - | - | - | - | **331,665,172** |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | **2,209,782** | - | - | - | - | **2,209,782** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **8,939,293** | - | - | - | - | **8,939,293** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | **759,756,457** | - | - | - | - | **759,756,457** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | **926,005,602** | **36,647,526** | **62,864,697** | **32,964,970** | **145,670,454** | **1,204,153,249** |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/වගකීම්** | **(56,464,697)** | **(14,127,187)** | **13,632,566** | **157,106,519** | **39,454,965** | **139,602,166** |

| | හය මසක් අඩු<br>රු. 000 | මාස 6 සිට 12 දක්වා<br>රු. 000 | අවු. 1 හා අවු. 2 අතර<br>රු. 000 |
|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනට** | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 212,727,267 | 91,893,999 | 731 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 210,190,966 | 90,813,211 | - |

## විදේශීය මුදල් පරිවර්තනය

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියලුම අනාගත මූල්‍ය ප්‍රවාහ වාර්තාගත කරන මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2013 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදි විය.

| | හය මසක් අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| 2013 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 425,676,763 | - | - | - | - | 425,676,763 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 104,105,563 | - | - | - | - | 104,105,563 |
| අලෙවි කළ හැකි සුරැකුම්පත් | 12,929,296 | 20,413,029 | 67,917,803 | 136,130,521 | 161,748,684 | 399,139,333 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 11,668,079 | - | - | 128,430 | 73,604,255 | 85,400,764 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 591 | - | - | - | - | 591 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 554,380,292 | 20,413,029 | 67,917,803 | 136,258,951 | 235,352,939 | 1,014,323,014 |
| **දේශීය මුදල් මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 15,985,640 | - | - | - | - | 15,985,640 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 109,167,071 | - | - | - | - | 109,167,071 |
| බැංකු සඳහා දෙන ලද ණය | 429,931 | 399,568 | 552,877 | 144,913 | - | 1,527,289 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 1,829,712 | - | - | - | - | 1,829,712 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 1,245,605 | 184,760 | 884,027 | 1,578,449 | 3,910,923 | 7,803,764 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 128,657,959 | 584,328 | 1,436,904 | 1,723,362 | 3,952,018 | 136,354,571 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 683,038,251 | 20,997,357 | 69,354,707 | 137,982,313 | 239,304,957 | 1,150,677,585 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 23,181,098 | 1,281,220 | 1,806,400 | 1,249,856 | 1,038,652 | 28,557,225 |
| ආසියානු නිශ්කාශන සංගමය | 37,301,553 | - | - | - | - | 37,301,553 |
| ජා.මූ.අ. | 45,088,418 | 50,290,928 | 72,835,137 | 100,581,856 | 153,235,672 | 422,032,012 |
| අනෙකුත් | - | | | | 1,784,046 | 1,784,046 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 105,571,069 | 51,572,148 | 74,641,537 | 101,831,712 | 156,058,369 | 489,674,836 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 148,809,893 | - | - | - | - | 148,809,893 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 416,230 | - | - | - | - | 416,230 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 84,601,000 | - | - | - | - | 84,601,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 2,419,087 | - | - | - | - | 2,419,087 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 5,659,719 | - | - | - | - | 5,659,719 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 241,905,929 | - | - | - | - | 241,905,929 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 347,476,998 | 51,572,148 | 74,641,537 | 101,831,712 | 156,058,369 | 731,580,765 |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/වගකීම්** | 335,561,253 | (30,574,791) | (5,286,830) | 36,150,601 | 83,246,588 | 419,096,820 |

| | හය මසක් අඩු | මාස 6 සිට 12 දක්වා |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **2013 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 272,936,121 | 96,790,456 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 270,565,621 | 92,955,576 |

### 42.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීමේ දී ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා විදේශීය සංචිත ඇවර කිරීමේ දී මෙය විභව අවශ්‍යතාවයකි. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල අවම හා උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවට වෙළෙඳ කටයුතු වැනි දේශීය මූල්‍ය ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල දී වන අවදානම අඩු කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුමක් ලෙස භාවිතා කර ඇත. ඒ මඟින් දේශීය මූල්‍ය වෙළෙඳපොළේ දිනපතා ද්‍රවශීලතාවය, අරමුදල් යෙදවීම හා පාලනය කිරීමට භාණ්ඩාගාර බිල්පත් හා මහබැංකු සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා අමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරුකරණය යොදාගෙන ඇත.

### 43. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පහක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගැහැණු සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය.මෙම සැලසුම්වලට 1994.08.01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994.08.01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකම සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයන් ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් වෙනුවෙන් දරන ලද සමහර වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවලට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වර්තන වියදම් සඳහා ආයුගණන ඇගයීම් නැවත තක්සේරු කිරීම සඳහා වර්ෂය තුළ ස්වාධීන ආයුගණකයෙකු වශයෙන් කන්සල්ටන්ට් ඇන්ඩ් ඇක්චුවරි (බොම්බාය) හි කේ. ඒ. පණ්ඩිත් මහතාගේ සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින්

වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

සියළු ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය රුපියල් මිලියන 35,922.746 (2013 - රුපියල් මිලියන 33,511.975) අතර එහි හිඟ අගය රුපියල් මිලියන 3,599.035 (2013 - රුපියල් මිලියන 4,936.339) ක අගයකින් ඉක්මවූ රුපියල් මිලියන 32,323.711 (2013 - රුපියල් මිලියන 28,575.636) සියළු සැලසුම්වල සාධාරණ වටිනාකමක් වර්ෂය අවසානයේ දී වාර්තා විය.

| 2014<br>ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2014 |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල ප්‍රවර්තන වටිනාකම | 28,883,317 | 4,179,572 | 725,176 | 230,186 | 1,904,495 | 35,922,746 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (24,273,554) | (5,054,224) | (1,594,306) | (132,733) | (1,268,894) | (32,323,711) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්** | 4,609,763 | (874,652) | (869,130) | 97,453 | 635,601 | 3,599,035 |
| **ප්‍රතිලාභ බැරකම්වල/(වත්කම්වල) චලනය** | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට | 5,508,804 | (492,159) | (734,320) | 78,253 | 575,761 | 4,936,339 |
| ප්‍රතිලාභ වියදම් | 1,163,340 | (49,216) | (73,432) | 35,846 | 125,700 | 1,202,238 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හඳුනාගත් කොටස | (1,105,279) | (310,474) | (52,502) | 3,064 | (22,412) | (1,487,603) |
| දායක ගෙවීම් | (957,102) | (22,803) | (8,876) | (19,710) | (43,448) | (1,051,939) |
| 2014 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන | 4,609,763 | (874,652) | (869,130) | 97,453 | 635,601 | 3,599,035 |
| **ප්‍රතිලාභ වියදම්** | | | | | | |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 550,881 | (49,216) | (73,432) | 7,825 | 57,576 | 493,634 |
| ශුද්ධ ප්‍රවර්තන සේවා පිරිවැය | 612,459 | - | - | 28,021 | 68,124 | 708,604 |
| **ශුද්ධ ප්‍රතිලාභ වියදම** | 1,163,340 | (49,216) | (73,432) | 35,846 | 125,700 | 1,202,238 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය** | 3,269,674 | 773,111 | 205,286 | 10,476 | 175,870 | 4,434,417 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 14.32% | 16.18% | 13.74% | 8.78% | 14.31% | 14.56% |
| **ගෙවූ ප්‍රතිලාභය මත ඉපැයූ අතිරික්ත පොළී** | 1,934,458 | 526,475 | 191,404 | 7,236 | 36,563 | 2,696,136 |
| **සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි චලනය** | | | | | | |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 21,381,994 | 4,504,946 | 1,394,026 | 105,787 | 1,188,883 | 28,575,636 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 3,269,674 | 773,111 | 205,286 | 10,476 | 175,870 | 4,434,417 |
| දායක ලැබීම් | 957,102 | 22,803 | 8,876 | 19,710 | 43,448 | 1,051,939 |
| ප්‍රතිලාභ ගෙවීම් | (1,335,216) | (246,636) | (13,882) | (3,240) | (139,307) | (1,738,281) |
| **වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්වල සාධාරණ අගය** | 24,273,554 | 5,054,224 | 1,594,306 | 132,733 | 1,268,894 | 32,323,711 |

| 2013 ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල ප්‍රවර්තන වටිනාකම | 26,890,798 | 4,012,787 | 659,706 | 184,040 | 1,764,644 | 33,511,975 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (21,381,994) | (4,504,946) | (1,394,026) | (105,787) | (1,188,883) | (28,575,636) |
| හඳුනා නොගත් ශුද්ධ ආයුගණන (ලාභය/පාඩුව) | - | - | - | - | - | - |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්/වත්කම්** | 5,508,804 | (492,159) | (734,320) | 78,253 | 575,761 | 4,936,339 |
| **ප්‍රතිලාභ බැරකම්වල චලනය** | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට | 4,576,066 | (650,436) | (646,013) | 70,224 | 482,847 | 3,832,688 |
| ප්‍රතිලාභ වියදම් | 919,024 | (65,044) | (64,601) | 33,325 | 106,613 | 929,317 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හඳුනාගත් කොටස | 335,057 | 247,277 | (14,080) | (5,586) | 29,749 | 592,417 |
| දායක ගෙවීම් | (321,343) | (23,956) | (9,626) | (19,710) | (43,448) | (418,083) |
| **2013 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන** | 5,508,804 | (492,159) | (734,320) | 78,253 | 575,761 | 4,936,339 |
| **ප්‍රතිලාභ වියදම** | | | | | | |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 457,606 | (65,044) | (64,601) | 7,022 | 48,285 | 383,268 |
| ශුද්ධ ප්‍රවර්ථන සේවා පිරිවැය | 461,418 | - | - | 26,303 | 58,328 | 546,049 |
| **ශුද්ධ ප්‍රතිලාභ වියදම** | 919,024 | (65,044) | (64,601) | 33,325 | 106,613 | 929,317 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය** | 2,677,443 | 610,533 | 187,353 | 11,693 | 170,945 | 3,657,967 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 13.06% | 14.19% | 14.39% | 12.90% | 14.92% | 13.38% |
| **ගෙවූ ප්‍රතිලාභය මත ඉපැයූ අතිරික්ත පොළී** | 1,425,146 | 382,691 | 174,056 | 10,599 | 42,645 | 2,035,137 |
| **අ.ගි.ප්‍ර. 19 ට අනුව ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ඉපැයීම්** | 2,138,199 | 450,495 | 139,403 | 10,579 | 118,888 | 2,857,564 |
| **ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ගෙවීම්** | 1,223,134 | 249,140 | 25,319 | 7,303 | 135,485 | 1,640,381 |
| **සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි චලනය** | | | | | | |
| වර්ෂ ආරම්භයේදී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 19,635,505 | 4,098,299 | 1,210,344 | 75,478 | 1,102,790 | 26,122,416 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 2,677,443 | 610,533 | 187,353 | 11,693 | 170,945 | 3,657,967 |
| දායක ලැබීම් | 321,343 | 23,956 | 9,626 | 19,710 | 43,448 | 418,083 |
| ප්‍රතිලාභ ගෙවීම් | (1,252,297) | (227,842) | (13,297) | (1,094) | (128,300) | (1,622,830) |
| **වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්වල සාධාරණ අගය** | 21,381,994 | 4,504,946 | 1,394,026 | 105,787 | 1,188,883 | 28,575,636 |

සියළුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 10.00% | 10.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 10.00% | 10.00% |
| අනාගත වැටුප් වැඩිවීම් | 8.50% | 8.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම | 7.50% | 7.50% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 27 | අවුරුදු 27 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 21 | අවුරුදු 21 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 31 | අවුරුදු 31 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

## 44. සාධාරණ වටිනාකම් පිළබඳ හෙළිදරව් කිරීම්

### අ) වත්කම් හා වගකීම්වල සාධාරණ වටිනාකම

වත්කම් හා වගකීම්වල සාධාරණ අගය වන්නේ අවබෝධය සහ කැමැත්ත ඇති පාර්ශවයන් අතර, සිදුවන සමීප ගනුදෙනුවක දී වත්කමක් හුවමාරු කිරීමට හෝ බැරකමක් බේරුම් කිරීමට අදාළ වන මුදල් ප්‍රමාණයන් වේ. මූල්‍ය ලියවිල්ලක් විකුණන්නාට එරෙහිව මිල චලනයක් සිදු නොවන පරිදි සැලකිය යුතු ගනුදෙනුවක්, ග්‍රහණය කරගත හැකි ලෙස සංවිධාන වූ සහ ද්‍රවශීලතාවය ඇති වෙළෙඳපොළක මූල්‍ය ලියවිල්ලක් විකිණීම කළ විට එහි ප්‍රකාශිත මිල සාධාරණ අගය වේ.

ඇගයුම් ක්‍රමයන්ට වන වත්කම් හා වගකීම්වල සාධාරණ අගය නිශ්චය කිරීමට සහ අනාවරණය කිරීමට බැංකුව විසින් පහත ධූරාවලිය උපයෝගී කරගනු ලැබේ.

**පළමුවන මට්ටම :** අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොසැකසූ) මිල ගණන්.

**දෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි සියළුම යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතා කරන අනෙකුත් ක්‍රම.

**තෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි යෙදවුම්, නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ යෙදවුම් භාවිතා කරනු ලබන ක්‍රම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2014 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම | දෙවන මට්ටම | තෙවන මට්ටම | එකතුව |
|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 61,495,307 | - | - | 61,495,307 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 408,189,500 | - | - | 408,189,500 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 1,580,237 | - | 1,580,237 |
| | 469,684,807 | 1,580,237 | - | 471,265,044 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 100,190,635 | | | 100,190,635 |
| | 100,190,635 | - | - | 100,190,635 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 5,833,100 | 5,833,100 |
| ගොඩනැගිලි | | | 7,814,883 | 7,814,883 |
| | - | - | 13,647,983 | 13,647,983 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | - | - | 16,350,511 | 16,350,511 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 2,758,520 | - | 2,758,520 |
| | - | 2,758,520 | 16,350,511 | 19,109,031 |

| 2013 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම | දෙවන මට්ටම | තෙවන මට්ටම | එකතුව |
|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 94,137,368 | - | - | 94,137,368 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 357,531,750 | - | - | 357,531,750 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 5,670,258 | - | 5,670,258 |
| | 451,669,118 | 5,670,258 | - | 457,339,376 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 95,601,221 | | | 95,601,221 |
| | 95,601,221 | - | - | 95,601,221 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 5,433,100 | 5,433,100 |
| ගොඩනැගිලි | - | - | 7,707,380 | 7,707,380 |
| | - | - | 13,140,480 | 13,140,480 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - විනිමය විකල්ප | - | - | 10,162,977 | 10,162,977 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 6,020,305 | - | 6,020,305 |
| | - | 6,020,305 | 10,162,977 | 16,183,282 |

**ඉඩම් හා ගොඩනැගිලි**

**අගය කිරීමේ ක්‍රමය**

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල අගය කිරීමේ දී එහි ඇති ඉහළ වාණිජමය ස්වභාවය සලකා බලා වට්ටම් මුදල් ප්‍රවාහ ක්‍රමය යොදා ගනී. අනෙකුත් ගොඩනැගිලි ප්‍රවර්ථන පිරිවැයට ප්‍රධාන වැඩි දියුණු කිරීමේ ප්‍රතිස්ථාපනය කිරීමෙන් හා ක්ෂය වීම් සඳහා දළ ප්‍රමාණයක් අඩු කර ගණනය කිරීමෙන් අගය කරයි.

ප්‍රවර්ථන වෙළෙඳ අගය ලබා ගැනීමෙන් ඉඩම් අගය කිරයි.

**අගය කිරීමට යොදා ගන්නා ලද උපකල්පන**

ඉඩම් හා ගොඩනැගිලි සංවේදීතා විශ්ලේෂණයේ දී යොදාගත් ප්‍රධාන උපකල්පනයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| වට්ටම් සාධකය | 6.5% |
| කුලී වර්ධනය | 5% |
| වැය | 45% |

**ප්‍රධාන ගොඩනැගිල්ල හා ඉඩම් සඳහා සංවේදීතා විශ්ලේෂණය**

| වට්ටම් සාධනය | කුලී වර්ධනය | වැය | ඉඩම් | ගොඩනැගිලි |
|---|---|---|---|---|
| | | | රු. 000 | රු. 000 |
| 5% | 5% | 45% | 3,548,316 | 6,386,765 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 7% | 5% | 45% | 2,453,546 | 4,416,242 |
| 7% | 4% | 45% | 2,297,649 | 4,135,637 |
| 6% | 4% | 45% | 2,714,813 | 4,886,508 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 6% | 6% | 45% | 3,112,269 | 5,601,906 |
| 6% | 5% | 40% | 3,170,842 | 5,707,333 |
| 6% | 5% | 45% | 2,906,605 | 5,231,722 |
| 6% | 5% | 50% | 2,642,368 | 4,756,111 |

**සහාධිපත්‍ය දේපොළ - නිව්යෝ(ර්)ක්**

**අගය කිරීමේ ක්‍රමය**

ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් විකුණුම් සන්සන්දනාත්මක ප්‍රවේශය නිර්දේශ කරන ලදී. ඒ අනුව දේපොළ අගය කරනුයේ ආදේශන මූලධර්මය හෙවත් වෙළඳපලේ සහභාගීකයන් ඒ හා සමාන දේපොලක් අත්පත් කරගැනීමට ගෙවනු ලබන්නා වූ වටිනාකම අනුවය.

**විකුණුම් සන්සන්දනාත්මක ප්‍රවේශය**

| | |
|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනට** | |
| ප්‍රමාණය (බද්දට දිය හැකි වර්ග අඩි) | 12,726 |
| | ඇ. ඩොලර් |
| වර්ග අඩියක ඒකක මිල | 550 |
| දේපොළෙහි වෙළඳපල වටිනාකම | 6,999,300 |
| **දේපොළෙහි වෙළඳපල වටිනාකම (ආසන්න වශයෙන්)** | **7,000,000** |

**විකුණුම් සන්සන්දනාත්මක ප්‍රවේශය සඳහා යොදාගන්නා ලද උපමානයන්ගේ සංවේදීතා විශ්ලේෂණය - නිව්යෝ(ර්)ක් දේපොළ**

| උපමානය | විස්තරය | උපමානයේ වෙනස්වීම | ගැළපීම | මුළු වටිනාකම මත වන බලපෑම (ඇ. ඩොලර්) |
|---|---|---|---|---|
| මූල්‍යකරණය | මූල්‍යමය ගනුදෙනු සඳහා මුදල් යෙදවීමෙන්, ගැනුම් මිලට එදිරිව ණය/උකස් ගනුදෙනුවලට අදාලව සාමාන්‍යයෙන් වට්ටමක් ලැබීම. | මුදලින් ගැනුම්<br>ණය ගැනුම් | 5%ක් පහළට ගැලපීම<br>5%ක් ඉහළට ගැලපීම | -350,000<br>350,000 |
| වෙළෙඳපල තත්ත්වය | මූර්ත දේපොළවල වෙළඳපල තත්ත්වයන්ට යොමු වේ. උදාහරණයක් ලෙස 2014 වර්ෂයේ පැවති වෙළඳපල තත්ත්වයන් 2013 වර්ෂයට වඩා හිතකරය. | හිතකර තත්ත්වයන්<br>අහිතකර තත්ත්වයන් | 5% - 10% ක් ඉහලට ගැලපීම<br>5% - 10% ක් පහලට ගැලපීම | -350,000 සිට -700,000 දක්වා<br>+350,000 සිට +700,000 දක්වා |
| ප්‍රමාණය | කුඩා ඒකකවලට සාපේක්ෂව විශාල එකකවල පරිමාණානුකූල ඵල නිසා ඒවා සාමාන්‍යයෙන් වට්ටම්වලට යටත්ව විකුණනු ලබයි. | විශාල දේපොළ<br>කුඩා දේපොළ | 5%ක් පහළට ගැලපීම<br>5%ක් ඉහළට ගැලපීම | -350,000<br>350,000 |
| තට්ටුවේ උස | සාමාන්‍යයෙන් සහාධිපත්‍ය ඒකකවල තට්ටු මට්ටම වැඩිවන විට මිලද වැඩිවේ. | වැඩිවන තට්ටු මට්ටම<br>අඩුවන තට්ටු මට්ටම | එක් තට්ටුවකට 2%ක් ඉහලට ගැලපීම<br>එක් තට්ටුවකට 2%ක් පහලට ගැලපීම | -70,000<br>70,000 |

**අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - මූල්‍ය විකල්පයන්**

අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අගය බ්ලැක්ෂෝල්ස් ආදර්ශකය භාවිතා කරමින් ගනණය කර ඇත.

| | තෙවන මට්ටම් | |
|---|---|---|
| | විකල්ප | එකතුව |
| | රු. 000 | රු. 000 |
| ආරම්භක ශේෂය | 10,162,977 | 10,162,977 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වගකීම් | 6,187,534 | 6,187,534 |
| **අවසන් ශේෂය** | 16,350,511 | 16,350,511 |
| ඉපයීම්වල ඇතුළත් උපලබ්ධි නොවූ ඉපැයීම්වල එකතුව | 1,239,699 | 1,239,699 |

**භාවිතා කරන ලද නිරීක්ෂණය නොවූ සුවිශේෂී යෙදවුම්**

| | |
|---|---|
| වට්ටම් සාධකය | 10% |
| උච්චාවචනය | 5% |

| සංවේදීතා විශ්ලේෂකය | වට්ටම් සාධකය | | උච්චාවචනය | |
|---|---|---|---|---|
| | 9% | 11% | 5% | 7% |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණ - මූල්‍ය විකල්පයන් | 17,338,572 | 15,540,084 | 14,849,574 | 17,696,309 |

| හුවමාරු ගනුදෙනුවලට එළඹීමේදී තිබූ වෙළෙඳ අගය | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 27,578,100 | - |
| හානිකරණය සඳහා වූ අධිමිල | (8,635,798) | - |
| නිරීක්ෂණයන් මත වූ අපර හඳුනාගැනීම් | 6,890,540 | (27,578,100) |
| දෙසැම්බර් 31 ට ශේෂය | 25,832,841 | (27,578,100) |

**ආ) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්**

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රුපියල් මිලියන 321,220 ක් විය. (2013 දී එය රුපියල් මිලියන 84,601) සහ නිත්‍ය තැන්පතු පහසුකම් රු.මි. 7,032 (2013 - ශුන්‍ය වේ). ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකිණූ ශ්‍රී.ලං.ම.බැ සුරැකුම්පත් කිසිවක් නොවේ. (2013 - ශුන්‍ය වේ). 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රුපියල් මිලියන 2,650 (2012 දී එය රුපියල් මිලියන 12,390) කි.

**ඇ) සංසරණයේ ඇති මුදල්**

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, ශේෂ පත්‍රයෙහි වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

**ඈ) තැන්පතු වටිනාකම**

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

**ඉ) සාධාරණ වටිනාකම තීරණය කිරීම හා සාධාරණ වටිනාකම් ධූරාවලිය**

පහත දැක්වෙන්නේ බැංකුවේ වත්කම් හා වගකීම් හි පන්ති ලෙස ධාරණ අගයන් හා සාධාරණ අගයන් අතර සංසන්දනාත්මක තොරතුරු වේ.

| සාධාරණ වටිනාකම් | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | 2014 රු. 000 | 2013 රු. 000 | 2014 රු. 000 | 2013 රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 487,070,771 | 425,676,763 | 487,070,771 | 425,676,763 |
| විදේශීය විනිමය විකුණුම් /විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | 469,684,807 | 451,669,118 | 469,684,807 | 451,669,118 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,580,237 | 5,670,258 | 1,580,237 | 5,670,258 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 79,816,029 | 85,400,764 | 79,816,029 | 85,400,764 |
| අනෙකුත් ලැබිය යුතු දේ | 7,105,914 | 591 | 7,105,914 | 591 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 1,045,257,758 | 968,417,494 | 1,045,257,758 | 968,417,494 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 124,443,452 | 15,853,513 | 124,072,219 | 15,810,695 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | 143,897,971 | 109,167,071 | 143,897,971 | 109,167,071 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 1,489,372 | 1,375,396 | 1,398,678 | 1,215,303 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 1,912,071 | 1,829,712 | 1,912,071 | 1,829,712 |
| මූල්‍ය හා අනෙක් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 41,095 | 41,095 | 41,095 | 41,095 |
| අනිකුත් වත්කම් | 8,107,914 | 6,443,534 | 5,712,113 | 4,845,310 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | 279,891,874 | 134,710,321 | 277,034,146 | 132,909,186 |
| **මුළු මූල්‍ය වත්කම්** | 1,325,149,632 | 1,103,127,815 | 1,322,291,904 | 1,101,326,680 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| රන්වලින් කරන ලද ආයෝජන | 100,190,635 | 95,601,221 | 100,190,635 | 95,601,221 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | 100,190,635 | 95,601,221 | 100,190,635 | 95,601,221 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 11,678,483 | 21,504,196 | 11,678,483 | 21,504,196 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19,207,822 | 16,183,282 | 19,207,822 | 16,183,282 |
| ආසියානු නිෂ්කාශන සංගමය | 57,230,304 | 37,301,553 | 57,230,304 | 37,301,553 |
| ජා.මූ.අා. | 308,011,133 | 422,032,012 | 308,011,133 | 422,032,012 |
| අනෙකුත් | 72,146,159 | 47,221,119 | 72,146,159 | 47,221,119 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | 468,273,901 | 544,242,162 | 468,273,901 | 544,242,162 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 161,009,323 | 148,809,893 | 161,009,323 | 148,809,893 |
| රජය හා රජයේ ආයතන විසින් තැතන්පතු | 311,950 | 416,230 | 311,950 | 416,230 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 328,252,000 | 84,601,000 | 328,252,000 | 84,601,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 2,209,782 | 2,419,087 | 2,209,782 | 2,419,087 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,939,293 | 5,659,718 | 8,939,293 | 5,659,718 |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | 500,722,348 | 241,905,928 | 500,722,348 | 241,905,928 |
| **මුළු මූල්‍ය වගකීම්** | 968,996,249 | 786,148,090 | 968,996,249 | 786,148,090 |

**45. සන්සන්දනාත්මක තොරතුරු**

| | 2013 රු. 000 |
|---|---|
| අ) පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | |
| **දේශීය මුදල් වත්කම්** | |
| අනෙකුත් වත්කම් | 6,443,534 |
| **දේශීය මූල්‍ය වගකීම්** | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 29,910,697 |

| | 2014 රු. 000 | 2013 රු. 000 |
|---|---|---|
| **වත්මන් ඉදිරිපත් කිරීම** | | |
| **දේශීය මූල්‍ය වත්කම්** | | |
| අනෙකුත් වත්කම් | **8,107,914** | 7,326,533 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **27,446,864** | 29,027,698 |

2013 වර්ෂයේදී අනෙකුත් ලැබිය යුතු දෑ වල හා කලින් කල ගෙවීම්වල අඩංගු වූ රු. මිලියන 882.999 ක් වූ තත්කාලීන දල පියවුම් පද්ධතියේ ආදායම් ආයෝජනය ඉන් ඉවත් කර ඇති අතර 2014 වර්ෂයේදී වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා වෙනත් වත්කම්වල අන්තර්ගත වුනි.

**46. සම්බන්ධිත පාර්ශවයන්**

**46.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු**

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන ද සම්බන්ධිත පාර්ශවයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී එකී ගණුදෙනු තනි වශයෙන් නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමග එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත සඳහන් පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (අ) | **121,793,452** | 2,923,513 |
| එක්වර විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **-** | 61,099,000 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **3,723,185,303** | 2,605,097,956 |
| දෙසැම්බර් 31 දිනට මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (ආ) | **851,816** | 954,259 |
| දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලං.ම.බැ. විසින් සපයන ලද ඇපවීම් (සටහන 47.2) | **2,577,998** | 2,561,264 |
| 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු සහ බදු (ඉ) | **603,729** | 405,650 |
| වර්ෂය තුළ දී අතිරික්තය රජයට ගෙවීම (සටහන 30) | **8,500,000** | 25,000,000 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 9) | **143,897,971** | 109,167,071 |
| නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත් | **1,380,689** | 1,219,657 |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු ( උ) | | |
| - විකුණුම් | **54,983,877** | 43,991,178 |
| - මිලට ගැනීම් | **102,063,864** | 40,884,447 |
| - ඇ.එ.ජ. ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **484,476,757** | 277,458,818 |
| ප්‍රතිමූල්‍ය පහසුකම් (ඒ) | **10,943,022** | 6,492,418 |
| ලංකා ක්ලියර් හා සී/ස ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ලද ලාභාංශ ආදායම් | **22,014** | 14,811 |
| ලංකා ක්ලියර් පුද්ගලික සමාගමට කරන ලද ගෙවීම් | **567** | 643 |
| උපදේශාත්මක, සන්නිවේදන හා වෘත්තීමය පාරිතෝෂික (ඌ) | **1,396,223** | |
| <u>**ශේෂයන්**</u> | | |
| සුසහන, සුසහන අදියර 2, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර 2), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ අදියර 2 සහ උතුරු නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසහන යටතේ දෙන ලද ණය | **877,513** | 1,242,405 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් ක්‍රමයේ (RTGS) ශේෂයන් | **84,976,155** | 77,899,164 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **137,486** | 106,922 |
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **1,399,832** | 1,394,987 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය (ඔ) | **283,114** | 333,114 |
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට කළ යුතු ගෙවීම් (සටහන 20) | **8,017,222** | 29,052,050 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතනවල ජංගම ගිණුම් ශේෂයන් | **30,023** | 172,571 |
| ලංකා ක්ලියර් හි ආයෝජන | **29,500** | 29,500 |
| ණය තොරතුරු කාර්යාංශයෙහි ආයෝජන | **5,845** | 5,845 |
| අනෙකුත් ගණුදෙනු හා ශේෂයන් (ඕ) | **950,931** | 1,076,631 |

අ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2014 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 21 හා 22 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 31 සටහනෙහි දැක්වේ.

ආ) මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ වැදගත් බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 07 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි මූල්‍ය සමාගම්වල විධිමත්භාවය සහ සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. ඒ අනුව රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

ඇ) මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා, දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

ඈ) මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

ඉ) බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ වැදගත් බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමග ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

ඊ) 48 සටහනේ පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරුවන් සහ අන් විශ්වාසනා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

උ) මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල ඉකුත් රාත්‍රි විවෘත විදේශ විනිමය තත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

ඌ) ශ්‍රී ලංකා රජය විසින් මෙහෙයවන ලද සන්නිවේදන වැඩසටහන් වෙනුවෙන් බැංකුව විසින් කළ ගෙවීම් මෙමගින් නිරූපණය කරයි. මෙම ගෙවීම් පරිපාලන හා අනිකුත් වියදම් යටතේ වාර්තා කර ඇත (සටහන 35).

එ) රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර, ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

ඒ) ණය ඇප වශයෙන් බැංකුව අරමුදල් සැපයූ ප්‍රතිමූල්‍යකරණ ණය ප්‍රමාණය රුපියල් මිලියන 12,620.079 (2013 රුපියල් මිලියන 6,492.418) ක් වන අතර රජය මූල්‍යකරණය කළ ප්‍රමාණය රුපියල් මිලියන 6,089.136 (2013 - රුපියල් මිලියන 3,359.77) ක් වේ.

ඔ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිඟ මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතුය. මේ යටතේ 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීයසංවර්ධනදෙපාර්තමේන්තුවවිසින්මහජනබැංකුව (රු. මි. 184.24), ලංකා බැංකුව (රු. මි. 38.275), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (රු. මි. 122.32) හා ලංකාපුත්‍ර බැංකුව (රු. මි. 22.94) හරහා රු. මි. 367.776 ණය ප්‍රතිමූල්‍ය කර ඇත. එමගින් රු. මි. 77.89 පොළියක් උපයා ඇත.

ඕ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා ගරු නීතිපතිතුමන්ගේ ඉල්ලීම හා නිර්දේශ මත රජය හා රජයේ ආයතනවල නියෝජිතයා ලෙස සහ ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන බැංකුව විසින් නීතිඥ ගාස්තු ගෙවා ඇත. එම නීතිඥ ගාස්තු වූ රු. මිලියන 283.114 (2013 - රු. මිලියන 333.114) මුදල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් ලෙස සලකන ලදී. (2015 ජනවාරි 1 දින බැංකුවට මේ සඳහා රු. මිලියන 279.968 ක් ලැබුණි.)

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට එරෙහිව Deutsche Bank AG විසින් පවරන ලද ඉදිරි රැකුම් නඩුව (Hedging Case) වෙනුවෙන් එය බේරුම්කරණ ක්‍රියාපටිපාටිය සඳහා පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා වර්ෂය තුළ රු. මිලියන 14.028 (2013 - රු. මිලියන 25.099) මුදලක් නීතිඥ ගාස්තු වශයෙන් බැංකුව ගෙවන ලදී. (සටහන් 35)

ක) රජය හා රජයේ දෙපාර්තමේන්තු, රජය මගින් පාලනය කෙරෙන ආයතන සමග සිදුකළ තනිව ගත්කල සැලකිය යුතු මට්ටමේ නොවන ගනුදෙනු හා ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ අන්තර්ගත වේ. බැංකුව විසින් සපයන ලද ඇපවීම රු.මි. 63.234 (2013-රු.මි. 177.627) රජය සපයන ලද ඇපවීම් රු.මි. 6.81 (2013 රු.මි. 19.484) ද විනිමය පාලන කටයුතු සඳහා රැස් කළ අරමුදල් ලෙස රු.මි. 37.928 (2013 - රු.මි. 22.602) ද නිශ්චිත අරමුණු

සඳහා රඳවාගත් රජයේ සුරැකුම්පත් රු.මි. ශුන්‍ය (2013 රු.මි. 83.531) ද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමණාකරණ ආයතනයේ තත්කාලීන දළ පියවුම් පද්ධති ශේෂය වන රු.මි. 0.167 (2013 - රු. මි. 0.203) ද, සුසහන, සුසහන අදියර 2, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍ය ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර 2), නැගෙනහිර පළාත තුළ, ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ අදියර 2 සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ ලබාදුන් ණය රු.මි. 325.946 (2013 - රු.මි. 142.499) ද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු හා බදු රු.මි. 186.976 (2013 රු.මි. 316.460) ද රජයේ හා රජයේ ආයතන වල ජංගම ගිණුම් ශේෂ ලෙස රු.මි. 281.927 (2013 රු.මි. 243.659) ද අත්හළ දේපළ වෙනුවෙන් ලද අරමුදල් රු.මි. 33.914 (2013 රු.මි. 45.468) හා බාහිර නඩු ගාස්තු වශයෙන් රු.මි. 14.028 (2013 - රු. මිලියන 25.099) ක මුදලක් ද අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ ඇතුළත් වේ.

ඛ) මුදල් නීති පනතේ වගන්ති 09 ප්‍රකාර බැංකුව විසින් 2011 වර්ෂය තුළදී ඇමරිකානු එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පිහිටි දේපලක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අන්තර් පරිහරණයට අත්පත් කර ගන්නා ලදී. එය 2012 ජූනි 01 දින සිට ආරම්භ වන තුන් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා මසකට ඇ.එ.ජ.ඩො 68,000 ක මුදලක බදු පදනම් මත ලබාදෙනු ලැබූ අතර ඒ වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ලැබිය යුතු සිව් මාසික (සැප්.-දෙසැ.) බදු කුලිය වන රුපියල් මිලියන 28 ක මුදල අයවිය යුතු උපචිත බදු කුලී ලෙස ඇතුළත් කොට ඇත.

ග) විවිධ වත්කම් හි ඇතුළත් රුපියල් මිලියන 88 ක මුදල, නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් ලෙස සටහන් කොට ඇත. මෙය කොළඹ 01, ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍රයේ පිහිටි බදු දේපළක් වන බැංකුවේ රථගාල පිහිටි භූමිය සඳහා අදාළ බදු මුදල නියෝජනය කරයි. ඉහත බදු දේපළ වෙනුවෙන් ගෙවූ මූලික මුදලේ කොටසක් වන මෙය, බදු දීමනාකරු වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු කාලය නිම වීමට ප්‍රථමයෙන් නැවත ලබාගැනීම හේතුවෙන් ඔවුන්ගෙන් ලැබිය යුතු අයිතමයක් ලෙස සටහන් කොට ඇත.

ඝ) දෙපාර්ශවයේම ප්‍රයෝජනය උදෙසා වනජීවී කාර්යාලයක් සහ පිරික්සුම් බංගලාවක් සෝමාවතිය ප්‍රදේශය තුළ ඉදිකිරීම, ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වූ අවබෝධතා ගිවිසුමකට 2008 නොවැම්බර් 20 වන දින බැංකුවේ මුදල් මණ්ඩලය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රවිෂ්ඨ වන ලදී. බැංකුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන පිරික්සුම් බංගලාව දේපළ, පිරියත හා උපකරණ යටතේ වාර්තා කොට අවබෝධතා ගිවිසුම් කාලපරිච්ඡේදය (වසර 30 ක්) තුළ ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, අවබෝධතා ගිවිසුම් 3 (C) වගන්තිය යටතේ ඉදිකරනු ලබන වනජීවී කාර්යාලය ඉදිකිරීම් වලින් අනතුරුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදීම සඳහා බැංකුව එකඟ වී ඇත. වනජීවී කාර්යාලය ඉදිකිරීම් සඳහා බැංකුව විසින් දරනු ලැබූ පිරිවැය වූ රු.මි. 6.2 ක මුදල පිරික්සුම් බංගලාව භාවිත කිරීමට ඇති හිමිකමෙහි වටිනාකම ලෙස සලකා විවිධ වත්කම් හි සටහන් කර ඇති අතර එය අවබෝධතා ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ඇත.

**46.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගනුදෙනු**

අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ඇතුළත්ව මුදල් මණ්ඩලයේ සාමාජිකවරුන් ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් වේ. (මෙම තනතුරු සඳහා අධ්‍යක්ෂ නිලධාරීන්, සේවක හෝ කිසිදු බැංකු ආයතනයක් කොටස් හිමියා ලෙස හැඳින්වීම මුදල් නීති පනතේ සීමා කර තිබේ).

**46.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් :**

| | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **67,816** | 57,534 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම් යටතේ මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**46.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වූ වෙනත් ගණුදෙනු**

| | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|
| කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය | **47,310** | 32,076 |

මෙම ණය සඳහා අදාළ වන පොළී අනුපාතයන් වර්ගය සියයට 2 සිට සියයට 12 දක්වා ණය පොළී පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**46.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගනුදෙනු**

| | 2014<br>රු. 000 | 2013<br>රු. 000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **39,925** | 49,776 |

සටහන් 43 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම්වලට විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු. මිලියන 406.489 ක් (2013 - රු. මිලියන 426.580) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් වලට බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 24 සටහනෙහි දක්වා ඇත.

**47. අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**

**47.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප

සපයනු ලැබේ. 2014 දෙසැම්බර් 31 දිනට පරිශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

### 47.2 ණය ඇප

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යය වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය සහ පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට එරෙහිව විය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය, ණය පැහැර හැරීම මත ආවරණයන් නොවූ පාඩු සඳහා සහභාගි වන ණය දෙන ආයතනවලට ඇතිවන්නා වූ අලාභ සඳහා කරනු ලබන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :**

| | ණය ඇප සැපයූ මුදල් වර්ගය | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|---|
| | | **2014** | 2013 |
| | | **රු. 000** | රු. 000 |
| **සම්බන්ධිත පාර්ශ්වයන්** | රුපියල් | | |
| බැංකුවේ යෝජනා ක්‍රම | | **63,234** | 177,627 |
| රජයේ යෝජනා ක්‍රම | | **2,584,808** | 2,580,748 |
| **අනිකුත්** | රුපියල් | | |
| බැංකුවේ යෝජනා ක්‍රම | | **52,503** | 135,803 |
| රජයේ යෝජනා ක්‍රම | | **1,999,483** | 690,295 |
| **මුළු ණය ඇප ප්‍රමාණය** | | **4,700,028** | 3,584,473 |

### 47.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

### 47.4 නෛතික හිමිකම්

අදාළ ආයතනවල අයිතීන් දරන්නන් විසින් රුපියල් මිලියන 53.274 ක් සඳහා හිමිකම්පාමින් නීති කෘත්‍යයන් 3 ක් බැංකුවට එරෙහිව ගොනු කර ඇත. මෙම නීති කෘත්‍යයන්ට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

බැංකුව, හානි සඳහා නෛතික පොලියද සමඟ රු. මිලියන 8.711 කට හිමිකම් පාමින් නීති කෘත්‍යයන් 3 කට පැමිණිලිකරු වන අතර ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

තවද, බැංකුවට එරෙහිව නීති කෘත්‍යයන් ගණනාවක් 2014 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 47.5 බැඳීම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 488.145 (2013 රුපියල් මිලියන 7.95 ක් සහ ඇ.ඩො.මි. 1.805) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට කැපීපෙනෙන ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | **2014** | 2013 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| **ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු** | | |
| ඉදිරි විනිමය විකුණුම්- එක්සත් රාජධානි පවුම | - | 139,000 |
| - යූරෝ | 50,000 | 141,000 |
| - ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | 2,239,119 | 2,337,998 |

### 47.6 වත්කම් ඔඩපන කිරීම

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා බැංකුව ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36,786 (2013-ශූන්‍ය) යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30 (2013 - ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ණය පහසුකම් ලබාගෙන ඇත. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

### 47.7 සවරින් රෙසිඩන්සි සඳහා වූ අසම්භාව්‍ය වගකීම

බැංකුවේ මුදල් මණ්ඩලය හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම විසින් සවරින් රෙසිඩන්සි පාලනය කිරීම සඳහා වූ බදු කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර එහි දී බදු ගැනුම්කරු විසින් කරනු ලබන ආයෝජන/වැඩිදියුණුකිරීම් දෙපාර්ශවයම විසින් සටහන් කළ යුතු බවට එකග වී ඇත. ඒ ගිවිසුම අනුව යම් හෙයකින් බැංකුව එම බදු ගිවිසුමෙන් ඉවත් වුවහොත් එම ආයෝජනය සඳහා එම පවත්නා වර්ෂයේ එකඟ වූ අනුපාතිකයන්ට වූ ගෙවීමක් බදු ගැනුම්කරුට ගෙවිය යුතුය.

2014 දෙසැම්බර් 31 දිනට බැංකුව බදු දීමනාකරු වශයෙන් රු.මි. 10.966 (2013 - රු.මි. 13.159) ක අසම්භාව්‍ය වගකීමක් දරන අතර එය ක්‍රියාකාරී සයවෙනි වසර අවසානයේදී ආයෝජන වටිනාකමින් 25% ක් වේ.

### 47.8 බැඳුම්කර ණයට ගැනුම්

දින 30 කොමිස් පදනමකට යටත්ව මුහුණත් අගය රු. මිලියන 191,781.425 ක බැඳුම්කර බැංකුව විසින් දෙසැම්බර් මාසය තුළ සේවක අර්ථසාධක අරමුදලින් ණයට ගෙන ඇත.

මෙම බැඳුම්කර ප්‍රති මිලදී ගැනීමේ පහසුම් සඳහා යොදා ගෙන ඇති අතර මුහුණත් අගය ශුන්‍ය වූ (2013 - මුහුණත් අගය රු.මි. 5,940.023 සහ වෙළඳ අගය රු.මි. 3,593.676) බැඳුම්කර 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රති මිලදී ගැනීමේ පහසුකම් සඳහා වෙන් නොකර ඉතිරිව පැවතුණි.

**48. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ) ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) වෙනුවෙන් විවිධ විදේශීය ණය, විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වැය පියවීම් සහ ආපසු ගෙවීම් බැංකුව විසින් කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිරූපක අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල්, අධිභාර, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පැවැත්වීම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිතිවලට විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්‍ෂණය යෝජනා ක්‍රමයක් වන තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දාතම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට පවරා ඇත.

ඈ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කිරීම බැංකුව විසින් කරගෙන යනු ලබයි. එහිදී මුදල් මණ්ඩලය විසින් නියෝජනය කරන ලද බලතල ප්‍රකාර, අදාල විෂය කරුණුවලට සම්බන්ධව සොයා බලනු ලැබේ. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

ඉ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයේ කාර්යයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ගැසට් පත්‍රයේ 5.2 වගන්තිය අනුව විශේෂිත අතහැරීම් සේ රක්ෂණය කර ඇති සියලුම ණය හැර සමාප්ත ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රුපියල් මිලියන 350.195 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රුපියල් මිලියන 1,168.306 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල නිමවා ඇත. 2014.12.31 දින වන තුරු මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 0.2 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකට සීමා වුනි. 2015.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි මෙම සීමාව රුපියල් මිලියන 0.3 ක් දක්වා එක් තැන්පතුකරුවකුට හෝ ආයතනයක් සඳහා ඉහළනංවන ලදී.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර, පවතින අරමුදල් ප්‍රමාණයට වන්දි මුදල සීමාවේ. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

මෙම යෝජනා ක්‍රමය 2013.11.22 වන දින සිට ‘ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල’ ලෙස නැවත නම් කරන ලදී.

ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා “විස්කම්” ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2014 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රුපියල් මිලියන 367.776 (2013 - 390.686) කි. වර්ෂය අවසන් දින ප්‍රාදේශීය සංවර්ධන දෙපා. විසින් රු. මි. 460.010 මුදලක ණය ලබා දී ඇති අතර එමගින් රු. මි. 77.890 පොළී ආදායමක් උපයන ලදී. වර්ෂය අවසන් දිනට ප්‍රා.සං.දෙ. ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, රුපියල් මිලියන 45.822 (2013 - ශුන්‍ය) ක රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. තවද රුපියල් මිලියන 188.178 (2013 රු.මි. 188.178) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

උ) බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | | | | |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ තේ භෝග කර්මාන්තයේ තේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරගකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම | 351.06 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | | | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණාත්මයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණාත්මය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම ආමන්ත්‍රණය කිරීම | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | | | | |
| නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීමට ආධාර කිරීම. | 1,362.00 | | | | |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | | | | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය හා ස්ථිර කිරීම | 249.06 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | | | | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | | | | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදැහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | | | | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | | | | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | | | | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් ඍජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 | | | | |
| සූසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට මාරු කළ යුතුය. | | | |
| සූසහන II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | | | | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සහ අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම | 1,000.00 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,199.82 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ආර්ථික වැඩිදියුණු කිරීමේ චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා මාතලේ දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 100.00 | | | | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පසු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉදිකිරීමේ හා රජයේ කටයුතු සඳහා සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | | | | |
| පසු සුනාමි වෙරල බඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ලබා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 | | | | |
| විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය පැවතීම තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 881.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම | | | |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහ-සුකම් සැලසීම | 2,900.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කල යුතුය. | | | |
| වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ආදායම ජනනය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.95 | | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම. | 1,428.47 | | | | |
| උතුරු හා නැගෙනහිර හානි නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර වැඩසටහන සංවර්ධනය | ඇ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන් විශේෂයෙන් යෞවනයන්ට අරමුදල් සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | | | | |

## ඉදිරියට යන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම. | 938.71 | | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකයින් විගණනය කළ යුතුය. | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාව ගිවිසුමේ අයිතිවාසිකම්, බැලීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතපාර දැමීම සිදුකරනු නොලැබේ. |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 1.75 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රිකවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම. | 339.89 | | | | |
| දිළිදුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,305.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරිම. | 3,126.29 | | | | |
| දිළිදුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල II (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරීම. | 2,748.15 | | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මුලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුල පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ඔවුන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘතිය ගොඩනගා ගැනීමට මුල්‍ය සහනාධාර සැපයීම. | 202.62 | | | | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | අඩු ආදායම්ලාභීන් අතර රැකියා ඇති කිරීමටත් ඉතුරුම් පුරුදු ඇති කිරීමටත් පිරිවැය ඵලදායි සහ තිරසාර ක්ෂුද්‍ර ණය ලබා දිමේ පද්ධතියක් ස්ථාපනය කිරීම. | 1,259.63 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම. | 238.56 | | | | |
| දිළිදුකම පිටුදැකිමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1,031.28 | අඩු ආදායම්ලාභී කුටුම්භයන්හි ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීමට | 2,931.06 | | | | |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | රුපියල් | 11,234.00 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා හානි වු කුඩා ව්‍යාපාර යන අංශ සදහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 11,234.65 | | | | |
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,157.28 | | | | |

**49. අනෙකුත් ආයතන වෙත ඇති බැඳියාව**

සුසහන, සුසහන අදියර 2, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර 2), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ අදියර 2 සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක වන උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසහටන සඳහා බැංකුව විසින් අරමුදල් සපයා ඇති අතර එහි ප්‍රාග්ධන ශේෂය හා හිඟ පොලී බැංකුවේ වත්කම් ලෙස වාර්තා කර ඇති අතර ආදායම බැංකුවේ ආදායම ලෙස සලකා ඇත.

තවද, ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන, ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ඇතැම් ව්‍යාපෘතිවල පරිපාලන වියදම් ආවරණය වෙනුවෙන් බැංකුව විසින් ප්‍රකාශිත ප්‍රතිශතයක් ලබා ගනී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා වූ බැංකුව විසින් නිකුත් කරන ලද ණය ඇපකර මත හටගත් අසම්භාව්‍ය වගකීම් සටහන් අංක 47.2 හි හෙළිදරව් කර ඇත.

**50. ශේෂ පත්‍ර දිනට පසු ඇති වූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

# 2. බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ සහ කාලීන පරීක්ෂා කටයුතු සිදුකිරීම සඳහා විශේෂ බලතල සහ කාර්යයන් සහිතව මුදල් නීති පනතෙහි 28 වැනි වගන්තිය යටතේ, පිහිටුවනු ලැබිණි. මෙයට අමතරව, බැංකු නියාමනය සහ අධීක්ෂණය, 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතෙහි විධිවිධාන හරහා ද පාලනය වේ. විචක්ෂණශීලී විධාන, මාර්ගෝපදේශ සහ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන අනුමැතීන් සකස් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සහ කාලීන පරීක්ෂා සිදුකිරීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි පරිපාලන කටයුතු සිදුකිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයන් වේ. මෙයට අමතරව, බැංකු අංශයේ දැනුම්වත්භාවය සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වන වැඩකටයුතු කිහිපයක ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව නිරත වේ. මුදල් නීති පනත සහ බැංකු පනත යටතේ නියාමනයට සහ අධීක්ෂණයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 ක් 2014 වසර අවසන් වන විට පැවතුණි. මෙම බැංකුවල නාම ලේඛනයක් ඇමුණුම II-1 හි අන්තර්ගත වේ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2014 වසර තුළදී සිදුකළ ප්‍රධාන කාර්යයන් සහ වැඩකටයුතුවල සාරාංශයක් පහත දක්වා ඇත.

## 2.1 විචක්ෂණශීලී විධාන, මාර්ගෝපදේශ සහ අවසරයන් නිකුත් කිරීම

### 2.1.1 විචක්ෂණශීලී විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම

මෙලෙස නිකුත් කළ විචක්ෂණශීලී විධානයන්ගේ වැඩිදුර තොරතුරු මෙම වාර්තාවේ III කොටසෙහි දක්වා ඇත. ඒ අතරින් ප්‍රධාන විචක්ෂණශීලී විධාන පිළිබඳ සාරාංශයක් පහතින් දක්වා ඇත.

(අ) **බාසල් II යටතේ මෙහෙයුම් අවදානම් සඳහා වන ප්‍රමිතිගත ක්‍රමවේදය ක්‍රියාවට නැංවීම:** බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුවෙහි, මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදය යටතේ ප්‍රාග්ධන වෙන්කිරීම ගණනය කිරීම සඳහා අවදානම් මත බර තැබූ වත්කම් ප්‍රමාණය ගණනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. ඒ අනුව, බැංකුවලට, අදාළ මාර්ගෝපදේශයන්හි දක්වා ඇති යෝග්‍යතා නිර්ණායකයන්ට අනුකූල වීමෙන් අනතුරුව, ප්‍රමිතිගත ක්‍රමවේදයට හෝ විකල්ප ප්‍රමිතිගත ක්‍රමවේදයට යොමු විය හැකිය.

(ආ) **නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව:** තක්සේරුකරුවන් සඳහා අදාළ යෝග්‍යතා නිර්ණායක ද ඇතුළුව, නිශ්චල දේපළ තක්සේරුකරණයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත සුදුසු විචක්ෂණශීලී ප්‍රතිපත්තීන් සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියම කරන ලදී.

(ඇ) **බලපත්‍රලාභී බැංකුවල තොරතුරු ආරක්ෂණ කළමනාකරණය:** බැංකුකරණ සේවා ස්වයංක්‍රීයව සම්බන්ධ කිරීම පිළිබඳ වර්ධනය වන උපනතීන් සහ ඒ ඇසුරෙන් පැන නගින තොරතුරු තාක්ෂණ අවදානම් සැලකිල්ලට ගනිමින්, ISO 27000 ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම් වූ තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වූ මූලික ආරක්ෂණ ප්‍රමිතීන් වෙත 2015 ජූලි 01 දින සිට අනුකූලවන ලෙස බැංකු වෙත නියම කරන ලදී.

(ඈ) **මූල්‍ය අංශයෙහි ඒකාබද්ධ කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා නිකුත් කළ බදු දිරිගැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ:** දේශීය ආදායම් පනතේ සහ එකතු කළ අගය මත බදු පනතේ සඳහන් නියමයන්ට අනුව, පිළිවෙළින්, සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් මූල්‍ය ආයතන අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ පිරිවැය නිර්ණය කිරීමට සහ අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බැරකම් මත හිමිකම්පෑමේ හැකියාවන් ආවරණය වන පරිදි, 2014 අයවැය මගින් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අතර ඒකාබද්ධකිරීම් සහ අත්පත්කර ගැනීම් දිරිමත් කිරීම සඳහා ඉදිරිපත් කළ ඒකාබද්ධකරණ ප්‍රතිපත්තිය යටතේ මෙම මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

(ඉ) **ණය පහසුකම් සලසාදීම පිළිබඳ උපරිම සීමා:** පැවති ණය පහසුකම් සලසාදීම පිළිබඳ උපරිම සීමා පිළිබඳ විධාන පහත පරිදි සංශෝධනය කරන ලදී.

- ණය පහසුකම් සලසාදීම පිළිබඳ උපරිම සීමා ගණනය කිරීමේදී, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම ප්‍රධාන කාර්යාලය සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් බැංකු ශාඛාවක් මගින් ලබාදෙන අරමුදල් උපයෝගී කර ගනිමින් ලබාදෙන ලද ණය පහසුකම් බැහැර කරන ලදී.
- තවද, මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව ණය පහසුකම් සලසාදීම පිළිබඳ උපරිම සීමා ඉක්මවමින් බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම්, සමස්ත ණය පහසුකම් සලසාදීම පිළිබඳ උපරිම සීමාව ගණනය කිරීමේදී, බැහැර කරන ලදී.

(ඊ) **බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව:** ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ සියලු බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්, 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිළිවෙළින්, රුපියල් බිලියන 10 ක සහ රුපියල් බිලියන 5 ක අවම මූලික ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතු යැයි තීරණය කරන ලද අතර, විදේශීය වාණිජ බැංකු සඳහා අදාළ අවම ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් බිලියන 5 ක මට්ටමෙහිම පවතිනු ඇත.

(උ) **ආයෝජන අරමුදල් ගිණුම:** ආයෝජන අරමුදල් ගිණුම පවත්වාගෙන යෑම සඳහා නියමිත කාලපරිච්ඡේදය වූ

වසර 3 ක කාලය ඉක්මයාම හේතුවෙන්, 2014 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් අත්හිටුවන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් නිකුත් කරන ලදී.

(ඌ) **බාසල් III යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය:** උසස් ගුණාත්මකභාවයකින් හෙබි ද්‍රවශීල වත්කම් තොග ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යෑම තහවුරු කිරීම හරහා බැංකුවල ද්‍රවශීලතා අවදානම් ව්‍යුහයෙහි කෙටිකාලීන ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් තොරතුරු විමසීමේ පත්‍රිකාවක් බැංකු වෙත නිකුත් කරන ලදී. ද්‍රවශීලතා ආවරණ අනුපාතයට අදාළ නිරීක්ෂණ කාලපරිච්ඡේදය 2014 දෙසැම්බර් මස සිට ආරම්භ විය.

### 2.1.2 මුදල් මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලද අවසරයන්

(අ) **බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක:** නව බැංකු ශාඛා 75 ක්, සිසු ඉතුරුම් ඒකක 208 ක් සහ ජංගම බැංකු ඒකකයක් විවෘත කිරීමට ද, ශාඛා 90 ක් ප්‍රතිස්ථාපනය කිරීමට ද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 167 ක් පිහිටු වීමට ද අවසර ලබාදෙන ලදී. 2014 වසර අවසන් වන විට, බැංකු ශාඛා 3,508 ක්, සිසු ඉතුරුම් ඒකක 3,046 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,635 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ආ) **බැංකු බලපත්‍රයක් නිකුත් කිරීම:** බැංකු ශාඛා ජාලය, කොළඹ නගරසභා සීමාව තුළ පිහිටි ශාඛා 3 ක උපරිමයකට සීමා කිරීම, මූල්‍ය අංශ ඒකාබද්ධකරණ වැඩසටහන යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම් 3 ක් දක්වා අත්පත්කර ගැනීම, කාර්ගිල්ස් සමූහය විසින් බැංකුවෙහි දරන සැලකිය යුතු හිමිකමෙහි ප්‍රතිශතය සියයට 30 නොඉක්මවීම සහ බැංකු ව්‍යාපාරය ආරම්භ කළ දින සිට වසර 2 ක කාලයක් ඉක්මයෑමට පෙර බැංකුව කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කිරීම යන කොන්දේසිවලට යටත්ව, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු ව්‍යාපාරයෙහි නිරතවීමට අවසර ලබාදෙමින් බැංකු බලපත්‍රයක් නිකුත් කරන ලදී.

(ඇ) **අනෙකුත් මෙහෙයුම් අනුමැතීන්:** සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම පිළිබඳ ඉල්ලීම් 2 ක්, උපකාරක ණය දෙවන පෙළ ප්‍රාග්ධනය යටතට ඇතුළත් කිරීම පිළිබඳ ඉල්ලීම් 5 ක්, ණය පහසුකම් පිළිබඳ උපරිම සීමා ඉක්මවා ප්‍රදානය කරන ණය පිළිබඳ ඉල්ලීම් 7 ක්, පරිපාලිත සමාගම්වල ආයෝජනය කිරීම පිළිබඳ ඉල්ලීම් 4 ක් සහ විදේශ රටවලට ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම පිළිබඳ ඉල්ලීම් 2 ක් ද ඇතුළුව, නියාමන අනුමැතීන් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් ගණනාවක් සම්බන්ධයෙන්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

## 2.2 අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකිරීම

බැංකුවල මූල්‍ය තත්ත්වය ඇගයීම සහ එළැඹිය හැකි ගැටලු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් කල්තබා හඳුනා ගැනීම මගින් සුදුසු නිවැරදි කිරීමේ පියවර කඩිනමින් ගැනීමෙහි අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී. බැංකු විසින් කලින් කලට ඉදිරිපත් කළ මූල්‍ය සහ කාර්යසාධන තොරතුරු සහ බැංකු සමග සිදුකරන අනෙකුත් තොරතුරු හුවමාරු කර ගැනීම් පදනම් කර ගනිමින් අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකෙරිණි. මෙම ක්‍රියාවලිය මගින්, බැංකුවල අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය යාවත්කාලීන කිරීමට, බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ මගින් හඳුනාගත් දුර්වලතාවයන් නියමිත කාලසීමාව තුළදී නිවැරදි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ කාලීන නිවැරදි කිරීමේ පියවර ක්‍රියාවට නැංවීම සඳහා බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ බාහිර විගණකයන් සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වීමට අවශ්‍ය තොරතුරු සපයන ලදී.

ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, බැංකුවල මාසික කාර්යසාධන වාර්තා 383 ක්, බැංකු අංශයෙහි කාර්යසාධනය පිළිබඳ කාර්තුමය වාර්තා 4 ක් සහ තැන්පතු පොලී අනුපාත පිළිබඳ විග්‍රහයක්, රන් භාණ්ඩ උකස් ණය සඳහා ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වාදීම, බැංකු අංශයෙහි අගය මත ණය අනුපාතය නිර්ණය කිරීම, බැංකුවල ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සහ ඉස්සන් වගා කිරීමේ කර්මාන්තය සහ ඇඟලුම් ක්ෂේත්‍රය වෙත ණය ලබාදීම වැනි විශේෂ කරුණු පදනම් කරගත් වාර්තා 6 ක් මෙම වසර තුළදී ඉදිරිපත් කෙරිණි.

බාසල් II දෙවන අදියර යටතේ බැංකුවල අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳ පළමු විමර්ශනය මෙම වසර තුළදී ආරම්භ කළ අතර, එහිදී අනාවරණය වූ තවදුරටත් වැඩි දියුණු විය යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් බැංකු වෙත දැනුම් දෙන ලදී. තවද, බාසල් III ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ප්‍රමිතීන් පිළිබඳ මූලික ඇගයීමක් ද සිදුකරන ලදී.

## 2.3 කාලීන පරීක්ෂණ සිදුකිරීම

පසුගිය වසරේ සිට ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 9 ක් ද ඇතුළුව, 2014 වසරේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යවස්ථාපිත පරීක්ෂණ 42 ක් සිදුකරන ලදී. මෙම පරීක්ෂණ සිදුකිරීමේදී අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ අධීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කෙරිණි. 2014 වසර තුළදී, අදාළ බැංකුවල කළමනාකාරිත්වය සමග විධිමත් සාකච්ඡාවන්හි නිරත වීමෙන් සහ මුදල් මණ්ඩලය වෙත අදාළ වාර්තා යොමු කිරීමෙන් අනතුරුව, බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ 30 ක් අවසන් කෙරුණු අතර, පරීක්ෂණ 12 ක කටයුතු අවසන් වෙමින් පැවතුණි. මෙයට අමතරව, මූල්‍ය වාර්තාකරණය සහ වංචනික ලෙස අරමුදල් හුවමාරු කිරීම වැනි විශේෂ කරුණු සඳහා සීමිත විෂය පථයකින් යුතු පරීක්ෂණ කිහිපයක් ද පැවැත්විණි.

## 2.4 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම පරිපාලනය කිරීම

2014 දෙසැම්බර් 31 දිනට, මුළු අරමුදලෙහි වටිනාකම රුපියල් බිලියන 18 ක් පමණ වූ මෙම යෝජනා ක්‍රමය සාමාජික ආයතන 82 කින් සමන්විත විය. රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ද්‍රවශීලතා ආධාර සැපයීම වෙනුවෙන් සාමාජික ආයතනයක් වෙත සැපයූ රුපියල් බිලියන 6 ක ණය මුදල ද ඇතුළත්ව, අනෙකුත් ණය සහ ලැබිය යුතු දෑ වලින් අරමුදලෙහි ආයෝජනයන් සමන්විත විය. ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී, සියයට 14 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වා ගනු ලැබූ බලපත්‍රලාභී බැංකු විසින්, සුදුසුකම් ලැබූ තැන්පතු ප්‍රමාණය මත වසරකට සියයට 0.1 ක් වාරික වශයෙන් ගෙවිය යුතු වූ අතර, අනෙකුත් සියලුම බැංකු විසින් වසරකට සියයට 0.125 ක් වාරික වශයෙන් ගෙවිය යුතු විය. බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වාරික මුදල වසරකට සියයට 0.15 ක් විය. මෙම වසර තුළදී, රුපියල් බිලියන 4.8 ක මුදලක් සාමාජික ආයතනවලින් වාරික සහ දඩ මුදල් වශයෙන් රැස්කරගන්නා ලදී.

2015 අයවැය තුළින් අනුමත වූ යෝජනාවකට අනුව, 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, තැන්පතු රක්ෂණ ආවරණය එක් ආයතනයක එක් තැන්පතුකරුවකු සඳහා රුපියල් 200,000/- සිට රුපියල් 300,000/- දක්වා ඉහළ නංවන ලදී.

## 2.5 බැංකු අංශයේ දැනුම්වත්භාවය සහ හැකියාවන් වර්ධනය

(අ) ''2020 ඉදිරි දැක්ම: මූර්ත ආර්ථිකය උදෙසා බැංකු අංශය සමගාමීකරණය'' යන තේමාව යටතේ 2014 නොවැම්බර් මස 26 වන දින අඛණ්ඩව සත්වන වරටත් පවත්වන ලද බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණයෙහි කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේදී, බැංකු අධ්‍යක්ෂවරුන්ගේ උපායමාර්ගික නායකත්වය පිළිබඳ විශේෂයෙන් අවධාරණය කරමින් ගෝලීය පරිසරයෙහි ඉස්මතුවන නව ප්‍රවණතා, බැංකු සඳහා ණය ශ්‍රේණිගතකරණයෙහි වැදගත්කම, ඩිජිටල් යුගයෙහි බැංකුකරණය මුල්කරගෙන පරිවර්තනීය වෙනසක් සහ බලගැන්වීම සඳහා උපායමාර්ගික සැලසුම්කරණය සහ වෙන් වෙන් වශයෙන් අවදානම් කළමනාකරණය කිරීමෙන් බැහැර වීමෙහි වැදගත්කම යන මාතෘකා ඔස්සේ සාකච්ඡා පැවැත්විණි.

(ආ) තවද, බාසල් II දෙවන අදියර යටතේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලිය සහ අවදානම් කළමනාකරණ යහභාවිතයන් පිළිබඳ බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා තාක්ෂණික සැසියක් පවත්වන ලදී.

(ඇ) බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳව නිකුත් කළ තොරතුරු විමසීමේ පත්‍රිකාව සම්බන්ධයෙන් බැංකු විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සාකච්ඡා කිරීම සඳහා ඒ පිළිබඳව වැඩමුළු 2 ක් ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරීන් සහ බැංකු අංශයේ වෘත්තිකයන් සඳහා පවත්වන ලදී.

(ඈ) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සහ බාසල් II දෙවන අදියර යටතේ, ආතති පරීක්ෂණ පිළිබඳව මෙයට පෙර නිකුත් කර ඇති අධීක්ෂණ මාර්ගෝපදේශ මත පදනම්ව, බැංකු වෙත ආතති පරීක්ෂණ පිළිබඳ මාර්ගෝපදේශයන් නිකුත් කරන ලද අතර, එමගින් ආතති පරීක්ෂණ රාමුවක් නිර්මාණය කර ක්‍රියාවට නැංවීමට සහ ආතති පරීක්ෂණ ප්‍රතිඵල බැංකුවල අවදානම් කළමනාකරණ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අන්තර්ගත කිරීමට බැංකුවලට නියම කරන ලදී.

(ඉ) **බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්, සභාපතිවරුන් සහ විගණකවරුන් සමග පැවති රැස්වීම්**

ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ප්‍රවණතා, මුදල් සහ බැංකු අංශයෙහි ප්‍රවණතා සහ අධීක්ෂණ ප්‍රගතිය පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමේ වේදිකාවක් ලෙස ක්‍රියාත්මක වූ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සමග මාසිකව සහ බැංකුවල සභාපතිවරුන් සමග කාර්තුමය වශයෙන් මහ බැංකු අධිපති විසින් පැවැත්වූ රැස්වීම් වල සංවිධාන කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. මූල්‍ය වාර්තාකරණය, බැංකුවල අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්, ආයතනික යහපාලනය පිළිබඳ විධානයන් නැවත විමසීම, බැංකුවල බාහිර විගණකයන් විසින් කළමනාකරණ ලිපි යොමු කිරීම සහ එළැඹෙන වසරෙහි විගණනයන් සැලසුම් කිරීමේදී අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍රවලට අදාළ කරුණු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා අනුමත විගණන ආයතන සමග රැස්වීමක් මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැඳවන ලදී. මෙයට අමතරව, අධීක්ෂණ ක්‍රියාවලියේ කොටසක් ලෙස බැංකුවලට විශේෂිත වූ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා විගණන ආයතන සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

(ඊ) **මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

2014 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව, මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදී ඇති මූල්‍ය ආයතන සහ නීති විරෝධී යෝජනා ක්‍රමවලට සම්බන්ධවීමේ අවදානම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහජන දැන්වීම් දෙකක් භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් ගණනාවක පළකරන ලද අතර එසේ පළකළ දැන්වීම් ගණන 242 කි.

(උ) මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රගතිය ද ඇතුළුව නියාමන ක්ෂේත්‍රයෙහි සිදුවන වෙනස්වීම් සහ වර්ධනයන් සම්බන්ධයෙන් තොරතුරු බෙදාහැරීම සඳහා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පුවත්පත් නිවේදන 51 ක් නිකුත් කරන ලදී.

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විද්‍යාපීඨය මගින් සහ විදේශීය ආයතනයක් ද ඇතුළුව බාහිර ආයතන මගින් සංවිධානය කළ පුහුණු වැඩසටහන්වල සම්පත් දායකයන් වශයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 16 දෙනෙකු සම්බන්ධ විය. මෙම වැඩසටහන් ප්‍රධාන වශයෙන් බැංකු අධීක්ෂණය, බැංකුවල අවදානම් කළමනාකරණය, ආයතනික යහපාලනය සහ බැංකුකරණය සහ මූල්‍යනයට අදාළ නීතිමය ප්‍රතිපාදන වැනි විෂයයන් ඔස්සේ පවත්වන ලදී.

(එ) **මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම**

2014 අයවැය මගින් නිවේදනය කළ ඒකාබද්ධවීම් සහ අත්පත්කර ගැනීම් තුළින් මූල්‍ය අංශයෙහි ශක්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පහසුකම් සලසන ලදී. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ අතිරේක අධ්‍යක්ෂවරයා මහ බැංකුවේ පිහිටුවන ලද මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ඒකකයෙහි සාමාජිකයන් ලෙස ක්‍රියාකළ අතර, එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු තාක්ෂණික සහාය කණ්ඩායමෙහි සාමාජිකයකු ලෙස ක්‍රියා කරන ලදී. මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා, දේශීය ආදායම් පනත සහ එකතු කළ අගය මත බදු පනත යටතේ නිකුත් කළ බදු දිරිගැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ බැංකුවල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරුන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් සකස් කරන ලදී. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇල්මක් දක්වන පාර්ශ්ව වන සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව, බැංකුවල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරුන්, උපදේශකවරුන්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ වෘත්තීය සමිති සමග සාකච්ඡා පැවැත්වීම මගින්, එම පාර්ශ්වවල අඛණ්ඩ සහභාගිත්වය ඒකාබද්ධකරණ ක්‍රියාවලිය සඳහා ලබාගන්නා ලදී.

(ඒ) **ආයතනික යහපාලනය පිළිබඳ විධිවිධාන නැවත විමසීම**

ආයතනික යහපාලනය පිළිබඳ විධාන නැවත විමර්ශනය කිරීම සඳහා පත්කළ කමිටු දෙක සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පහසුකම් සලසන ලදී. බැංකුවල සභාපතිවරුන්ගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සැදුම්ලත් මෙම කමිටු දෙකෙහි සභාපතිත්වය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරයා විසින් උසුලන ලදී. ඒ අනුව, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව ආයතනික යහපාලනය සම්බන්ධයෙන් ඇති වූ නව අන්තර්ජාතික නියාමන වෙනස්කම් සහ යහභාවිතයන් මෙන්ම මේ සම්බන්ධයෙන් ලත් අනෙකුත් නිරීක්ෂණ ද මෙහිදී විමර්ශනයට සහ සාකච්ඡාවට භාජනය කරන ලදී. මෙම නිරීක්ෂණ ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව, ආයතනික යහපාලනය සම්බන්ධයෙන් මේ වන විට පවතින විධාන යටතේ, වර්තමාන භාවිතයන් තවදුරටත් ශක්තිමත් කිරීමට මෙයට සම්බන්ධිත පාර්ශ්ව එකඟ විය.

(ඔ) **නඩු කටයුතු පවත්වාගෙන යෑම**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව සහ නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතනවල සහාය ද සහිතව 2002 දී අසාර්ථකභාවයට පත් වූ ප්‍රමුඛ සේවිංග්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්හි කටයුතු, විනිමය පාලන විධානයන්ට අදාළ කටයුතු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි හෙජින් ගනුදෙනුවලට අදාළ ආරවුල් සහ නීති විරෝධී යෝජනා ක්‍රම යන කරුණුවලට අදාළ නඩු 16 කට සම්බන්ධ කටයුතු සිදුකරන ලදී.

(ඕ) **අන්තර් නියාමන ආයතනික සභාව**

මූල්‍ය අංශයේ ක්‍රමවත් සංවර්ධනය සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්තිමය තීරණය ගැනීමේ අරමුණින්, මූල්‍ය අංශයේ සියලුම ප්‍රාථමික නියාමන ආයතනවල සහභාගිත්වයෙන් 2007 වසරේදී, අන්තර් නියාමන ආයතනික සභාව පිහිටුවන ලදී. මෙයට පහසුකම් සැලසීම සඳහා, යෝජිත මූල්‍ය අංශයේ නියාමන ආයතන අතර තොරතුරු හුවමාරු කිරීමේ පනත, අන්තර් නියාමන ආයතනික සභාව සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් අනතුරුව, මේ වන විට නීති කෙටුම්පත්කරු විසින් කෙටුම්පත් කරමින් පවතී. 2014 වසරේදී පැවති අන්තර් නියාමන ආයතනික සභාවෙහි රැස්වීමක් සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පහසුම් සලසන ලද අතර, එහිදී කොටස් වෙළඳපොළ තැරැව්කාර සමාගම් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, සාංගමික ණය වෙළඳපොළෙහි සංවර්ධනය, අර්බුද නිවාරණ රාමුව තුළ නියාමන ආයතනවල කාර්යභාරය, බලපත්‍රලාභී ආයතනවල ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම සහ වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් විගණකවරු සියලුම ලැයිස්තුගත සමාගම් විසින් යොදා ගැනීම යන කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

**ඇමුණුම II-1 බලපත්‍රලාභී බැංකු ලේඛනය**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පීඑල්සී
2. ඇක්සිස් බැන්ක් ලිමිටඩ්
3. ලංකා බැංකුව
4. කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්
5. සිටි බැන්ක්, එන් ඒ
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
7. ඩොයිෂ් බැන්ක් ඒජී
8. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී
9. හබීබ් බැන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී
11. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
12. ඉන්දියන් බැංකුව
13. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
14. එම්සීබී බැන්ක් ලිමිටඩ්
15. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
16. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
17. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
18. මහජන බැංකුව
19. පබ්ලික් බැන්ක් බර්හාඩ්
20. සම්පත් බැන්ක් පීඑල්සී
21. සෙලාන් බැන්ක් පීඑල්සී
22. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
23. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
24. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
25. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

26. ඩීඑෆ්සීසී බැංකුව*
27. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
28. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
29. එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්**
30. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
31. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
32. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
33. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
34. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

* ඩීඑෆ්සීසී බැංකුව 2015 ජනවාරි 06 වන දින සිට ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී යන නමින් සමාගම් පනත යටතේ, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සීමිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත.

** මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය යටතේ, එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී සහ එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් සමග ඒකාබද්ධ කළ අතර, එලෙස ඒකාබද්ධව පිහිටු වන ලද ආයතනය 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී යන නමින් බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

## 3. බැංකු විද්‍යා පියෙස

බැංකු විද්‍යා පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ගේත්, ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ වෘත්තිකයින්ගේත් දැනුම වර්ධනය හා කුසලතා ඔප් නැංවීම තුළින් මානව සම්පත් දියුණු කිරීමේ කාර්යභාරයේ වගකීමෙන් බැඳී ඇත. මෙම වගකීම ඉටුකරලීම උදෙසා පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සැලසුම් කොට පැවැත්වීම බැංකු විද්‍යා පියෙස මගින් සිදු කෙරේ. දකුණු ආසියානු කලාපයේ බැංකු හා මූල්‍ය අංශයේ ආයතනවල නිලධාරීහු ද එම පාඨමාලාවට සහභාගී වෙති. මීට අමතරව බැංකු විද්‍යා පියෙස මගින් කාලීනව වැදගත් මාතෘකා යටතේ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණද, අ.පො.ස. (උ.පෙළ) පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ ආර්ථික විද්‍යා ගුරුභවතුන්ගේ ආර්ථික විද්‍යා විෂය පිළිබඳ ප්‍රායෝගික දැනුම වර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව විශේෂ වැඩසටහන්ද පවත්වනු ලැබේ.

2014 වසර තුළදී බැංකු විද්‍යා පියෙසෙහි මූලික අවධානය යොමු වූයේ එමගින් පැවැත්වූ පුහුණු වැඩසටහන්වල සහ ඒවාට සැපයූ පහසුකම් හා සේවාවන්හි ගුණාත්මකභාවය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගැනීම සඳහාය. එහිදී වේගයෙන් වෙනස්වන ගෝලීය මූල්‍ය ක්ෂේත්‍රයේදී නව්‍ය ක්‍රමවේදයන් හරහා යාවත්කාලීන වූ දැනුම් සම්භාරයක් මනා අධ්‍යයන පරිසරයකදී පුහුණුවන්නන් සඳහා පිරිනැමීමේ අවශ්‍යතාව බැංකු විද්‍යා පියෙස විසින් හඳුනා ගන්නා ලදී.

ඒ අනුව, බැංකු විද්‍යා පියෙස විසින් මූල්‍ය ආයතනවල ප්‍රධාන කටයුතු හා උපකාරක සේවා පිළිබඳ පුහුණු අවශ්‍යතා සපිරි ලෙස ආවරණය කරමින් පුහුණු පාඨමාලා සැලසුම් කරන ලද අතර බැංකු කටයුතු මෙහෙයුම් සහ නියාමන, මූල්‍ය කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ග්‍රාමීය සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදන කුසලතා යන ක්ෂේත්‍රයන්හි පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී. ජාත්‍යන්තරව පවතින දැනුම් කේන්ද්‍රස්ථාන සමඟ සබඳතා තවදුරටත් පුළුල් කර ගැනුමට බැංකු විද්‍යා පියෙසේ අවධානය යොමු කෙරුණු අතර ඉන්ටර්නැෂනල් කම්ප්ලයන්ස් අසෝසියේෂන් සහ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව ආරම්භ කරන ලද 'අනුකූලතාවය පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලාව' එවැනි සබඳතාවල ප්‍රතිඵලයකි.

2014 වසර තුළ බැංකු විද්‍යා පියෙස විසින් කලින් ප්‍රකාශයට පත් කරන ලද පාඨමාලා 65 ක්ද, විවිධ මූල්‍ය ආයතනවලින් කෙරෙන ඉල්ලීම් මත සහ හඳුනාගත් දැනුම් පරතරයන් පියවීම සඳහා සැලසුම් කළ විශේෂ පාඨමාලා 67 ක්ද, ජාත්‍යන්තර පාඨමාලා 08 ක්ද, ඩිප්ලෝමා පාඨමාලා 04 ක්ද, සහතික පත්‍ර පාඨමාලා 03 ක්ද, පුහුණුකරුවන් සඳහා වූ පුහුණු පාඨමාලාවක්ද පවත්වන ලදී. ඊට අමතරව දැනුම ලබා දීම මුල් කොටගත් මහජනතාවට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 12 ක්ද, පාසැල් සිසුන් සඳහා වූ වැඩසටහන් 16 ක්ද, විශ්වවිද්‍යාල සිසුන් සඳහා වූ

වැඩසටහන් 6 ක්ද 2014 වසර තුළ බැංකු විදු පියෙස මගින් සංවිධානය කොට පවත්වන ලදී. විදේශීය පුහුණුවන්නන් 211 ක් ද ඇතුළුව, විදු පියෙසෙහි පාඨමාලා සඳහා 2014 දී සහභාගි වූ මුළු පුහුණුවන්නන් ගණන 5,092 ක් විය. ඉහත වැඩසටහන්වලට අමතරව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ආර්ථික විද්‍යාව හදාරණ සිසුන් සඳහා සැලසුම් කළ 'තක්ෂිලාව' රූපවාහිනී වැඩසටහන් මාලාව විකාශනය කිරීමේ කටයුතු 2014 තුළදී ද බැංකු විදු පියෙස මගින් සම්බන්ධීකරණය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාල මෙහෙයුම් දෙපාර්තමේන්තුවත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවත් හා ඒකාබද්ධව බැංකු විදු පියෙස, ප්‍රාදේශීය මට්ටමින්ද වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. 2014 වසර තුළදී, එවැනි වැඩසටහන් 10 ක් ප්‍රාදේශීයව පවත්වන ලද අතර ඊට පළාත් කාර්යාල පහ ඒ ඒ පළාත්වලදී දායකත්වය ලබා දෙන ලදී. මෙම වැඩසටහන්වලදී ණය අත්තිකාරම් ප්‍රදානය සහ ණය අගයනය වැනි මූලික බැංකු කටයුතුවල සිට උකස් කටයුතු වැනි උපකාරක සේවා දක්වා පුළුල් පරාසයක් තුළ වූ විෂය ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

2015 වසරේ පුහුණු අවශ්‍යතා සපුරාලීමට සහ වසර 2020 දැක්ම කරා යෑමේදී අවශ්‍ය ඉලක්ක ජය ගැනීමට ඉවහල් වන අයුරින් බැංකු විදු පියෙස 2015 සඳහා එහි වාර්ෂික පාඨමාලා සහ විශේෂ පුහුණු පාඨමාලා සමූහය සැලසුම් කරන ලදී.

## 4. සන්නිවේදන

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ මෙහෙවරට සිය දායකත්වය සපයමින් තොරතුරු බෙදාහැරීම සහ මහජනතාව අතර ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම උදෙසා අඛණ්ඩව කටයුතු කරන ලදී.

දිවයිනේ සියලු ප්‍රදේශ නියෝජනය කරමින් සිංහල මාධ්‍ය පාසැල් 550 ක සහ දෙමළ මාධ්‍ය පාසැල් 263 ක සහභාගිත්වයෙන් දෙවන වතාවටත් පැවති "ඉකෝන් අයිකොන්" ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය සාර්ථක ලෙස නිම කිරීම තුළින්, ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම් තේරුම් ඇති සමාජයක් ගොඩනැගීම සඳහා වූ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ කැපවීම මනාව ප්‍රදර්ශනය විය.

### 4.1. බාහිර සන්නිවේදන කටයුතු

බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cbsl.gov.lk 2014 වසර තුළ පිවිසීම් වාර මිලියන 86.9 ක් වාර්තා කළ අතර එය පෙර වර්ෂයේ වාර්තා වූ පිවිසීම් වාර මිලියන 83.6 හා සසඳන කළ සියයට 3.94 ක වැඩි වීමකි. තොරතුරු මූලාශ්‍රයක් ලෙස වෙබ් අඩවිය ලබා ඇති ජනප්‍රියතාව මෙම වර්ධනයෙන් තහවුරු වෙයි. තවද, සමාජ ජාල අඩවි තුළ මහ බැංකුවේ නියෝජනය ද නොවෙනස්ව පවත්වා ගැනුණු අතර, ෆේස්බුක්හි පළ කිරීම් 567ක් ද, ට්විටර් පණිවුඩ 567 ක් ද නිකුත් කරනු ලැබී ය. බැංකුවට අදාළ වීඩියෝ දර්ශන 51 ක් යූ ටියුබ් වෙත එක් කරනු ලැබූ අතර යූ ටියුබ් පරිශීලකයන් 23,239 ක් විසින් එම වීඩියෝ දර්ශන නරඹා තිබේ.

මහජනතාවට සෘජුවම අධිපති වෙතින් ප්‍රශ්න ඇසීමට අවස්ථාව සැලසූ, පැයක කාලසීමාවකින් යුක්ත වූ ට්විටර් සාකච්ඡා සැසි 2ක් වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කෙරුණි. එම සාකච්ඡා සාර්ථක අන්දමින් පැවති අතර එක් එක් සැසියේ දී ට්විටර් පරිශීලකයන් 100 කට අධික සංඛ්‍යාවක් විසින් ප්‍රශ්න රාශියක් යොමු කරන ලදී.

භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාත, උද්ධමන ප්‍රතිශතය, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික ආදී තොරතුරු බෙදාහැරීම පිණිස දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන විද්‍යුත්-තැපැල් තොරතුරු සේවාවේ දායකත්වය සඳහා 1,800 දෙනෙකු ලියාපදිංචි වී සිටින අතර, එම සේවාව තුළින් එම තොරතුරු ඇතුළත් විද්‍යුත්-තැපැල් පණිවුඩ 581 ක් වසර තුළ දී නිකුත් කරන ලදී.

කෙටි පණිවුඩ සේවාව සඳහා ලියාපදිංචිය ලැබූවන්ගේ සංඛ්‍යාව පසුගිය වර්ෂාවසානයේ පැවති 840 සිට 913 දක්වා වැඩි විය. වෙළඳපොළ තොරතුරු ප්‍රකාශයට පත් වූ වහාම මෙම සේවාව මගින් පමාවකින් තොරව ඒවා ලබා දීම නිසා එය පුවත්පත් කලාවේදීන්ට, මූල්‍ය වෙළඳපොළ ගනුදෙනුකරුවන්ට සහ පොදු මහජනතාවට මහත් පහසුවක් විය.

සාම්ප්‍රදායික නොවන ක්‍රමවේද වන විද්‍යුත්-තැපැල, කෙටි පණිවුඩ සේවය සහ සමාජ ජාල අඩවි මගින් සිදුකෙරෙන සන්නිවේදනය වැඩිදියුණු කරන අතරම, සාම්ප්‍රදායික සන්නිවේදන කාර්යයන් ද නිසි ලෙස පවත්වා ගෙන යන ලදී. සමාලෝචනයට අදාළ කාල වකවානුව තුළ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදන 1,866 ක් සහ ගැසට් නිවේදන 13 ක් ද නිකුත් කරන ලදී.

බැංකුවට අදාළ විවිධ කරුණු සම්බන්ධව මාධ්‍ය හමු 24 ක් 2014 තුළ පැවැත්වුණි. ඊට අතිරේකව බැංකුව හා සම්බන්ධ විශේෂ අවස්ථා වූ 2014 ඉදිරි දැක්ම එළි දැක්වීම, ඉදිරි දැක්ම පිළිබඳ සාකච්ඡා මණ්ඩපය, මහ බැංකුවට එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ගේ 18 වැනි සමරුව, 2013 වාර්ෂික වාර්තාව පිළිගැන්වීම, මූල්‍ය වාර්තාකරණය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව, බැංකු පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර සංසදය දියත් කිරීම, නියාමන අනුකූලතාව පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය, ඉන්දීය මහ බැංකු අධිපතිගේ දේශනය, මහ බැංකුවේ වාර්ෂික සමරු දේශනය, 2015 අයවැය පිළිබඳ සාකච්ඡාව, දිස්ත්‍රික්ක 25 කාසි හඳුන්වාදීම සහ 2014 බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව යන අවස්ථාවන් සඳහා මාධ්‍ය පහසුකම් සැලසීම ද සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

සන්නිවේදන දෙපාර්තමේන්තුව, කුලියාපිටියේ පැවැති "දැයට කිරුළ" ප්‍රදර්ශනය, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති "කොළඹ ජාත්‍යන්තර පොත් සල්පිළ" සහ ජාතික පුස්තකාලයේ පැවැති පොත් ප්‍රදර්ශනය යන ජාතික මට්ටමේ ප්‍රදර්ශනවල දී මහ බැංකුව නියෝජනය කරමින් ඒවාට සහභාගි විය.

### 4.2. අභ්‍යන්තර සන්නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන බැංකුවේ අභ්‍යන්තර වෙබ් අඩවිය වන "සීබීඑස්එල් ඩේලි" (cbsl daily) අඩවිය බැංකුවේ කාර්යමණ්ඩලය වෙත තොරතුරු ගෙන යන බිහි දොරක් වශයෙන් ලබා ඇති ජනප්‍රියත්වය තව දුරටත් රැක ගැනීමට සමත් වී ය. මෙම අඩවිය තුළින් ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික නිවේදන සහ විනිමය අනුපාතික නිවේදන 404 ක් සහ පුවත්පත් නිවේදන 176 ක් වසර තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වෙබ් අඩවිය පුවත් වෙබ් අඩවියක්, දැන්වීම් පුවරුවක් මෙන්ම බැංකුවේ අභ්‍යන්තර වෙබ් අඩවි ජාලය වෙත පිවිසීමේ බිහි දොරක් වශයෙන් ද ක්‍රියා කරයි. නිල අභ්‍යන්තර පුවත්පත වන "කවුළුව" කලාප 4 ක් වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලදී. මාධ්‍ය නිරීක්ෂණ අංශය විසින් භාෂා තුනට අයත් පුවත්පත් 15 ක් තුළින් රැස් කර ගන්නා ලද ආර්ථිකයට සහ මහ බැංකුවේ විෂය පථයට අදාළ පුවත්, ලිපි, සහ මහජන අදහස් දැක්වීම් 1,600ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 4.3. මහජනයා දැනුම්වත් කිරීම

මහජනතාවගේ ආර්ථික සහ මූල්‍ය සාක්ෂරතාව දියුණු කිරීමට මග සලසාලීම සන්නිවේදන දෙපාර්තමේන්තුව ඉහළම ප්‍රමුඛතාවක් දක්වන කටයුත්තකි. මෙම කාර්යයට සිය කැපවීම විදහා දක්වමින් පාසැල් සිසු සිසුවියන් සහ ගුරු මහත්ම මහත්මීන් සඳහා වූ සම්මන්ත්‍රණ 10 ක් ත්‍රිකුණාමලය, දෙහිඅත්තකණ්ඩිය, මඩකලපුව සහ හම්බන්තොට යන දුරබැහැර ප්‍රදේශ ද ඇතුළත්ව ලංකාවේ විවිධ පළාත්වල පවත්වන ලදී.

මහ බැංකු ප්‍රකාශන අලෙවිය මිලියන 5.03 සිට මිලියන 6.09 දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 21.07 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම මහ බැංකු ප්‍රකාශන පිටපත් 22,529 ක් පාසැල් සිසුන් සහ ගුරුවරුන් අතර නොමිලේ බෙදාහරින ලදී.

වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් රාජ්‍යතාන්ත්‍රිකයන්, පාසැල්/සරසවි සිසු සිසුවියන්, පාසැල් ගුරුවරුන්, ත්‍රිවිධ හමුදාවන්හි පුහුණුව ලබන්නන් සහ රාජ්‍ය ආයතනයන්ගෙන් ලත් නිල ආරාධනා මත ශ්‍රී ලංකාවට පැමිණි විදේශ දූත පිරිස් ආදී වූ සමාජයේ විවිධ තලයන් ඉලක්ක කර ගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 4.4. දෙමළ භාෂා පරිවර්තන සේවාව

ත්‍රෛභාෂාවන්ගෙන් ම තොරතුරු සැපයීමේ කාර්යය සඳහා දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂා පරිවර්තන ඒකකය සිය අඛණ්ඩ දායකත්වය සපයන ලදී.

### 4.5. මුද්‍රණාලය

මුද්‍රණාලය විසින් 2014 වසර තුළ මුද්‍රණ කාර්යයන් 398 ක් සම්පූර්ණ කරනු ලැබී ය. මෙම මුද්‍රණ කාර්යයන් ට "නිවුස් සර්වේ" (News Survey), "සටහන", "සැදෑව", "ප්‍රාදේශීය පුවත්" සහ "කවුළුව" යන වාරික ප්‍රකාශනවලට අමතරව එළි දැක්වුණ "මහ බැංකුවේ 64 වැනි සමරු දේශනය", "මහ බැංකුවේ අරමුණු", "මුදල් ගනුදෙනු බැංකු සහ ආර්ථිකය", (5 වැනි සහ 6 වැනි මුද්‍රණ), "2014 ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත", (සිංහල, දෙමළ, ඉංග්‍රීසි), පර්යේෂණ පත්‍රිකා අංක 70/71 සහ මාණ්ඩලික පත්‍රිකා අංක 42 යන වාරික නොවන ප්‍රකාශන ද ඇතුළත් විය. තවද, විවිධ ආකෘති පත්‍ර, ලිපිද්‍රව්‍ය සහ බැංකුවේ වෙනත් මුද්‍රණ අවශ්‍යතා මුද්‍රණය කර දීම ද මුද්‍රණාලය විසින් සිදු කරනු ලැබී ය.

### 4.6. බැංකුවේ වැදගත් අවස්ථා ඡායාරූපයට නැගීම

නිශ්චල ඡායාරූප සහ වීඩියෝ මාධ්‍ය තුළින් මහ බැංකුව විචිත්‍ර ලෙස බාහිර ලෝකය වෙත ගෙන යෑම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය ඉමහත් මෙහෙයක් ඉටු කරන ලදී. තව ද ඒකකය විසින් බැංකුවේ විවිධ අවස්ථාවන් 485 ක් ඡායාරූපයට නැගීම සහ එම අවස්ථාවන්හි දී ගත් ඡායාරූප මුද්‍රණය, වීඩියෝ සංස්කරණය, ඡායාරූප රාමු කිරීම, ඡායාරූප ඇල්බම සහ සංගත තැටි සැකසීම ආදී කාර්යයන් උසස් වෘත්තීයමය තත්ත්වයෙන් යුතුව ඉටු කරනු ලැබී ය.

### 4.7. පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය එය සතුව ඇති පොත් 28,930 ක්, වාර්තා 18,681 ක්, සංගත තැටි 1,813 ක් සහ පර්යේෂණ සඟරා 1,570 කින් සමන්විත එකතුව තුළින් බැංකු කාර්ය මණ්ඩලයට සහ ඉල්ලීම් කරන ලද බාහිර පුද්ගලයන්ට ද සිය සේවාව සපයන ලදී. එසේම, ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂයයන් පිළිබඳ මහත් දැනුම් සම්භාරයක් පුස්තකාලයේ පරිශීලකයන් වෙත ලබා දීම පිණිස "සයන්ස් ඩිරෙක්ට්"(Science Direct), සහ "ඊ.බී.එස්.සී.ඕ හොස්ට්"(EBSCO Host) යන මංගත දත්ත මූලයන් වෙතින් ලබාගෙන ඇති දායකත්වය තව දුරටත් පවත්වා ගනු ලැබී ය. මෙයට අතිරේකව, මහ බැංකුවේ කාර්යයන්ට අදාළ වන විෂයයන් පිළිබඳව වූ වෙනත් මංගත දත්ත ප්‍රභව කීපයකටත් පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය දායක වී ඇත.

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් දායකත්වය ලබා ඇති දේශීය සහ විදේශීය පර්යේෂණ සඟරා සංඛ්‍යාව පිළිවෙළින් 96 ක් සහ 63 ක් වේ. පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් බෙදාහරින "රීසන්ට් ඇඩිෂන්ස්" (පුස්තකාලයට ලැබුණු අලුත් පොත්), "කරන්ට් කන්ටෙන්ට්ස්", "නිවුස් ඇලර්ට්", ආර්ථිකය, බැංකු සහ මූල්‍යය පිළිබඳ දේශීය

මාධ්‍යයන්හි පළවන වාර්තා යන විද්‍යුත් ප්‍රකාශන සකස් කිරීම සහ අභ්‍යන්තර පරිගණක ජාලය ඔස්සේ ඒවා බෙදා හැරීම සුපුරුදු පරිදි සිදු කරන ලදී. තෝරාගත් තොරතුරු බෙදා හැරීමේ සේවය ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

මහ බැංකුවේ පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය, දිවයිනේ සාමාජික පුස්තකාල 24 ක් අතරේ විද්‍යුත්-තැපැල මගින් තොරතුරු හුවමාරු කර ගන්නා "ශ්‍රී ලංකා ආර්ථික සහ බැංකුකරණ පුස්තකාල ජාලය" පවත්වාගෙන යයි. එසේම පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය, ලොව වටා මහ බැංකු පුස්තකාල අතර තොරතුරු, සම්පත් සහ අත්දැකීම් හුවමාරු කරගන්නා "ජගත් මහ බැංකු තොරතුරු වෘත්තිකයන්ගේ ජාලය"හි උද්‍යෝගිමත් සාමාජිකයෙකි. අභ්‍යන්තර පරිගණක ජාලය ඔස්සේ මහ බැංකු කාර්යමණ්ඩලය වෙත පුස්තකාල සේවා සපයන ඩිජිටල් පුස්තකාල සේවය පවත්වා ගෙන යන්නේ ද පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසිනි.

# 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 48 සිට 59 (අ) දක්වා වගන්තිවලට අනුව ගෙවීම් මාධ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ අධිකාරීත්වය දරන්නේ මුදල් මණ්ඩලයයි. මුදල් මණ්ඩලය සතු මෙම අධිකාරීත්වය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා බැංකු කටයුතු හා මුදල් දෙපාර්තමේන්තුව ලෙස 1950 ජූලි මස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඒ අනුව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යයන් වනුයේ, මහජන ඉල්ලුම් සපුරාලීම සඳහා මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම, මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට හා කාසි ටංකනය කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම, ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීමේ අවස්ථා පිළිබඳව කටයුතු කිරීමට නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහයෝගය ලබාදීම සහ මුදල් පරිහරණය සහ මුදල් වල ගුණාත්මකභාවය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

## 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව

රටෙහි ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නව මුදල් නෝට්ටු හා කාසි වශයෙන් නිකුත් කිරීම සහ මුදල් නෝට්ටු නැවත නිකුත් කිරීම් වශයෙන් (සේවා නිසි නෝට්ටු) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ මුදල් හුවමාරු කවුළු හරහා ව්‍යවහාර මුදල් සංසරණයට නිකුත් කරනු ලබයි. 2014 දෙසැම්බර් 31 දිනට සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් වටිනාකම රුපියල් බිලියන 416.2 ක් වූ අතර එය 2013 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව සියයට 22.5 ක වර්ධනයකි (සංඛ්‍යා සටහන II-1). ඒකපුද්ගල ව්‍යවහාරික මුදල් අගය තවදුරටත් වටිනාකමින් මෙන්ම ප්‍රමාණාත්මකව ද වර්ධනය වී ඇති අතර 2014 වසර අග දී එය වටිනාකමින් රුපියල් 20,133 ක් වූ අතර ප්‍රමාණයෙන් 421 ක් විය.

**II-1 සංඛ්‍යා සටහන — සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල්**

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| නෝට්ටු | 250.0 | 287.1 | 311.1 | 332.3 | 408.7 | 17.8 | 14.9 | 8.4 | 6.8 | 23.0 |
| කාසි | 5.7 | 6.2 | 7.0 | 7.5 | 7.5 | 7.9 | 8.4 | 13.4 | 6.9 | 1.1 |
| එකතුව | 255.6 | 293.2 | 318.1 | 339.8 | 416.2 | 17.5 | 14.7 | 8.5 | 6.8 | 22.5 |

(මුදල් වර්ගය අනුව විස්තර මෙම වාර්තාවේ සිව්වන කොටසෙහි සංඛ්‍යා සටහන් යටතේ දක්වා ඇත.)

**II-1 රූප සටහන — ඒකපුද්ගල ව්‍යවහාරික මුදල් - වටිනාකම**




**II-2 රූප සටහන — ඒකපුද්ගල ව්‍යවහාරික මුදල් - ප්‍රමාණය**




**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සමග කෙරෙන ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු**

2014 වසර අවසානය වන විට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට රුපියල් බිලියන 431.8 ක මුදල් නෝට්ටු සහ රුපියල් මිලියන 763.8 ක කාසි නිකුත් කර ඇත (සංඛ්‍යා සටහන II-2).

**II-2 සංඛ්‍යා සටහන — නව සහ නැවත ව්‍යවහාර මුදල් නිකුතුව**

| ව්‍යවහාර මුදල් නිකුතු | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2012 | 2013 | 2014 |
| නෝට්ටු | 355.4 | 401.9 | 431.8 | 6.1 | 13.1 | 7.7 |
| කාසි | 0.7 | 0.5 | 0.8 | 58.5 | (27.7) | 41.1 |
| එකතුව | 356.1 | 402.4 | 432.6 | 6.1 | 13.0 | 7.5 |

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යෑමේ මූලික අවශ්‍යතාවය සඳහා මුදල් මෙහෙයුම් කටයුතුවල දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් තැන්පත් කෙරෙන සේවා නිසි සහ සේවා අනිසි මුදල් නෝට්ටු හා කාසි ද භාර ගනු ලබයි (සංඛ්‍යා සටහන II-3). පෙර වසර සමඟ සසඳන විට 2014 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින් සිදු කළ තැන්පතු ප්‍රමාණය සියයට 7 කින් අඩු වී ඇත. මෙසේ තැන්පත් කෙරුණු සේවා නිසි මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සංසරණය සඳහා නැවත නිකුත් කරනු ලබන අතර, සේවා අනිසි නෝට්ටු විනාශ කරනු ලබයි. 2014 දී රුපියල් බිලියන 55.5 වටිනා සේවා අනිසි නෝට්ටු මිලියන 178.8 ක ප්‍රමාණයක් විනාශයට පත් කරනු ලැබීය.

**II-3 සංඛ්‍යා සටහන — බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින් කෙරෙන ව්‍යවහාර මුදල් තැන්පතු**

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2012 | 2013 | 2014 |
| නෝට්ටු | 331.2 | 381.0 | 354.4 | 11.2 | 15.0 | (7.0) |
| කාසි | 0.003 | 0.001 | 0.000 | (78.3) | (53.3) | 0.0 |
| එකතුව | 331.2 | 381.0 | 354.4 | 11.2 | 15.0 | (7.0) |

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් පරිහරණය කිරීමේ හොඳ පුරුදු අනුගමනය කිරීමට දිරිගැන්වීම සිදු කරනු ලබන අතර එමඟින් මුදල් නෝට්ටුවල ආයු කාලය වැඩි වීම නිසා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට යන පිරිවැය අඩු කිරීම, අව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සඳහා නෝට්ටුවල ඇති ආරක්ෂණ සලකුණු පැහැදිලිව දැක ගැනීමට හැකි වීම, මුදල් නෝට්ටු පිරිසැකසීම පහසුවීම සහ රටේ ජනතාව පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සිදු වේ. ඒ අනුව, ව්‍යවහාර මුදල් නෝට්ටු තෝරා වෙන් කිරීමේ සහ පරිහරණ ක්‍රියාකාරකම්වල ඇති ගැටලු සහ කාර්යක්ෂම ලෙස මුදල් පිරිසැකසීමට ඇති බාධක පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් කළමනාකරුවන් සමග රැස්වීම් 3 ක් මෙහෙයවන ලදී. තවද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාවන්ට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකු ක්‍රියා කරන බවට සහතික වීම සඳහා ඔවුන්ගේ මුදල් මෙහෙයුම් කටයුතු අහඹු ලෙස පරීක්ෂා කිරීම ද සිදු කෙරිණි.

### (ආ) ව්‍යවහාර මුදල් හුවමාරු කවුළුව

විවිධ වර්ගයේ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් සඳහා මහජනතාව අතර පවත්නා කැමැත්ත අනුව ව්‍යවහාර මුදල් හුවමාරු කර ගැනීමට ඉඩ සලසන අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මඟින් ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි මුදල් හුවමාරු කවුළුව තවදුරටත් පවත්වා ගෙන යන ලදී. 2014 වසරේ දී රුපියල් මිලියන 2,851.5 ක් වටිනා ව්‍යවහාර මුදල් නෝට්ටු හා රුපියල් මිලියන 97.8 ක් වටිනා කාසි මේ හරහා නිකුත් කරනු ලැබීය. මෙයට අමතරව, රටපුරා පවත්නා මහජන බැංකු ශාඛා හරහා ව්‍යවහාර මුදල් හුවමාරු කවුළු පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගනු ලැබීය.

### (ඇ) කාසි එකතු කිරීමේ වැඩසටහන

සංසරණයේ පවතින කාසි භාවිතය වැඩිකිරීම සඳහා ආගමික සිද්ධස්ථාන සහ නිවෙස්වල ඇති කැටවල භාවිතයට නොගෙන එක්රැස් වන කාසි එකතු කිරීමේ වැඩසටහන් කිහිපයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කළ අතර එහි වාර්ෂික ඉලක්කය වූ කාසි මිලියන 18 ක් අබිබවමින් කාසි මිලියන 19.2 ක් එකතු කර ගැනීමට ද 2014 වසර තුළ හැකි විය. තව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ අදාළ ප්‍රදේශයේ බලපත්‍රලාභී වාණිජ බැංකු එක්ව එම ප්‍රදේශයේ කාසි අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා භාවිතයට නොගෙන ඇති කාසි එක්රැස් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සකසා දෙන ලදී. එම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාසි ගණන් කරන යන්ත්‍ර ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කාර්යාලවලට ලබා දෙන ලදී.

### (ඈ) පද්ධතියෙහි වැඩිදියුණු කිරීම්

2014 වසර තුළ දී, මුදල් නෝට්ටු වල නිරවද්‍ය බව බැලීමේ, ගණන් කිරීමේ, තේරීමේ සහ විනාශ කිරීමේ කටයුතුවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය නෝට්ටු පිරිසැකසුම් යන්ත්‍ර දෙකක් ස්ථාපනය කරන ලදී. කැබලි කරන ලද නෝට්ටු කුට්ටි වශයෙන් සකස් කළ හැකි යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පසුව වඩාත් පරිසර හිතකාමී ලෙස ව්‍යවහාර මුදල් විනාශ කිරීමට හැකියාව ලැබිණි.

## 5.2 ව්‍යවහාර මුදල් මුද්‍රණය සහ ටංකනය

### (අ) සංසරණය සඳහා ව්‍යවහාර මුදල් මුද්‍රණය සහ ටංකනය

ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහාත්, හොඳ තත්ත්වයේ නෝට්ටු සංසරණයෙහි පවත්වාගෙන යෑම සඳහාත්, හදිසි අවස්ථාවන්හි දී භාවිතයට ගත හැකි මුදල් සංචිත ප්‍රමාණවත් ලෙස පවත්වා ගෙනයාම සඳහාත් 2014 වසර තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 115 ක් මුද්‍රණය කිරීමට සහ කාසි මිලියන 295 ක් ටංකනය කිරීමට කටයුතු යොදන ලදී. තවද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2014 - 2017 කාලය සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල් නෝට්ටු අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා මුදල් නෝට්ටු මුද්‍රණ සමාගම වන ඩි ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පෞද්ගලික) සමාගම සමඟ ගිවිසුම් අත්සන් කරන ලදී. මුදල් නෝට්ටුවල කල්පැවැත්ම වැඩිකිරීම සඳහා මුද්‍රිත කඩදාසියේ ඝනකම වැඩිකිරීම සහ අඩු වටිනාකම්

සහිත මුදල් නෝට්ටු සඳහා වාර්නිෂ් ආලේපයක් හඳුන්වා දීම වැනි ගුණාත්මක වැඩිදියුණු කිරීම් කිහිපයක්ම සිදු කර ඇත.

**(ආ) පරිපාලන දිස්ත්‍රික්ක 25 නියෝජනය කරන රු.10 නව කාසි කාණ්ඩය**

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 නියෝජනය කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කවලට අනන්‍ය වූ ලක්ෂණ/විශේෂිත ස්ථාන පිළිබිඹු කෙරෙන නිර්මාණ සහිතව රු.10 නව කාසි කාණ්ඩයක් 2014 නොවැම්බර් මස 17 වන දින ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී. මෙම කාසි නිර්මාණය කිරීම සඳහා ජාතික මට්ටමේ තරගාවලියකින් චිත්‍ර ශිල්පීන් තෝරා ගනු ලැබූ අතර එම ජයග්‍රාහකයින්ට සම්මාන ප්‍රදානය කරන ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සමරු අයිතමයක් ලෙස දිස්ත්‍රික්ක 25 නියෝජනය කරන කාසි ඇතුළත් ඇසුරුම් සහ තනි කාසියක් සහිත ඇසුරුම් ශ්‍රී ලංකා මහ බැංකු කෞතුකාගාර හරහා අලෙවි කිරීමට කටයුතු කරන ලදී. මෙම නව රු. 10 දිස්ත්‍රික්ක කාසි කාණ්ඩය එළිදැක්වීමට සමගාමීව "Our People, Our Potential, Our Pride" යන නමින් වූ විධා නිවුම් පුස්තකයක් ද නිකුත් කරන ලදී.

**(ඇ) සමරු කාසි නිකුත් කිරීම**

2014 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සමරු කාසි 3 ක් ටංකනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ඒවා නම්, මුහුණත වටිනාකම රු. 500 කින් යුතු සංසරණය සඳහා නොවන ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වැනි ජන්ම දින සැමරීම සහ අති උතුම් ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ශ්‍රී ලංකා ගමන (සුදතුම් පිය ශ්‍රී ලංකා ගමන - 2015) සැමරීම සඳහා නිකුත් කරන ලද කාසි සහ රුපියල් 5 සංසරණය සඳහා වන ලංකා බැංකුවේ 75 වැනි සංවත්සරය වෙනුවෙන් සකස් කරන ලද කාසිය වේ. තවද, කොළඹ පිහිටි ආර්ථික ඉතිහාස කෞතුකාගාරය ඇතුළත්ව ශ්‍රී ලංකා මහබැංකු ප්‍රාදේශීය කාර්යාලවල පිහිටි කෞතුකාගාර මගින් සමරු අයිතම 11,324 ක ප්‍රමාණයක් පසුගිය වසර තුළම අලෙවි කර ඇත.

## 5.3 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට ලබාදුන් සහාය

2014 වසර තුළ දී, මුදල් නීති පනතේ ව්‍යවහාර මුදල් සම්බන්ධව විධිවිධාන උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පහත සඳහන් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නයන්ට අදාළව පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශය හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ඉතා සමීපව සහයෝගයෙන් කටයුතු කරන ලදී. 2014 වසර තුළ දී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු ගණන 8,266 ක් වූ අතර එය සංසරණයේ පැවති අව්‍යාජ නෝට්ටු මිලියනයකට ව්‍යාජ නෝට්ටු 9.57 ක් විය.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු සකස් කිරීම පිළිබඳව උසාවියේ ඉදිරි කටයුතු සඳහා නිශ්චිත සාක්ෂි වශයෙන් සහතික 207 ක් අධිපතිතුමාගේ අත්සනින් අනුමතව නිකුත් කරනු ලැබිණි.

(ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳව අධිකරණවල විභාග වන නඩු 22 කට අවශ්‍ය සාක්ෂි ලබා දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පෙනී සිටිනු ලැබීය.

## 5.4 මහජනතාව දැනුම්වත් කිරීම

ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම මෙන්ම මුදල් නෝට්ටු හා කාසි භාවිතයේ දී ඇතිකර ගත යුතු යහපත් පුරුදු පිළිබඳව මහජනයා සහ මහජන නියෝජිතයින් දැනුම්වත් කිරීමේ අරමුණින් පහත විස්තර කර ඇති වැඩසටහන් මාලාවන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී.

(අ) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය සහ ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු පිළිබඳව සම්මන්ත්‍රණ/වැඩමුළු 41 ක් බැංකු විදුපියෙසදීත්, විවිධ වාණිජ බැංකුවලදීත්, මාර්ග සංවර්ධන අධිකාරියේදීත්, ජාතික ප්‍රවාහන කොමිසමේදීත්, විවිධ ජාතික පාසැල්වලදීත් පවත්වන ලදී.

(ආ) රූපවාහිනී නාලිකා අටක සහ විවිධ පොදු ස්ථානයන්හි පිහිටුවන ලද ඩිජිටල් එල්.සී.ඩී තිර මඟින් ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ ඒවා සැකසීමේ ඇති ප්‍රතිවිපාක දැක්වෙන දැන්වීම් ප්‍රචාරය කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මීට අමතරව, පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය සහ ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීමේ ප්‍රතිවිපාක දැක්වෙන තොරතුරු පත්‍රිකා මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් බෙදාහරින ලදී.

(ඇ) කුලියාපිටිය, මහනුවර, මාකඳුර, තෙලිජ්ජවිල සහ කොළඹ පවත්වන ලද ප්‍රදර්ශන පහේ දී ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කරන ලදී.

(ඈ) පාසැල් සිසුන්, විදේශික සංචාරකයින් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළුව 15,000 ක පමණ පිරිසකට ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් මුදල් කෞතුකාගාර තුන නැරඹීමට පහසුකම් සලසන ලදී.

## 5.5 ව්‍යවහාර මුදල් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවසර ලබාදීම

දැන්වීම් සඳහා මුදල් නෝට්ටු ප්‍රතිනිර්මාණය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුකූලව අනුමැතීන් 3 ක් ලබා දෙන ලදී. මෙම ප්‍රතිපත්තිය පිළිබඳව තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# 6. දේශීය කටයුතු

## 6.1 දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනත යටතේ පැවරී ඇති විධිවිධාන අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන කාර්යයන් වන විවට වෙළෙඳ කටයුතු පවත්වාගෙන යෑම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව බලාත්මක කිරීම සහ වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීම යන ප්‍රධාන කාර්යයන්හි නිරත විය. එමෙන්ම දෙපාර්තමේන්තුව තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ගෙවීම් සහ පියවීම් කටයුතු සුමටව පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දෛනික ද්‍රවශීලතා පහසුකම් ලබාදෙමින් කාර්යක්ෂම හා ඵලදායී ගෙවීම් සහ පියවීම් පද්ධතියක් පවත්වාගෙන යෑම සඳහා පහසුකම් සලසන ලදී.

## 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

මිල ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තවදුරටත් කෙටිකාලීන පොලී අනුපාතිකවල අපේක්ෂිත වෙනස්කම් සිදු කිරීම මත රඳා පැවතුණි. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳ කටයුතු හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. කෙටිකාලීන පොලී අනුපාතික, මුදල් මණ්ඩලය මගින් තීරණය කරනු ලබන නිත්‍ය පහසුකම් කොරිඩෝවෙහි අපේක්ෂිත මට්ටමක පවත්වා ගැනීමට නිත්‍ය පහසුකම සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ද වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

පසුගිය වසර කිහිපය තුළ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුවෙහි සැලකිය යුතු වෙනස්කම් රාශියක් සිදුවිය. 2013 මැයි මස සිට සංචිත ගණනය කිරීමේ සහ පවත්වා ගැනීමේ කාලපරිච්ඡේදය සතියක සිට මාසයකට දෙවරක් දක්වා දීර්ඝ කරන ලද අතර එය අන්තර් බැංකු වෙළඳපොළ පොලී අනුපාතිකවල විචලනය අවම කරමින් වාණිජ බැංකුවලට සිය දෛනික ද්‍රවශීලතාව සුමටව කළමනාකරණය කරගැනීමට ප්‍රමාණවත් අවකාශයක් ලබා දෙන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව නිත්‍ය පහසුකම් කොරිඩෝව ලෙස 2014 සිට නම් කරන ලදී. ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස නම් කරන ලදී. 2014 පෙබරවාරි 03 වැනි දින සිට නිත්‍ය තැන්පතු පහසුකම සුරැකුම්පත් රහිත තැන්පතුවක් බවට පත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 6.50 ක් ලෙස නොවෙනස්ව තබා ගනිමින් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 සිට සියයට 8.00 දක්වා අඩුකර නිත්‍ය පහසුකම් කොරිඩෝවෙහි පරාසය පෙර පැවති පදනම් අංක 200 සිට පදනම් අංක 150 ක් දක්වා අඩු කරන ලදී. තවද, 2014 අප්‍රේල් මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම මත මුදල් අමාත්‍යාංශය විසින් නිත්‍ය තැන්පතු පහසුකමෙහි පොලිය රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීමට සංශෝධන හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල පැවැති විෂමතාව ඉවත්ව ගිය අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයෙහි සඵල පොලී අනුපාතිකය කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික සමඟ සමපාත විය.

## 6.3 වෙළඳපොළ වර්ධනයන්

2013 අගෝස්තු ආරම්භයේ සිට දේශීය වෙළඳපොළෙහි සැලකිය යුතු අතිරික්ත සංචිත ප්‍රමාණයක් දක්නට ලැබුණි. ඉන්පසු මෙය තවදුරටත් ඉහළගොස් 2014 වසර මුළුල්ලේම මුදල් වෙළඳපොළෙහි අතිරික්ත සංචිත ප්‍රමාණයක් පැවතිණි. අතිරික්ත සංචිතවල වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල් යොදා ගැනීමයි. මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම, විදේශ ණය ලබා ගැනීම්වල විදේශ මුදල් මහ බැංකුව විසින් අවශෝෂණය කරගැනීම සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සහ විනිමය අනුපාතිකයෙහි විචලනය අවම කිරීමට විදේශ විනිමය වෙළඳපොළෙහි සිදු කරන ලද මැදිහත්වීම් මෙම වර්ධනය සඳහා බලපෑ අනෙකුත් සාධක වේ.

2013 වසර අවසානයේ දී රුපියල් බිලියන 71.7 ක් පමණ වූ සමස්ත අතිරික්ත සංචිත ඉන්පසුව 2014 දෙසැම්බර් ආරම්භයේ දී රුපියල් බිලියන 378.8 දක්වා ඉහළ ගොස්, 2014 අවසානය වන විට රුපියල් බිලියන 325.6 ක් දක්වා අඩු විය. 2014 වසර තුළ දී අතිරික්ත සංචිත රුපියල් බිලියන 89-378.8 ක පරාසය තුළ පැවතුණු අතර එහි සාමාන්‍යය රුපියල් බිලියන 266 ක් විය. වෙළඳපොළෙහි පැවති පෙර නොවූ විරූ ඉහළ අතිරික්ත සංචිත මට්ටම මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමෙහිලා විශාල අභියෝගයක් විය. අඛණ්ඩව පැවති ඉහළ අතිරික්ත සංචිත හේතුකොටගෙන ඇතිවන අහිතකර බලපෑම මැඩපවත්වන අතරම, පෞද්ගලික අංශයට ණය අරමුදල් ගලායාම වැඩි කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් අන්තර් බැංකු වෙළඳපොළෙහි පවත්වා ගැනීම තහවුරු කිරීම ද අවශ්‍ය විය. ඒ අනුව, කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීම සඳහා ඒක්ෂණ ප්‍රතිමිලදී ගැනුම්, කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් සහ කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි, විවිධ අවස්ථාවලදී පවත්වන ලදී. මෙම ක්‍රියාවලියේ දී කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි හරහා අතිරික්ත සංචිත අවශෝෂණය කර ගැනීම තුළින් වෙළඳපොළෙහි පැවැති ඉහළ අතිරික්ත සංචිත අඩු කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලදී. විවට වෙළඳ කටයුතු සඳහා ඉහළ සහ පහළ පොලී අනුපාතික සීමාව නිර්මාණය කරමින් දෛනික පදනම මත නිත්‍ය පහසුකම් ද සපයන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් මත වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව වසර මුළුල්ලේම සියයට 6 ක මට්ටමේ පවත්වා ගැනුණි.

මෙලෙස සිදුකරන ලද අතිරික්ත ද්‍රවශීලතා අවශෝෂණ ක්‍රියාකාරකම් හේතුවෙන් මහ බැංකුව දෛනික ඒක්ෂණ අතිරික්ත සංචිත, සාමාන්‍යය රුපියල් බිලියන 29.1 ක හිතකර මට්ටමේ පවත්වා ගැනීමට සමත් විය. 2014 ජනවාරි අවසානය දක්වා සියයට 7 ඉක්මවා පැවතුණු බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉන් පසුව ක්‍රමයෙන් අඩුවෙමින් එය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාව තුළ ස්ථායීව පැවතුණි. පෞද්ගලික අංශය වෙත නිකුත් කරන

ණය ඉහළ දැමීම අරමුණු කොට 2014 සැප්තැම්බර් 23 දා සිට සියයට 6.50 පොලී අනුපාතිකය යටතේ මසකට සිදුකළ හැකි නිත්‍ය තැන්පතු පහසුකම් වාර තුනකට සීමා කළ අතර අවස්ථා තුන ඉක්මවා නිත්‍ය පහසුකම භාවිතා කිරීමේදී අදාළ පොලී අනුපාතිකය වාර්ෂික සියයට 5 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් අඩු වී සියයට 6.00 මට්ටමේ ස්ථාවර වූ අතර එය වසර අවසානය තෙක් එම මට්ටමේ පැවතිණි. එක් දින ද්‍රවශීලතා හිඟය පියවීම සඳහා වසර තුළ අවස්ථා කිහිපයක දී ම නිත්‍ය ණය පහසුකම පිරිනැමීම සිදු කරන ලදී.

මේ අතර, මුදල් වෙළඳපළෙහි අතිරික්ත සංචිත ප්‍රමාණය අඛණ්ඩවම මහ බැංකුව සතු භාණ්ඩාගාර සුරැකුම්පත් ප්‍රමාණය ඉක්මවා පැවතිණි. එම නිසා, අතිරික්ත ද්‍රවශීලතා අවශෝෂණය කිරීමේ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සඳහා භාණ්ඩාගාර සුරැකුම්පත් ණයට ලබා ගැනීමේ වැඩසටහන යටතේ ලබාගත් සුරැකුම්පත් ප්‍රමාණවත් නොවීය. ද්‍රවශීලතා අවශෝෂණ ක්‍රියාවලිය සුමටව පවත්වා ගැනීමට පහසුකම් සලසනු වස් එවකට පැවති බිලියන 150 ක් වූ භාණ්ඩාගාර සුරැකුම්පත් ණය සීමාව වැඩිවන ද්‍රවශීලතා ප්‍රමාණයට සරිලන පරිදි ඉහළ නංවන ලදී.

### 6.3.1 විවට වෙළෙඳ කටයුතු

**(අ) දෛනික වෙන්දේසි**

**(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

2013 වසරේ දී අතිරික්ත සංචිතයෙන් වැඩිප්‍රමාණයක් දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි හරහා අවශෝෂණය කළ ද, 2014 වසරේ දී කෙටිකාලීන සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. 2014 වසරේ දී දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි 22 ක් පමණක් පවත්වන ලදී. සාමාන්‍ය වශයෙන්, දෛනිකව රුපියල් බිලියන 19.6 ක පමණ දෛනික වෙන්දේසි පිරිනැමූ අතර, අතිරික්තයක් පවතින දිනයන්හි අතිරික්ත සංචිතයෙන් සියයට 3.3 ක පමණ ප්‍රමාණයක් අවශෝෂණය කරගනු ලැබීය. ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවල බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 5.6 ත් සියයට 6.6 ත් අතර පැවතිණ.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

වසර මුළුල්ලේම දේශීය වෙළඳපොළ තුළ අතිරික්ත සංචිතයක් පැවතුණි. එබැවින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් දෛනික පොලී අනුපාතිකය ඉහළ යෑමට පැවති පීඩනය මැඩපැවැත්වීම සඳහා එක් වතාවක් පමණක් දෛනික ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් පවත්වන ලදී. එම වෙන්දේසියේදී රුපියල් බිලියන 4.0 ක් සියයට 6.72 ක බරතබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතයකට පිරිනමන ලදී.

**(ආ) නිරන්තර වෙන්දේසි**

**(i) කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

2014 වසරේ දී බහුල වශයෙන් කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පැවැත්විණි. අතිරික්ත ද්‍රවශීලතාව සතියක් දක්වා වූ කාල පරාසයකට අවශෝෂණය කරගැනීමේ පිළියමක් වශයෙන්, එදිනම ගෙවීම් පදනම මත කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි 2013 අගෝස්තු මාසයේ දී හඳුන්වා දෙන ලදී. 2014 වසරේ පළවෙනි කාර්තුවේ දී කෙටිකාලීන වෙන්දේසි හරහා සිදුකරන ලද සමස්ත මාසික අවශෝෂණය කිරීම් සමස්ත අවශෝෂණ කිරීම්වලින් සියයට 20 ක් වූ අතර, එය වසර අවසානය වන විට ක්‍රමයෙන් සියයට 10 ටත් වඩා අඩු විය. සාමාන්‍යය සැලකූ විට කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් හරහා දෛනිකව රුපියල් බිලියන 23.5 ක ප්‍රමාණයක් පිරිනැමුණු අතර රුපියල් බිලියන 15.4 ක ප්‍රමාණයක් අවශෝෂණය කර ගන්නා ලද අතර එහි බරතබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 5.59 ත් සියයට 7.09 ත් අතර පැවතුණි.

**(ii) කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2014 වසර මුළුල්ලේම අඛණ්ඩවම වෙළඳපොළේ අතිරික්ත සංචිත පැවතුණ බැවින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපවත්වන ලදී.

**(ඇ) දිගුකාලීන වෙන්දේසි**

**(i) දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

වසර ආරම්භයේදී අතිරික්තව පැවති වෙළඳපොළේ ද්‍රවශීලතාව, ඉන්පසුව ක්‍රමානුකූලව ඉහළ ගියේය. සැලකිය යුතු කාලසීමාවකට පසුව 2013 වසරේ දෙසැම්බර් මස නැවත සක්‍රීය වූ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි, 2014 වසර තුළ දී මුදල් වෙළඳපොළ තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා බෙහෙවින් උපයෝගී කරගන්නා ලදී. බොහෝ අවස්ථාවල දී කාලීන ප්‍රතිමිලදී ගැනුම් තුළින් සිදු කළ සමස්ත මාසික අතිරික්ත ද්‍රවශීලතා අවශෝෂණ මට්ටම සියයට 80 ඉක්මවා පැවති අතර 2014 නොවැම්බර් මස දී එය සියයට 90 මට්ටම ඉක්මවීය. වසර තුළ දී බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 5.88 සහ සියයට 6.85 අතර පැවතුණි. 2014 වසරේ දී කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවල කල්පිරීමේ කාලය දින 11 සහ 78 ත් අතර කාලපරාසයක පැවතුණ ද, සිදු කළ වෙන්දේසිවල කල්පිරීමේ කාලය බොහෝ දුරට දින 35, දින 56 සහ දින 77 වැනි කාලසීමාවන්ට සීමාවිය.

(ii) **කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2014 වසර තුළ දී, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපවත්වන ලදී.

**(ඈ) නිත්‍ය පහසුකම්**

අන්තර් බැංකු මුදල් වෙළඳපොළ සහ මහ බැංකුවේ විවට වෙළඳපොළ දෛනික වෙන්දේසි තුළින් සිය කෙටිකාලීන අරමුදල් අවශ්‍යතා කළමනාකරණය කරගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතන සඳහා මහ බැංකු නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වසර පුරාම සිදු කරන ලදී. 2014 වසරේ දී නිත්‍ය පහසුකම් යටතේ සිදු කරන ලද මුළු නිත්‍ය තැන්පතු පහසුකම්වල වටිනාකම රුපියල් බිලියන 5,181.6 ක් වූ අතර එහි දෛනික සාමාන්‍යය, රුපියල් බිලියන 21.4 ක් විය. 2014 වසරේ දී නිත්‍ය ණය පහසුකම්වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 9.8 ක් විය.

**II-3 රූප සටහන** **සමස්ත ද්‍රවශීලතාව සහ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව**




**(ඉ) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා සිය ආයෝජන කළඹ සතු භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත අලෙවි කිරීමට වෙන්දේසි පවත්වන ලදී. කෙසේ වෙතත්, 2014 වසරේ දී ඉදිරිපත් කරනු ලැබූ මිල ගණන් වෙළඳපොළ තුළ පැවති මිල ගණන් සමග අනුගත නොවූ නිසා සහ ඉදිරිපත් කරනු ලැබූ මිල ගණන් තුළින් වෙළඳපොළ මිල ගණන් විකෘති විය හැකි බැවින් ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් අලෙවියක් සිදු නොවිණි.

### 6.3.2 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ කොන්දේසි සහ විධිවිධානවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම් පදනම් කරගෙන මහ බැංකු ජංගම ගිණුමේ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ලෙස හඳුන්වනු ලැබේ. වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත පරිපාලනය සහ එහි අනුකූලතාව පවත්වාගෙන යාමෙහි වගකීම දේශීය කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ. වාණිජ බැංකුවල මුළු රුපියල් තැන්පතු වගකීම් වලින් සියයට 8 ක් වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය, 2013 ජූලි 01 වැනි දින සිට සියයට 6 දක්වා පහත දමන ලදී.

### 6.3.3 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකු වලට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් මෙම වසර තුළ දී ඇති නොවුණු අතර, මෙම බැංකු අනුපාතිකය හුදෙක් ශාස්ත්‍රීය වැදගත් කමක් පමණක් දැරීය.

## 6.4 වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

### 6.4.1 මූල්‍ය ආයතනවල ගිණුම්

මහ බැංකුවට වාණිජ බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් හා පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සපයන ලදී. 2014 වසර අවසාන වන විට මහ බැංකුව විසින් වාණිජ බැංකු සඳහා ගිණුම් 25 ක් ද ප්‍රාථමික වෙළෙඳුන් සඳහා ගිණුම් 8 ක් ද පවත්වාගෙන යන ලදී. මෙම ගිණුම් ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවුම් පදනමක් මත ක්‍රියාත්මක විය.

### 6.4.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් රජයට අවශ්‍ය බැංකු පහසුකම් ලබා දෙමින් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන හා සංස්ථා සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය ගිණුම් පවත්වාගෙන යන ලදී. 2014 වසර අවසාන වන විට, මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ මුළු ගිණුම් සංඛ්‍යාව 60 ක් විය. වසර තුළ දී, රජයේ ඉල්ලීම මත නව ගිණුම් 3 ක් විවෘත කළ අතර එක ගිණුමක් වසා දැමීමට කටයුතු කරන ලදී. මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් රජයට පොලී රහිතව අත්තිකාරම් ලබා දුන් අතර මෙකී අත්තිකාරම් රජයේ ඉදිරි වසරේ ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 10 ක් නොඉක්මවීය. රජයේ ඇස්තමේන්තුගත ආදායම් ඉහළ යෑම හේතුවෙන්, 2014 වසර තුළ රජයට සැපයිය හැකි තාවකාලික අත්තිකාරම්වල වටිනාකම් සීමාව රුපියල් බිලියන 18.0 කින් ඉහළ ගොස් මුළු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 146.3 ක් විය. 2013 වසර අවසානයේ ලබාගත්

මුළු අත්තිකාරම් වටිනාකම වූ රුපියල් බිලියන 109.2 ට සාපේක්ෂව 2014 වසර අවසානයේ දී එය රුපියල් බිලියන 143.9 ක් විය.

### 6.5 එක්දින ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව සිදු කිරීම සහතික කිරීමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත දෛනික ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් දිනය තුළ දී ද්‍රවශීලතා පහසුකම් සැපයීම්, ගාස්තුවකින් තොරව සිදු කළ අතර, එකී සුරැකුම්පත්වල වටිනාකම, ඒවායේ වර්තමාන මිල ගණන් මත එම දිනය තුළ සිදුවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් ගැළපීමක් සහිතව ගණනය කරන ලදී.

2014 වසර තුළ ලබාගත් මුළු එක් දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය හා දෛනික වටිනාකමේ සාමාන්‍යය, පිළිවෙළින් රුපියල් බිලියන 5,144 ක් සහ රුපියල් බිලියන 21.3 ක් විය. පසුගිය වසරේ මෙම අගයන්, පිළිවෙළින් රුපියල් බිලියන 4,674.1 ක් හා රුපියල් බිලියන 19.2 ක් විය.

II-4 රූප සටහන
2014 වසරේ දී ලබාගත් එක් දින ද්‍රවශීලතා පහසුකම්




### 6.6 මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන විවිධ මූල්‍ය ආයතනවල කටයුතු නියාමනය කිරීමේ වැඩපිළිවෙළ පුළුල් කිරීම අරමුණු කර ගනිමින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 10 (ඇ) වගන්තිය යටතේ 2013 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි "2013 අංක 01 දින මුදල් තැරැව්කරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ රෙගුලාසි" නිකුත් කරන ලදී. මේ යටතේ මුළු මුදල් තැරැව්කරුවන්ගේ සමාගම් ගණන වන සමාගම් 9 සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කර ඇති අතර ඒවා "බලයලත් මුදල් තැරැව්කරුවෝ" ලෙස නම් කරන ලදී. 2014 වසර තුළ බලයලත් මුදල් තැරැව්කාර ආයතන සංඛ්‍යාව නොවෙනස්ව පැවතුණි. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වසර තුළ දී බලයලත් මුදල් තැරැව්කාර සමාගම් 6 ක එතැන් පරීක්ෂණ පවත්වා ඇති අතර ඉන් ආයතන 4 ක අධ්‍යක්ෂ මණ්ඩල සමඟ රැස්වීම් පවත්වා ඇත.

## 7. ආර්ථික පර්යේෂණ

1949 මුදල් නීති පනතේ 25 වැනි වගන්තියට අනුව මුදල් මණ්ඩලයට සහ අධිපතිවරයාට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වීමේ අරමුණින් සහ මුදල් හා බැංකු ක්ෂේත්‍රය පිළිබඳව මෙන්ම අනෙකුත් වැදගත් ආර්ථික විෂයයන් පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම සඳහා ආර්ථික පර්යේෂණ සිදු කිරීමේ අරමුණින් යුතුව 1950 වසරේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම වගකීම් ඉටු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට මහ බැංකුවේ කාර්යභාරයන් සහ වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම තොරතුරක් ඕනෑම පුද්ගලයෙකුගෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය බලය මුදල් නීති පනත මගින් ලබා දී ඇත.

ඉහළ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම මෙන්ම, බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම වැනි ප්‍රධාන වගකීම් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. කළමනාකාරිත්වයට සහ මුදල් මණ්ඩලයට කාලීන සහ විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය නිර්දේශ සැපයීම හේතුවෙන් 2014 වසරේ ආර්ථික ප්‍රතිලාභ ගණනාවක් අත්කර ගන්නා ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළ දී දේශීයව, කලාපීයව සහ ගෝලීය වශයෙන් වැදගත් කරුණු සම්බන්ධව අඛණ්ඩ පර්යේෂණ සිදු කරන ලදී. රජයේ ආර්ථික උපදේශක ලෙස, රට තුළ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රමෝපාය සම්බන්ධව රජයට අවශ්‍ය විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය උපදේශන සැපයීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වසර තුළ දී දත්ත බෙදාහැරීමේ, දැනුම බෙදාහැරීමේ සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ කටයුතුවල ක්‍රියාකාරීව නියැළුණේ ය.

### 7.1 ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම

මුදල් සැපයුමේ ප්‍රසාරණය පිළිබඳ අපේක්ෂිත දිශාව වසර ආරම්භයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කළ අතර ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා මූර්ත, විදේශීය, රාජ්‍ය මූල්‍ය හා මුදල් යන ආර්ථිකයෙහි ප්‍රමුඛ අංශවල ප්‍රවණතා හා වර්ධනයන් වසර මුළුල්ලේම සමීපව නිරීක්ෂණය කරන ලදී. මුදල් හා සාර්ව ආර්ථික කටයුතුවල සිදු විය හැකි වර්ධනයන් ඇගැයීමට ලක් කරමින් සහ මුදල් මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරි මුදල් ප්‍රතිපත්තියේ දිශාව සම්බන්ධයෙන් උචිත නිර්දේශ ඉදිරිපත් කරමින් සාර්ව ආර්ථික සංඛ්‍යා සහ දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම, මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත අවශ්‍ය තාක්ෂණික තොරතුරු සම්පාදනය කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලියේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්භාවිතා ඝනත්ව ශ්‍රිතය (Fan Charts) මත පදනම්ව මතුපිට හා මූලික උද්ධමන පුරෝකථන සම්පාදනය කළ අතර

නිමැවුම් පරතර විශ්ලේෂණය සිදු කරන ලදී. මීට අමතරව, වසර තුළ දී සිය ගණිත හා ආර්ථිකමිතික ආකෘතිමය හා පුරෝකථන ශක්‍යතා වර්ධනය කර ගැනීමට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් කටයුතු කරන ලදී. ඊට අදාළව, ශ්‍රී ලංකාව සඳහා ගතික අනුමානික පොදු සමතුලිතතා (Dynamic Stochastic General Equilibrium) ආකෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී. තවද, මුදල් සහ මූල්‍ය සංඛ්‍යාන වැඩිදියුණු කිරීමට උපකාරී වීම සඳහා 2015 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහයෝගිතා කණ්ඩායමක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිය හ. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පෞද්ගලික අංශයේ අදහස් ලබා ගැනීමේ අරමුණෙන් පිහිටුවන ලද මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ මාසික රැස්වීම් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පහසුකම් සපයන ලදී.

සාමාන්‍ය ජනතාවගේ උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, සන්නිවේදනය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරන බැවින් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ හා වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව ක්‍රියා කරන ලදී. ඒ අනුව, සාමාන්‍ය ජනතාවට සහ වෙළෙඳපොළ සහභාගිවන්නන්හට දිගුකාලීන දැක්මක් සහිතව වඩා නිවැරදි තීරණ ගැනීමට ඉඩ ලබා දෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුව වසර ආරම්භයේ දී ''2014 සහ ඉන් ඉදිරිය සඳහා වන සිය මුදල් ප්‍රතිපත්ති පෙරදැක්ම'' ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ මාසික මුදල් ප්‍රතිපත්ති පුවත්පත් නිවේදන මගින් මහජනතාවට දැනුම් දෙන ලදී. මේ හරහා වෙළෙඳපොළ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ අනිසි පුරෝකථන වළක්වාලීමට හැකි විය. වසර 5 කට වඩා වැඩි කාලයක් අඩු උද්ධමනකාරී වාතාවරණයක් පවත්වාගෙන යෑම සහ මෙතෙක් වාර්තා වූ අඩුම පොලී අනුපාතික පවත්වාගෙන යෑම හරහා පෞද්ගලික අංශයට ණය ගලා යෑම තහවුරු කිරීම තුළින් ආර්ථික වර්ධනයට අවශ්‍ය දිරිගැන්වීම ලබාදීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ හා එම ප්‍රතිපත්ති නිසිකලට ක්‍රියාත්මක කිරීම මහත් සේ ඉවහල් විය.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා විදේශීය අංශයේ වර්ධනයන් අධීක්ෂණය හා ඇගයීම සහ සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. විදේශීය අංශයේ වර්ධනයන් පුවත්පත් නිවේදන මගින් මාසිකව මහජනතාව වෙත සන්නිවේදනය කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළ දී අඛණ්ඩව විදේශීය අංශය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකසීම සහ ප්‍රකාශනය වැඩිදියුණු කරන ලදී. ගෙවුම් තුලනය පිළිබඳ අත්පොතෙහි හයවන සංස්කරණයට අනුව කාර්තුමය පදනම මත ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම, ගෙවුම් තුලනය පිළිබඳ අත්පොතෙහි හයවන සංස්කරණයට අනුව විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ලෝක බැංකුවට ඉදිරිපත් කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ආරම්භ කරන ලද විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය (CDIS) සඳහා දායක වීම සහ මාසිකව ජාත්‍යන්තර සංචිත දත්ත සටහන (RDT) ප්‍රකාශයට පත් කිරීම ආදිය මෙසේ සිදු කරන ලද වැඩිදියුණු කිරීම්වලට ඇතුළත් විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශයෙහි සමාගම් 2,000 කට වැඩි ප්‍රමාණයක් ආවරණය කෙරෙන පරිදි නව සමීක්ෂණ කිහිපයක් ආරම්භ කරන ලදී. ඒ අතුරින් ප්‍රධානතම සමීක්ෂණයක් වූයේ පෞද්ගලික අංශයේ සමාගම්වල විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු රැස්කෙරෙන ජාත්‍යන්තර ආයෝජන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයයි. එයට අමතරව, සේවා අංශය ආවරණය කෙරෙන සමීක්ෂණ 8ක් ද හඳුන්වා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති කමිටුව, වෙළෙඳපොළ සහ මෙහෙයුම් කමිටුව වැනි විවිධ කමිටු සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයන් ලබාදීම අඛණ්ඩව සිදු කරනු ලැබිණි. විදේශ විනිමය වෙළෙඳපොළ තත්ත්වය මෙන්ම දේශීය මුදල් මත ඇති පීඩනය අධීක්ෂණය කිරීම සඳහා, විනිමය අනුපාතිකය, පොලී අනුපාතිකය සහ ජාත්‍යන්තර සංචිතය යන විචල්‍යවල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් විදේශ විනිමය වෙළෙඳපොළ පීඩන දර්ශකයක් සැකසීම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාව වර්තමානයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනුගමනය කරන සාමාන්‍ය දත්ත ව්‍යාප්ත සම්මතයේ (General Data Dissemination System) සිට විශේෂිත දත්ත ව්‍යාප්ත සම්මතයට (Special Data Disseminatin Standard) දායක වීම සඳහා අවශ්‍ය කටයුතු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. විශේෂිත දත්ත ප්‍රචාරණ සම්මතයට පිවිසීම මගින් දත්ත සම්පාදනය හා ප්‍රසිද්ධ කිරීමේ ගුණාත්මක සහ විනිවිදභාවය තහවුරු වනු ඇත. තවද, 2015 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහයෝගිතා කණ්ඩායම විශේෂිත දත්ත ප්‍රචාරණ සම්මතයට පිවිසීමේ ප්‍රගතිය සමාලෝචනය කළ අතර, එහිදී මෙම ක්‍රියාවලිය පිළිබඳ සාධනීය ප්‍රතිචාර ලබා දී ඇත. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සංචාරක පරිවාර ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කළ අතර, වසර තුළ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් රැස්වීම් කිහිපයක්ම පවත්වන ලදී.

## 7.3 ව්‍යවස්ථාපිත සහ අනෙකුත් වාර්තා ප්‍රකාශයට පත් කිරීම මගින් තොරතුරු බෙදා හැරීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ප්‍රතිපත්ති පුරෝකථනය කිරීමේ හැකියාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම අරමුණු කොට සකස් කරනු ලබන මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන ''2014 සහ ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙරදැක්ම'' අඛණ්ඩව අටවන වරටත් සම්පාදනය කිරීම සම්බන්ධීකරණය කළ අතර, එය 2014 ජනවාරි මස 02 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

මුදල් නීති පනතේ 35 වන වගන්තිය පරිදි ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 වසර සඳහා මහ බැංකු වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම සකස් කර නියමිත කාලය තුළ දී ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. වාර්ෂික වාර්තාවේ ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, සාර්ව ආර්ථික සංවර්ධනයන් පිළිබඳව පුළුල් වශයෙන් විස්තර කර ඇති අතර, මහ බැංකුවේ ගිණුම් හා මෙහෙයුම් කටයුතු සහ සංඛ්‍යාලේඛන පරිශිෂ්ට ඇතුළත් වේ. මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තිය පරිදි 2015 වසරේ ජාතික අයවැය සකස් කිරීම සඳහා උපයෝගී කර ගැනීමට හැකිවන පරිදි, සැප්තැම්බර් 15 වාර්තාව ද ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. 2014 වසරේ පළමු මාස හය තුළ දී ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය, 2014 වසරේ ආර්ථික දැක්ම හා 2015 වසර පිළිබඳ මැදිකාලීන දැක්ම පිළිබඳ විග්‍රහයක් මෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් මහ බැංකුවේ අරමුණු ළඟා කර ගැනීම කෙරෙහි වන බලපෑම සහ 2015 අයවැය සඳහා යෝජනා මෙම රහස්‍ය වාර්තාවට ඇතුළත් විය. එයට අමතරව, මැත කාලීන ආර්ථික ප්‍රවණතා: 2014 සුවිශේෂී සිදුවීම් හා 2015 අපේක්ෂාවන් වාර්තාව ද 2014 නොවැම්බර් මස දී ප්‍රකාශයට පත් කරන ලදී.

පොදු මහජනතාවගේ යහපත පිණිස, විවිධ විෂයය ක්ෂේත්‍ර පිළිබඳව වැදගත් ආර්ථික දත්ත සහ තොරතුරු ලබා දීමේ වගකීම ඉටු කරනු පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් මුදල් ප්‍රතිපත්තිය, විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය සහ වෙනත් අවස්ථාවන්හි දී පැනනගින විශේෂ කරුණු හා සම්බන්ධව පුවත්පත් නිවේදන අඛණ්ඩව නිකුත් කළ අතර මාසික විවරණිකා මෙන්ම අනෙකුත් ආර්ථික හා මූල්‍ය තොරතුරු දිනපතා, සතිපතා හා මාසික පදනමින් මහ බැංකු වෙබ් අඩවියේ ද ප්‍රකාශයට පත් කරන ලදී. තවද, තොරතුරු ලබා දීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනවත් ආර්ථික සහ මූල්‍ය තොරතුරු ඇතුළත් සාර්ව ආර්ථික ප්‍රස්ථාර ගොනුව මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

## 7.4 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම

රජයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට විවිධ ආර්ථික ගැටලු පිළිබඳව පූර්වගාමී ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම 2014 වසරේ දී ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. සාර්ව ආර්ථික ස්ථායීතාව රැක ගැනීම සඳහා උචිත නිර්දේශ සැපයීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය වෙත ප්‍රතිපත්ති පත්‍රිකා කිහිපයක්ම ඉදිරිපත් කරන ලදී. "සැප්තැම්බර් 15 වාර්තාව" මගින් ඉදිරිපත් කළ ප්‍රතිපත්තිමය යෝජනාවන්ට අමතරව, වසර තුළ දී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 112 ක සාර්ව ආර්ථික බලපෑම් පිළිබඳව ස්වාධීන නිරීක්ෂණ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදී. තවද, මෙම දෙපාර්තමේන්තුව විසින් රජය ලබා ගැනීමට යෝජිත විදේශ ණය 23 කට අදාළ කොන්දේසි සහ මූල්‍යමය බලපෑම ඇගයීමට ලක් කළ අතර අදාළ අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද ණය දෙන ආයතන මගින් ස්වේච්ඡාවෙන් අර්පනය කරන ලද ණය යෝජනා පත්‍ර 48 කට අදාළ නිර්දේශ ද ලබා දෙන ලදී.

වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් අභ්‍යන්තර හා බාහිර ප්‍රතිපත්ති උපදේශන කමිටු රාශියකට සේවය ලබා දෙන ලදී. බාහිර කමිටු වශයෙන් ආයෝජන කමිටුව, ජාතික දත්ත කමිටුව, වාණිජ කේන්ද්‍රස්ථාන කමිටුව, ගිවිසුම් කාල නිම වූ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගේ වලංගු කාලසීමාව දීර්ඝ කිරීම විශ්ලේෂණය කිරීම සඳහා වන තාක්ෂණ-ආර්ථික උප කමිටුව, නිවාස සහ නාගරික සංවර්ධනය සඳහා වන තුන්වන එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව, සංචාරක පරිවාර ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන කමිටුව යනාදිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නියෝජනය කරන ලදී. මෙයට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විවිධ අමාත්‍යාංශ, අනෙකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන මගින් පැවැත්වූ රැස්වීම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සහභාගි විය.

මුදල් ප්‍රතිපත්ති කමිටුව, මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව වැනි රැස්වීම් සම්බන්ධීකරණය කිරීමට අමතරව දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මූල්‍ය ස්ථායීතා කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව වැනි අභ්‍යන්තර කමිටු රැසකට ද 2014 වසරේ දී සහභාගි විය.

## 7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම ලබාදීමේ ක්‍රියාකාරකම්

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වනුයේ රටේ පුළුල් සාර්ව ආර්ථික අරමුණ හා සමාන්තරව මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා මග පෙන්වීමට ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීමය. පසුගිය වසරවල මෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයට මුදල් ප්‍රතිපත්තිමය නිර්දේශ සඳහා පහසුකම් සැපයීම පිණිස මාසික මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම සඳහා දේශීය හා විදේශීය ප්‍රවණතා ද ඇතුළත්ව සවිස්තරාත්මක ආර්ථික හා මුදල් විශ්ලේෂණ වාර්තා පිළියෙල කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා දැනුම බෙදාහැරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීමට ස්ථාපිත කරන ලද පර්යේෂණ උපදේශක මණ්ඩලය, මාණ්ඩලික පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම, දෙපාර්තමේන්තුවේ ආර්ථික දේශන මෙහෙයවීම, ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පැවැත්වීම වැනි කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කාලීන ආර්ථික ගැටලු පිළිබඳව පර්යේෂණ කටයුතුවල නිරතවීමට "සාර්ව ආර්ථික ආකෘතිකරණ ඒකකය" (Macro Modeling Unit) තුළින් අවස්ථාව ලබා දෙන ලදී. මෙම ඒකකයේ සහාය ඇතිව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පර්යේෂණ පත්‍රිකා 6 ක් එළිදැක්වූහ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂණ ප්‍රකාශනය වන මාණ්ඩලික පත්‍රිකා 43 වන කලාපය දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සම්පාදිත විස්තීරණ පර්යේෂණ පත්‍රිකා 3 ක් සහිතව ආර්ථික

පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, 2014 වසරේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිම කරන ලද පර්යේෂණ පත්‍රිකා International Financial Markets, Institutions and Money සහ Journal of Business and Social Science වැනි ජාත්‍යන්තර අධ්‍යයන සඟරාවල පළ විය. ඒ සමගම, 2015 පෙබරවාරි මාසයේ තුර්කියේ පැවති ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් විසින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රචිත ලිපි "News Survey", "සටහන" වැනි මහ බැංකු ප්‍රකාශනවල මෙන්ම බාහිර ආයතනවල ප්‍රකාශනවල ද ප්‍රකාශයට පත් විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 39 ක් හා පර්යේෂණ යෝජනා 19 ක් ඇගයීමට ලක් කරන ලදී. තවද, පර්යේෂණ හැකියා වර්ධනය කිරීම පිණිස පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු මාලාවක් පැවැත්වීම සඳහා පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී. එහි පළමුවන වැඩමුළු මාලාවේ කටයුතු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අරමුණු කර ගනිමින් 2015 පෙබරවාරි මාසයේ දී ආරම්භ කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ දැනුම හුවමාරු කිරීමේ හා යාවත්කාලීන කිරීමේ අරමුණින් සම්මන්ත්‍රණ 20 ක් පවත්වන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් හා එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළ "උපාධිධාරී පුහුණුවන්නන්" ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් මෙන්ම දේශීය හා ගෝලීය ආර්ථික කරුණු මෙම සම්මන්ත්‍රණවල දී ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව හා එක්ව විවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තීයවේදීන්ට ඇරයුම් කර ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් බැංකු නිලධාරීන් හා බෙදා ගැනීමට "මාසික ආර්ථික සම්මන්ත්‍රණය" සංවිධානය කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මුදල් ප්‍රතිපත්තිය සහ මහ බැංකුකරණය පිළිබඳව රුචිකත්වයක් දක්වන මහ බැංකුව තුළ සහ පිටත සිටින පාර්ශ්වයන්ගේ දැනුම වැඩිදියුණු කිරීමට විශාල දායකත්වයක් දක්වන ලදී. ඒ අනුව, බැංකු විදු පියෙස, විශ්ව විද්‍යාල, පාසැල් සහ විවිධ රාජ්‍ය සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහා සම්පත් දායකයන් ලෙස කටයුතු කරන ලදී. 2014 වසරේ දී "තක්ෂිලාව" රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන, ''Vision 2020'' රූපවාහිනී වැඩසටහන, "Econ Icon" වැඩසටහන, "Interbank Quiz Competition" වැඩසටහන, වාර්ෂික අපනයන තිළිණ වැඩසටහන ආදී දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය විවිධ මට්ටමින් ලබා දෙන ලදී. තවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහ බැංකුවට පැමිණෙන දේශීය හා විදේශීය දූත මණ්ඩල සහ ආයෝජකයන් සඳහා වසර තුළ දී මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික සංවර්ධනයන් පිළිබඳ දේශන පවත්වන ලදී. තවද, විවිධ කර්මාන්තායතනවල ක්‍රියාකාරිත්වය සහ ගැටලු පිළිබඳ වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු විවිධ කර්මාන්තශාලාවල නිරීක්ෂණ චාරිකාවන්හි නියැළුණහ.

මහ බැංකුවේ, විශ්වවිද්‍යාලවල සහ වෙනත් පර්යේෂණායතනවල පර්යේෂකයන් අතර අදහස් හුවමාරු කර ගැනීම සහ මෑත කාලීන පර්යේෂණ තුළින් අනාවරණය වූ කරුණු ඉදිරිපත් කිරීම සඳහා නිසි ප්‍රවේශයක් සපයමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව 2014 වසරේ දී අඛණ්ඩව සත්වන වරටත් ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සාර්ථකව පවත්වන ලදී. "අභියෝගාත්මක ගෝලීය සහ දේශීය වාතාවරණයක් හමුවේ සංවර්ධනය සහ ස්ථාවරත්වය" යන මැයෙන් පවත්වන ලද සමුළුව සඳහා ඉදිරිපත් වූ පර්යේෂණ පත්‍රිකා 27 ක් අතුරින් ඉතා දැඩි ක්‍රියාපිළිවෙතක් තුළින් තෝරාගත් පර්යේෂණ පත්‍රිකා 8 ක් මෙම සමුළුවට ඉදිරිපත් කරන ලදී. 2014 වසරේ පැවැත්වූ මෙම ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක් ද සිය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ හ. මේ අතර, 2013 වසරේ පැවති සමුළුවේ සම්මන්ත්‍රණ පත්‍රිකා ප්‍රකාශනය ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

## 7.6 ජාත්‍යන්තර සංවිධාන සමග පවත්නා වූ සබඳතාව ශක්තිමත් කිරීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN), අග්නිදිග ආසියානු, නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA) සහ මහ බැංකු අධිපතිවරුන් සහ මුදල් ලේකම්වරුන්ගෙන් සමන්විත සාර්ක් මූල්‍ය ජාලය සමග ශ්‍රී ලංකාවේ කටයුතු සම්බන්ධීකරණය කරන ලද අතර, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට සහාය ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණවල දී ප්‍රතිපත්තිමය සංවාද සඳහා නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව 2014 වසරේ ජූලි මස 24 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ දී පවත්වන ලද 28 වැනි සාර්ක් මූල්‍ය ජාලයේ කණ්ඩායම් රැස්වීම් සහ සාර්ක් මූල්‍ය ජාලයේ අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා පහසුකම් සලසන ලදී. 28 වැනි සාර්ක් මූල්‍ය ජාලයේ කණ්ඩායම් රැස්වීම් සඳහා සාර්ක් කලාපයේ මහ බැංකු අධිපතිවරු සහ මුදල් අමාත්‍යාංශවල ලේකම්වරු, අනෙකුත් නියෝජිතයින් පිරිසක් සහභාගි වූහ. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අබුඩාබි විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ද්විපාර්ශ්වීය සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සහභාගි වූ අතර රෝමයේ Workshop Asia නමින් පැවැති ආයෝජන සාකච්ඡා, සූරිච් හි පැවැති තුන්වන ස්විස් ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුව සහ අනෙකුත් ආයෝජන කමිටු සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සහභාගි වී ඇත.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව මෙන්ම අන්තර්ජාතික ආයෝජකයන්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සහ උපදේශක ආයතන, තානාපතිවරුන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් වෙත යාවත්කාලීන ආර්ථික දත්ත ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ෆිච් රේටින්ග්ස් (Fitch Ratings), එස් ඇන්ඩ් පී රේටින්ග්ස් (S& P Ratings) සහ මූඩීස් රේටින්ග්ස් (Moody's Ratings) යන අන්තර්ජාතික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සමඟ සහ ණය ශ්‍රේණිගත කිරීමේ උපදේශක ආයතන සමඟ සමීපව කටයුතු කළ අතර ණය ශ්‍රේණිගත කිරීම හා සම්බන්ධ වාර්තා 7 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී. තවද, ජාත්‍යන්තර බැඳුම්කර නිකුතු වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සියලුම ප්‍රතිපත්තිමය විමර්ශන සඳහා පිළිතුරු ලබාදුන් අතර, වත්මන් සාර්ව ආර්ථික තත්ත්වය පිළිබඳව ලේඛනාදියෙන් සහ ඉදිරිපත්කිරීම් මගින් සහාය දක්වන ලදී. එසේම, 2014 මැයි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වැනි වගන්තිය (IMF Article IV) යටතේ පැවැත්වූ සාකච්ඡා සහ 2015 පෙබරවාරි මාසයේ පැවැති තෙවන පසු වැඩසටහන් අධීක්ෂණ (Third Post Programme Monitoring) සාකච්ඡා සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

# 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන වල සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීමේ අරමුණ පෙරදැරිකොට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධානවලට අනුව අරමුදලෙහි සියලුම පරිපාලන බලතල හා කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදලෙහි භාරකරු ලෙස අරමුදල් කළමනාකරුවන්ට අදාළ බලතල, කාර්යයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත මගින් තමන් වෙත පැවරී ඇති වගකීම් හා කාර්යභාරයන් මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

## 8.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, පොදු ගිණුම් හා සාමාජික ගිණුම් පවත්වා ගෙන යෑම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරන පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම හා සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම යනාදිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් වේ. 2014 වසර තුළ එම කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති හා නිර්දේශයන්ට අනුව කටයුතු කළ අතර කම්කරු කොමසාරිස් ජනරාල් සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී.

## 8.2 කාර්යයන්හි කාර්යසාධනය

### (අ) සාමාජිකත්වය, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව 2014 වසර අවසානයේ දී මිලියන 15.4 ක් වූ අතර, එය 2013 වසර අවසානයේ වූ මිලියන 15.2 හා සසඳන විට සියයට 1.3 ක ඉහළ යෑමකි. (සංඛ්‍යා සටහන II-4)

2014 වසර අවසානයේ දී සේ.අ.අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් බිලියන 1,486.9 ක් වූ අතර, එය 2013 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,300 හා සසඳන විට සියයට 14.4 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වසර තුළ දී අරමුදල විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම මගින් ඉපැයූ ආදායම සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ඉහළ යෑම අරමුදලේ වර්ධනයට හේතු විය. 2013 වසරේ සාමාජික පොලී ගෙවීම් ද ඇතුළු රුපියල් බිලියන 1,281.9 ක් ව පැවති සාමාජිකයන් සඳහා වූ අරමුදලෙහි මුළු වගකීම 2014 වසර අවසන් වන විට රුපියල් බිලියන 1,445.5 ක් දක්වා සියයට 12.8 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-4). ශුද්ධ දායක මුදල් ලැබීම් ද පසුගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 30.0 සිට රුපියල් බිලියන 24.9 දක්වා අඩු විය. වසර තුළ දී අරමුදලේ සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 65.1 ක මුදලක් ගෙවන ලදී. එය පෙර වසරේ ගෙවන ලද මුදල හා සසඳන විට සියයට 29.7 ක වර්ධනයක් පෙන්නුම් කරයි. අරමුදලේ ශුද්ධ ආදායම 2014 වසරේ දී රුපියල් බිලියන 150.7 ක් වූ අතර, එය 2013 වසරේ උපයන ලද රුපියල් බිලියන 125.6 හා සසඳන විට සියයට 19.9 ක වර්ධනයකි.

**II-4 සංඛ්‍යා සටහන — අරමුදල පිළිබඳ ප්‍රධාන දත්ත**

| අයිතමය | 2013 | 2014 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 15.2 | 15.4 | 1.3 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.4 | 2.4 | - |
| වර්තමානයේ දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 12.8 | 13.0 | 1.6 |
| දායක මුදල් එවනු ලබන සේවායෝජකයන් | 69,148 | 71,000 | 2.7 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 80.2 | 90.0 | 12.2 |
| ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 50.2 | 65.1 | 29.7 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 114,114 | 127,492 | 11.7 |
| ශුද්ධ ආදායම (රුපියල් බිලියන) | 125.6 | 150.7 | 19.9 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 1,281.9 | 1,445.5 | 12.8 |
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 1,300.0 | 1,486.9 | 14.4 |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභ

**(i)** ආයෝජන කළඹ:

2014 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 1,437.7 (පොත් අගය) ක් ලෙස වාර්තා වූ අතර, එය 2013 වසරේ පැවති රුපියල් බිලියන 1,257.3 ට සාපේක්ෂව සියයට 14.3 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-5). අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබා දීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 91.2 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස්වල සහ භාරකාර සහතිකපත් ඇතුළු සාංගමික ණය සඳහා, පිළිවෙළින්, සියයට 6.7 ක් සහ සියයට 1.5 ක් ආයෝජනය කර තිබුණි. ඉතිරි සියයට 0.6 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම වැනි ඉහළ ද්‍රවශීලතාව සහිත වත්කම්වල ආයෝජනය කර තිබුණි. රාජ්‍ය සුරැකුම් කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාතික සංඛ්‍යා සටහන II-6 හි දක්වා ඇත.

**II-5 සංඛ්‍යා සටහන** **ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2013 | | 2014 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 1,140.5 | 90.7 | 1,287.5 | 89.6 |
| රජයේ රුපියල් ණය | 23.1 | 1.8 | 23.1 | 1.6 |
| සමාගම් කොටස් | 72.8 | 5.8 | 96.6 | 6.7 |
| සාංගමික ණය | 14.3 | 1.2 | 22.4 | 1.5 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | 6.6 | 0.5 | 8.1 | 0.6 |
| **එකතුව** | **1,257.3** | **100.0** | **1,437.7** | **100.0** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-6 සංඛ්‍යා සටහන** **2014 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. බිලියන) (අ) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 102.3 | 6.9 | 9.8 |
| වසර 1-2 | 157.3 | 10.7 | 9.9 |
| වසර 3-4 | 199.9 | 13.6 | 10.7 |
| වසර 5 ට වැඩි | 1,014.7 | 68.8 | 11.6 |
| **එකතුව** | **1,474.2** | **100.0** | **11.1** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii)** ආයෝජන ආදායම:

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2014 වසරේ දී රුපියල් බිලියන 163.2 ක් ලෙස සටහන් වූ අතර, එහි 2013 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 19.7 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී (සංඛ්‍යා සටහන II-7). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය (එය ආදායමෙන් සියයට 78.1කි). 2014 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 127.5 ක් වූ අතර, එය 2013 වසරේ උපයන ලද රුපියල් බිලියන 105.0 හා සැසඳීමේ දී සියයට 21.4 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තවද, ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් 2014 වසර තුළ දී රුපියල් මිලියන 5,598 ක් උපයන ලද අතර, එය 2013 වසරේ දී ආදායම වූ රුපියල් මිලියන 3,339 සමග සැසඳීමේ දී සියයට 67.7 ක වැඩිවීමකි. මෙම ප්‍රතිලාභයන් හි වසර තුළ උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ අන්තර්ගත වේ. කෙසේ වුවත්, වට්ටම් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර මගින් උපයන ලද ක්‍රමක්ෂය ලාභ 2013 වසරේ උපයන ලද රුපියල් බිලියන 27.0 හා සැසඳීමේ දී 2014 වසර තුළ රුපියල් බිලියන 25.9 දක්වා සියයට 3.9 කින් අඩු විය (සංඛ්‍යා සටහන II-7).

**II-7 සංඛ්‍යා සටහන** **ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2013 | | 2014 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු. මිලියන) | දායකත්වය (%) |
| පොලී | 105,038 | 77.0 | 127,499 | 78.1 |
| ක්‍රමක්ෂය ලාභ | 26,956 | 19.8 | 25,897 | 15.9 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 1,019 | 0.8 | 4,082 | 2.5 |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/(පාඩු) | (45) | - | 89 | 0.1 |
| ප්‍රාග්ධන ලාභ/ව්‍යාපාර කොටස් | 113 | 0.1 | 2,277 | 1.4 |
| ලාභාංශ | 3,226 | 2.4 | 3,321 | 2.0 |
| නිදහස් කරන ලද උකස්කර මත අධිමිල / වට්ටම් | (4) | - | - | - |
| **එකතුව** | **136,303** | **100.0** | **163,165** | **100.0** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii)** වියදම්:

2014 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,043 ක් වූ අතර, එය පෙර වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 979 හා සසඳන විට සියයට 6.5 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2014 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.64 ක් ලෙස සටහන් වූ අතර, එය 2013 වසරේ දී සියයට 0.72 ක් විය (සංඛ්‍යා සටහන II-8). අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වීම වසර ගණනාවක් පුරාම අරමුදලේ කැපී පෙනෙන ලක්ෂණයක් විය.

**II-8 සංඛ්‍යා සටහන** **මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2013 | 2014 (අ) | |
| සේවක පිරිවැය | 569 | 579 | 1.8 |
| පරිපාලන වියදම් | 364 | 421 | 15.7 |
| වෙනත් වියදම් | 46 | 43 | (6.5) |
| **එකතුව** | **979** | **1,043** | **6.5** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.72** | **0.64** | - |

(අ) තාවකාලික

මූලයා: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඇ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

අරමුදලේ සාමාජිකයන් වෙත පොලිය ලෙස බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2013 වසරේ පැවති රුපියල් බිලියන 123.4 සමඟ සැසඳීමේ දී 2014 අවසානයේ දී රුපියල් බිලියන 141.6 ක් විය (සංඛ්‍යා සටහන II-9). සංචිත සඳහා රුපියල් බිලියන 4.0 ක් මාරු කිරීමෙන් පසු සාමාජික ශේෂ මත පොලී අනුපාතිකය ලෙස සියයට 10.5 ක ප්‍රතිශතයක් වෙන් කිරීමට අරමුදලට 2014 දී හැකි වුණි (සංඛ්‍යා සටහන II-10).

**II-9 සංඛ්‍යා සටහන** **සාමාජිකයන්ට ගෙවන ලද පොලිය**

| අයිතමය | වටිනාකම (රු.මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2013 | 2014 (අ) | |
| දළ ආදායම | 136,657 | 163,873 | 19.9 |
| මුළු මෙහෙයුම් වියදම | (979) | (1,043) | 6.5 |
| ආදායම් බදු | (10,069) | (12,169) | 20.9 |
| වසරේ ශුද්ධ ආදායම | 125,610 | 150,662 | 19.9 |
| පෙර වසරට අදාළ ගැළපුම් | 28 | - | (100.0) |
| පෙර වසරේ රඳවාගත් ලාභ | 28 | 141 | 403.6 |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | (2,233) | (3,201) | 43.4 |
| ලාභාංශ වෙන් කිරීම | - | (6,000) | - |
| සාමාජිකයන් වෙත බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළදී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 123,433 | 141,602 | 14.7 |
| සංචිතවලින්/(සංචිතවලට) මාරුකිරීම | 3,700 | (4,000) | (208.1) |
| සංචිතවලින්/(සංචිතවලට) මාරුකිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 127,133 | 137,602 | 8.2 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | (126,992) | (137,291) | 8.1 |
| රඳවාගත් ශුද්ධ ආදායම | 141 | 311 | 120.6 |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතිකය % | **11.0** | 10.5 | - |

(අ) තාවකාලික

මූලයා: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

[1] සඵල පොලී අනුපාතිකය = (සාමාජිකයින්ට ගෙවූ පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + පොලී ගෙවීම්වලට පෙර අවසන් සාමාජික ශේෂය)/2]

**II-10 සංඛ්‍යා සටහන** **සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතිකය (%) | සඵල පොලී අනුපාතිකය (%)[1] |
|---|---|---|
| 2005 | 9.00 | 9.13 |
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 (අ) | 10.50 | 10.60 |

(අ) තාවකාලික

මූලයා: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 8.3 සාමාජික සේවාවන්

### (අ) සාමාජික ගිණුම් ප්‍රකාශන

2014 වසරේ පළමු අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයින් මගින් සාමාජිකයන් වෙත නිකුත් කිරීම 2014 වසරේ දෙසැම්බර් මාසය තුළ ආරම්භ කරන ලදී. 2014 වසරේ දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන 2015 වසරේ ජූලි මාසය අවසානය වන විට නිකුත් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.

### (ආ) සාමාජිකයන් සඳහා වූ නිවාස ණය පහසුකම

අරමුදලේ සාමාජිකයන් හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමය 1988 වසරේ දී හඳුන්වා දුන් අතර, එම ණය ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව හා සමුපකාර ග්‍රාමීය බැංකු යන සහභාගිත්ව ණය දෙන ආයතන මගින් 2014 වසර තුළ දී ද ලබා ගැනීමට හැකි විය. වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 17,786 ක් අදාළ ආයතන වෙත නිකුත් කරන ලද අතර අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 8,021 කි (සංඛ්‍යා සටහන II-11). තවද, 2013 වසරේ දී පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,394 කට ආසන්න මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම්වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත 2014 වසර තුළ දී ප්‍රේෂණය කරන ලදී.

**II-11 සංඛ්‍යා සටහන** **නිවාස ණය සේවාව**

| වසර | නිකුත් කළ සහතිකපත් (සංඛ්‍යාව) | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 (අ) | 17,786 | 8,021 | 2,394 |
| **එකතුව** | **144,784** | **44,150** | **16,542** |

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) මහජන දැනුම්වත්භාවය**

සේ.අ.අ.හි කටයුතු පිළිබඳ දැනුම්වත් භාවය ඉහළ නැංවීම, මෙම දෙපාර්තමේන්තුව පූර්ණ ස්වයංක්‍රීය කඩදාසි රහිත කාර්යාල පරිසරයකට විතැන් වීම සඳහා වන ප්‍රධාන ඉලක්කයකි.

සාමාජිකයන්ගේ හා අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන්ගේ දැනුම්වත්භාවය වැඩි කිරීමෙහිලා ජංගම සේවා සැපයීම, නිවාස ණය කළමනාකරණ සම්බන්ධව බැංකු කාර්ය මණ්ඩලය දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ජාතික මට්ටමේ උත්සව වලට හා ප්‍රදර්ශනයන්ට සහභාගි වීම සහ දැන්වීම්, අත්පත්‍රිකා, වීඩියෝ දර්ශන වැනි විවිධ සන්නිවේදන මාධ්‍ය මෙම ඉලක්ක ළඟා කරගැනීමේ උපායමාර්ග වේ.

2014 වසර තුළ කහවත්ත ප්ලාන්ටේෂන් පී.එල්.සී.හි ජංගම සේවාවන් 4ක් පවත්වන ලදි. ඒ යටතේ හුණුවෙල වතුයාය, පැල්මඩුල්ල වතුයාය, රිල්හේන වතුයාය, පොරොනුව වතුයාය, හෝපේ වතුයාය, වැල්ලඳුර වතුයාය, ඕපාත වතුයාය සහ ඇන් දාන වතුයාය ආවරණය කරමින් ජංගම සේවා පැවැත්වීය. ශ්‍රී ජයවර්ධනපුර හා මොරටුව සිංහ සමාජය සංවිධානය කරන ලද තවත් ජංගම සේවා වැඩසටහන් 2ක් ත්‍රිකුණාමලය සිංහල මහා විද්‍යාලීය බහු සේවා කඳවුරෙහි සෞඛ්‍ය හා ප්‍රජා සත්කාර දිනයට සමගාමීව පවත්වන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ අදාළ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි අනෙකුත් අදාළ ආයතනයන්හි ද සහයෝගීත්වය මත මෙම ජංගම සේවාවන් පවත්වන ලදී. ඒ අනුව ජංගම සේවා ඔස්සේ පහත දැක්වෙන සේවා ලබා දෙන ලදී.

i. සාමාජිකන් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම.

ii. සාමාජික තොරතුරු සහ ගිණුම් නිවැරදිව සකස් කිරීම.

iii. සාමාජිකයන්ගේ තොරතුරු නැවත ලියාපදිංචි කිරීම.

iv. කෙටි පණිවිඩ (SMS) හා අන්තර්ජාලය යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජිකයන් දිරිමත් කිරීම.

v. සේ.අ.අ. සාමාජිකයන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ලබා දීම.

vi. සේ.අ.අ. සාමාජිකයන්ට උප්පැන්න සහතික / අනුමාන වයස් සහතික / අවලංගු වාර්තා සහ අදාළ සේවාවන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීම.

vii. සමස්ත සේ.අ.අ. ක්‍රියාපිළිවෙළ පිළිබඳව උපදෙස් ලබා දීම.

සෑම ජංගම සේවාවක්ම පැවැත්වීමට ප්‍රථම අදාළ සේවායෝජකයන්, කළමනාකරුවන් හා අනෙකුත් පරිපාලන නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම තුළින් ජංගම සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත.

තවද, ජාතික මට්ටමේ ප්‍රදර්ශන 03 කට සහ ආයතනික අංශයන්ට දෙපාර්තමේන්තුව සහභාගි වූ අතර ඒවා නම් කුලියාපිටියේ දී පවත්වන ලද ''දැයට කිරුළ 2014'', සේවක කළමනාකරණ ආයතනය (IPM) සංවිධානය කළ ජාතික මානව සම්පත් සැපයුම්කරුවන්ගේ ප්‍රදර්ශනය 2014 හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් සංවිධානය කළ කාර්මික ප්‍රදර්ශනය හා වෙළෙඳ ප්‍රදර්ශනය 2014 ලෙස දැක්විය හැක.

2014 වසර තුළ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ වතු අංශයේ සාමාජිකයන් සඳහා වූ අතර ඊට හේතු වූයේ කොළඹ පිහිටි සේ.අ.අ. කාර්යාලයෙන් සේවය ලබාගැනීමට පැමිණෙන්නන් අතුරින් බහුතරය ඔවුන් වන බැවිනි. මෙම වසර තුළ දී සේවය සපයනු ලැබූ සේ.අ.අ. සාමාජිකයන්ගේ ගණන 12,000 ට වඩා වැඩිය.

**(ඈ) විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය**

"සී" වාර්තා සහ "සී3" වාර්තාව මගින් සාමාජික දායක මුදල් ගෙවීම් සඳහා වූ තොරතුරු ඉදිරිපත් කිරීම වෙනුවට හඳුන්වා දෙනු ලැබූ විද්‍යුත් මාධ්‍යයෙන් (e-Return) එම තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඳහා සම්බන්ධවීමට සේවායෝජකයන් උනන්දු කිරීමේ අරමුණින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ගතවූ වසර තුළ ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ලේඛන ඉදිරිපත් කිරීමෙන් තොරව විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු දීමේ මෙම නව ක්‍රමය මගින් අරමුදලට හා සේවායෝජකයන්ට දැනට මුහුණපාන ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද, සේ.අ.අ. දායක මුදල් හා විස්තර විද්‍යුත් මාධ්‍යය මගින් සැපයීම, විදේශීය ආයෝජන රට තුළට ආකර්ෂණය කර ගැනීමේ වැදගත් දර්ශකයක් වන ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ ශ්‍රී ලංකාවේ ස්ථානය ඉහළ මට්ටමකට ගෙනයෑම සඳහා දායක විය.

2012 වසර වන තෙක් මෙලෙස තොරතුරු සැපයීම සේවායෝජකයන්ගේ ස්වේච්ඡාවෙන් සිදු වූ අතර, මෙම ක්‍රමය අවම සේවකයින් 50 ක් සහිත සේවායෝජකයන්ට අනිවාර්ය කිරීම සඳහා 2012 අංක 2 දරණ සේ.අ.අ. පනතට සංශෝධනයක් ලෙස නව නීති ප්‍රතිපාදනයක් එක් කරන ලදී. මෙම සංශෝධනයන්ට අදාළ රෙගුලාසි 2013 මැයි මස දී ගැසට් කරන ලදී.

මෙම ක්‍රමය යටතේ විද්‍යුත් මාධ්‍යය මගින් ආයක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු පත් කිරීම මගින් ඔවුන්ගේ සේවය ලබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද තවත් පියවරකි. ඒ අනුව, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හා ලංකා බැංකුව, පිළිවෙළින්, 2011 ඔක්තෝබර් හා 2012 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සිය ගනුදෙනුකරුවන්ට මේ සඳහා තම සේවය ලබාදීමට පියවර ගන්නා ලදී. 2013 වසරේ දී මහජන බැංකුව, සම්පත් බැන්ක් පී.එල්.සී සහ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී, මෙම පද්ධතිය හඳුන්වා දී ආයක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස සේ.අ.අ. හා එක් වෙමින් සේ.අ.අ. සඳහා ආයක මුදල් සපයන තම බැංකු පාරිභෝගිකයන් වෙත සපයන සේවාවන් වැඩි කිරීමට සමත්ව ඇත.

තවද, පවත්නා විද්‍යුත් මාධ්‍ය ආයක මුදල් රැස්කිරීමේ පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා, 2014 දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහය ඇතිව සාමාජිකයන්ගේ තොරතුරු පිළිබඳ මාර්ග ගත සත්‍යාපනයක් සහිත නව ජාලගත පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය. මෙම නව පද්ධතිය තුළින් සාමාජික තොරතුරුවල වලංගුභාවය ස්වයංක්‍රීයකරණය කිරීම හරහා විද්‍යුත් මාධ්‍ය මගින් ආයක මුදල් රැස්කිරීමේ ක්‍රියාවලියේ මානව මැදිහත් වීම අවම කිරීමට සහ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට බලාපොරොත්තු වේ. මෙසේ, නියෝජිත වාණිජ බැංකු විසින් නව පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය කරන අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය නවීකරණය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටින අතර, ජාතික සංවර්ධන බැංකුව හා සෙලාන් බැංකුව ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී. 2015 වසරේ පළමු කාර්තුවේ දී නව ආකෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද, මෙම ක්‍රමය යටතේ සේවායෝජකයන්ට අරමුදල වෙත කරනු ලබන ගෙවීම් සිය බැංකුව හරහා සෘජු හර කිරීමක් මගින් මාසිකව සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට සෘජුවම ප්‍රේෂණය කිරීමට හා ඊට අදාළ ආයකත්ව තොරතුරු විද්‍යුත් තැපෑල හරහා සෘජුවම සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත එවීමේ පහසුකම සලසා ඇත.

2014 වසර අවසාන වන විට මෙම ගෙවීම් පද්ධතිය යටතේ සේවායෝජකයන් 3,706 දෙනෙකු තම ආයක මුදල් එවීම සිදු කර ඇත. මෙම පහසුකම, දැනට සක්‍රීය සාමාජිකයන් වන මිලියන 2.4 න් සියයට 44 ක් ආවරණය කරන අතරම, එමගින් සේ.අ.අ. සාමාජික ගිණුම් ඉක්මනින් හා නිවැරදිව යාවත්කාලීන කිරීමට හේතු වී ඇත.

2014 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය ආයක මුදල් රැස්කිරීමේ ක්‍රමය පිළිබඳව සේවායෝජකයින් හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩමුළු 27 ක් පවත්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2013 වසර අවසානයේ මෙම ව්‍යාපෘතිය යටතේ ලියාදිංචි වී සිටි 1,868 ක් වූ සේවායෝජක සංඛ්‍යාව 2014 වසර තුළ දී 3,706 දක්වා වර්ධනය විය.

**(ඉ) සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම**

2009 දී සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී සිදු කළ ප්‍රධාන ව්‍යාපෘති අතුරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) නම සඳහන්ව ඇති ආකාරයට සාමාජික ගිණුම් නැවත ලියාපදිංචි කරන අතර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (UID) ලෙස භාවිතා කිරීම සිදු කරනු ඇත. ආයතන දෙකටම පොදු සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (MCD) භාවිතා කිරීමට මෙමගින් හැකියාව ලැබී ඇත.

2014 අවසාන වන විට මිලියන 1.6 කට ආසන්න සාමාජිකයන්ගේ ජා.හැ.ප. තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ ආයක මුදල ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 75 ක් (ගිණුම් මිලියන 1.2) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටලු නිසා රැස් කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම ලබා ගැනීමෙන් පසුව ලියාපදිංචි කිරීම සඳහා යොමු කරනු ලැබේ.

2010 නොවැම්බර් මාසයේ සිට සේ.අ.අ. ට සම්බන්ධ වන සාමාජිකයන් තත්කාලීනව ලියාපදිංචි කරන ලදී. පළමුවරට ආයක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු මාසික පදනමින් රැස්කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලියන් ද පවත්වාගෙන යනු ලැබේ.

2014 වසරේදී 139,266 ක් පමණ වර්තමාන හා නව සාමාජිකයන් ලියාපදංචි වී ඇති අතර ඔවුන් අතරින් 129,891 ක් නව සාමාජික ලේඛනයට (NMR) ඇතුළත් කරන ලදී.

සාමාජිකයන්ගේ පූර්ව සේවා නියුක්තියන්ට අදාළ වන සාමාජික ගිණුම්, ඒකීය හඳුනා ගැනීමේ අංකයට සම්බන්ධ කිරීම, 2014 වසර තුළ දී ද සිදු කරන ලදී. ඒ අනුව, 2014 දී එවැනි සාමාජික ගිණුම් 38,694 ක් ඒකීය හඳුනා ගැනීමේ අංකයට සම්බන්ධ කරන ලදී. මෙම ක්‍රමය මගින් අන්තර්ජාලය හරහා සහ ජංගම දුරකථන තුළින් කෙටි පණිවුඩ සේවාව හරහා ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කිරීමෙන් සාමාජිකයන්ට තමන්ට හිමි සියලුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු විමසීමට හැකියාව ලැබේ.

**(ඊ) ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP)**

සේ.අ.අ. සාමාජිකයන්ට හා අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැළසීමේ උපායමාර්ගික අරමුණ සපුරාලනු පිණිස සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් පරිසරය අවම ලේඛන සහිත විද්‍යුත් පරිසරයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP) ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් අදියර 4 ක් යටතේ හඳුනා ගත හැක.

i. දැනට පවත්නා ලේඛන විද්‍යුත් මාධ්‍යයට හැරවීම
ii. ලේඛන තත්කාලීනව ඡායාස්ථගත කිරීම
iii. විද්‍යුත් තොරතුරු ගබඩාවක් ස්ථාපනය කිරීම
iv. ලේඛන කළමනාකරණ පද්ධතිය දැනට පවත්නා සේ.අ.අ. පරිගණක පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම

2014 අවසානයේ දී, 2012 වර්ෂය දක්වා යාවත්කාලීන කරන ලද ප්‍රධාන ලිපිගොනුවලින් සියයට 90ක්, "RRI" පෝරමවලින් සියයට 100ක්, "RR6" පෝරමවලින් සියයට 90ක්, හා "D" පෝරමවලින් සියයට 100ක් ඡායාස්ථගත කරන ලදී.

වර්ෂය තුළ දී ඡායාස්ථගත ලේඛන හා ඒ සම්බන්ධ පරිගණක දත්ත පද්ධතිය විගණනය සඳහා විධිමත් ටෙන්ඩර් පටිපාටිය යටතේ සේවා සපයන්නෙකු (KPMG) තෝරා පත් කරන ලදී. වර්ෂය අවසාන වන විට ප්‍රධාන ලිපිගොනුවලින් සියයට 40ක විගණනය සම්පූර්ණ කරන ලදී.

ඉලෙක්ට්‍රොනික් වාර්තා කාමරය ස්ථාපනය කිරීමේ, අවශ්‍ය දෘඩාංග සම්පාදනය අවසන් කර ඇත. එමෙන්ම ඉලෙක්ට්‍රොනික් වාර්තා (IBM File net) ලෙස ප්‍රධාන ලිපිගොනුහි සියයට 80ක් අදාළ පරිශීලකයන් සඳහා සකසා තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාර්තා සංශෝධන අංශයේ සාමජික තොරතුරු සංශෝධන කටයුතු ලොයිඩ්ස් (Lloyd's) ගොඩනැගිල්ලෙහි සාර්ථකව ස්ථාපිත කරන ලදී. තවද IBM File net පිළිබඳව පුහුණුවක් ද පරිශීලකයින් වෙත ලබාදෙන ලදී.

ලේඛන තත්කාලීනව ඡායාස්ථගත කිරීම හා සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියේදී කඩදාසි භාවිතය අවම කිරීම සඳහා 2014 වර්ෂය තුළ දී විශේෂ අධ්‍යයනයකින්, පවතින මෙහෙයුම් පද්ධතිය හා පරිශීලක අවශ්‍යතා සවිස්තරාත්මකව විශ්ලේෂණ කිරීමෙන් පසුව පද්ධති අවශ්‍යතා වර්ගීකරණ (SRS) වාර්තාව පිළියෙල කරන ලදී. මේ සඳහා පරිශීලකයන්ගේ, කළමණාකරන මණ්ඩලයේ හා සේවා සපයන්නන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී. කළමණාකරන අනුමැතිය ලබා ගැනීමට ප්‍රථම ඉදිරිපත් කිරීම් හා ආදර්ශන කිහිපයක් සකසන ලදී. වසර අවසානයේදී සේවා සපයන්නා සහ ව්‍යාපෘති කමිටුව ලේඛන තත්කාලීනව ඡායාස්ථගත කිරීම සඳහා පරීක්ෂණ වටයක් පවත්වන ලදී.

ලේඛන කළමනාකරණ පද්ධතිය හා AS400 පද්ධතිය සමෝධානය කිරීම 2015 පළමු කාර්තුව අවසාන වන විට ආරම්භ කිරීමට නියමිතව ඇත.

# 9. විනිමය පාලනය

විනිමය පාලන දෙපාර්තමේන්තුව, 2014 වර්ෂය තුළ දී ද, 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව එහි කාර්යයන් සහ ව්‍යවස්ථාපිත වගකීම් අඛණ්ඩව ඉටු කර ගෙන යන ලදී. බලයලත් වෙළඳුන් වෙත විධානයන් නිකුත් කිරීම, ගැසට් නිවේදන නිකුත් කිරීම, විශේෂ විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතීන් සහ බලපත්‍ර ප්‍රදානය කිරීම, විවිධ විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය සහ විනිමය පාලන පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම යනාදිය තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය උදෙසා විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යනාදිය මීට අන්තර්ගත වේ. 2014 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලද එවැනි ප්‍රතිපත්තිවල සාරාංශයක් පහත දැක්වේ.

## 9.1 විධාන නිකුත් කිරීම

පහත සාරාංශ ගත කර ඇති ආකාරයට විනිමය පාලන දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ දී බලයලත් වෙළෙඳුන් වෙත විධාන 12 ක් නිකුත් කරන ලදී. මෙම විධාන වාර්ෂික වාර්තාවේ III කොටසින් දැක්වේ.

(අ) **විදේශ සංචාරක කාඩ්පත් (FTC):** විදේශ සංචාර සඳහා විදේශ විනිමය ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට විදේශ සංචාරක කාඩ්පත් නිකුත් කිරීම සඳහා බලයලත් වෙළඳුන් හට අවසර ලබාදීම.

(ආ) **විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA):** විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුමක ඇ.එ.ජ. ඩොලර් 10,000/- ක අවම ශේෂයක් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවය ඉවත් කිරීම.

(ඇ) **ශිෂ්‍ය වීසා බලපත්‍රය ලබා ගැනීමට පෙර මුදල් ප්‍රේෂණය කිරීම:** විදේශ රටවල ශිෂ්‍ය වීසා බලපත්‍ර අයදුම් කරනු ලබන, ශ්‍රී ලංකාවේ නේවාසික ශිෂ්‍යයන්ගේ ජීවන වියදම් සපුරා ගැනීම සඳහා කල්තියා ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම අවශ්‍ය යැයි වීසා ප්‍රදානය කරනු ලබන අධිකාරිය විසින් පවසා සිටින අවස්ථාවන්හිදී, එවැනි ප්‍රේෂණ සිදු කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඈ) **නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC):** ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම පිණිස, ශ්‍රී ලංකාවේ නේවාසික ශිෂ්‍යයෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් අරමුදල් මාරු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඉ) **නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC):** ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම පිණිස, ශ්‍රී ලංකාවේ නේවාසික ශිෂ්‍යයෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට නේවාසික

විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් අරමුදල් මාරු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඊ) **අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE)**: ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම පිණිස, ශ්‍රී ලංකාවේ නේවාසික ශිෂ්‍යයෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් අරමුදල් මාරු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(උ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA)**: ගිණුම් හිමියා විසින් භාර ගෙන ඇති විදේශ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයෙකුට විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමේ දැනට පවතින අරමුදල් භාවිතා කරමින් ගෙවීම් සිදු කිරීමට අවසර ලබාදීම.

(ඌ) **ශ්‍රී ලංකාවේ නේවාසික ආනයනකරුවන් හට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික සැපයුම්කරුවන් විසින් ලබාදෙන ණය පහසුකම්**: භාණ්ඩ ආනයනකරුවන් හට එම භාණ්ඩ සැපයුම්කරුවන් විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් සම්බන්ධයෙන් පොලී ගෙවීම වෙනුවෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණයන් සිදු කිරීම පිණිස බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(එ) **ණයවර ලිපි (LC)**: ණයවර ලිපි නිකුත් කිරීමට, වලංගු කාලය දීර්ඝ කිරීමට සහ වගන්ති සංශෝධනය කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඒ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් සඳහා ණය පහසුකම්**: ඕනෑම අරමුණක් වෙනුවෙන් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඔ) **චීන රෙන්මින්බිවලින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යෑම**: චීන රෙන්මින්බිවලින් නාමනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යෑමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඕ) **සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම**: ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සඳහා වන විදේශ ගමන් දීමනාවේ කොටසක් ලෙස ඇ.එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් ඕනෑම පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදලකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

## 9.2 ගැසට් නිවේදන නිකුත් කිරීම

පහත සාරාංශ ගත කර ඇති ආකාරයට විනිමය පාලන දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ දී නව ගැසට් නිවේදන 5 ක් නිකුත් කරන ලදී. එම ගැසට් නිවේදන මෙම වාර්තාවේ III කොටසේ දැක්වේ.

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂවල දී ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ද්විතීයික වෙළඳපොළෙන් අත්කර ගැනීමට, දැරීමට හා පැවරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම (2014 මාර්තු 17 දිනැති ගැසට්පත්‍ර අංක 1854/3).

(ආ) අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටකට යෑමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකු ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යෑමට අවසර ලබාදීම (2014 මැයි 28 දිනැති ගැසට් පත්‍ර අංක 1864/38).

(ඇ) සුරැකුම්පත් ආයෝජන ගිණුම හරහා, ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද ලැයිස්තුගත නොකළ ණයකරවල ආයෝජනය කිරීම සඳහා විදේශීය ආයෝජකයන් හට අවසර ලබාදීම (2014 මැයි 28 දිනැති ගැසට් පත්‍ර අංක 1864/39).

(ඈ) බලයලත් වෙළෙඳුන්ගෙන් ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කාඩ්පත් ලබා ගැනීම සඳහා නම් කරන ලද ගිණුම් වර්ග හිමි පුද්ගලයන් සඳහා අවසර ලබා දෙමින් 2012 දෙසැම්බර් 20 දිනැති අංක 1789/34 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම (2014 මැයි 28 දිනැති ගැසට් පත්‍ර අංක 1864/40).

(ඉ) භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස කටයුතු කරනු ලබන, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට පනවා තිබූ කොන්දේසි සහ අවශ්‍යතා ඉවත් කරමින් 1990 දෙසැම්බර් 20 දිනැති අංක 641/15 දරන ගැසට් නිවේදනය අවලංගු කිරීම (2014 දෙසැම්බර් 31 දිනැති ගැසට් පත්‍ර අංක 1895/15).

## 9.3 අනුමැතීන්/අවසරපත්‍ර ප්‍රදානය කිරීම

(අ) **අනුමැතීන්**: ඇ.එ.ජ. ඩොලර් මිලියන 105.2 ක මුදලක් ආයෝජනය කිරීම සඳහා සමාගම් 9 ක් සඳහා ද, ඇ.එ.ජ. ඩොලර් මිලියන 248.5 ක මුදලක් විදේශයන්ගෙන් ණයට ලබා ගැනීම සඳහා සමාගම් 18 ක් සඳහා ද අනුමැතිය ලබා දෙන ලදී.

(ආ) **අවසරපත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම**:

(i) සීමාසහිත සමාගම් 4 කට සහ එක් සංචාරක හෝටලයකට නව මුදල් මාරු කිරීමේ බලපත්‍ර 5ක් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 10 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2කින්, එක් සුපිරි වෙළඳසැලකින්, එක් සංචාරක හෝටලයකින් සහ වෙනත් සීමාසහිත සමාගම් 70 කින් සමන්විත වන ආකාරයට බලයලත් මුදල් හුවමාරු කරන්නන්ගේ මුළු ගණන 84 ක් බවට පත්විය. තවද, 2014 වර්ෂය අවසාන වන විට, සීමාසහිත සමාගම් 5 ක්, බලපත්‍රලාභී මුදල් සමාගම් 10 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 ක් සහ එක් සුපිරි වෙළඳසැලක් ඇතුළුව විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සඳහා බලයලත් මුළු මුදල් හුවමාරු කරන්නන් ගණන 18 ක් විය.

(ii) භාණ්ඩ නැව්ගත කරන්නන්ගේ මුළු ගණන 555 ක් දක්වා ඉහළ නංවමින් නව සමාගම් 17 ක් භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි කරන ලදී.

### 9.4 සංක්‍රමණික අරමුදල් ප්‍රේෂණය කිරීම

2014 වර්ෂය තුළ දී, 2013 ජුනි 12 දිනට පසුව වෙනත් රටක ස්ථිර නේවාසික බලපත්‍ර ලබාගෙන ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් හට හිමි සංක්‍රමණික දීමනාව නිදහස් කිරීම සඳහා නව සංක්‍රමණික ආවෘත ගිණුම් 257 ක් විවෘත කිරීම පිණිස බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදෙන ලදී. තවද, 2013 ජුනි 12 දිනට පෙර වෙනත් රටක ස්ථිර නේවාසික බලපත්‍ර ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් 330 දෙනෙකුට අනේවාසික ආවෘත ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීමට අවසර ලබා දෙන ලදී.

### 9.5 සුපරීක්ෂණය/විමර්ශන

විනිමය රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් විමර්ශන 138 ක් 2014 වර්ෂය තුළ දී සිදු කරන ලද අතර, එබඳු විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පනවන ලද දඩ මුදල් වශයෙන් අයකර ගත් රු. මිලියන 15.3 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. විමර්ශනවලින් බහුතරයක්ම නේවාසිකයන් විසින් අනේවාසිකයන්ට කරන ලද අනවසර ගෙවීම්, සීමිත බලයලත් වෙළෙඳුන් විසින් බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම් සහ පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් නිකුත් කිරීම හා පැවරීම සමඟ සම්බන්ධ වේ.

### 9.6 මහජනතාව දැනුම්වත් කිරීම

විනිමය පාලන රෙගුලාසි පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිකිරීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය 2014 ජනවාරි 01 දින දියත් කරන ලදී. බැංකු, මූල්‍ය ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයන්, සමාගම් අධ්‍යක්ෂවරුන්, ආයෝජකයන් සහ විනිමය පාලන නීතිරීති දැන ගැනීමට කැමති පාර්ශ්වයන් ඉලක්ක කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රය සමඟ සහයෝගයෙන් විනිමය පාලනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී. තවද, විවිධ පාර්ශ්වයන් අතර වර්තමාන විදේශ විනිමය ප්‍රතිපත්ති සහ ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනුවල මෑතකාලීන ලිහිල් කිරීම් පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය කරමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 14 ක් පවත්වන ලදී.

## 10. පහසුකම් කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ පරමාර්ථ කරා ළඟාවීම උදෙසා, එහි කාර්ය මණ්ඩලයට විසිත්ත සහ සුවපහසු වැඩ පරිසරයක් ලබා දෙමින්, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව එහි තීරණාත්මක සේවාවල මෙහෙයුම් විශ්වසනීයත්වය 2014 වර්ෂය තුළ තහවුරු කරන ලදී.

2014 වර්ෂයේ උපායමාර්ගික සැලසුම්වලට සමගාමීව, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූලික අරමුණුවලට ළඟාවීම සඳහා එහි ප්‍රධාන කාර්යයන් වන විදුලිය, වායුසමනය, ජලය, ප්‍රවාහනය සහ සන්නිවේදනය නිසි පරිදි සැපයීමෙන් සහ බැංකු පරිශ්‍රය නිසි පරිදි නඩත්තු කිරීමෙන් එහි තීරණාත්මක සේවාවන්වල මෙහෙයුම් විශ්වසනීයත්වය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මෙම සේවා සියයට 100 ක් විශ්වසනීය ලෙස සැපයීමට හැකියාව ලැබීම තුළින් බැංකුවේ ව්‍යාපාරික සබඳතාවය සහතික කිරීමට දායකවීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

ව්‍යාපෘති වෘත්තීය වශයෙන් ඇගයීම, ඉහළ ප්‍රමිතියෙන් සහ පිරිවැය ඵලදායී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, අවශ්‍ය ප්‍රමිතීන් සහ එකඟ වූ දිනයන්හි දී ව්‍යාපෘති නිම කිරීම පිළිබඳ වූ ප්‍රගතිය දැඩිව නිරීක්ෂණය කිරීම යනාදියෙන් කාර්යක්ෂමව පිරිවැය ඵලදායී ලෙස සහ නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීම තුළින් වැය කරන මුදල් සඳහා ඉහළ වටිනාකමක් ලබාදීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමත් විය.

විවිධ කරුණු සම්බන්ධයෙන් මහ බැංකුවට පැමිණෙන මහජනතාවගේ පහසුව තකා, වඩා ඉඩකඩ සහිත සහ අලංකාර කරන ලද රැඳීසිටීමේ ස්ථානයක් ව්‍යාපෘතියක් ලෙස වර්ෂය තුළ දී නිම කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්පත් කරගත් සහ අලුත්වැඩියා කළ යටත්විජිත යුගයට අයත් අවුරුදු 100 ක් පමණ පැරණි, නැෂනල් මියුචුවල් ගොඩනැගිල්ල ලෙස පෙරදී හැඳින්වූ, වර්තමානයේ සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල ලෙස හඳුන්වන ගොඩනැගිල්ලේ මුදල් කෞතුකාගාරය සහ ආර්ථික ඉතිහාස කෞතුකාගාරය ස්ථාපනය කරන ලදී.

යාපනය ප්‍රාදේශීය කාර්යාලය කිලිනොච්චියේ ස්ථාපනය කිරීම සඳහා වර්ග අඩි 18,000 ක බිම් ප්‍රමාණයකින් යුතුව කිලිනොච්චියේ ඉදි කරනු ලබන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් නිම කිරීමට හැකි විය. සංවර්ධන මූල්‍යනය, බැංකු කටයුතු, මූල්‍ය කටයුතු සහ ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම වැඩිදියුණු කිරීම මගින් පළාත්බද සංවර්ධන ක්‍රියාකාරකම් කඩිනම් කිරීම, මෙම ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, පුහුණු ආයතනයේ කටයුතු පුළුල් කිරීම සඳහා රාජගිරිය බැංකු විදු පියෙසේ නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු බැංකුව විසින් ආරම්භ කෙරිණි.

බැංකු කාර්ය මණ්ඩලයේ දිගුකාලීන බලාපොරොත්තුවක් වූ බහු මහල් රථ ගාල, ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් නිම කිරීමෙන් පසු 2014 අගෝස්තු 28 දින රථ ගාල් කිරීම සඳහා විවෘත කෙරිණි.

බැංකුව විසින් ශ්‍රී ලංකා රජයෙන් මිල දී ගත් වයිට්අවේස් ගොඩනැගිල්ල එහි ඓතිහාසික ශ්‍රී විභූතිය මුල් ආකාරයටම

ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වූ ප්‍රතිසංස්කරණ තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි.

මීට අමතරව, නව ප්‍රවේශ පාලන පද්ධතිය සවි කිරීම, ජල සිසිලනයන් සහ වායු පරිහරණ ඒකකය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සහ මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා රථ වාහනවල තත්ත්වය වැඩිදියුණු කිරීම මගින් රථ වාහන ඇණිය ශක්තිමත් කිරීම වැනි ව්‍යාපෘති ගණනාවක් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළ දී නිම කරන ලදී.

සාමාන්‍ය බැංකු කටයුතුවලට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ගණනාවකට බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් සැලසීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

# 11. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වා ගෙන යෑම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතියක් පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 12ක් කළමනාකරණය කිරීම, ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වා ගෙන යෑම ඇතුළත් වේ.

## 11.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, 2013 වසරේ දෙසැම්බර් මාසය හා 2014 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙල කරන ලද අතර, ඒවා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම 2014 වර්ෂය තුළ දී සිදු කරන ලදී.

(ආ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන:** 2002 වර්ෂයේ සිට මෙම කාර්යය සඳහා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කරගන්නා ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2014 වර්ෂය තුළදීත් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ පදනමකින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත අනුකූල වීම සඳහා ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2014 වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ මෙම කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

## 11.2 වාර්ෂික අයවැය ලේඛනය හා ක්‍රියාකාරකම් මත පදනම් වූ අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපාය මාර්ගික සැලසුම්වල කාර්යයන්ට අනුකූලව සිදු කරන ලදී. කාර්යයන් මත පදනම් වූ අයවැය පිළියෙල කිරීම ද වාර්ෂික අයවැය සමග සිදු කළ අතර, එමගින් මහ බැංකුවේ කාර්යයන් මත පිරිවැය පෙන්නුම් කරන ලදී. මෙම ක්‍රියාවලිය 2014 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් මස අවසන් විය. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2014 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, අනුමත අයවැය 2015 වසරේ මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබා දෙන ලදී. 2014 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා ඵලදායී අයවැය පාලනය සඳහා සියලුම දෙපාර්තමේන්තු හා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## 11.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතිය

(අ) 2014 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය ගෙවන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2014 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 5,586 ක් සිදු කරන ලද අතර, ඉන් 5,225 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 361 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) 2014 වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා ණය අරමුදල් නිදහස් කිරීම් 2,915 ක් සහ විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 558 ක් ආසන්න වශයෙන් සිදු කර ඇත.

## 11.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව අභ්‍යන්තර අරමුදල් 12 ක් කළමනාකරණය කරන අතර, එයට සේවකයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක්ද, වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් 3 ක් සහ විශේෂ අරමුදල් 3 ක්ද ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ කළමනාකරණය, අරමුදල් ආයෝජනය, ගෙවීම් හා පියවීම් සිදු කිරීම, ගිණුම් තැබීම හා වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම මේ හා සම්බන්ධ ප්‍රධාන කාර්යයන් වේ. මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල හා ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල ආයෝජනය කරන අතර, 2014 වසරේ ආයෝජන සඳහා වූ සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය සියයට 7.31 ක් විය. 2013 වසර සඳහා වූ මෙම අරමුදලට අදාළ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීතිරීති අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**II-12 සංඛ්‍යා සටහන** **අරමුදල් කළමනාකරණ කාර්යසාධනය - 2014**

රුපියල් මිලියන

| අරමුදල් | ලැබීම් | ගෙවීම් | ආයෝජන | වසර අවසාන ආයෝජන | සාමාන්‍ය වාර්ෂික ඵලදාව % |
|---|---|---|---|---|---|
| විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් | 21,836.3 | 3,249.8 | 18,594.1 | 37,794.3 | 7.33 |
| වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් | 75.0 | 0.9 | 73.1 | 112.9 | 7.73 |
| විශේෂ අරමුදල් | 1,342.1 | 22.5 | 1,319.7 | 2,071.6 | 7.04 |
| එකතුව | 23,253.4 | 3,273.2 | 19,986.9 | 39,978.8 | 7.31 |

### 11.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් ඒකකය යටතේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යනු ලබයි. සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම් හා ඒවායේ ස්ථානගත කිරීම, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්, ක්ෂය වීම් සහ ඉවත් කිරීම් 2014 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. අයිතමයන් අත්පත් කර ගැනීම් 1,396 ක් සහ ඉවත් කිරීම් 944 ක් සමගින් 2014 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 11.6 කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වා ගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත අඛණ්ඩව පවත්වා ගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2014 වසර තුළ දී පහසුකම් සපයන ලදී.

### 11.7 අනෙකුත් කාර්යයන්

(අ) **මිලදී ගැනීමේ ක්‍රියාවලිය :** ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති නීතිරීතිවලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලුම තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහ භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩලවලට සහ භාණ්ඩ ඉවත්කිරීම සඳහා පවත්වනු ලබන සමීක්ෂණ මණ්ඩලවලට සහභාගි විය යුතුය. 2014 වසර තුළ දී ආසන්න වශයෙන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 400 ක් සහ එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ සියලු තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහභාගි වී ඇත.

(ආ) **වාර්තාකරණ ක්‍රියාවලියේ වැඩිදියුණු කිරීම් :** 2003 වසරේ සිට භාවිතා කළ ඔරකල් පොදු ලෙජර් පද්ධතිය වෙනුවට, ගිනුම්කරණ ප්‍රමිතීන් අනුව වාර්තා කිරීමට හැකිවන පරිදි, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නවතම සංකලිත පොදු ලෙජර් ගිණුම් පද්ධතියක් (iGLAS) මහ බැංකුව තුළම නිර්මාණය කරන ලද අතර, එය 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. 1996 වසරේ සිට බාහිර සේවා ආයතනයකින් ලබාගෙන තිබූ IHRM පද්ධතිය වෙනුවට මහ බැංකු සේවකයන් සඳහා නව සේවක වැටුප් මානකයක් සහ නව ණය මානකයක් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුව තුළම නිර්මාණය කරන ලදී. මෙම නව සේවක වැටුප් මානකය 2015 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදී.

(ඇ) **ආයෝජන සමාලෝචන කමිටුව :** ආයෝජන සමාලෝචන කමිටුව 2014 වසර තුළදීද තම දායකත්වය අරමුදල් ආයෝජනය කිරීමේ කටයුතු සඳහා ලබාදෙන ලදී. මුදල් මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් 16 ක් සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන ව්‍යාපෘති කිහිපයකට අදාළ අරමුදල්වල ආයෝජන කටයුතු පිළිබඳ උපදේශකත්වය සැපයීම සහ නිරීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපතිවරයෙකු සභාපතිත්වය දරන මෙම කමිටුව මාසිකව රැස්වන අතර, අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හා අනෙකුත් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මාසිකව පැවැත්වෙන මෙම කමිටු රැස්වීම සඳහා මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව එහි ලේකම් කාර්යභාරය ඉටු කරනු ලබයි. 2014 වසර තුළ දී කමිටුව රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර, ආයෝජන අපරානුමත කිරීම සඳහා කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී. 2014 වසර අවසාන වන විට කළමනාකරණය යටතේ ඇති අරමුදල් වටිනාකම රු. බිලියන 52.2 ක් වේ.

## 12. මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 06 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය, 2007 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දැක්වෙන අනෙකුත් අනීතික ක්‍රියාවන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු එක්රැස් කිරීම, තොරතුරු ලබා ගැනීම, සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විශ්ලේෂණ සිදු කිරීම සහ නෛතික බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සඳහා අදාළ නියාමන සහ/හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවශ්‍ය තොරතුරු හා විස්තර ලබා දීම ඇතුළත් වේ. 2014 වසර තුළ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සඳහන්ව ඇති පරිදි මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන්හි සහ අනෙකුත් කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

## 12.1 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳ වූ ජාතික අවදානම් ඇගයීම

මූල්‍ය කාර්ය සාධක බලකායේ (Financial Action Task Force) 1 වන නිර්දේශයට අනුව රටවල මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳ වූ අවදානම හඳුනාගෙන තක්සේරු කළ යුතු අතර එම හඳුනාගත් අවදානම්වලට සරිලන සේ නිසි ක්‍රියාමාර්ග ගැනීමට අවදානම පාදක කරගත් පිවිසුම් ක්‍රියාවලියක් (Risk Based Approach) එළිදැක්විය යුතු වේ. ඒ අනුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවදානම පාදක කරගත් ක්‍රියාරාමුවක් වර්ධනය කිරීම සහ හඳුනාගත් අවදානම්වලට පිළියම් යෙදීමේ දී වඩාත් ඵලදායී ලෙස සම්පත් යෙදවීමේ අරමුණ ඇතිව, ලෝක බැංකුවේ තාක්ෂණික සහයෝගය ඇතිව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳ වූ ජාතික අවදානම ඇගයීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස, ජාතික අවදානම ඇගයීමෙහි ප්‍රධාන කාර්යයක් ඉටු කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකයෙහි උපදේශක මණ්ඩලයේ මාර්ගෝපදේශනය යටතේ, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ප්‍රධාන ආයතන 23 ක, නිලධාරීන් 80 කට වැඩි සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ජාතික අවදානම ඇගයීම 2014 වසරේ දී සිදු කරන ලදී.

## 12.2 මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාරාමුව සම්බන්ධයෙන් වූ අන්‍යෝන්‍ය ඇගයීම

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ පළමු අන්‍යෝන්‍ය ඇගයීම 2006 වසරේ දී ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ වූ කණ්ඩායම (Asia Pacific Group on Money Laundering) විසින් සිදු කරන ලදී. ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ වූ කණ්ඩායම විසින් මූල්‍ය කාර්ය සාධක බලකායේ 2012 නව නිර්දේශයන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාරාමුව ඇගයීම අරමුණු කරගෙන, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ දෙවන ඇගයීම 2014 වසරේ දී සිදු කෙරිණි. ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ වූ කණ්ඩායමේ සාමාජික රටවල්වල සහ ලේකම් කාර්යාලයේ විශේෂඥයින් 8 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ නෛතික සහ ආයතනික ව්‍යුහය මෙන්ම ඒවා ක්‍රියාවට නැංවීමේ ඵලදායිත්වය ද ඇගයීමට ලක් කරන ලදී. අන්‍යෝන්‍ය ඇගයීමේ අවසාන අදියරේ දී ඉහත කී ඇගයීම් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාවට මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන 50 කට වැඩි ගණනක් සමග පවත්වන ලද සාකච්ඡාවලට ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් පහසුකම් සපයන ලදී.

## 12.3 තොරතුරු එක්රැස් කිරීම, විමර්ශනය සහ බෙදාහැරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, කොටස් තැරැව්කරුවන් හා රක්ෂණ සමාගම් විසින්, මූල්‍ය බුද්ධි ඒකකය මගින් පනවන ලද අවශ්‍යතාවයන්ට අනුකූලව, එනම් රුපියල් මිලියනයක් හෝ ඊට වැඩි සහ විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන හෝ වැඩි දේශීය හා විදේශීය ගනුදෙනු, මූල්‍ය බුද්ධි ඒකකය සතු මාර්ගගත දත්ත කළමනාකරණ පද්ධතිය වන ලංකාෆින් (LankaFIN) හරහා වාර්තා කරන ලදී. බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ද එම ක්ෂේත්‍රය අධීක්ෂණය කර නියාමනය කරන විනිමය පාලකවරයා හරහා රුපියල් මිලියනයක් සහ ඊට වැඩි වන්නා වූ අගයකින් යුත් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වාර්තා කරන ලදී. ඒ අනුව 2014 වසර තුළ දී මිලියන 5.5 කට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා සංඛ්‍යාවක් වාර්තා වූ අතර සැක කටයුතු වාර්තා 718 ක් වාර්තා විය. මූලික පරීක්ෂණවලින් අනතුරුව සැක කටයුතු ගනුදෙනු වාර්තා 189 ක් වැඩිදුර විමර්ශනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හා නියාමන අධිකාරීන්ට යොමු කරන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් සිදු කරන ලද පරීක්ෂණයන් පදනම් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2014 වසර අග වන විට මුදල් විශුද්ධිකරණය සම්බන්ධව අධිචෝදනා පත්‍ර 7 ක් ද ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ වරද සම්බන්ධව අධි චෝදනා පත්‍ර 3 ක් ද ගොනු කර ඇත.

## 12.4 විමර්ශන පැවැත්වීම

බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට පාත්‍රවීමේ අවදානම සොයා බැලීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශිත නියාමනවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සොයා බැලීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය මගින් 2014 වසර තුළ දී විමර්ශන 4 ක් පවත්වන ලදී. තවද මූල්‍ය බුද්ධි ඒකකය මගින් 2014 වසර තුළ දී වාර්තාකරණ ආයතන සමග සම්මුඛ සාකච්ඡා 5 ක් සිදු කරන ලදී.

## 12.5 වෙනත් කටයුතු

### (i) අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විමර්ශන කටයුතු සහ චෝදනා ගොනු කිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය පහසු කර ගැනීමට, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදන අනුව, මූල්‍ය බුද්ධි ඒකකය 2014 වසරේ දී ඇල්බේනියානු, පේරු සහ මියන්මාර මූල්‍ය බුද්ධි ඒකක සමග අවබෝධතා ගිවිසුම් 3 ක් අත්සන් කරන ලදී. ඒ අනුව 2014 වසර අවසාන වන විට අත්සන් කර ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 27 දක්වා ඉහළ යන ලදී.

**(ii) ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම උදෙසා, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් නියෝජනය කළ නිලධාරීන් 1,200 කට වැඩි ගණනකගේ සහභාගිත්වයෙන් දැනුම්වත් කිරීමේ වැඩමුළු/පුහුණු වැඩසටහන් 22 ක් පවත්වන ලදී. තවද, ගරු මහාධිකරණ විනිසුරුවරුන්, ගරු මහේස්ත්‍රාත් සහ දිසා විනිසුරුවරුන් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ද විශේෂ වැඩසටහන් 3 ක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් පවත්වන්නට යෙදිණි.

**(iii) ජාත්‍යන්තර සම්බන්ධතා**

**(අ) එග්මොන්ට් කණ්ඩායම (Egmont Group)**

විමර්ශන පවත්වාගෙන යෑමේ දී අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම මගින් මූල්‍ය බුද්ධි ඒකක 139 කින් සමන්විත එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකයට ලැබුණි. 2014 වසර තුළ මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවස්ථා 18 ක දී විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමග තොරතුරු හුවමාරු කර ගන්නා ලදී.

**(ආ) ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායම (Asia Pacific Group on Money Laundering)**

ආසියා ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායමෙහි ආරම්භක සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු, 2014 වසරේ ජූලි මාසයේ දී මැකාවෝහි දී පැවැත්වූ 17 වන වාර්ෂික වැඩමුළුවට ද 2014 නොවැම්බර් මස තායිලන්තයේ දී පැවති මුදල් විශුද්ධිකරණ උපාය මාර්ග පිළිබඳ 17 වන වාර්ෂික වැඩමුළුවට ද සහභාගි වූහ.

## 13. මූල්‍ය අංශ පර්යේෂණ

මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව 2007 වසරේ දී පිහිටුවනු ලැබූ අතර, එය පිහිටුවීමේ මූලික අරමුණු වූයේ, එක් එක් මූල්‍ය ආයතන මට්ටමින් සිදුවන අධීක්ෂණයට අනුපූරකයක් ලෙස පුළුල් සාර්ව විචක්ෂණ ප්‍රවේශයක් ඇති කිරීමත්, දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි වෙළඳපොළ හා සාර්ව ආර්ථික සාධක පිළිබඳ විධිමත් වූ ලෙස අවධානය යොමු කිරීමත්ය. මුදල් නීති පනතට අනුව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ එක් ව්‍යවස්ථාපිත අරමුණක් වේ.

ඉදිරියේ දී, දේශීය මූල්‍ය අංශයේ අපේක්ෂිත ශීඝ්‍ර වර්ධනය සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුවට අදාළ විෂය ක්ෂේත්‍රය ක්‍රමයෙන් පුළුල් විය. ඒ අනුව, මූල්‍ය අංශය හා සම්බන්ධ විශ්ලේෂණ හා පර්යේෂණ පැවැත්වීම ද දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට එක් වූ අතර, මේ අරමුණින් 2014 නොවැම්බර් 7 සිට මෙම දෙපාර්තමේන්තුව මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව ලෙස යළි නම් කෙරිණ.

දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරයට අනුකූලව යමින්, මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව 2014 වසරේ දී, මූල්‍ය අංශයේ සංවර්ධනය සහ එහි ස්ථායීතාව ශක්තිමත් කිරීම හා සම්බන්ධ පර්යේෂණ කටයුතුවල ද නියැළුණු අතර, දේශීය මූල්‍ය පද්ධතියේ අවදානම් සහ සිදු විය හැකි විචලතාවන් තක්සේරු කිරීම සඳහා අඛණ්ඩව සාර්ව විචක්ෂණ ආවේක්ෂණ සිදු කරන ලදී. එසේම, මෙම පර්යේෂණ සහ ආවේක්ෂණ මත පදනම් ව සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයන් මෙන් ම මූල්‍ය අංශයට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර මූල්‍ය ස්ථායීතාව සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම ද 2014 වසර තුළ දී සිදු කරනු ලැබීය.

### 13.1 වසර තුළ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්

**(අ) පර්යේෂණ**

2014 වසර තුළ දී පර්යේෂණ අධ්‍යයන 4ක් සිදු කරන ලදී. (i) මූල්‍ය අංශයේ ඒකාබද්ධකරණය: අනෙක් රටවල අත්දැකීම්, (ii) ශ්‍රී ලංකා රුපියල මත ඇතිවන පීඩනය නිර්ණය කිරීම සඳහා වන පූර්ව අවදානම් හඳුනා ගැනීමේ පද්ධතියක්, (iii) ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතියෙහි ව්‍යාප්ත වීමේ අවදානම (පද්ධතිමය අවදානම) විශ්ලේෂණය කිරීම සඳහා වන ජාල විශ්ලේෂණ ප්‍රවේශයක් සහ (iv) මූල්‍ය උපකරණයක් ලෙස නිවාස ණය යන මාතෘකා යටතේ මෙම අධ්‍යයන සිදු කරන ලදී.

**(ආ) සාර්ව විචක්ෂණ අවේක්ෂණය**

2014 වසරේ දී මෙම දෙපාර්තමේන්තුව විසින් දේශීය මූල්‍ය පද්ධතිය ආශ්‍රිත සාර්ව විචක්ෂණ අවේක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර, එම අවේක්ෂණ යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූර්ත ආර්ථිකය මත අයහපත් බලපෑම් සිදු කළ හැකි ප්‍රධාන මූල්‍ය නිපැයුම් සහ සේවාවන් සැලසීමේ දී ඇති වන බාධා අවම කිරීම හෝ එවැනි බාධාවන්ගේ බලපෑම සීමා කිරීම අරමුණු කර ගනිමින් සිදු කළ එවැනි අවේක්ෂණයන්ගේ මූලික අභිප්‍රාය වූයේ, සමස්ත මූල්‍ය පද්ධතිය තුළ ඇති විය හැකි අවදානම සීමා කිරීමයි. 2014 වසරේ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ සාර්ව විචක්ෂණ අවේක්ෂණය ප්‍රධාන වශයෙන් අදියර තුනක් මත පදනම් විය. සමස්ත මූල්‍ය පද්ධතියට බලපෑම් ඇතිකළ හැකි සාර්ව විචලතාවන් තක්සේරු කිරීම සහ ඒවා මගින් මූල්‍ය පද්ධතියට ඇති විය හැකි බලපෑම් ආරම්භයේ දී ම හඳුනා ගැනීම, සාර්ව මූල්‍ය කම්පනයන්ට අනාවරණය වීම් නිර්ණය කිරීම සහ එක් එක් ආයතන හා වෙළඳපොළ අතර පවත්නා අන්තර් සම්බන්ධතාවය නිසා ඒවායින් මූල්‍ය පද්ධතියට ඇති විය හැකි ව්‍යාප්ත වීමේ අවදානම් තක්සේරු කිරීම යනාදිය එම ප්‍රධාන අදියරයන් ය.

මේ අනුව, මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවලින් සහ මහ බැංකුවෙන් පරිබාහිර අනෙකුත් ආයතනවලින් අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම මෙම දත්ත, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ශක්තිමත්භාවය සහ අවදානම්වලට අනාවරණය වීම්, සාංගමික අංශය, ගෙවීම් සහ පියවීම් පද්ධති, සාර්ව-ආර්ථික කාර්ය සාධනය සහ මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල් යනාදියට අදාළ තොරතුරුවලින් සමන්විත විය. මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දත්ත පදනම් කර ගනිමින් බැංකු ශක්තිමත්භාව දර්ශකය, මූල්‍ය වෙළඳපොළ ස්ථායීතා දර්ශකය, සාර්ව-ආර්ථික ස්ථායීතා දර්ශකය ඇතුළුව සාර්ව විචක්ෂණ දර්ශක කිහිපයක් යාවත්කාලීන කරන ලදී. මෙම දර්ශක අනුසාරයෙන් සමස්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශකය පිළියෙල කරන අතර, එය පද්ධතිමය වශයෙන් ඇතිවන විචලතා ලක්ෂණ, මූල්‍ය පද්ධතියට ඇතිවන බලපෑම් සහ සිදු විය හැකි සාර්ව-මූල්‍ය කම්පනයන්ට ඇති අනාවරණ කල් තියා හඳුනා ගැනීම සඳහා යොදා ගනු ඇත. එසේම, මෙම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ සාංගමික අංශයේ ණය ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කිරීම පිණිස සංස්ථාපිත අංශය සඳහා වූ ණය ආපසු ගෙවීමේ හැකියා දර්ශකය ද කාර්තුමය පදනම මත යාවත්කාලීන කරන ලදී.

වසර තුළ දී, එක් එක් බැංකු මගින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව මත ඇතිවිය හැකි අයහපත් තත්ත්වයන් සමස්ත මූල්‍ය අංශය පුරා ව්‍යාප්ත වීමේ බලපෑම තක්සේරු කිරීම පිණිස බැංකු අංශය සඳහා ණය අවදානම, වෙළඳපොළ අවදානම සහ ද්‍රවශීලතා අවදානම ආශ්‍රිතව ක්ෂුද්‍ර ආතති පරීක්ෂා සිදු කරන ලදී. බැංකු අංශයේ ණය අවදානම මත සමස්ත පද්ධතියේ ම ස්ථායීතාවට සිදු කළ හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා සාර්ව ආතති පරීක්ෂා ද සිදු කරන ලදී.

(ඇ) ප්‍රකාශන

2013 වසරේ මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම, 2014 වසරේ ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. 2013 මහ බැංකු වාර්ෂික වාර්තාව සඳහා "මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව" යන පරිච්ඡේදය ද 2014 මෑතකාලීන ආර්ථික ප්‍රවණතා යන ප්‍රකාශනය සඳහා "මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ ස්ථායීතාව" පරිච්ඡේදය ද මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී.

(ඈ) මූල්‍ය පද්ධති ස්ථායීතාවට අදාළ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය

මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවේ සහ මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශන කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව කටයුතු කරන ලදී.

(ඉ) අනෙකුත් ක්‍රියාකාරකම්

දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තුවල සහ නියෝජිත ආයතනවල කාලීන වාර්තා, ප්‍රකාශන සහ ඒවායේ ඵලදායී ක්‍රියාකාරිත්වයට දායක වීම සඳහා එම ආයතනයන්ට අදාළව පිළියෙල කරන අවදානම් වාර්තා (Risk Reports) සහ තොරතුරු සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. තවද, මහ බැංකුවට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට පහසු වන තොරතුරු සපයාලමින්, මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශයේ ණයවල මන්දගාමී වර්ධනය පිළිබඳව විශේෂ අධ්‍යයනයක් ද සිදු කරන ලදී.

## 14. අධිපති ලේකම්

2014 වර්ෂය තුළ, මහ බැංකු අධිපතිගේ නිල කාර්යයන් සිදු කිරීම සඳහා අවශ්‍ය ලේකම් හා සන්ධාන කටයුතු සැපයීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා වගකීම විය. ඒ අනුව, අධිපතිගේ හමුවීම් හා රැස්වීම් සංවිධානය, දේශන හා ලිපි සඳහා අවශ්‍ය කෙටුම්පත් සකස් කිරීම, මූල්‍ය වෙළඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම, පුවත්පත් තොරතුරු සාරාංශ හා අනෙකුත් තොරතුරු සැපයීම සිදු කරන ලදී. අධිපතිගේ දේශීය හා විදේශීය නිල සංචාර හා අධිපති සහ නියෝජ්‍ය අධිපතිවරුන්ගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීමද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සපයන ලද සන්ධාන සේවාවන් විය. මීට අමතරව, මහ බැංකුවේ හා අධිපතිගේ විශේෂිත ආරාධිත අමුත්තන්ට අවශ්‍ය සන්ධාන පහසුකම් සැපයීම ද සිදු කෙරුණි.

2009 ජූනි 29 වැනි දින පිහිටුවන ලද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව, 2015 පෙබරවාරි 9 වැනි දින වසා දමන ලදී. එහි කටයුතු හා වගකීම් ලේකම් දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.

## 15. මානව සම්පත් කළමනාකරණ

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික අරමුණ වනුයේ, ඉදිරි අභියෝග හමුවේ මහ බැංකුවේ සමස්ත අරමුණු ඉටුකර ගැනීමට දායක විය හැකි ඉහළ ඵලදායීතාවකින් යුත්, අභිප්‍රේරිත හා කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ ඇති කිරීමයි. 2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිය උපායමාර්ගික මෙන්ම මෙහෙයුම් මානව සම්පත් කළමනාකරණ කාර්යයන් වෙළඳපොළ මනා පරිචයන්ට අනුගත වෙමින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, මෙම වසරේ ප්‍රධාන ඉලක්කය වූයේ බැංකු කාර්යමණ්ඩලයට සිය රාජකාරී වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ දැනුම, කුසලතා හා නිපුණතා වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමයි. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් වූයේ, මහ බැංකු උපායමාර්ගික සැලැස්ම තුළ

හඳුනාගත් උපායමාර්ගයන්ට අනුකූලව පුහුණුවීම් ලබාදීම හා සංවර්ධනය, කාර්යසාධන කළමනාකරණය, අනුප්‍රාප්ති සැලසුම්කරණය හා උසස්වීම් ලබා දීම, නව සේවකයන් බඳවා ගැනීම, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම, බැංකුවේ සියලු අභ්‍යන්තර පාර්ශ්වයන් සමඟ සමීප සබඳතාවක් පවත්වා ගැනීම හා අනෙකුත් සාමාන්‍ය පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීමයි.

## 15.1 මානව සම්පත් ව්‍යුහය

2014 දෙසැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,483 ක් වූ අතර එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 675 කින් ද, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 645 කින් ද, සුළු සේවක කාර්යමණ්ඩලය 161 කින් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 2 කින් ද සමන්විත විය. 2014 වසර තුළ මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 38 ක් ද, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 20 ක් ද, සුළු සේවක පන්තියේ සේවකයින් 01 ක් ද බැංකු සේවයෙන් විශ්‍රාම ගිය අතර, මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 6 ක් හා මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 10 ක් බැංකු සේවාවෙන් ඉල්ලා අස්වන ලදී.

**II-5 රූප සටහන** **2014 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය**




## 15.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තිකයින්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා මහ බැංකුව, ඉහළ සුදුසුකම් හා නිපුණතාවලින් හෙබි දක්ෂ කාර්යමණ්ඩලයකින් සමන්විතය. 2014 දෙසැම්බර් මස අවසානය වන විට, ශ්‍රී ලංකා මහ බැංකුවේ සිටි ආචාර්ය උපාධි සුදුසුකම් සහිත නිලධාරීන් සංඛ්‍යාව 10 ක් වූ අතර ප්‍රථම උපාධි සුදුසුකමක්, පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ වෘත්තීය සුදුසුකමක් සහිත මාණ්ඩලික පන්තියේ සමස්ත නිලධාරීන් සංඛ්‍යාව 554 ක් විය. 2014 දෙසැම්බර් මස අවසානය වන විට බැංකු විෂයය පථයට අයත් ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් සපුරන ලද මාණ්ඩලික පන්තියේ හා මාණ්ඩලික නොවන පන්තියේ සමස්ත නිලධාරීන් සංඛ්‍යාව 636 ක් විය. 2014 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික පන්තියේ නිලධාරීන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු පහත II-13 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

ඉහත නිලධාරීන් ඔවුන්ගේ සුදුසුකම්, හැකියාවන්, නිපුණතාවන් හා අත්දැකීම් සැලකිල්ලට ගනිමින් මහ බැංකුවේ දෙපාර්තමේන්තු 27 සහ ප්‍රාදේශීය කාර්යාල 5 තුළ ඒ ඒ දෙපාර්මේන්තු/ප්‍රාදේශීය කාර්යාලවල කාර්යයන් ඵලදායි හා කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට හැකිවන පරිදි ස්ථානගත කර තිබිණි.

## 15.3 මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන්

### (අ) පුහුණු වැඩ කටයුතු හා සංවර්ධනය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 27 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලය සඳහා මහ බැංකුවේ වියදමින් ආර්ථික විද්‍යාව, බැංකුකරණය, සංඛ්‍යානය හා බැංකු විෂයය පථයට අදාළ අනෙකුත් විෂයය ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් පුහුණුව ලබාදීමට මහ බැංකුවට බලතල පැවරී ඇත. ඒ අනුව, ආර්ථික හා මූල්‍ය ක්ෂේත්‍රය තුළ දේශීය හා විදේශීය වශයෙන් සිදුවන වෙනස්කම් පිළිබඳව මහ බැංකු කාර්යමණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ දක්ෂතා හා නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු අවස්ථා සලසා දීමටත්, නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාවන් පුළුල් කිරීමේ

**II-13 සංඛ්‍යා සටහන** **2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික පන්තියේ නිලධාරීන්ගේ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්**

| කාණ්ඩය | නිලධාරීන් සංඛ්‍යාව | | | සාමාන්‍ය වයස අවුරුදු | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | මුළු සංඛ්‍යාව | | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | පශ්චාත් උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි | වෘත්තීය සුදුසුකම් |
| (i) මා. IV ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි | 59 | 19 | 78 | 56 | 15 | 53 | 3 | 3 | 4 | - |
| (ii) මා. III. 2 ශ්‍රේණිය | 42 | 14 | 56 | 52 | 8 | 32 | 1 | 1 | 14 | - |
| (iii) මා. III. 1 ශ්‍රේණිය | 17 | 25 | 42 | 48 | 2 | 16 | 1 | 4 | 17 | - |
| (iv) මා. II ශ්‍රේණිය | 91 | 115 | 206 | 42 | 28 | 41 | 3 | 26 | 80 | 5 |
| (v) මා. I ශ්‍රේණිය | 136 | 157 | 293 | 40 | 10 | 19 | 2 | 54 | 87 | 25 |
| **එකතුව** | **345** | **330** | **675** | **44** | **63** | **161** | **10** | **88** | **202** | **30** |

අරමුණින් දේශීය හා විදේශීය දිගුකාලීන පුහුණු අවස්ථා සලසා දීමටත්, 2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු සම්පාදනය කරන ලදී.

**(i) කෙටිකාලීන පුහුණු අවස්ථා**

පෙර වසරවල දී මෙන්ම, 2013 වසර අවසානයේ දී සිදු කරන ලද වාර්ෂික නිපුණතා අනුරූපන ක්‍රියාවලිය තුළින් හඳුනා ගත් බැංකු කාර්යමණ්ඩලයේ නිපුණතා පරතරයන් අවම කිරීමේ අරමුණින්, 2014 වසරේ පුහුණු සැලැස්ම තුළ සැලසුම් කළ පරිදි, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් බැංකු කාර්යමණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 3,046 ක් සැපයීමට කටයුතු කරන ලදී.

**(ii) කෙටිකාලීන විදේශීය පුහුණු අවස්ථා**

2014 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද කෙටිකාලීන විදේශීය පුහුණු අවස්ථා අතරට, පිළිගත් විදේශීය පුහුණු ආයතන, එංගලන්ත මහ බැංකුව (Bank of England), ඩොයිෂ් බුන්ඩෙස් බැංකුව (Deutsche Bundesbank), ඉන්දීය සංචිත බැංකුව (Reserve Bank of India), මලයාසියානු නෙගාරා බැංකුව (Bank Negara Malaysia), ඇමෙරිකා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත ක්‍රමය, (Federal Reserve System of USA) වැනි මහ බැංකු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, සියැසන් මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (Bank for International Settlements), ඉන්දියාවේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය හා ආසියා ශාන්තිකර ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය ආයතනයේ කෘෂිකාර්මික බැංකුකරණය පිළිබඳ පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය (APRACA CENTRAB) වැනි ආයතන මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ අධ්‍යයන චාරිකා ඇතුළත් විය. 2014 වසර තුළ මහ බැංකු කාර්යමණ්ඩලය සඳහා ලබා දුන් සමස්ත කෙටිකාලීන විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව 315 ක් වන අතර, ඒ පිළිබඳ තොරතුරු පහත II-14 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-14 සංඛ්‍යා සටහන — කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2014**

| ක්ෂේත්‍රය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ආර්ථික විද්‍යාව | 77 |
| මූල්‍ය ස්ථායීතාව | 67 |
| සංචිත කළමනාකරණය | 24 |
| රාජ්‍ය ණය කළමනාකරණය/ආයෝජන කළඹ කළමනාකරණය | 33 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 3 |
| තොරතුරු තාක්ෂණය හා ගෙවීම් පද්ධති | 21 |
| මහ බැංකු කටයුතු | 24 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 17 |
| මානව සම්පත් කළමනාකරණය | 26 |
| වෙනත් | 23 |
| **එකතුව** | **315** |

ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කටයුතු පිළිබඳ අනුකමිටුව විසින් කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථාවන්ට සහභාගි වූ නිලධාරීන් ඒ තුළින් ලැබූ ප්‍රගතිය ඇගැයීම සඳහා අඛණ්ඩව කටයුතු කළ අතර, ඒ අනුව එම නිලධාරීන් විසින් ලබාගත් දැනුම හා අවබෝධය භාවිත කොට විවිධ පැවරුම් ඉටු කිරීමට අවස්ථාව සලසන ලදී.

2014 වසර තුළ දී කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථාවන්ට සහභාගී වූ නිලධාරීන් විසින් එවැනි පැවරුම් 146 ක් සම්පූර්ණ කරන ලදී. මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද මාර්ගෝපදේශ සකස් කිරීම, දැනුම බෙදා දීමේ හා මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් පුහුණු අවස්ථාවන් තුළින් ලබා ගත් දැනුම උපයෝගී කරගෙන සම්මන්ත්‍රණ පැවැත්වීම, බැංකුව තුළ දැනට පවතින ක්‍රමවේදයන්, පද්ධතීන් හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට අදාළ යෝජනා කෙටුම්පත් කිරීම ආදිය මේ අතරට ප්‍රධාන වශයෙන් අයත් විය. 2014 වසර තුළ සිදු කරන ලද වටිනාකම් ආකලනයන් හා පැවරුම් සම්පූර්ණ කිරීම පිළිබඳ සාරාංශයක් පහත II-15 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-15 සංඛ්‍යා සටහන — 2014 වසර තුළදී කෙටිකාලීන විදේශ පුහුණුව ලැබූ නිලධාරීන් විසින් පැවරුම් සම්පූර්ණ කිරීම**

| කාණ්ඩය | පැවරුම් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා වූ මාර්ගෝපදේශ | 4 |
| දැනුම බෙදාදීමේ සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 100 |
| පද්ධතීන් හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා | 42 |
| **එකතුව** | **146** |

**(iii) කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා**

2014 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා 1,523 ක් මහ බැංකු කාර්යමණ්ඩලයට ලබා දුන් අතර ඊට ප්‍රධාන වශයෙන් අයත් වුයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කිරීමේ ආයතනය වන බැංකු විදු පියෙස හා අනෙකුත් දේශීය පිළිගත් ආයතන විසින් ලබා දුන් පුහුණු අවස්ථාවන්ය.

බැංකු විදු පියෙස විසින් ලබා දුන් පුහුණු අවස්ථාවන්ට නිලධාරීන් 668 ක් සහභාගී වූ අතර අනෙකුත් දේශීය ආයතන විසින් ලබා දුන් පුහුණු අවස්ථාවන්ට සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව 855 කි. දේශීය පුහුණු අවස්ථා සැපයීමේ දී ඒ සඳහා සහභාගී වන නිලධාරීන්ට තම දැනුම යාවත්කාලීන කර ගනිමින් කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට පහසුකම් සලසමින්, ආර්ථික විද්‍යාව, බැංකු අධීක්ෂණය, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපොළ, ක්ෂුද්‍ර මූල්‍යය, තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, අභ්‍යන්තර විගණනය සහ කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පුහුණු අවස්ථා ලබාදීමට ප්‍රමුඛත්වය දෙන ලදී.

**(iv) වැඩමුළු සහ භාෂා පුහුණු පාඨමාලා**

මහ බැංකු කාර්යමණ්ඩලයේ තෝරාගත් කණ්ඩායම්වල සුවිශේෂී පුහුණු අවශ්‍යතා හඳුනාගෙන, ඒ සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා සැපයීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී බැංකු විදු පියසෙහි සහයෝගය ඇතිව විවිධ වැඩමුළු 9 ක් සංවිධානය කරන ලදී. ඒ අනුව නායකත්වය, සේවක සහභාගීත්වය, අභිප්‍රේරණය, පුද්ගල පෞරුෂ සංවර්ධනය, ඉදිරිපත් කිරීමේ හැකියාව සහ වාර්තා ලිවීම ආදී අංශ ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු පවත්වන ලදී. මෙම වැඩමුළු අතරට, 2014 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට හඳුන්වා දුන්, මාණ්ඩලික නොවන පන්තියේ සිට මාණ්ඩලික පන්තියට උසස් කළ නිලධාරීන් 27 සඳහා වූ එක් මසක විශේෂ පුහුණු පාඨමාලාව ද ඇතුළත් වේ. මීට අමතරව ද්‍රවිඩ භාෂාව කථා කරන ප්‍රජාව සඳහා වඩාත් හොඳින් සේවාවන් ලබාදීම උදෙසා මහ බැංකු කාර්යමණ්ඩලයට ද්‍රවිඩ භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට පහසුකම් සපයමින්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ද්‍රවිඩ භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**(v) දිගු කාලීන පුහුණු අවස්ථා**

මහ බැංකු නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාවන් පුළුල් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන මහ බැංකු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ, මහ බැංකු මාණ්ඩලික නිලධාරීන්ට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කිරීම සඳහා පහසුකම් සැපයීමට ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව අඛණ්ඩව කටයුතු කරන ලද අතර, ඒ අනුව 2014 වසර තුළ දී එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව යන රටවල පිළිගත් විශ්වවිද්‍යාල වල ආචාර්ය උපාධි හා විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන කටයුතු කිරීම සඳහා පිළිවෙළින් නිලධාරීන් 5 දෙනෙකුට හා 24 දෙනෙකුට ද අනුග්‍රහය දක්වන ලදී. මේ අතර, ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව සම්පූර්ණ කරන ලද නිලධාරීහු 2ක් සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව සම්පූර්ණ කරන ලද නිලධාරීන් 11ක් 2014 වසරේ දී නැවත බැංකු සේවයට වාර්තා කළහ.

2010 සිට 2014 දක්වා කාලසීමාව තුළ මහ බැංකු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කළ නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත II-16 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**(ආ) කාර්යසාධන කළමනාකරණය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රධාන කොටස් 4කින් සමන්විත වේ. එනම්, සේවකයන්ගේ රැකියා පිරිවිතර සකස් කිරීම, උපායමාර්ගික සැලැස්ම හා අනුගත වන පරිදි ඉලක්ක පිහිටුවීම, අඛණ්ඩ පදනමක් මත කාර්යසාධනය නිරීක්ෂණය හා කාර්යසාධනය ඇගැයීමයි. කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලියේ දී එක් එක් සේවකයාගේ කාර්යසාධන මට්ටම, කාර්යසාධන ඇගැයීම් ආකෘතියෙහි දක්වා ඇති පරිදි එක් එක් ඉලක්කය ළඟා කරගත් මට්ටම සහ එම ඉලක්ක ළඟා කර ගැනීමට සේවකයා සතු වූ සාමාන්‍ය නිපුණතා හා තාක්ෂණික නිපුණතා මට්ටම් වලට සුදුසු අගයන් ලබා දෙමින් සිදු කරනු ලබයි. අවසාන කාර්යසාධන මට්ටම්, සේවක උසස්වීම් පටිපාටියේ එක් සංරචකයක් ලෙස යොදා ගැනේ.

2014 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2013 වසර සඳහා මහ බැංකුවේ සියලුම සේවකයන්ගේ කාර්යසාධනය ඇගැයීම උපායමාර්ගික සැලැස්මෙහි ඉලක්කගත කාලසීමාවන් තුළ දී ම සම්පූර්ණ කරන ලදී. එමෙන්ම, 2014 වසර සඳහා දෙපාර්තමේන්තුවල සහ සේවකයන්ගේ රැකියා ඉලක්ක සකස් කිරීම ද, උපායමාර්ගික සැලැස්ම තුළ සැලසුම් කළ පරිදි නිම කිරීමට කටයුතු කරන ලදී. තවද, 2014 වසරේ මුල් භාගය තුළ සේවකයන්ගේ කාර්යසාධනය ඇගැයීම සඳහා එක් එක් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

**(ඇ) අනුප්‍රාප්ති සැලසුම්කරණය සහ උසස්වීම්**

ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සඵලදායී අනුප්‍රාප්ති සැලසුම්කරණය තහවුරු කරමින්, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී දෙපාර්තමේන්තු ප්‍රධානීන් 4 දෙනෙකු සහකාර අධිපති ධූරයට උසස් කිරීමට සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් 11 දෙනෙකු අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානී ධූරයට උසස් කිරීමට පහසුකම් සලසන ලදී.

මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් මාණ්ඩලික පන්තියට උසස් කිරීම සඳහා වන උසස්වීම් පටිපාටිය යටතේ මාණ්ඩලික නොවන පන්තියේ IV සහ V ශ්‍රේණිවල නිලධාරීන් 27 දෙනෙකු, 2014 වසරේ දී මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමට ද කටයුතු කරන ලදී. තවද, විවිධ පන්තිවලට

**II-16 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන්**

| | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සුදුසුකම | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය | 15 | 6 | 17 | 10 | 18 | 17 | 11 | 19 | 24 | 11 |
| ආචාර්ය උපාධිය | 1 | 1 | 2 | 2 | 4 | 2 | 6 | 0 | 5 | 2 |

අයත් සේවකයන් 66 දෙනෙකුට, අදාළ උසස් කිරීම් පටිපාටි යටතේ නියමිත ශ්‍රේණි උසස්වීම් ලබාදීමට ද කටයුතු කරන ලදී.

(ඇ) බඳවා ගැනීම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2014 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ පාර්ශවික බඳවා ගැනීම් ප්‍රතිපත්තිය යටතේ තාක්ෂණ නිලධාරීන් 4 දෙනෙකු සහ එක් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරුවකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී. මීට අමතරව, මහ බැංකුවේ පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුවට බාහිර සේවා සැපයුම්කරුවන් මගින් ඇතැම් සේවා ලබා ගැනීම සඳහා ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

(ඉ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම

බහුවිධ කුසලතාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් ඇති කොට මහ බැංකුවේ සමස්ත ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් යුක්තව, ශ්‍රී ලංකා මහ බැංකුව සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමේ ක්‍රියාවලියක් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ 2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරීන් 29 ක්, මාණ්ඩලික නොවන නිලධාරීන් 52 ක් හා සුළු සේවකයින් 14 ක් 2014 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර මාරු කිරීමට කටයුතු කරන ලදී.

(ඊ) සේව්‍ය සේවක සබඳතා

මහ බැංකුවේ කාර්මික සාමය පවත්වා ගැනීම සඳහා පහසුකම් සලසන්නාගේ කාර්යභාරය අඛණ්ඩව ඉටු කරමින් 2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව, කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති අතර සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී. ඒ අනුව, 2014 වසර තුළ දී එවැනි සාකච්ඡා වාර 7 ක් සංවිධානය කරන ලද අතර එමගින් උසස් කිරීම්, පුහුණුවීම්, සුභසාධනය හා සාමාන්‍ය පරිපාලනය ආදී කටයුතු සම්බන්ධයෙන් පැවති ගැටලු ගණනාවක් විසඳා ගැනීමට කළමනාකාරිත්වයට හා වෘත්තීය සමිතිවලට ඉඩ ප්‍රස්ථාව සැලසුණි.

(උ) අනෙකුත් සාමාන්‍ය පරිපාලනමය කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාන්‍ය පරිපාලනයට අදාළ විවිධ කරුණු පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වයට පහසුකම් සපයමින් 2014 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ආයතනික කළමනාකරණ කමිටු රැස්වීම් වාර 20 ක් සංවිධානය කරන ලදී. එමෙන්ම, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට තම දෙපාර්තමේන්තු විෂයය පථයන්ට අයත් විවිධ කරුණු පිළිබඳව කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කොට සාමූහික තීරණවලට එළැඹීමට අවස්ථාව සලසමින්, 2014 වසර තුළ දී දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ රැස්වීම් 12 ක් ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙමගින්, කළමනාකාරිත්වයට එම රැස්වීම්වල දී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට ද පහසුකම් සැලසිණ.

## 15.4 උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයින් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා පුහුණු අවස්ථා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව ප්‍රාග්ධනය සඵලදායී කිරීමට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමූහික සමාජයීය වගකීම ඉටු කරනු වස් උපාධිධාරීන් සඳහා වන සය මාසික පුහුණු පාඨමාලාව, උපාධි අපේක්ෂකයින් සඳහා වන ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා වන එක් අවුරුදු ගණකාධිකරණ පුහුණු පාඨමාලාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරන ලදී. මෙම පුහුණු පාඨමාලාවන්හි අරමුණ වූයේ දක්ෂතා සහිත තරුණ සිසුන් හට විශ්ව විද්‍යාල/වරලත් ගණකාධිකරණ ආයතනය තුළින් ලබන න්‍යායාත්මක විෂය දැනුම පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සැලසීමයි.

(අ) උපාධිධාරී පුහුණු වැසටහන

නවක උපාධිධාරීන් හට මහ බැංකුවේ ප්‍රායෝගික පුහුණුවක් ලබාගැනීමට පහසුකම් සලසා දෙන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව, 2013 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපාධිධාරී පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී. ඒ අනුව 2014 වසරේ දී ද, දේශීය විශ්ව විද්‍යාල 3 කින් තෝරා ගනු ලැබූ උපාධිධාරීන් 5 දෙනෙකුට රැකියා වෙළඳපොළ තුළ ඔවුන්ගේ රැකියා නියුක්තභාවය ඉහළ නංවා ගැනීමට පහසුකම් සලසමින්, මහ බැංකුවේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු සලස්වන ලදී.

(ආ) උපාධි අපේක්ෂක පුහුණු වැසටහන

උපාධි අපේක්ෂකයන්ට විශ්ව විද්‍යාල තුළ දී ලබන න්‍යායාත්මක විෂයය දැනුම මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු තුළ ප්‍රායෝගිකව භාවිත වන අයුරු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින්, මහ බැංකුව 2011 වසරේ සිට උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන මඟින් උපාධි අපේක්ෂකයන්ට රැකියා වෙළඳපොළ තුළ ඔවුන්ගේ රැකියා නියුක්තභාවය ඉහල නංවා ගැනීමට ඉවහල් වන පූර්ව අවශ්‍යතා වන මනා පෞරුෂත්වය හා වෘත්තීය හැකියාව වැඩිදියුණු කර ගැනීමට ද පහසුකම් සැලසේ. 2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ එක්ව දේශීය විශ්වවිද්‍යාල 12 කින්, විදේශීය විශ්වවිද්‍යාල

3 කින්, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් (Sri Lanka Institute of Information Technology) සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් තෝරා ගනු ලැබූ සිසුන් 116 දෙනෙකු සඳහා උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහන් 4 ක් සාර්ථකව පවත්වන ලදී. එමෙන්ම, 2011-2014 කාලසීමාව තුළ උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහන යටතේ සිසුන් 355 දෙනෙකුට පුහුණුව ලබා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අවස්ථාව සලසා දෙන ලදී.

### (ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා වන ගණකාධිකරණ පුහුණු වැඩසටහන

2014 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන්ට වරලත් ගණකාධිකරණ පාඨමාලාවේ සහතිකපත්‍ර මට්ටම සඳහා වන එක් අවුරුදු අනිවාර්ය පුහුණු අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා මහ බැංකුවේ අත්දැකීම් සහිත වරලත් ගණකාධිකාරීවරුන් යටතේ පුහුණුව ලැබීමට පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, සිසුන් 25 දෙනෙකුට ගණකාධිකරණ පුහුණුවන්නන් ලෙස මහ බැංකුවේ පුහුණුව ලැබීමට පහසුකම් සලසා දෙන ලදී.

## 15.5 2014 වසර තුළ අධිපති විසින් විදේශයන්හි සහභාගි වූ රැස්වීම්

1. ජනවාරි මාසයේ දී සිංගප්පූරුවේ දී පැවති ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයෝජක සමුළුව (Invest Sri Lanka Investor Forum) හා වොෂින්ටනයේ දී ආයෝජකයන් සමඟ පැවති රැස්වීම.
2. අප්‍රේල් මාසයේ දී ලන්ඩනයේ හා වොෂින්ටනයේ ආයෝජකයන් සමග පවත්වන ලද රැස්වීම්. වොෂින්ටනයේ පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුවේ වසන්ත සෘතුවේ දී පවත්වන ලද රැස්වීම් (Spring Meetings) සහ බැංකොක් හා ලොස් ඇන්ජලීස්හි ආයෝජකයන් සමග පවත්වන ලද රැස්වීම්.
3. මැයි මාසයේ දී, ලන්ඩනයේ දී පැවති ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයෝජක සමුළුවේ (Invest Sri Lanka Investor Forum) ප්‍රධාන දේශනය පැවැත්වීම.
4. ජුනි මාසයේ දී රෝමයේ පැවති "යුරේසියා" (Eurasia) වැඩමුළුවේ ආරම්භක සැසියේ දී හා සූරිච්හි පැවති 3 වන ස්විස් - ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුවේ දී ප්‍රධාන දේශන පැවැත්වීම සහ මොංගෝලියාව සඳහා වූ සාර්ව ආර්ථික දර්ශනය පිළිබඳ ඉහල මට්ටමේ නිලධාරීන් සඳහා වූ සම්මන්ත්‍රණයේ දේශනය හා සිංගප්පූරුවේ දී ආයෝජකයින් සමඟ සාකච්ඡා පැවැත්වීම.
5. අගෝස්තු මාසයේ චීනයේ දී චීන මහජන බැංකුවේ අධිපති සොවු ෂියාඕචුආන් මහතා සමග පැවති සාකච්ඡා.
6. සැප්තැම්බර් මාසයේ දී ක්වේට්හි දී ඕසීඒ (OCA) ක්‍රීඩා සම්මේලනයේ සහ ආසියානු ඔලිම්පික් මණ්ඩලයේ සභාපති ෂෙයික් අහමඩ් අල්-ෆහාඩ් අල්-හබාන් මහතා සමඟ පැවති සාකච්ඡාව, නිව්යෝර්ක්හි පැවති ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයෝජක සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම, වොෂින්ටනයේ දී ආයෝජකයින් සමඟ පැවැත්වූ සාකච්ඡාව සහ කොරියාවේ ඉන්චන් හි දී පැවති 33 වන ඕසීඒ (OCA) මහා සමුළුවට සහභාගී වීම.
7. ඔක්තෝබර් මාසයේ දී ලන්ඩනයේ දී Conservative Friends for Sri Lanka (CFSL) මඟින් පැවැත්වූ "ශ්‍රී ලංකා - සාමයෙන් හා ප්‍රතිසන්ධානයෙන් සෞභාග්‍යය කරා (Sri Lanka - From Peace and Reconciliation to Prosperity)" නමැති කොන්සර්වේටිව් පක්ෂ සම්මන්ත්‍රණයේ දී දේශනයක් පැවැත්වීම. ඕස්ට්‍රේලියාවේ දී "CRC - Corporate Renewal Conference" හි ප්‍රධාන දේශනය පැවැත්වීම.
8. නොවැම්බර් මාසයේ දී ඉන්දියාවේ පැවති ඉන්දියානු ආර්ථික සමුළුවේ දී "මූල්‍ය අන්තර්ගතභාවය" පිළිබඳ දේශනයක් පැවැත්වීම.

## 15.6 උසස් කිරීම්/පත් කිරීම්

1. සහකාර අධිපති පී. සමරසිරි මහතා 2014 ජූනි 01 දින සිට නියෝජ්‍ය අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
2. 2014 අගෝස්තු 28 දින සිට පහත සඳහන් නිලධාරීන් මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් හා පත් කිරීම් සිදු කරන ලදී.
   i. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත මුදාහැර සිටින එස්.ආර්. ආටිගල මහතා සහකාර අධිපතිවරයකු ලෙස පත් කරන ලදී.
   ii. එච්.ඒ. කරුණාරත්න මහතා සහකාර අධිපතිවරයකු ලෙස පත් කරන ලදී.
   iii. සී.පී.ඒ. කරුණාතිලක මහතා සහකාර අධිපතිවරයෙකු ලෙස පත් කරන ලදී.
   iv. ඩී. වසන්ත මහතා සහකාර අධිපතිවරයකු ලෙස පත් කරන ලදී.
3. 2014 අගෝස්තු 28 දින සිට පහත සඳහන් නිලධාරීන් මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියට උසස් කිරීම් හා පත් කිරීම් සිදු කරන ලදී.
   i. ආචාර්ය එම්.ඉසෙඩ්.එම්. ආසිම් මහතා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.
   ii. කේ.එම්. අබේකෝන් මහතා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   iii. කේ.වී.කේ. අල්විස් මහතා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   iv. කේ.එච්.ඒ.එස්. ආරියරත්න මහතා බැංකු විදු පියසෙහි වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

v. කේ.එන්.එන්.එම්. බණ්ඩාර මහත්මිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

vi. ඩී.වී.එස්. දයාවංශ මහත්මිය ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක ලේකම් ලෙස පත් කරන ලදී.

vii. ආර්.එම්. ජයවර්ධන මහතා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

viii. ආචාර්ය ආර්.ඒ. පෙරේරා මහත්මිය ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ix. කේ.ඩී.ආර්. පියතිලක මහතා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

x. ඒ.ජී.යූ. තිලකරත්න මහතා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xi. පී.ඒ. විජේරත්න මහතා මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

4. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ජේ.පී.ආර්. කරුණාරත්න මහතා 2014 පෙබරවාරි 06 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2014 අප්‍රේල් 29 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

5. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච්.එම්. ඒකනායක මහතා 2014 අප්‍රේල් 29 දින සිට මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

6. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී සී.එම්.ඩී.එන්.කේ. සෙනෙවිරත්න මහත්මිය 2014 අප්‍රේල් 29 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධිකාරී ලෙස ද, අනතුරුව 2014 ඔක්තෝබර් 29 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස ද පත් කරන ලදී.

7. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.එස්.කේ. ධර්මවර්ධන මහතා 2014 අප්‍රේල් 29 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරීවරයකු වශයෙන් පත් කරන ලදී.

8. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ටී.ඩී.එච්. කරුණාරත්න මහතා 2014 අප්‍රේල් 29 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරීවරයකු වශයෙන් පත් කරන ලදී.

9. මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඩී.එම්. රූපසිංහ මහතා 2014 ජූනි 11 දින සිට විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

10. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච්. අමරතුංග මහතා 2014 ජූනි 17 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

11. දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී.ඒ.ජී.කේ. විජේතුංග මහතා 2014 ජූනි 17 දින සිට ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2014 දෙසැම්බර් 17 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

12. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ සී.එන්. විජයසේකර මහතා 2014 ජූනි 17 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2014 අගෝස්තු 29 දින සිට බැංකු විදු පියෙසෙහි වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

13. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී එම්.අයි. සුහියාන් මහතා 2014 අගෝස්තු 29 දින සිට මහ බැංකුවේ ලේකම් ලෙස පත් කරන ලදී.

14. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරී පී.වී.එල්. නන්දසිරි මහතා 2014 අගෝස්තු 29 දින සිට වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

15. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඒ.ඒ.එම්. තාසිම් මහතා 2014 අගෝස්තු 29 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

16. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ටී.එච්.බී. සරත්චන්ද්‍ර මහතා 2014 සැප්තැම්බර් 15 දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

17. බැංකු විදු පියෙසෙහි වැඩබලන අතිරේක අධ්‍යක්ෂ කේ.එච්.ඒ.එස්. ආරියරත්න මහතා 2014 සැප්තැම්බර් 15 දින සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

18. මහ බැංකුවේ වැඩබලන අතිරේක ලේකම් ඩී.වී.එස්. දයාවංශ මහත්මිය 2014 සැප්තැම්බර් 15 දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

19. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ආර්.එම්. ජයවර්ධන මහතා 2014 සැප්තැම්බර් 15 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

20. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ කේ.ඩී.ආර්. පියතිලක මහතා 2014 සැප්තැම්බර් 15 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

21. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්.බී.ඩී. කරුණාරත්න මහතා 2014 දෙසැම්බර් 31 දින සිට දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

### 15.7 විශ්‍රාම ගැනීම්

1. සහකාර අධිපති ඒ. කමලසිරි මහතා 2014 ජූලි 21 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
2. මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩබ්.ආර්.ඒ. ධර්මරත්න මහතා 2014 ජූලි 29 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
3. විනිමය පාලක පී.එච්.ඕ. චන්ද්‍රවංශ මහතා 2014 සැප්තැම්බර් 11 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

### 15.8 මුදාහරිනු ලැබ සිටි නිලධාරීන්

1. සහකාර අධිපති කේ.ඩී. රණසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂවරයකු ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
2. සහකාර අධිපති එස්.ආර්. ආටිගල මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
3. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
4. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ කේ.එම්.එම්. සිරිවර්ධන මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
5. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එම්. මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.
6. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්.ජී.එස්.ඩී. ජයසේකර මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
7. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්.ජේ.කේ. ගුරුගේ මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
8. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ ජේ.ඒ.ඒ. ප්‍රියන්ත මහතා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත.
9. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්. රණසිංහ මහත්මිය අධිකරණ අමාත්‍යාංශය වෙත.
10. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එච්.එස්.එස්. සිල්වා මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
11. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ජේ.එන්. දන්තනාරායන මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
12. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එස්.පී. සේදර මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.
13. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ නීති නිලධාරිනී එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

### 15.9 වැටුප් රහිත අධ්‍යයන නිවාඩු මත සිටින නිලධාරීන්

1. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ යූ.පී. අලවත්තගේ මහතා 2012 සැප්තැම්බර් 04 දින සිට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා සිටී.

## 16. තොරතුරු තාක්ෂණ

2014 වර්ෂය තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට සුවිශේෂී වර්ෂයක් විය. එම වසර තුළ දී නවීනතම තාක්ෂණය භාවිතයෙන් නවමු ව්‍යාපාරික මට්ටමේ පරිගණක යෙදවුම් පද්ධතීන් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 'මධ්‍ය ආදායම් උගුල' (Middle Income Trap) ජය ගැනීමේ උපාය මාර්ගික ක්‍රියාදාමයට උර දීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු සහ සන්නිවේදන (ICT) තාක්ෂණ අවශ්‍යතා සපුරාලීමේ කර්තව්‍ය ඉටුකරමින්, විවිධ ක්‍රියාවලියන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව පහත දැක්වෙන පුළුල් අංශ 5 ක් යටතේ දායකත්වය සපයන ලදී.

i නවීන මෘදුකාංග සහ සේවා හඳුන්වාදීම

ii තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම්හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම

iii ජාතික වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා දායකත්වය සැපයීම

iv තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

v තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිපුණතා ඉහළ නැංවීම

**(i) නවීන මෘදුකාංග සහ සේවා හඳුන්වාදීම**

ව්‍යාපාරික ක්‍රියාවලියන්හි ගුණාත්මක භාවය, ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය සහ උපයෝජ්‍යතාවය (availability) වැඩිදියුණු කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව නවමු, ඵලදායී නිපැයුම් සහ සේවා අඛණ්ඩව හඳුන්වා දෙන ලදී. එසේම දැනට පවතින සියලුම ස්වයංක්‍රීය පරිගණක යෙදවුම් නිසි පරිදි නඩත්තු කිරීම ද සිදු කෙරිණි. පසුගිය වර්ෂය තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සමහරක් පහත දැක්වේ.

- විවිධ පහසුකම්වලින් හෙබි අනන්‍ය මහ බැංකු අවශ්‍යතා සපුරාලීම සඳහා, ව්‍යාපාරික ප්‍රජාව පිළිගත් ගිණුම්කරණ භාවිතයන් සහ ප්‍රමිතීන්ට අනුකූල වූ ඒකාබද්ධ පොදු ලෙජර් ගිණුම්කරන පද්ධතිය (iGLAS) හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතියෙහි ගුණාත්මක භාවය බ්‍රිතාන්‍ය පරිගණක සංගමය විසින් සංවිධානය කරන ලද ජාතික මට්ටමේ අනර්ඝ තත්ත්වයේ මෘදුකාංග සම්මානයෙන් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය විසින් සංවිධානය කරන ලද ඉ-ස්වාභිමානී (e-Swabhimani) සම්මානයෙන් ඇගයීමට ලක් කෙරුණි.

- ඉහළ වටිනාකමින් යුත් ගෙවීම් සඳහා භාවිතා වන ලංකා පියවීම් (Lanka Settle) පද්ධතියේ යෙදවුම් මෘදුකාංගය වන CAS/CSS 3.6 අනුවාදය CAS/CSS 3.7 අනුවාදය දක්වා යාවත්කාලීන කරන ලදී.

- ණය උපකරණ වලට අදාළ තොරතුරු ගබඩා කිරීම සඳහා සහ ප්‍රාථමික නිකුතුන් සහ ණය උපකරණ ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය මධ්‍යගත කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙනුවෙන් පොදු දත්ත සමුදායක් නිර්මාණය කරන ලදී.

- බැංකු අධීක්ෂණ, ආර්ථික පර්යේෂණ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල අවශ්‍යතා සපුරාලීම සඳහා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS) අනුකූල වන සේ, නව වාර්තා එක් කරමින් නියාමන මූල්‍ය වාර්තා පද්ධතිය (FinNet) වැඩිදියුණු කරන ලදී.

- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා තත්කාලීන දත්ත වලංගුකරණය (Real Time Data Validation) සහිත නව සේවාවන් අන්තර්ජාලය උපයෝගී කර ගනිමින් හඳුන්වා දෙන ලදී.

- හස්තමය ක්‍රියාකාරකම් (Manual Operations) අවම කිරීම සහ කාර්යයන් විමධ්‍යගත කිරීම මෙන්ම එකම කාර්යය නැවත සිදුවීම වැළැක්වීම සඳහා හඳුන්වා දෙන ලද මානව සම්පත් කළමනාකරණ පද්ධතියෙහි (eHRNet) කාර්යමණ්ඩල වැටුප් සහ ණය අයකර ගැනීමේ මොඩියුලයන් නිර්මාණය කරන ලදී.

- මුදල් සුරක්ෂිතාගාර අතර පවතින ව්‍යවහාර මුදල් ප්‍රවාහය සුමටව පාලනය කිරීම සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ව්‍යවහාර මුදල් වර්ගයක ලේඛනයක් (Inventory) ලබා ගැනීම සඳහා ව්‍යවහාර මුදල් ලේඛන කළමනාකරණ පද්ධතිය (CIMS) ස්ථාපිත කරන ලදී.

- පෞද්ගලික තොරතුරුවලට ස්වයං ප්‍රවේශයක් ලබාදීම සඳහාත්, තොරතුරු තාක්ෂණ සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවලට වඩාත් හොඳ සේවාවන් සැපයීම සඳහා වූ උපකාරක අංශයේ (Help Desk) සේවාවන් සඳහාත් විශේෂාංග හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විද්‍යුත් සන්ධිස්ථානය වන 'මංසල' වැඩිදියුණු කරන ලදී.

**(ii) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම**

ඉහළ සේවා උපයෝජ්‍යතාවක් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ යටිතල පහසුකම් නඩත්තු කරන ලද අතර, විකසනය වන්නා වූ ව්‍යාපාර සහ තාක්ෂණ ඉල්ලුමට යෝග්‍ය වන පරිදි සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුකූල වන සේ එම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදු කරන ලදී. පසුගිය වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එසේ නඩත්තු කරන ලද සහ වැඩිදියුණු කරන ලද වැදගත් පද්ධති කිහිපයක් පහත දැක්වේ.

- පද්ධතිමය වශයෙන් වැදගත් වූ ගෙවීම් හා පියවීම් පද්ධතිය (Lanka Settle) සහ අනෙකුත් ඉතා වැදගත් මෘදුකාංග පද්ධතීන්හි සියයට 99.8ක පද්ධති උපයෝජ්‍යතාවයක් පවත්වා ගනිමින් නඩත්තු කිරීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමත් විය.

- ස්විෆ්ට් (SWIFT) පණිවිඩවල අපේක්ෂිත වර්ධන පරිමාව දරා ගැනීමට සහ වඩාත් යෝග්‍ය කාර්යසාධනයක් සැපයීමේ අරමුණින් ස්විෆ්ට් සන්නිවේදන කටයුතු සඳහා භාවිතා වන සේවාදායකය (Server) වේගවත් සහ වඩාත් ඉක්මනින් ප්‍රතිචාර දක්වන්නා වූ සේවාදායකයකින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

- වඩාත් හොඳ සේවා උපයෝජ්‍යතාවක්, විශ්වසනීයත්වයක් සහ ධාරිතාවක් සැපයීමේ අරමුණින් ආයතනික තොරතුරු තාක්ෂණ ජාලය යාවත්කාලීන කිරීම සහ ප්‍රමිතිගත කිරීම සිදු කරන ලදී.

- ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව කරගෙන යෑමටත්, ආයතනික තොරතුරු තාක්ෂණ සේවාවන්ට පිවිසීමට සහ වීඩියෝ සම්මන්ත්‍රණ (Video Conferencing) පහසුකම් භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වීමටත් ප්‍රාදේශීය කාර්යාල, අතථ්‍ය පෞද්ගලික ජාලයක් (VPN) තුළින් ආයතනික ජාලය සමඟ සම්බන්ධ කරන ලදී. තවදුරටත් ප්‍රාදේශීය කාර්යාලවල දැනට පවත්නා රැහැන් ජාල ප්‍රතිසංවිධානය කිරීම තුළින් හෝ රැහැන් රහිත (Wi-Fi) ජාල ස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පරිගණක ජාල පුළුල් කරන ලදී.

- මයික්‍රොසොෆ්ට් නිෂ්පාදන භාවිතා කරමින් තත්කාලීන සහයෝගිත්වය, ඩිජිටල් හිමිකම් කළමනාකරණය, විද්‍යුත් සන්නිවේදනය සහ වැඩතල (Desktop) කළමනාකරණයෙහි නවමු සොයාගැනීම්වල වැඩිදියුණු කරන ලද ගුණාංග ක්‍රියාවට නැංවීම සඳහා දැනට පවතින ව්‍යවසාය ගිවිසුම් අලුත් කිරීම සඳහා වන ප්‍රසම්පාදන (Procurement) ක්‍රියාවලිය අවසන් කරන ලදී.

**(iii) ජාතික වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා ආයකත්වය සැපයීම**

ජාතික ගෙවීම් පද්ධතියේ ප්‍රතිසංස්කරණ සඳහා ඵලදායී උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියාකරමින් ජාතික ගෙවීම් කවුන්සිලයේ පෙරදැක්මට අනුව ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා තාක්ෂණික විශේෂඥතාවය තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සපයන ලදී. වර්ෂය තුළ දී පහත දැක්වෙන ජාතික ව්‍යාපෘති සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීහු තම තාක්ෂණික ආයකත්වය සැපයූහ.

- ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම (LCPL) විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන පොදු කාඩ්පත් සහ ගෙවීම් ස්විචය (CCAPS) යටතේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය (CAS), පොදු විද්‍යුත් අරමුදල් හුවමාරු ස්විචය (CEFTS), පොදු ජංගම ගෙවීම් ස්විචය (CMobs) සහ පොදු විකුණුම් ස්ථාන ස්විචය (CPOS) ස්ථාපිත කිරීම.
- දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම.
- මහා භාණ්ඩාගාරයෙහි ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (ITMIS) මිලදී ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරු පද්ධති සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය අතර අතුරු මුහුණත් (Interface) ගොඩනැගීම.
- ණය තොරතුරු කාර්යාංශය (CRIB) සඳහා වැඩිදියුණු කළ ගුණාංග සහිත නව ස්වයංක්‍රීය මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම.

**(iv) තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය**

අවදානම පිළිබඳ දැනුම්වත් වූ සංස්කෘතියක් ස්ථාපනය කිරීම සඳහා ඵලදායී තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුවක වැදගත්කම සැලකිල්ලට ගනිමින් පූර්ව විචාරීව අවදානම අඩු කිරීමට සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ තොරතුරු තාක්ෂණ ආරක්ෂණය ශක්තිමත් කිරීමට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- අවම පිළිගත හැකි මට්ටමේ තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන් සහිත තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතියේ ISO/IEC 27000 කාණ්ඩය මත පදනම් වූ මූලික ආරක්ෂණ ප්‍රමිතීන් (Baseline Security Standards) බලපත්‍රලාභී බැංකු සඳහා හඳුන්වා දෙන ලදී.
- ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම යටතේ (LCPL) තොරතුරු ආරක්ෂණ ප්‍රයත්න සම්බන්ධීකරණය සඳහා මධ්‍යගත සංවිධානයක් ලෙස බැංකු පරිගණක ආරක්ෂණ සිද්ධි ප්‍රතිචාර කණ්ඩායම (BankCSIRT) ස්ථාපනය කරන ලදී. මෙම කණ්ඩායම, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම, ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය නියෝජනය කරන නියාමන කමිටුවක් මගින් පාලනය වේ.
- සයිබර් තර්ජනවලට (Cyber Threats) එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු පද්ධතීන්හි ආරක්ෂාව තර කිරීම සඳහා තොරතුරු ආරක්ෂණ කළමනාකරණය [Information Security Management (ISM)] තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ නව ප්‍රධාන කාර්තව්‍යයක් ලෙස හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරු පද්ධතීන්හි ආරක්ෂණ පරීක්ෂණ (Securiy Tests) දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ විශේෂඥතාව භාවිතා කරමින් සිදු කරන ලද අතර, එම නිරීක්ෂණ උපයෝගී කර ගනිමින් ආරක්ෂණය බලාත්මක කරන ලදී.
- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි [Information Security Policy (ISP)] 2.3 අනුවාදය සහ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අනෙකුත් අදාළ ප්‍රතිපත්ති ලේඛන විමර්ශනය කරන ලද අතර, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල කාලීන වෙනස්කම් සහ ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරු ආරක්ෂණ කළමනාකරණ කර්තව්‍යයට නිසි ලෙස යොමු වීම සහතික කිරීම සඳහා සංශෝධනයන් සහ වැඩිදියුණු කිරීම් සහිත තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියේ 3.0 අනුවාදය සම්පාදනය කරන ලදී.

**(v) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිපුණතා ඉහළ නැංවීම**

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සතු දැනුම වර්ධනය කරගැනීම සඳහා දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු මෙන්ම පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා ලබාදීම අඛණ්ඩව සිදු කෙරුණි. ඒ අනුව, නිලධාරීන් 35 දෙනෙක් දේශීය කෙටිකාලීන පුහුණු සඳහා සහභාගි වූ අතර, නිලධාරීන් 6 දෙනෙක් විදේශීය කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගි විය. තවද, එක් නිලධාරියෙකු විදේශ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

තවදුරටත් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු විදු පියෙස සඳහා නිලධාරීන් සම්පත් දායකයන් ලෙස මුදා හරින ලදී. එමෙන්ම දෙපාර්තමේන්තු දැනුම්වත් කිරීමේ සැසි අවශ්‍ය පරිදි පවත්වන ලදී.

මහ බැංකු අතර කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් බංග්ලාදේශ බැංකුව, නේපාල රස්ට්‍රා බැංකුව සහ භූතානයේ රාජකීය මූල්‍ය අධිකාරිය යන මහ බැංකුවලින් පැමිණි කණ්ඩායම් සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ඔවුන්ගේ දැනුම සහ විශේෂඥතාව ලබාදෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්ගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් තැපැල් හා විද්‍යුත් සන්ධිස්ථානය වන 'මංසල' හරහා තාක්ෂණික උපදේශයන් (Technical Tips) සහ කෙටි වීඩියෝ පසුරු (Video Clips) සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

# 17. අභ්‍යන්තර විගණන

1951 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ මෙහෙවර සහ කාර්ය වපසරියත්, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂකගේ සහ කාර්ය මණ්ඩලයේ වගවීම, ස්වාධීනත්වය, වගකීම සහ අධිකාරියත්, අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයෙහි අන්තර්ගත වී ඇත. විගණන කටයුතු ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව සිදු කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළ සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

## 17.1 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

### (අ) 2014 වර්ෂය සඳහා වාර්ෂික විගණන සැලැස්ම

වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණනයට භාජනය විය යුතු ක්‍රියාකාරකම් සියල්ල (Audit Universe) සැලකිල්ලට ගනු ලැබීය. මේ සඳහා ක්‍රියාකාරකම් පදනම් කරගත් පිරිවැය පද්ධතිය තුළ අන්තර්ගත ක්‍රියාකාරකම් සමාලෝචනය කරන ලදී. ඒ අනුව, බැංකුවේ සියලුම පර්ෂද ආවරණය වන පරිදි වැදගත් ක්‍රියාකාරකම් වාර්ෂික විගණන සැලැස්මට ඇතුළත් කරන ලද අතර තොරතුරු පද්ධති විගණනයන් ද එයට ඇතුළත්ය. මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවේ අනුමැතිය සහිතව වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාවට නංවන ලදී.

### (ආ) අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටිය

සෑම විගණන පැවරුමක්ම අදියර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. එනම්, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය සහ නිරාකරණය කිරීමට අදාළ කටයුතු වේ. ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී, විගණන තොරතුරු රැස්කිරීම සහ ලේඛන ගත කිරීම සිදු කෙරේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී පියවර හතරක් අනුගමනය කරන ලදී. එනම්, විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිම කිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම් දීම, විගණන කෙටුම්පත් වාර්තාව නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තාව නිකුත් කිරීම වේ. මීට අමතරව දෙපාර්තමේන්තුවල ක්‍රියාවලි හිමිකරුවන් විසින් එකඟ වූ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන්ද කාලීනව ක්‍රියාත්මක කරන ලදී.

### (ඇ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම, විගණකාධිපති වෙත විගණන කටයුතු පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා සපයන ලදී.

## 17.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණු සැසි පැවැත්වීම

බාහිර විද්වතකුගේ සහාය ලබා ගනිමින් 'Cloud Computing' පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. තවද, අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දැනුම හුවමාරු කර ගැනීමේ සැසි පවත්වන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් පරිදි උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශිෂ්‍යයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට සම්බන්ධ විෂයයන් පිළිබඳව පුහුණු කිරීම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළ දී කරනු ලැබිණි.

## 17.3 මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව

මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව මුදල් මණ්ඩලයේ එක් සාමාජිකයෙකු සහ බාහිර විගණන වෘත්තිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් මණ්ඩලයේ ලේකම් උපදේශාත්මක විගණන කමිටුවේ ලේකම් වන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ උපදේශාත්මක විගණන කමිටුවේ සහකාර ලේකම් වේ. තවද, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් උපදේශාත්මක විගණන කමිටුවෙහි ලේඛන කටයුතු සඳහා පහසුකම් සපයන ලදී.

අදාළ විධිවිධානයන්ට අනුව, උපදේශාත්මක විගණන කමිටු රැස්වීම් හයක් වර්ෂය තුළ දී පවත්වන ලද අතර එම රැස්වීම් වලදී අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය සහ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා වූ කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී.

## 17.4 බාහිර විගණන කටයුතු සඳහා පහසුකම් සැපයීම

විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සිදු කරනු ලබන අතර, මුදල් මණ්ඩලයේ ලේකම් මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බාහිර විගණනය සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරයි. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති විසින් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) වරලත් ගණකාධිකාරීවරුන් පත්කර ඇත. ඒ අනුව, අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය සහ සන්නිවේදනය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ ලේකම් වෙත තාක්ෂණික සහාය සැපයීම ද දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී.

# 18. ජාත්‍යන්තර මෙහෙයුම්

විදේශ සංචිත කළමනාකරණය කිරීමේ සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණය කිරීමේ වගකීම් මුදල් මණ්ඩලය විසින් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත. විදේශ සංචිත සහ එහි සංයුතිය, රුපියලේ බාහිර ස්ථායිතාව සුරැකීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල පරාසය සහ රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීම යන විෂයයන්හි මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල සහ වගකීම් යනාදිය ඇතුළත් ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණයට අදාළ නෛතික රාමුව මුදල් නීති පනතෙහි දක්වා ඇත. වත්කම් වර්ග, ප්‍රතිපාර්ශ්ව විදේශ ආයතන, මූල්‍ය උපකරණ සහ නිකුත් කරන්නන් පිළිබඳ සීමාවන් මුදල් නීති පනතේ 67 වන වගන්තියේ සඳහන් වේ. එකී ප්‍රතිපාදනවලට අමතරව, වඩාත් හොඳින් සංචිත කළමනාකරණ අරමුණු ඉටුකර ගැනීම උදෙසා සංචිත කළමනාකරණ කාර්යයන්ගේ විෂය පථය පුළුල් කිරීම සඳහා පියවර ගැනීමට මුදල් මණ්ඩලයට හැකියාව ඇත.

## 18.1. විදේශ සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය අනුමත කර ඇති විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශ අනුව සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ (Foreign Reserve Management Committee) අධීක්ෂණය යටතේ, ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ අරමුණු කරන ප්‍රතිලාභ ද සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර සංචිත ආයෝජනයන් සිදු කරනු ලැබේ. විවිධ ප්‍රධාන මුදල් වර්ග ගණනාවකින් පවත්වාගෙන යනු ලබන ජාත්‍යන්තර සංචිත, මූලික වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම් (Fixed Income Securities), මුදල් වෙළඳපොළ උපකරණ සහ රන් සංචිතවල ආයෝජනය කෙරේ. ස්ථාවර ආදායම් සුරැකුම් කළඹ ආයෝජනය කෙරෙනුයේ ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්, රාජ්‍ය වගකීම සහිත සුරැකුම් නැතහොත් රාජ්‍ය නියෝජිත ආයතනවල හෝ අන්තර්ජාතික සංවිධාන විසින් නිකුත් කර ඇති සුරැකුම්වල ය. තවද, ස්ථාවරභාවය සහ ණය ලබාදීමට ඇති යෝග්‍යතාව නිසිලෙස සලකා බැලීමෙන් පසු කළමනාකාරීත්වය විසින් අනුමත කරන ලද ප්‍රතිපාර්ශ්ව විදේශ පාර්ශ්ව වන ඉහළ ඇගයුමක් ඇති මහ බැංකු, වාණිජ බැංකු සහ ආයෝජන ආයතන සමග ද ස්ථාවර ආදායම් සුරැකුම් සහ මුදල් වෙළඳපොළ ගනුදෙනු සිදු කරනු ලැබේ. විදේශ සංචිත කළඹෙහි ඇතුළත් කළ යුතු වත්කම් සහ මුදල් වර්ග සංයුතීන් නිර්ණය කිරීමේ දී සලකා බැලෙන ප්‍රධාන අංග වනුයේ ද්‍රවශීලතා අවශ්‍යතාව, ණය සේවා ගෙවීම්, අවදානම් කළමනාකරණ පරාමිතීන්, ආදායම් උපදවන ශක්‍යතා සහ මුදල් මණ්ඩලයේ විශේෂිත නියෝග යනාදියයි.

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් ඉක්බිතිව ලොව ප්‍රමුඛ පෙළේ මහ බැංකු අතර ඇති වූ මුදල් ප්‍රතිපත්තිමය විචලනයන්ගෙන් පිරීගිය වසරක් ලෙස 2014 වසර හඳුනාගත හැකිය. ෆෙඩරල් සංචිත බැංකුව මූලික ආර්ථික සිද්ධාන්තයන්ගේ වර්ධනයන් අනුව යමින් 2014 වසර තුළ තම මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණය (Tapering Cycle) ක්‍රියාත්මක කරන ලදී. 2014 වසරේ පළමු අර්ධය තුළ ලොව පුරා සංචිත කළමනාකරණය සිදු කෙරුණේ ෆෙඩරල් සංචිත බැංකුව සහ බ්‍රිතාන්‍ය මහ බැංකුව විසින් සිදු කිරීමට ඉඩ ඇති පොලී අනුපාත ඉහළ දැමීම් පිළිබඳ අපේක්ෂා අනුවය. මෙම වර්ධනයන් මධ්‍යයේ වර්ෂය තුළ රත්රන් මිල ශීඝ්‍ර ලෙස පහළ වැටිණි. කෙසේ වෙතත්, 2014 ජූනි මාසයේ ඇරඹී, වසරේ ඉතිරි මාස වලට ද බලපෑ තෙල් මිලෙහි පහළයෑම වර්ෂ අවසානය වන විට රත්රන් මිල ඉහළයෑමට බලපාන ප්‍රවණතාවක් ඇති කරන ලදී. තෙල් සහ වෙළඳ භාණ්ඩ මිල පහළයෑම ලොව පුරා අවධමනාත්මක පීඩනයක් ඇරඹීමට ද හේතු විය. මෙකී තත්ත්වයන් ඔස්සේ ජපාන මහ බැංකුව සිය මූල්‍ය ලිහිල්කරණ වැඩසටහන තවත් පුළුල් කරන ලද අතර යුරෝපා මහ බැංකුව විසින් ආවරණිත බැඳුම්කර සහ වත්කම් මත වන සුරැකුම් මිල දී ගැනීම මගින් තම බැංකුවටම ආවේණික ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

එපමණක් නොව, යුරෝපා මහ බැංකුව විසින් 2015 මාර්තු මස සිට ඇරඹෙන රාජ්‍ය බැඳුම්කර මිල දී ගැනීමේ සැලසුමක් ද ප්‍රකාශයට පත් කරන ලදී. චීන මහජන බැංකුව ද මෙම උත්තේජනය ඉදිරියට ගනිමින් 2014 වසරේ අග භාගයේ දී ලිහිල්කරණ ප්‍රවණතාවට එක් විය. මෙම අභියෝගාත්මක තත්ත්වය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විදේශ විනිමය ගනුදෙනු, මුදල් වෙළඳපොළ ආයෝජන සහ ප්‍රාග්ධන ඉපැයුම් මගින් සහ ස්ථාවර ආදායම් සුරැකුම් මගින් ලද කූපන ආදායම මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 173.3 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 22.9 ක) උපලබ්ධි ආදායමක් 2014 වසර තුළ ජනනය කිරීමට සමත්වීම විශේෂත්වයකි.

දියුණු රටවල් ඒකාකාරී තත්ත්වයෙන් පවත්නා තම ආර්ථිකයන් උත්තේජනය කිරීමේ පිළිවෙත අඛණ්ඩව පවත්වා ගැනීම නිසා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ද ආසියානු කලාපයේ මහ බැංකු අතර සහසම්බන්ධතා ගොඩනැගීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, සිය සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම් තවදුරටත් විවිධාංගීකරණය කරගනිමින් චීන මහජන බැංකුව සහ ඉන්දියානු සංචිත බැංකුව සමග ආයෝජන ගිවිසුම්වලට එළඹුණි. එසේම ශ්‍රී ලංකාව සහ චීනය අතර ශීඝ්‍රයෙන් දියුණු වන ද්විපාර්ශ්වික වෙළඳ සහ ආයෝජන කටයුතු සඳහා පහසුකම් සැපයීමට චීන මහජන බැංකුව සමග ද්විපාර්ශ්වික මූල්‍ය හුවමාරු (Swap) ගිවිසුමක් ද අත්සන් කරන ලදී.

## 18.2. අවදානම් කළමනාකරණය

විදේශ සංචිත කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශයන්හි නියම කොට දක්වා ඇති ආයෝජන කළඹ සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පරාමිතීන්ට අනුකූල වීම උදෙසා, ජාත්‍යන්තර සංචිත කළඹ කළමනාකරණය කිරීමේ දී පැනනගින අවදානම් තක්සේරු කිරීමේ කාර්යය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මධ්‍යම කාර්යාලය විසින් සිදු කරන ලදී. එහිදී පරීක්ෂාකාරී, තීරණාත්මක සහ කාලානුරූප

පියවර ගැනීම සඳහා විවිධ අවදානම් සමූහයක් තුළින් ඇති වන හානිකර බලපෑම් විග්‍රහ කරමින්, නිරන්තරව අවදානම් ආකෘතීන් සම්පාදනය කර ගනු ලැබිණි. තවද, සංචිත කළමනාකරණ උපායමාර්ගවල කාර්යක්ෂමතාව වටහාගැනීම සඳහා උපායමාර්ගික ඉලක්ක සහ නිෂ්ක්‍රීය ලෙස පවත්වා ගනු ලැබූ කඩඉම් නිර්ණායක (Benchmark Portfolio) මත පදනම්ව සක්‍රීය අලෙවි කටයුතු මගින් ලබන ප්‍රතිලාභ සංසන්දනාත්මකව විමර්ශනය කරන ලදී.

වර්ෂය තුළ දී ඇමරිකානු ෆෙඩරල් සංචිත බැංකුව විසින් තුන්වන අදියරේ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම අවසන් කරමින් සිදු කළ මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණය සහ ජපාන මහ බැංකුවත්, යුරෝපා මහ බැංකුවත් විසින් යොදා ගන්නා ලද සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්ති හේතුවෙන් ඇති වූ ඉහළ මට්ටමේ අස්ථාවර තත්ත්වයන් මධ්‍යයේ ජාත්‍යන්තර වෙළඳපොළවල විචලතාවය අඛණ්ඩව පැවතිණි. මේ අනුව, 2014 වසර සඳහා අනුමත උපායමාර්ගයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම දුෂ්කර වූ අතර උපායමාර්ගයන්හි ඇතැම් අංගයන් ක්‍රියාත්මක කරන අතරම ගෝලීය ආර්ථික සහ මූල්‍ය සංවර්ධනයන්ට අනුකූලව අනෙකුත් පියවර වසර මැද දී සංශෝධනය කිරීමට සිදු විය. භාණ්ඩාගාර කළමනාකරණ උපකරණ ගණනාවක් අලුතින් හඳුන්වා දෙන ලදී. ජාත්‍යන්තර පියවීම් සඳහා වූ බැංකුවේ චීන යුවාන් සඳහා වූ ආයෝජන උපාංගය මෙන්ම අවදානම් අඩු කිරීමේ අරමුණට අදාළ ඉදිරි ගනුදෙනු (Futures) සහ විකල්ප ගනුදෙනු (Options) උපාංග යන් ද ඊට ඇතුළත් විය.

ඇතිවිය හැකි විනිමය අනුපාත හෝ ව්‍යවහාර මුදල් අවදානම් කල්තබා හඳුනාගන්නා ලද අතර ඉන්දියාව සහ දකුණු කොරියාව ඇතුළු නැගී එන වෙළඳපොළවල අප සතු මුදල් වර්ගයන් ආයෝජනය කරමින් විවිධාංගීකරණයට ලක් කිරීම ද සිදු විය. පොලී අනුපාතයන් වෙනස් වීම අනුව ස්ථාවර ආදායම් සුරැකුම් අවදානම්වලට නිරාවරණය වන ආකාරය මැන ගැනීම සඳහා සංවේදිතා විශ්ලේෂණය යොදා ගන්නා ලදී. ස්ථාවර ආදායම් සුරැකුම්වල අගයන්ගේ සිදුවන කෙටිකාලීන පහළයාම් නවීකෘත කාලාන්තර ගණනයන් (Modified Duration Calculation) යොදා ගනිමින් තක්සේරු කරන ලද අතර ඒවා යෝග්‍ය මට්ටම්වල පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා අවදානම් මත අගයන් (Value at Risk) පිළිබඳ ගණනයන් භාවිත කෙරිණි.

ඇමරිකා එක්සත් ජනපදයේ එළඹ අනුපාතික ඉහළයෑම අනුව ස්ථාවර ආදායම් සහ මුදල් වෙළඳපොළ ආයෝජනවල කාලසීමාවන්ට සිදු කළ මැදි-වාර්ෂික වෙනස්කම් ඔස්සේ පොලී අනුපාත අවදානමට නිරාවරණය වීම් අඩු කරන ලදී. මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළඳපොළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ජාත්‍යන්තර පියවීම් සඳහා වූ බැංකුව (BIS) සහ බාර්ක්ලේස් බැංකුව (Barclays Bank PLC) සමග ජාත්‍යන්තර හුවමාරු සහ ව්‍යුත්පන්න සංගමයේ (ISDA) ගිවිසුම්වලට ඇතුළත් වූ අතර තවත් එවැනි ප්‍රතිපාර්ශ්වයන් රැසක් සමග ද එවැනි ගිවිසුම්වලට එළඹීම සඳහා අවශ්‍ය සංවිධාන සිදු කරන ලදී.

ප්‍රතිපාර්ශ්වයන් සමග කෙරෙන මූල්‍ය අලෙවි කටයුතු සම්බන්ධයෙන් සීමාවන් පැනවීමේ අරමුණින් මූල්‍ය දර්ශක, ණය වර්ගීකරණ සහ ඒවායේ වෙළඳපොළ නිරාවරණ යෙදවීමට භාවිත කෙරෙන ප්‍රතිපාර්ශ්ව ණය අවදානම් කළමනාකරණ පද්ධතිය ඉවහල් කොටගෙන නිරන්තර පදනමකින් ප්‍රතිපාර්ශ්ව ණය අවදානම විමර්ශනය කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරන ලදී. ණය අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රමවේද වඩාත් උසස් කිරීම සඳහා 2003 වසරේ දී පිහිටුවන ලද එම පද්ධතිය, ප්‍රතිපාර්ශ්ව ඇගයීමට ලක්කිරීමත්, තෝරාගැනීමේ පටිපාටිය, උපකරණ සඳහා යෝග්‍යතාව සහ සීමා රාමුව වර්ධනය කිරීමත් මගින් පූර්ණ සංශෝධනයකට ලක් කරන ලදී. අදාළ ණය පැහැර හැරීමේ හුවමාරු කටයුතුවල (Credit Default Swap) විහිදීම් සහ කොටස් වෙළඳපොළ මිල ගණන් නිරීක්ෂණය කිරීම ඔස්සේ ඔවුන් මුහුණ දිය හැකි අවදානම් ද හඳුනා ගැනිණි.

සියලුම ගෙවීම් නිසි කලට සිදු කිරීමට හැකි වන ලෙස වසර පුරාම ඒ ඒ මුදල් වර්ගයන්ගෙන් ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් ප්‍රමාණයන් පවත්වා ගැනීමට වගබලා ගැනීම මගින් ද්‍රවශීලතා අවදානම පහත හෙළීමට හැකි විය. ජාත්‍යන්තර සංචිත කළමනාකරණය හා සම්බන්ධ සේවකයන් සහ පද්ධතීන් ද කාර්යපටිපාටි ද මගින් උද්ගත වන මෙහෙයුම් අවදානම් වලට ඇති ඉඩ අවම කිරීම සඳහා සුපරීක්ෂණ පටිපාටි ශක්තිමත් කිරීම, නව අලෙවි පද්ධතියක් පිහිටුවීම සහ ආයෝජන මාර්ගෝපදේශ සංශෝධනය කිරීම යන පියවරයන් උපකාරී විය.

## 18.3. දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

2014 වසර තුළ දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එහි අඛණ්ඩ අධීක්ෂණ කටයුතු හරහා විනිමය අනුපාතයේ අධි විචලතාව පාලනය කරමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සුමටව පවත්වාගනු ලැබීය. තවදුරටත්, බලපත්‍රලාභී වාණිජ බැංකු ඔවුන්ට නියමිත දෛනික ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණයන්ට අනුකූලව කටයුතු කරන්නේ ද යන වග අධීක්ෂණයට ලක් කෙරිණි.

බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පවත්වාගත හැකි දෛනික ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය, 2014 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එක්සත් ජනපද ඩොලර් මිලියන 120 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 189 ක් වූ ඉහළ මට්ටමක් දක්වා සංශෝධනය කරන ලදී. මෙසේ සිදු කරන ලද්දේ වර්ධිත ආර්ථික ක්‍රියාකාරකම් සමග බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ විනිමය ගනුදෙනු වඩාත් නම්‍යශීලී ආකාරයෙන් කළමනාකරණය කරගෙන යෑමට ඉඩ සලසා දීම සඳහාය. ඒ සමගම බැංකු කටයුතු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ඔවුන්ගේ ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණ වාර්තා කිරීම සඳහා නව ආකෘතියක් හඳුන්වාදෙන ලදී. එසේ සිදු කරන ලද්දේ කළමනාකරණ තොරතුරු වාර්තාගත කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන බලපත්‍රලාභී වාණිජ බැංකුවල දෛනික ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණයන් පිළිබඳ නිරවද්‍ය සහ යාවත්කාලීන

තොරතුරු නිසි කලට ලබා ගැනීමේ අදහසිනි. මීට අමතරව, මෙමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවක් ඇති වූ අතර අදාළ වාර්තාගත කිරීමේ කාර්යයන්ට අදාළ පිරිවැය අවම වීමක් සිදු විය. සමස්ත අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2013 වසරෙහි වූ එක්සත් ජනපද ඩොලර් බිලියන 13.7 සිට එක්සත් ජනපද ඩොලර් බිලියන 15.5 දක්වා 2014 වසරේ දී වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, එතැන් (Spot) සහ පසුදින (Tom) පියවීම් පදනම යටතේ වන ගනුදෙනු සුළු වශයෙන් අඩුවීමක් පෙන්නුම් කරන අතර එදින (Cash) හා ඉදිරි (Forward) ගනුදෙනු ආශ්‍රිත පියවීම් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. තවද, වාණිජ බැංකු සමග වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනු මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 545 ක ශුද්ධ මිල දී ගැනුම් තත්ත්වයක් පෙන්නුම් කරන ලදී.

**II-17 සංඛ්‍යා සටහන** — **අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය - 2014**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 249.20 | 230.75 | 182.25 | 524.41 | 1,186.60 |
| පෙබරවාරි | 213.35 | 176.85 | 198.58 | 521.36 | 1,110.14 |
| මාර්තු | 266.28 | 243.14 | 292.13 | 465.62 | 1,267.16 |
| අප්‍රේල් | 319.80 | 219.50 | 194.52 | 453.40 | 1,187.22 |
| මැයි | 389.28 | 275.20 | 269.10 | 593.73 | 1,527.30 |
| ජුනි | 339.78 | 279.10 | 259.45 | 531.39 | 1,409.71 |
| ජූලි | 629.44 | 299.38 | 263.38 | 780.14 | 1,972.33 |
| අගෝස්තු | 320.25 | 214.20 | 259.30 | 533.89 | 1,327.64 |
| සැප්තැම්බර් | 181.90 | 272.18 | 288.05 | 534.91 | 1,277.04 |
| ඔක්තෝබර් | 215.15 | 178.68 | 221.30 | 548.08 | 1,163.21 |
| නොවැම්බර් | 166.80 | 121.55 | 148.03 | 561.38 | 997.75 |
| දෙසැම්බර් | 188.06 | 148.25 | 89.00 | 626.33 | 1,051.64 |
| **එකතුව** | **3,479.27** | **2,658.77** | **2,665.07** | **6,674.63** | **15,477.74** |

මූලය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-18 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය මිලට ගැනුම් සහ විකුණුම් - 2014**

එ.ජ.ඩොලර් මිලියන

| මාසය | මිලට ගැනුම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනුම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | 73.75 | 50.45 | 23.30 |
| පෙබරවාරි | 40.95 | 19.30 | 21.65 |
| මාර්තු | 81.90 | 74.25 | 7.65 |
| අප්‍රේල් | 257.60 | 11.75 | 248.85 |
| මැයි | 131.50 | - | 131.50 |
| ජුනි | 124.20 | 3.00 | 121.20 |
| ජූලි | 250.00 | 10.00 | 240.00 |
| අගෝස්තු | 315.20 | 44.50 | 270.70 |
| සැප්තැම්බර් | 96.60 | 173.90 | (77.30) |
| ඔක්තෝබර් | 1.50 | 200.15 | (198.65) |
| නොවැම්බර් | 30.00 | 79.85 | (49.85) |
| දෙසැම්බර් | 4.00 | 195.10 | (191.10) |
| **එකතුව** | **1,407.20** | **862.25** | **544.95** |

මූලය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 19. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62අ වගන්තියට අනුව, අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගිත්ව ආයතනවලට පද්ධති රීති නිකුත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. ඊට අමතරව, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීමේ වගකීම ද ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. මුදල් නීති පනතෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරුන වගකීම් ඉටුකිරීම සඳහා 2002 දී පිහිටුවනු ලැබූ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට, පසුව ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරුනු වගකීම් ඉටු කිරීමද පවරා දෙන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ රටවල් අතර ගනුදෙනු පියවීම මෙන්ම, ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතු වේ. 2014 වසර තුළ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතුවලට අදාළ ක්‍රියාකාරිත්වය සාරාංශගතව පහත දැක්වේ.

### 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් සහභාගීත්ව ආයතන අතර කාල සංවේදී විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අතිරේක අරමුදල් ඉල්ලා සිටින සහභාගිත්ව ආයතන වෙත දෛනික ද්‍රවශීලතා පහසුකම ලබා දීම ද සිදු කරයි. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වනුයේ, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි. 2014 වසර අවසානයේ දී සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 36 ක් විය. වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 59,551 ක වටිනාකමින් යුතු ගනුදෙනු 317,940 ක් පියවන ලදී. රාජ්‍ය සුරැකුම්පත් සුරැකුමක් ලෙස තබාගෙන දෛනිකව ලබා දෙන ලද ද්‍රවශීලතා පහසුකමෙහි වටිනාකම රුපියල් බිලියන 5,144 ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ක්‍රියාකාරී පැවැත්ම 2014 වසරේ දී සියයට 99.79 ලෙස පවත්වා ගැනීමට හැකි විය.

### 19.2 මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

**(i) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

2014 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

(අ) විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් ගනුදෙනු 22,229 කට අදාළ පියවීම් කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 466 ක් විය.

(ආ) පොලී අනුපාතික හුවමාරු ගිවිසුම්, ඉදිරි ගිවිසුම්, හුවමාරුවක් තුළින් ගනුදෙනු නොවන විනිමය විකල්ප, ඒකක භාර ආයෝජන සහ පාවෙන අනුපාතික බැඳුම්කර වැනි නව උපකරණ දක්වා පහසුකම් සපයන ලදී.

**(ii) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙමින් ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය සඳහා පහසුකම් සලසන ලදී. 2014 වසර තුළදී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 4,279 ක් වූ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු 2,832 ක් ද, වටිනාකම රුපියල් බිලියන 4,340 ක් වූ නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 3,451 ක් ද, රුපියල් බිලියන 13.75 ක් වූ නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු 17 ක් ද සඳහා පහසුකම් සලසන ලදී.

## 19.3 ස්විෆ්ට් සන්නිවේදන කටයුතු කළමනාකරණය

ස්විෆ්ට් යනු සුරක්ෂිත හා ආරක්ෂාකාරී පරිසරයක් තුළ මූල්‍ය ගනුදෙනුවල ගෙවීම් උපදෙස් සහ වෙනත් අදාළ තොරතුරු හුවමාරු කිරීමේ සන්නිවේදන පසුබිමක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන දේශීය ගනුදෙනු හා විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් 2014 වසරේ දී යවන ලද සහ ලැබුණු මුළු ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව, පිළිවෙළින්, 1,641,947 සහ 866,570ක් විය. අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ස්විෆ්ට් පද්ධති සඳහා භාවිතා කරන පරිගණක පද්ධති ප්‍රතිස්ථාපනය කරන ලද අතර යෙදවුම්වල නව සංස්කරණයක් ද හඳුන්වා දෙන ලදී.

## 19.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදුකරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

ආසියානු නිෂ්කාශන සංගමයේ සාමාජික රටවල් නවය අතර අන්තර්ජාතික වෙළඳ ගනුදෙනුවලට අදාළ ගෙවීම් හා පියවීම් කටයුතු සඳහා අන්‍යෝන්‍ය වශයෙන් සකස් කර ගන්නා ලද ක්‍රමයක් ලෙස ආසියානු නිෂ්කාශන සංගමය හැඳින්විය හැකිය. 2014 වසර තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයේ යාන්ත්‍රණය හරහා රුපියල් බිලියන 343.8 ක් වූ ගනුදෙනු 6,222 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය හරහා සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 287.4 ක් විය. ආසියානු නිෂ්කාශන සංගමයේ අධ්‍යක්ෂවරුන්ගේ 43 වන රැස්වීම 2014 වසරේ මැයි මාසයේ ඉරානයේ දී පැවැත්වූ අතර නියෝජ්‍ය අධිපති ආසියානු නිෂ්කාශන සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ආසියානු නිෂ්කාශන සංගමයේ විකල්ප අධ්‍යක්ෂවරියක ලෙස ද එම රැස්වීමට සහභාගි වූහ.

## 19.5 ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ අවේක්ෂණය

ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ශක්තිමත් කිරීමේ කටයුතු සිදු කරන අතරදී, සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි නියාමන හා අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2014 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

(i.) ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා ආයතන 6 ක් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර ඇගයීමෙන් පසු එම සේවා සැපයුම්කරුවන්ට, 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝගයේ විධිවිධාන යටතේ කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස කටයුතු කිරීමට බලපත්‍ර ලබා දෙන ලදී.

(ii.) ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් පදනම් කරගත් ගෙවීම් පද්ධති ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දී ඇති ජංගම දුරකථන ජාල සැපයුම්කරුවෙකුට එම සේවාව, වෙනත් ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවකුගේ ග්‍රාහකයන්ට ද ලබා දීමට අනුමැතිය දෙන ලදී.

(iii.) ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවෙකු විසින් බස්නාහිර පළාතට හඳුන්වා දී තිබූ තනි කාර්යය අගය රාශිගත ප්‍රවාහන කාඩ්පත සහ ගාස්තු එක්රැස් කිරීමේ පද්ධතිය අනෙකුත් ප්‍රවාහන සේවා අංශයන් සඳහා ද හඳුන්වා දීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එම අදාළ සේවාවන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට, උතුරු මැද පළාත් ප්‍රවාහන අධිකාරියට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් පාලනය වන අන්තර් පළාත් පෞද්ගලික ප්‍රවාහන සේවාවන්ට සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන අධිවේගී මාර්ගවල ගාස්තු අය කිරීම සඳහා සැපයිය යුතු වේ.

(iv.) වෙළෙඳුන් විසින් සිදු කරන ගෙවීම් කාඩ්පත් ද්විත්ව භාවිතය (Double Swiping) නැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට සියලුම මූල්‍ය අත්පත්කරුවන්ට (ගෙවීම් කාඩ්පත් ගෙවීම් මාධ්‍යයක් ලෙස යොදා ගැනීමේ දී

වෙළෙඳුන්ට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ආයතන) උපදෙස් ලබා දෙන ලදී. ගෙවීම් කාඩ්පත අදාළ මූල්‍ය අත්පත්කරුගේ විකුණුම්පොළ ගෙවීම් යන්ත්‍රයට අමතරව, වෙළෙඳුන් විසින් ඔවුන් සතු වෙනත් උපකරණයක ද එම ගෙවීම් කාඩ්පත් භාවිතා කිරීමේ පුරුද්ද නිසා ගෙවීම් කාඩ්පතෙහි ගබඩා කර ඇති කාඩ්පත් හිමියාගේ දත්ත අනවසරයෙන් භාවිතා කිරීමට අවස්ථාව සැලසෙන බැවින් ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව උදෙසා මෙම උපදෙස් ලබා දෙන ලදී.

(v.) මුළු රටම ආවරණය වන පරිදි සුළු පරිමාණ විද්‍යුත් ගෙවීම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයේ උප යාන්ත්‍රණ පිහිටුවීම සඳහා ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමට අවශ්‍ය සහාය ලබා දෙන ලදී. ඒ අනුව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර් ජාලය, ජංගම දුරකථන සහ කියොස්ක්ස් (Kiosks) වැනි විවිධ විද්‍යුත් ගෙවීම් මාධ්‍යයන් මගින් සිදු කරන ගෙවීම් පියවීම සඳහා පොදු යටිතල පහසුකමක් සැපයීමට විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය පිහිටුවීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහසුකම් සලසන ලද අතර ඒ සම්බන්ධයෙන් පහත විධිවිධාන නිකුත් කොට ඇත.

(අ) 2013 අංක 2 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරනු ලබන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරමින්, 2014 අංක 1 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරනු ලබන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන

(ආ) ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමට සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ යාන්ත්‍රණයේ සාමාජිකයන් හට විචක්ෂණශීලී හා අනිවාර්ය අවශ්‍යතා නියම කරමින් නිකුත් කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ 2014 අංක 2 දරන පොදු විධිවිධාන

(vi.) එදිනෙදා සුළු පරිමාණ ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා සුරක්ෂිත හා විශ්වාසදායී ගෙවීම් පද්ධතීන් පවත්වාගෙන යාම මඟින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා ණය කාඩ්පත් හා ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වන මාර්ගෝපදේශයන්ට සේවා සැපයුම්කරුවන්ගේ අනුකූලතාව සහතික කිරීම සඳහා දුරස්ථ අවේක්ෂණ කටයුතු සිදු කරන ලදී.

(vii.) හදිසි අවස්ථාවක දී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවන් සහ ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 19.6 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය "ගෙවීම් සඟරාව" (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාව මත පදනම්ව ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව දැනුම්වත් කිරීමේ අරමුණින් කලාපීය මහ බැංකු නිලධාරීන්, සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමේ වැඩසටහන් 11 ක් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම පිළියෙල කිරීමේ කටයුතු සම්බන්ධීකරණය, උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ මහ බැංකුව විසින් යොදා ගන්නා ලද ප්‍රතිපත්ති පියවරයන් පිළිබඳව සමාලෝචන සහ අධ්‍යයන සිදු කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත.

### 20.1 උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම හා නිරීක්ෂණ ක්‍රියාවලිය

''පියවර ඉහළට - උගුලෙන් ඉවතට'' යන තේමාව යටතේ වූ, 2014 - 2018 කාලපරිච්ඡේදය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම, 2014 ජනවාරි 01 වන දින පැවැත් වූ අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවයේ දී දියත් කරන ලදී. ඉන්පසු, දෙපාර්තමේන්තුවල අරමුණු සහ උපාය මාර්ග පිළිබඳව මෙන්ම, උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාවට නැංවිය යුතු ක්‍රමවේද පිළිබඳව හා උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැනීම සඳහා භාවිතා කරන මූලික ක්‍රියාකාරී දර්ශක පිළිබඳව මහ බැංකුවේ නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සියලුම දෙපාර්තමේන්තු සමග ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වන ලද අතර, උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (Strategic Plan Review Committee) වෙත උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කෙරිණි. එහිදී, උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව විසින් කරන ලද නිර්දේශ සහ යෝජනා අදාළ දෙපාර්තමේන්තු වෙත අවශ්‍ය කටයුතු සඳහා දැනුම් දෙන ලදී. 2014 වර්ෂය තුළ දී, 2014 - 2018 සඳහා වූ උපාය මාර්ගික සැලැසුම යටතේ සියයට 97.6 ක සාධන මට්ටමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්කර ගන්නා ලද බවට දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය කාර්යාල වාර්තා කරන ලදී.

### 20.2 උපාය මාර්ගික කතිකාවත සංවිධානය කිරීම

නව වන උපාය මාර්ගික සැලසුම් කතිකාවත 2014 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රතිපත්ති සමාලෝචන

සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, මහ බැංකුවේ සාංගමික කළමනාකාරිත්වය, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, තෝරාගත් කාර්යය මණ්ඩල සාමාජිකයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදේශක කමිටුවල සාමාජිකයන් මෙම කතිකාවත සඳහා සහභාගී වූහ. මෙහිදී, 2014 - 2018 කාලපරිච්ඡේදය සඳහා වූ උපාය මාර්ගික සැලසුමේ වසරේ පළමු කාර්තු තුනෙහි ප්‍රගතිය සමාලෝචනය කළ අතර "7k+@2020.sl" යන තේමාව යටතේ 2015 - 2020 කාලපරිච්ඡේදය සඳහා වූ උපාය මාර්ගික සැලසුම පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. මෙම උපාය මාර්ගික සැලසුම තුළින්, ඇමෙරිකානු ඩොලර් 7,000 කට වැඩි ඒක පුද්ගල ආදායමක් වසර 2020 වන විට ළඟා කර ගැනීමට බලාපොරොත්තු වේ.

### 20.3 ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයන සිදුකිරීම

වසර තුළ දී, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 'අරමුණු, ක්‍රියාකාරිත්වයන් සහ සංවිධානය' යන තේමාව යටතේ ග්‍රන්ථයක් සකසන ලදී. තවද, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 'ණය ඇප ආවරණ ආයතනය සහ ණය ඇප ආවරණ යොජනා ක්‍රමය සඳහා යෝජනාවලියක්', 'අපනයන අංශයේ කාර්යසාධනය පිළිබඳ නිර්ණායකයන්', 'මූල්‍ය අංශයේ නීති' සහ 'ශ්‍රී ලංකාවේ අපනයන අංශය සංවර්ධනයේ නැඹුරුතාවන් හා අභියෝගයන්' යන විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති අධ්‍යයන කිහිපයක් සිදුකරන ලදී. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දැනුම හුවමාරු කර ගැනීමේ කටයුතුවල නිරත වෙමින්, 'ලාභාංශ ප්‍රතිපත්තිය', 'ගෝලීය වයස් නිරීක්ෂණ දර්ශකය', 'මූල්‍ය අන්තර්ගතය' හා 'ශ්‍රී ලංකා සැපයුම් දාමයන්' යන මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා පවත්වන ලදී.

ප්‍රතිපත්ති සම්බන්ධ ලිපිලේඛනවල ඉලෙක්ට්‍රොනික එකතුවක් වන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලය අඛණ්ඩව යාවත්කාලීන කළ අතර මේ වන විට ලිපි ලේඛන 776 ක් එහි අඩංගු වේ.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1950 අගෝස්තු මස 28 වන දින මහ බැංකුවේ ආරම්භයත් සමග පිහිටුවන ලද අතර, මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රජයේ නියෝජිත වශයෙන් රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටුකරයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, විසර්ජන පනතෙහි සඳහන් දල ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස්කිරීම, නියමිත කාලයට ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදුකිරීම සඳහා ලංකාසෙකියෝ (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම වේ. මීට අතිරේකව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය සුරැකුම්පත් වෙළඳපළ සංවර්ධනය හා ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථායීතාව සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන්, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය හා සුපරීක්ෂණය කිරීමෙහි නියැලේ.

### 21.1 විසර්ජන පනතෙහි සඳහන්වන පරිදි රාජ්‍ය ණය ගැනීමේ (දළ) අවශ්‍යතාවය සඳහා අරමුදල් රැස්කිරීම

2014 වසරේදී රජයේ දළ ණය අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් මුදල් රැස්කිරීමෙහි නිරත විය. ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදුකරනු ලැබූ මූල්‍යන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ:

**(අ) භාණ්ඩාගාර බිල්පත්**

2014 වසර තුළ දී නිකුත් කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත මුළු වටිනාකම රුපියල් බිලියන 1,121.7 ක් විය. මෙම නිකුතු ප්‍රධාන වශයෙන්ම සතිපතා පවත්වනු ලැබූ ප්‍රාථමික වෙන්දේසි මගින් සිදුවිය. විදේශීය ආයෝජකයන් 2014 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත්වල සිදු කළ දළ ආයෝජනය නැවත ආයෝජනය කිරීම් ද ඇතුළත්ව රුපියල් බිලියන 55.4 ක් විය. 2014 වසර තුළ දී කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 1,145.5 ක් විය. ඒ අනුව, මධ්‍යම හා දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර රැස්කළ අරමුදල් භාවිතා කරමින් රු. බිලියන 23.8 ක්වූ භාණ්ඩාගාර බිල්පත් කලින් ගෙවා පියවන ලදී.

**(ආ) භාණ්ඩාගාර බැඳුම්කර**

2014 වසරේ දී සිදු කළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 860.7 ක් විය. මෙම නිකුතුන් ප්‍රාථමික වෙන්දේසි 15 ක් හා සෘජු නිකුතුන් හරහා සිදු කරන ලදී. එම වසර තුළදී රුපියල් බිලියන 470.8 ක භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම සිදුවන ලදී. කල්පිරීමේ කාලය වසර 30 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වසර තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. 2014 දී භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විදේශිකයන්ගේ දළ ආයෝජනය රුපියල් බිලියන 401.7 ක් විය.

**(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර**

2014 වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 731.5 වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කරන ලදී. එ.ජ. ඩොලර් මිලියන 571.0 වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වසර තුළදී කල් පිරෙන ලදී.

### (ඇ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර

2014 වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 1,500 ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙන්දේසි 2 ක් මගින් නිකුත් කරන ලදී. රජයේ ණය ගැනීමේ වැඩසටහනට අනුව යමින් එ.ජ. ඩොලර් මිලියන 1,000 ක් 2014 ජනවාරි මාසය තුළදීද, ඉතිරි එ.ජ. ඩොලර් මිලියන 500, 2014 අප්‍රියෙල් මාසය තුළ දී ද නිකුත් කරන ලදී.

2014 වසරේදී පොලී අනුපාතිකය පහළ, ස්ථාවර අගයක පැවති පරිසරයක් තුළ, මූල්‍යනය කිරීමේ උපක්‍රමයක් ලෙස දිගුකාලීන ණය උපකරණ නිකුත් කිරීම මගින් 2013 වසරෙහි වසර 4.82 ක්වූ නොපියවූ ණය ප්‍රමාණයේ සාමාන්‍ය කල් පිරීමේ කාලය, 2014 වසරේදී වසර 5.75 ක් දක්වා ඉහළ දැමීමට හැකිවිය. ඉකුත් කාලපරිච්ඡේදයන් හි, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව අධි වට්ටම් යටතේ කළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුන් නිසා ඉදිරියට ගෙන ආ නොපියවූ බැඳුම් කර නිකුතුන්හි ඍණ අගයන් හිලව් කිරීම සඳහා අධිමිල බැඳුම්කර නිකුත් කිරීම 2014 වසරේ බැඳුම්කර උපාය මාර්ග යට ඇතුළත් විය. තවද, ප්‍රාථමික වෙළඳපොළ තුල දිගු කාලීන බැදුම්කර සාර්ථකව හා විධිමත්ව නිකුත් කිරීම තුළින් රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික හා ද්විතිය වෙළඳපොළ ඵලදා වක්‍රයන්ගේ විෂමතාවයන් ඉවත් කිරීමට පියවර ගන්නා ලදී. මේ සඳහා දිගුකාලීන ඵලදා වක්‍රය සක්‍රිය කිරීමට මෙන්ම එය තව දුරටත් දිගු කිරීමට ද කටයුතු කරන ලදී. එය 2014 වසර සඳහා සාධනීය මිනුම් දණ්ඩක්ද විය.

## 21.2 රාජ්‍ය ණය සේවාකරණ

වසර තුළදී සිදුකරන ලද සමස්ත ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,076.3 ක්වූ අතර දේශීය ණය සේවාකරණය රුපියල් බිලියන 777.5 කින් හා විදේශ ණය සේවාකරණය රුපියල් බිලියන 298.8 කින් සමන්විත විය.

## 21.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ රාජ්‍ය සුරැකුම්පත්වල ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙකියෝ (LankaSecure) පද්ධතිය හරහා තත්කාලීනව හා අඛණ්ඩව සිදු කරන ලදී. 2014 දෙසැම්බර් 31 දින වන විට ලංකාසෙකියෝ පද්ධතිය තුළ පැවති නිර්ලේඛන සුරැකුම්පත් මුළු වටිනාකම රුපියල් බිලියන 4,092.0 ක් විය.

2014 වසර තුළදී කාගිල්ස් බැංකුව සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්, ලංකාසෙකියෝ (LankaSecure) පද්ධතියේ ඍජු අලෙවි සහභාගිකරුවන් ලෙස පත්කරන ලදී. ඒ අනුව ඍජු අලෙවි සහභාගිකරුවන් ගණන 33 දක්වා වැඩි විය.

## 21.4 රාජ්‍ය සුරැකුම්පත්වල හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම ද්විතීයික වෙළඳපොළෙහි ද්‍රවශීලතාව හා ගනුදෙනුවල වර්ධනයක් ඇති කිරීමට උපකාරී විය. මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රජයේ සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් අප්‍රමාදව සහ නිවැරදිව සටහන් කිරීමේ ක්‍රියාවලිය සහ ගිණුම් හිමියන්හට කාලීන හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් ප්‍රකාශනයන් යැවීමේ කාර්යය සහ ගිණුම් හිමියන්ගේ අභිමතය පරිදි මුද්‍රිත ප්‍රකාශනයන් වෙනුවට තම කාලීන ප්‍රකාශනයන් විද්‍යුත් මාධ්‍යය හරහා විද්‍යුත් තැපැල ඔස්සේ ලබාගැනීමට සැලැස්වීම මගින්, ගනුදෙනු හා ගෙවීම් 2014 වසර තුළදී තවදුරටත් වැඩිදියුණු විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් 2014 වසරේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා විද්‍යුත් ප්‍රකාශනයන් 1,786 ක් යවන ලදී. ඊට අමතරව 2014 වසර අග වන විට අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 25,740 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 70,126 ක් සහ ගෙවීම් ප්‍රකාශන 52,620 ක් තැපැල මගින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන් වෙත යවන ලදී. තවද, ගනුදෙනුකරුවන්ට ලංකා සෙකියෝ (LankaSecure) පද්ධතිය හරහා තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් තුළින් නිරීක්ෂණය කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2014 දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 86,944 ක් විය.

## 21.5 ණය වෙළඳපොළ දියුණු කිරීම

රජයේ ණය පිරිවැය සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීමට නම් රාජ්‍ය ණය වෙළඳපොළ දියුණු කිරීම අනිවාර්ය සාධකයකි. එම නිසා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේදීත් රාජ්‍ය සුරැකුම් පත් වෙළඳපොළ වර්ධනය සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

(අ) වෙළඳපොළ ප්‍රති මිලදීගැනීම් / ප්‍රති විකුණුම් ගනුදෙනු සඳහා වන ප්‍රතිමිලට ගැනීම් ගිවිසුම් සහ ගනුදෙනුකාර ගිවිසුම්, ආයෝජකයන්ගේ සුරක්ෂිතභාවය සලකා ප්‍රමිතිගත කිරීම. මෙය, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය, නීති විශාරදයන් සහ අනෙකුත් පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

(ආ) රාජ්‍ය ණය ආයෝජකයන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ ඔවුන්ට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීම සඳහා ගනුදෙනුකරු ප්‍රඥප්තිය හඳුන්වාදීම.

(ඇ) මධ්‍යම ප්‍රති පාර්ශවයක් (CCP) සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා විද්‍යුත් වෙළඳ පද්ධතියක් හඳුන්වා දීම සඳහා තවදුරටත් කටයුතු කරන ලදී. කොළඹ කොටස් හුවමාරුවෙහි විද්‍යුත් වෙළඳ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමග රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සමීපව කටයුතු කරන ලදී. කොළඹ කොටස් හුවමාරුවෙහි මූලිකත්වයෙන් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යෑම සඳහා, ව්‍යාපෘති

කළමනාකරු සහ විශේෂඥ උපදෙස් සඳහා පාර්ශ්වයක් පත් කරගත් අතර වෙළඳපොළ අධ්‍යයන අවධිය මේ වන විටත් ආරම්භ කර ඇත.

## 21.6 රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කිරීම

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථායීතාවය සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන්, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2014 වසරේදී ද රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කටයුතු වල අඛණ්ඩව නිරත විය. 2014 වසරේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද නියාමන කාර්යයන්ගේ සාරාංශයක් පහත දැක්වේ.

**(අ) විචක්ෂණ නියාමන**

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අපේක්ෂාවෙන්, එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමනයන්ට හා විධානයන්ට අනුකූල වීම පිළිබඳ තක්සේරු කිරීම සහ එම නියාමනයන් / විධානයන් සහ මෙහෙයුම් පද්ධතීන් අතර පවතින හඳුනාගත් පරතරයන් පියවීමට පියවර ගැනීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

**(ආ) ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම**

තම ව්‍යාපාර කටයුතු මඟින් ජනනය වන එහෙත් මුළුමනින්ම අහෝසි කළ නොහැකි අවදානම් (වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් ආදී) සහ එකී අවදානම් අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් පවත්වා ගැනීම පිළිබඳ එතැන් පරීක්ෂණයන්හි දී ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව 2014 වසරේදී ප්‍රාථමික අලෙවිකරුවන් පහළොස් දෙනෙකු පිළිබඳව අවදානම ඉලක්ක කරගත් එතැන් පරීක්ෂණ සම්පූර්ණ කරන ලදී. එම පරීක්ෂණ වාර්තා මඟින් මතු කරන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කාලසටහනක් පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්මකට ඒ ඒ ප්‍රාථමික අලෙවිකරුවන් යටත් කිරීම සිදු කරන ලදී. එකී කරුණු පිළිබඳ නිවැරදි කිරීමේ කටයුතු වල ප්‍රගතිය, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් එවන ලද කාර්තුමය වාර්තා උපයෝගී කර ගනිමින් නිරීක්ෂණය කරනු ලැබිණි.

**(ඇ) දුරස්ථ පරීක්ෂාව**

ප්‍රාථමික අලෙවිකරුවන් විසින් මූල්‍ය තොරතුරු ජාලය (FinNet) ඔස්සේ එවනු ලබන වාර්තා පදනම් කර ගනිමින් එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මෙන්ම සමස්ත කර්මාන්තය පිළිබඳ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් කටයුතු තත්කාලීනව විමර්ශනය කිරීමේ ක්‍රියාදාමය දුරස්ථ පරීක්ෂාවන් යටතේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. විමර්ශන ක්‍රියාමාර්ග යන්ගේ සොයා ගැනීම් මත පදනම්ව අවශ්‍ය අවස්ථා වලදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නොපමාව නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග දියත් කරන ලදී. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූල්‍ය වාර්තාකරණයෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් මූල්‍ය තොරතුරු ජාලය (FinNet) සඳහා වැඩි දියුණු කිරීම් හඳුන්වා දෙන ලදී.

**(ඈ) නියාමන අනුමැතිය ලබාදීම**

2014 වසර තුළදී යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස පත් කිරීමත් සමඟ 2014 වසර අවසාන වන විට ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මුළු සංඛ්‍යාව 16 දක්වා වර්ධනය විය.

**(ඉ) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ මාසික රැස්වීම් පැවැත්වීම**

රාජ්‍ය ණය අධිකාරී / ලේඛකාධිකාරී විසින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ මාසිකව පවත්වන රැස්වීම් 12 ක් 2014 වසර තුළ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබිණි. මෙම රැස්වීම් ආර්ථික හා මූල්‍ය සංවර්ධනයන්, ප්‍රාථමික අලෙවිකාර කර්මාන්තයේ කාර්යසාධනය, රජයේ සුරැකුම්පත් හි ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ කටයුතු සහ වෙළඳපොළ වර්ධනයන් කෙරෙහි බලපාන බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් ලෙස යොදා ගැනිණි.

## 21.7 ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනීම තහවුරු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ ෆිස්කල් නියෝජිතයා වශයෙන්, ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් නියෝජිතයන් මඟින් ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ලබාගැනීම තහවුරු කිරීම සහ එම ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය කළමණාකරනයට සම්බන්ධ ඍජු කාර්යයක් ලෙස සලකා ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ මූඩීස් ඉන්වෙස්ටර් සර්විස් වෙතින් ලබාගන්නා ශ්‍රේණිගත කිරීමේ සේවා ඇගයීම ද පැවරී ඇති කාර්යයකි. ඒ අනුව ශ්‍රේණිගත කිරීමේ නියෝජිතයින් තිදෙනා විසින් ලබාදෙන ලද සේවාවන් ඇගයීමේ කටයුතු රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර 2014 වසරේ දී ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම ද සිදුකරන ලදී.

**ඇමුණුම II - 2** **රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන්**

1. ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්
2. ලංකා බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
3. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
5. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී.
6. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
7. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
8. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
9. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
10. මහජන බැංකු ප්‍රාථමික අලෙවිකරු අංශය
11. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
12. සම්පත් බැන්ක් පී.එල්.සී. ප්‍රාථමික අලෙවිකරු අංශය
13. සෙලාන් බැන්ක් පී.එල්.සී ප්‍රාථමික අලෙවිකරු අංශය
14. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ප්‍රාථමික අලෙවිකරු අංශය
15. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
16. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්

## 22. ප්‍රාදේශීය සංවර්ධන

සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ණය ඇප ආවරණ යෝජනා ක්‍රම පරිපාලනය කිරීම මගින් රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ තුලිත වර්ධනය ළඟා කර ගැනීම සඳහා වන ප්‍රතිපත්තිවලට සහයෝගය දැක්වීම ප්‍රධාන අරමුණ කර ගනිමින් ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ඒකාබද්ධ කර 2002 ජනවාරි මාසයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ප්‍රතිමූල්‍ය පහසුකම් හෝ පොලී සහනාධාර සපයනු ලබන ණය යෝජනා ක්‍රම කෘෂි හා පශු සම්පත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ වෙත යොමු කරන ලදී.

වසර තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය යෝජනා ක්‍රම කිහිපයකට අදාළ පොලී අනුපාතික හා ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය සංශෝධනය කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී. ණය ප්‍රතිලාභීන් සහ ජනතාව අතර දැනුම්වත්භාවය ඉහළ නැංවීම හා නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා මුද්‍රිත, විද්‍යුත් සහ ගුවන්විදුලි මාධ්‍ය යොදා ගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ද පැවැත්විණි.

2014 වසර තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය යෝජනා ක්‍රම 14 ක් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම කරන ලදී. (සංඛ්‍යා සටහන II-19) මෙම ණය යෝජනා ක්‍රම අතරින්, කෘෂිකාර්මික හා සත්ත්වපාලන අංශය ඉලක්ක කර ගනිමින් ණය යෝජනා ක්‍රම තුනක් ක්‍රියාත්මක කළ අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සඳහා ණය යෝජනා ක්‍රම හයක් ක්‍රියාත්මක කරන ලදී. ඉතිරි ණය යෝජනා ක්‍රම පහ ක්ෂුද්‍ර මූල්‍ය හා වෙනත් අංශ වෙත යොමු කෙරිණි. මෙම ණය යෝජනා ක්‍රම සහ ණය පරිපූරක සේවා සඳහා අරමුදල් සැපයීම ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, ණය ප්‍රදානය කරන ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සිදු කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම වල කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දක්වා ඇත.

### 22.1 කෘෂිකර්ම හා සත්ත්ව පාලන අංශය

“සරුසාර” හෙවත් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සහ මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය මෙම අංශයට ණය සැපයීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වූ ප්‍රධාන ණය යෝජනා ක්‍රම දෙකකි.

ආහාර මිල ගණන් හිතකර මට්ටමක පවත්වා ගැනීම සඳහා වෙළඳපොළේ ඇති කෘෂි නිෂ්පාදන වැඩි කිරීමට නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය පහසුකම් සැපයීම උපකාරී විය. මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ගොවිපළ සංවර්ධනය, සැකසීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ අලෙවිකරණය ඇතුළු සියලුම කිරි ආශ්‍රිත කටයුතුවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් අඛණ්ඩව ලබා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමේ ඉලක්කය ළඟා කර ගැනීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කෙරිණි.

- මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ මුදාහළ මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 7,700 ක් වූ අතර, එය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම ණය යෝජනා ක්‍රමවලින් මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 48.3 ක ප්‍රමාණයකි.
- 2014 වසර තුළ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ගොවීන් 86,143 ක් වෙත ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රුපියල් මිලියන 6,749 ක ණය මුදලක් ලබාදෙන ලදී. කෙසේ වුවද, 2014 වසරේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදල එහි වටිනාකම අනුව සියයට 17 කින් ද, ලබා දුන් ණය සංඛ්‍යාව අනුව සියයට 11 කින් ද පහළ යාමක් වාර්තා කළේය. මෙම ප්‍රමාණයෙන් රුපියල් මිලියන 4,338 ක් ණයකරුවන් 54,527 ක් අතර 2013/2014 මහ කන්නය තුළ මුදාහැර ඇති අතර, ඉතිරි රුපියල් මිලියන 2,411 ණයකරුවන් 31,616 ක් අතර යල කන්නය තුළ මුදාහැර තිබේ.

**II-19 සංඛ්‍යා සටහන** 2014 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ණය යෝජනා ක්‍රම

| | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුදල් සපයන ලද ආයතන | පුළුල් අරමුණ | මුළු අරමුදල් යෙදවීම (රු.මිලියන) | 2014 වසරේදී මුදාහළ අරමුදල් (රු.මිලියන) | මුදාහැරීමට ඇති ඉතිරි අරමුදල් (රු.මිලියන) | ණයකරුවන් ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය (වසර අවසානයේදී) |
|---|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය | | | | | | |
| 1.1 | තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDP-RF) | ශ්‍රී ලංකා රජය | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් HACCP* සහතිකය ලබා ගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම | 1,100 | 13 | 161 | 9% |
| 1.2 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර | වී සහ කෙටි කාලීන භෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 6,749 | අදාළ නොවේ | 7% |
| 1.3 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී සහනාධාර පහසුකම් | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් පිහිටුවීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිතභාවය ළඟාකර ගැනීමට සහාය වීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 951 | අදාළ නොවේ | 6% |
| 2. | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශය | | | | | | |
| 2.1 | ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (SEPI) | ශ්‍රී ලංකා රජය | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය සැපයීම | 250 | 49 | 48 | 9% |
| 2.2 | පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II (ANLS-Ph II) | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු පළාත තුළ ණය ප්‍රතිලාභීන් බවට පත් විය හැකි පුද්ගලයන්ගේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම සඳහා සහාය වීම | 2,157 | 719 | 81 | 9% |
| 2.3 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර III (REAEP III) | ශ්‍රී ලංකා මහ බැංකුව | දැනට සිදු කෙරෙන සහ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මගින් නැගෙනහිර පළාත තුළ ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 1,000 | 1,000 | අවසන් කර ඇත | 9% |
| 2.4 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ව්‍යසනයක බලපෑමකට ලක් වූ එවැනි ව්‍යාපෘති ඇරඹීම හෝ වැඩිදියුණු කිරීම | 11,234 | 3,280 | අවසන් කර ඇත | 8% |
| 2.5 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම්වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | 474 | 90 | 130 | 9% |
| 2.6 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන-චක්‍රීය අරමුදල | ශ්‍රී ලංකා රජය | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ආදායම් උත්පාදන කටයුතු සඳහා සහාය වීම සහ දිළිඳුකම පිටු දැකීම | 253 | 115 | 14 | 10% |
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය හා වෙනත් අංශ | | | | | | |
| 3.1 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SFLCP-RF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ණය සැපයීම | 346 | 234 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙද වේ | 12% - 14% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3.2 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMP-RF) | ශ්‍රී ලංකා රජය | | 1,031 | 401 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | 12% |
| 3.3 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II (PAMP II) | ශ්‍රී ලංකා රජය සහ ජපන් අන්තර් ජාතික සහයෝගිතා සංවිධානය (JICA) | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳුබව පිටු දැකීම | 2,000 | 246 | - | 12% |
| 3.4 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMP II -RF) | ශ්‍රී ලංකා රජය | | 2,764 | 1,792 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | සහභාගිත්ව මූල්‍ය ආයතන -12%- සහභාගීත්ව ණය දෙන ආයතන -14%- |
| 3.5 | උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් සැපයීම | 600 | 304 | අවසන් කර ඇත. | 8% |

* HACCP - උපද්‍රව්‍ය විශ්ලේෂණ අති අවදානම් පාලන ස්ථාන

- නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදාහළ ඉහළම කෘෂි ණය ප්‍රමාණයට හිමිකම් ලැබුවේ යාපනය දිස්ත්‍රික්කය (සියයට 19) වන අතර, පිළිවෙළින් අනුරාධපුර (සියයට 14), හම්බන්තොට (සියයට 10) සහ අම්පාර (සියයට 10) යන දිස්ත්‍රික්ක වෙත ඉන් අනතුරුව වැඩි කෘෂි ණය ප්‍රමාණයක් මුදා හරින ලදී.
- කිසිදු බාධාවකින් තොරව වගා කටයුතු කරගෙන යෑමට හැකිවන පරිදි අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ ගොවීන්ගේ ණය මුදල් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලේඛනගත කරන ලදී.
- වෙළඳපොළ ප්‍රවණතා සැලකිල්ලට ගෙන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා වූ පොලී අනුපාතිකය 2014 ජුනි සිට බලපැවැත්වෙන පරිදි සියයට 9 සිට සියයට 7 දක්වා අඩු කරන ලද අතර, ඉහළ ගිය වගා පිරිවැය ආවරණය කර ගැනීම සඳහා උපරිම ණය සීමාව ද ඉහළ නංවන ලදී.
- මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ වසර තුළ කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියුතු ව්‍යවසායකයන් හා කිරි ගොවීන් 604 දෙනෙකු අතර රුපියල් මිලියන 951 ක් ලබා දී තිබේ. 2014 වසර ආරම්භයේ සිට දිස්ත්‍රික්ක කිහිපයක කිරි ගවයින් අතර පැතිර ගිය මුඛ හා කුර රෝගය සහ අදාළ ආයතන විසින් කිරි ගොවිපළ කටයුතු මත පැන වූ සීමාවන් හේතුකොට ගෙන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය සඳහා වූ ඉල්ලුම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය.

## 22.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සංවර්ධනය

2014 වසරේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය යෝජනා ක්‍රම හයක් යටතේ ණයකරුවන් 27,675 ක් අතර රුපියල් මිලියන 5,254 ක් මුදා හරිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා මූල්‍යමය සහාය අඛණ්ඩව ලබා දෙන ලදී.

- මුළු රටම ආවරණය වන පරිදි සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ණය සපයන ප්‍රධාන ණය යෝජනා ක්‍රමය වූ "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින් 13,590 ක් අතර රුපියල් මිලියන 3,280 ක් මුදාහැරිණි. සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් සැපයීමේ දී නව්‍ය සහ නවෝත්පාදන ව්‍යාපාර, කාන්තාවන් සහ උපාධිධාරී ව්‍යවසායකයන් වෙත විශේෂ අවධානය යොමු කරන ලදී.
- වෙළඳපොළ පැවති අඩු පොලී අනුපාතික සැලකිල්ලට ගනිමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතිකය 2014 දෙසැම්බර් 05 වන දින සිට බලපාන පරිදි සියයට 9 සිට සියයට 8 දක්වා අඩු කරන ලදී.
- විශේෂිත තාක්ෂණික ආයතන යටතේ වෘත්තීය පුහුණු සුදුසුකම් ලබාගත් තරුණ කොටස්වලට කුඩා පරිමාණ ව්‍යවසාය ආරම්භ කිරීමට 2014 වසර තුළ ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 49 ක් මුදාහරින ලදී.
- 2014 වසර තුළ පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II සහ නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර III යටතේ ණයකරුවන් 11,546 ක් අතර රුපියල් මිලියන 1,719 ක් මුදාහරින ලදී. නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර III, වසර පහ හමාරක කාලපරිච්ඡේදයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව 2014 ඔක්තෝබර් මස 16 දින අවසන් කරන ලදී.
- තවදුරටත්, කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සහ වියළි කලාපීය ජීවනෝපාය සඳහා සහාය වීමේ හා හවුල් වීමේ චක්‍රීය අරමුදල එක්ව, වසර තුළ ණයකරුවන් 2,317 ක් සඳහා රුපියල් මිලියන 205 ක් ලබා දුනි.

### 22.3 ක්ෂුද්‍ර මූල්‍ය හා වෙනත් අංශ

ජනතාව අතර මූල්‍ය කටයුතු ප්‍රචලිත කිරීම හා දරිද්‍රතාව තුරන් කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2014 වසරේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II, දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II - චක්‍රීය අරමුදල, දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල සහ සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය නමින් අඩු ආදායම් ලාභීන් සඳහා වූ ණය යෝජනා ක්‍රම හතරක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

- මෙම ණය යෝජනා ක්‍රම හතර මගින් රුපියල් මිලියන 2,674 ක ණය මුදල් ප්‍රමාණයක් ණයකරුවන් 44,744 දෙනෙකු අතර මුදාහරින ලදී. මුදා හරින ලද මුළු ණය මුදලින් සියයට 33 ක් කුඩා කර්මාන්ත සඳහා ලබා දී ඇති අතර, කෘෂිකර්මාන්ත අංශය සඳහා සියයට 30 ක් ද, වෙළඳ කටයුතු සඳහා සියයට 17 ක් ද, සේවා සඳහා සියයට 14 ක් ද, පශු හා ධීවර අංශය සඳහා සියයට 5 ක් ද ලබා දී ඇත.
- උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා වන විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 2,988 ක් සඳහා රුපියල් මිලියන 304 ක් ලබා දුනි. මෙම ණය යෝජනා ක්‍රමය ඒ සඳහා වෙන් වූ අරමුදල් සම්පූර්ණයෙන් භාවිතා කිරීමෙන් පසු 2014 ඔක්තෝබර් 27 දින අවසන් කරන ලදී.

### 22.4 ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය 2014 ජුනි මස 17 වැනි දින හඳුන්වා දෙන ලදී. මෙම ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි අරමුණ වූයේ කෘෂි සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයෙහි ණය වර්ධනය ඉහළ නැංවීම සහ රන් මිල ගණන් පහළ යෑම හේතුවෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන මුහුණදෙන අවදානම අඩු කිරීමයි. 2014 අවසානය වන විට මෙම ණය ඇප ආවරණ ක්‍රමය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රුපියල් මිලියන 11,290 ක උකස් අත්තිකාරම් මුදාහැර තිබිණි.
- උකස් අත්තිකාරම් මත ආරම්භයේ දී නියම කළ සියයට 15 ක වාර්ෂික පොලී අනුපාතිකය 2014 ඔක්තෝබර් 09 වන දින සිට සියයට 12 දක්වා අඩු කරන ලදී. මෙම යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් කාලසීමාව 2015 ජනවාරි සිට 2015 ජුනි අවසානය දක්වා දීර්ඝ කරන ලද අතර බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ද එය විවෘත කරන ලදී.

### 22.5 දැනුම්වත්භාවය වර්ධනය කිරීම

මෙම වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ස්වයං උපකාරක කණ්ඩායම් පිහිටුවීම ද ඇතුළුව මූල්‍ය කළමනාකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පසු අස්වනු තාක්ෂණය, ව්‍යවසායකයන් සඳහා වැඩමුළු සහ පුහුණු කරන්නන් පුහුණු කිරීම් ආදී වැඩසටහන් මෙහෙයවමින් මූල්‍ය අන්තර්ගත බව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද මෙම වැඩසටහන් පිළිබඳ විස්තරයක් සංඛ්‍යා සටහන II-20 මගින් දැක්වේ.

**II-20 සංඛ්‍යා සටහන** — **2014 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය සාක්ෂරතාව | 81 |
| ව්‍යවසායකත්ව සංවර්ධනය | 57 |
| පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් | 31 |
| ව්‍යාපෘති ඇගයීමේ වැඩමුළු | 106 |
| පසු අස්වනු තාක්ෂණ වැඩසටහන් | 13 |
| ගුවන්විදුලි වැඩසටහන් | 35 |
| රූපවාහිනී වැඩසටහන් | 8 |
| පුවත්පත් දැන්වීම් | 27 |

## 23. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු

මුදල් නීති පනතේ 33 වන වගන්තියට අනුකූලව, ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාවට නැංවිය යුතු ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කිරීම සහ ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධන කටයුතු හා ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම යන අරමුණු පෙරදැරිව, 2009 වසරේ දී ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මුදල් නීති පනතේ 7 වන වගන්තියට අනුකූලව පිහිටුවන ලද මාතර, අනුරාධපුරය, මාතලේ, යාපනය සහ ත්‍රිකුණාමලය යන ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු 2014 වර්ෂය තුළදී ද සිදුකරන ලදී. ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන් ලෙස ප්‍රාදේශීය වශයෙන් මූල්‍ය පහසුකම් වර්ධනය කිරීමේ කටයුතු සඳහා බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම හා උපදෙස් ලබාදීම, ගොවීන්, ව්‍යවසායකයන් හා මහජනතාව අතර මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තුවල කටයුතු සඳහා ආයතනික සහයෝගය ලබා දීම සහ ආර්ථිකය, බැංකුකරණය හා මූල්‍ය යන විෂයයන් පිළිබඳව ගුරුවරුන් හා සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අධ්‍යාපනික සම්මන්ත්‍රණ පැවැත්වීම යනාදිය දැක්විය හැකිය. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මගින් 2014 වසර තුළ සිදු කරනු ලැබූ කාර්යයන් සැකෙවින් පහතින් දක්වා ඇත.

### 23.1 ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය

(i) 2014-2018 වර්ෂ සඳහා වන උපායමාර්ගික සැලැස්මට අනුකූලව වැඩසටහන් පිළියෙල කිරීම මෙන්ම,

2015-2020 වර්ෂ සඳහා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාලවලට අදාළ උපායමාර්ගික සැලැස්ම සංස්ථාපනය කිරීම.

(ii) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණය සඳහා ප්‍රශ්න මාලාවක් සකස් කිරීම, පළාත් මට්ටමේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා වන ආකෘතියක් පිළියෙල කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පවත්වන ලද වැඩසටහන් සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක් හඳුනා ගැනීම සහ මූල්‍ය සාක්ෂරතාව සඳහා වන පුහුණු වැඩසටහනට අදාළ විෂය මාලාව පිළියෙල කිරීම.

(iii) නව ප්‍රාදේශීය කාර්යාල ආරම්භ කිරීම සහ දැනට පවතින ප්‍රාදේශීය කාර්යාල ප්‍රතිව්‍යුහගත කිරීම; ප්‍රාදේශීය කාර්යාල කටයුතු දිවයින පුරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් 2015 වසරේ දී කිලිනොච්චිය, කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි නව ප්‍රාදේශීය කාර්යාල තුනක් පිහිටුවීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබිණි. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක පහත සඳහන් පරිදි වේ.

(අ) ප්‍රාදේශීය කාර්යාලය, මාතර - ගාල්ල, මාතර සහ හම්බන්තොට

(ආ) ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුරය - අනුරාධපුරය, පුත්තලම සහ කුරුණෑගල

(ඇ) ප්‍රාදේශීය කාර්යාලය, මාතලේ - මාතලේ, මහනුවර සහ නුවරඑළිය

(ඈ) ප්‍රාදේශීය කාර්යාලය, යාපනය - යාපනය සහ මුලතිව්

(ඉ) ප්‍රාදේශීය කාර්යාලය, ත්‍රිකුණාමලය - ත්‍රිකුණාමලය, මඩකලපුව සහ පොළොන්නරුව

(ඊ) ප්‍රාදේශීය කාර්යාලය, කිලිනොච්චිය - කිලිනොච්චිය, වව්නියාව සහ මන්නාරම

(උ) ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල - කෑගල්ල, රත්නපුරය, ගම්පහ, කොළඹ සහ කළුතර

(ඌ) ප්‍රාදේශීය කාර්යාලය, මොණරාගල - මොණරාගල, බදුල්ල සහ අම්පාර

## 23.2 ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු අධීක්ෂණය කිරීම

ප්‍රාදේශීය කාර්යාල මගින් පවත්වනු ලබන ඔවුන්ගේ දෛනික කටයුතු පිළිබඳ වාර්තා, සතිපතා ඉදිරි සැලසුම් වාර්තා, මාසික සහ සතිපතා ප්‍රගති වාර්තා, ප්‍රාදේශීය කළමනාකරුවන් සමග පවත්වන රැස්වීම් සහ ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් ප්‍රාදේශීය කාර්යාල විසිත්ත කිරීම් යනාදිය පදනම් කර ගනිමින් අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

## 23.3 ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම

මේ යටතේ මූල්‍ය ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම, නව තාක්ෂණික ක්‍රම ව්‍යාප්ත කිරීම, ව්‍යවසායකයන්ගේ නිපුණතාවය හා තාක්ෂණික වර්ධනය සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීම වැනි විවිධ ක්‍රියාකාරකම් හරහා අදාළ පළාත්වල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා 2014 වසර තුළදී සියලුම ප්‍රාදේශීය කාර්යාල විසින් දායකත්වය සපයන ලදී. තවද මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම, වෙළඳ සම්බන්ධතා හා වෙළඳ ප්‍රවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් හා ආදර්ශවත් ව්‍යවසායකයන් හමුවීමේ අවස්ථා සලසා දීම ආදී කටයුතුවල ද නියැළිණි. ඒ අනුව, ව්‍යවසායකයන් 1,389 ක් සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩමුළු 17 ක් ද, කෘෂි ව්‍යාපාර හා සම්බන්ධ ව්‍යවසායකයන් හා ගොවි මහතුන් 3,677 දෙනෙකු සඳහා පුහුණු වැඩමුළු 80 ක් ද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ගොවීන් 2,030 දෙනෙකු සඳහා වැඩසටහන් 43 ක් ද, තවත් 11,385 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ණය පහසුකම් සඳහා වන දැනුම්වත් කිරීමේ වැඩමුළු 90 ක් ද, 11,588 දෙනෙකු සඳහා මූල්‍ය සාක්ෂරතා පිළිබඳ වැඩසටහන් 91 ක් ද, 1,823 දෙනෙකු සඳහා ප්‍රවීණ සම්පත්දායකයන් සමග වැඩමුළු 11 ක් ද සහ ගොවීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 423 දෙනෙකු සඳහා ප්‍රායෝගික වැඩමුළු චාරිකා 12 ක් ද පවත්වන ලදී.

## 23.4 ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා වන ආයතනික පහසුකම්

පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම, ව්‍යාජ මූල්‍ය ආයතන හා ආශ්‍රිත ආයෝජන කටයුතු, සේ.අ.අරමුදල් සම්බන්ධ සේවා, විනිමය පාලන අණ-පනත් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ අ.පො.ස. (උ.පෙළ) සිසුන් සහ ගුරුභවතුන් වෙනුවෙන් අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රාදේශීය කාර්යාල තුළින් සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී. මේ අනුව, පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

(අ) පිරිසිදු මුදල් නෝට්ටු භාවිතය හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳව වැඩසටහන් 84 ක් පවත්වන ලද අතර, ඒ සඳහා 7,765 දෙනෙකු සහභාගී වූහ.

(ආ) අවසර නොලත් මූල්‍ය ආයතන හා යෝජනා ක්‍රමයන්හි පවතින අවදානම පිළිබඳව වැඩසටහන් 151 ක් පවත්වන ලද අතර, ඒ සඳහා 16,396 දෙනෙකු සහභාගී වූහ.

(ඇ) රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳව වැඩසටහන් 10 ක් පවත්වන ලද අතර, ඒ සඳහා 952 දෙනෙකු සහභාගි වූහ.

(ඈ) ආර්ථිකය, බැංකුකරණය හා මූල්‍ය යන විෂයයන් සම්බන්ධව අ.පො.ස. (උ.පෙළ) හදාරන සිසුන් සහ ගුරුභවතුන් සඳහා සම්මන්ත්‍රණ 49 ක් පවත්වන ලද අතර, ඒ සඳහා 5,722 දෙනෙකු සහභාගි වූහ.

# 24. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව මහ බැංකුව ආරම්භයේ දී ම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එහි කාර්යයන් අතරින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, නිවාඩු ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාවට නැංවීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පරිපාලනය, විදේශ සංචාර සම්බන්ධයෙන් වන සේවා හා අනෙකුත් පොදු සේවා සැපයීම සහ නීතිමය සේවා සැපයීම ආදී කාර්යයන් ප්‍රධාන වේ.

**(අ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය:**

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් මිලියන 173.9 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා ගුණාත්මකභාවයෙන් යුතුව තරගකාරී මිල ගණන් යටතේ සැලසුම් කළ කාලය තුළ දී ප්‍රසම්පාදනය කරන ලදී. දෙපාර්තමේන්තුවල භාණ්ඩ හා සේවා අවශ්‍යතා කලට වේලාවට සැපයීම කඩිනම් කිරීමේ අරමුණින් පෙර වර්ෂවල දී මෙන්ම මහ බැංකුවේ ප්‍රසම්පාදන කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රසම්පාදන සැලසුම් කිරීම තවදුරටත් කරගෙන යනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත ප්‍රසම්පාදන අවශ්‍යතාවලින් 89% ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව, පොදු වගකීම් රක්ෂණ ආවරණය ද ඇතුළු බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී.

**(ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පරිපාලනය:**

මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු අරමුදල සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතු ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. 2014 වර්ෂය තුළ දී මෙම ක්‍රම යටතේ සේවා නියුක්තයන් 82 ක් විශ්‍රාම ලැබූ අතර, වර්ෂය අවසාන වන විට විශ්‍රාම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2108 දෙනෙකු විය.

**(ඇ) පොදු සේවා සැපයීම හා නිවාඩු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම:**

සේවා නියුක්තයන්ගේ විදේශ පුහුණු සංචාර 481 ක් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසනු ලැබූ අතර 2014 වර්ෂයේ දී පිළිගත් වෘත්තීය ආයතනවලට සේවා නියුක්තයන් විසින් සාමාජික ගාස්තු වශයෙන් කරන ලද ගෙවීම් 175 ක් ප්‍රතිපූරණය කරන ලදී. මීට අමතරව, සේවා නියුක්තයන්ගේ විදේශ සංචාර සඳහා පෞද්ගලික හා රාජකාරී නිවාඩු අනුමැති 465 ක් ලබා දෙන ලදී.

**(ඈ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම හා උත්සව සංවිධානය කිරීම:**

2014 වර්ෂය තුළ දී අභාවිත සහ යථාවත් කළ නොහැකි කාර්යාලීය උපකරණ ඉවත් කිරීම උදෙසා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී සමීක්ෂණ මණ්ඩලයක කටයුතු සම්පූර්ණ කළ අතර ඒ තුළින් රුපියල් මිලියන 0.7 ක ආදායමක් උපයනු ලැබිණි. 2014 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවය හා දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය, නිදහස් දින උත්සවය සහ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ 64 වැනි සාංවත්සරික දේශනය ඇතුළු විවිධ සැමරුම් උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය කරනු ලැබීය.

**(ඉ) නීතිමය සේවා සැපයීම:**

බැංකුවේ කටයුතු උත්ප්‍රේරණය කිරීම සඳහා අවශ්‍ය සුපුරුදු නීතිමය කටයුතුවල සිට ප්‍රතිපත්ති සැලසුම් කිරීම දක්වා වූ පුළුල් පරාසයක් තුළ නීතිමය සේවා සපයන ලදී. බැංකුවේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා අධිකරණමය කටයුතු මෙහෙයවීමේ දී පූර්ව ක්‍රියාකාරී පිළිවෙත අනුගමනය කරන ලදී. බැංකුව හමුවේ ඇති අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති සහ අනුනීති සැකසීම මගින් ක්‍රියාකාරී සහයෝගය ලබා දෙන ලදී.

# 25. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කරමින් එහි සේවකයින් හට, ගොඩනැගිලිවලට, අනෙකුත් දේපළවලට සහ මුදල් ප්‍රවාහනය හා කාසි එක්රැස් කිරීම සඳහා රජයේ ආරක්ෂක අංශ සහ පොලීසියේ සහාය ඇතිව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂාව සපයන ලදී. මහ බැංකු ආරක්ෂක සේවාව ශක්තිමත් කිරීම මූලික වශයෙන් ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම සහ පුහුණුවීම් වශයෙන් අංශ දෙකකින් ඉදිරියට යන ලදී.

## 25.1 ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම

**(අ) කේන්ද්‍රගත ඒකාබද්ධ ප්‍රවේශ පාලන පද්ධතිය**

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 2013 වර්ෂයේ පසු භාගයේ දී ආරම්භ කරන ලද නවීනතම කේන්ද්‍රගත ඒකාබද්ධ ප්‍රවේශ පාලන පද්ධතියක් සවි කිරීමේ ක්‍රියාවලියේ වැඩ කටයුතු දැනට අවසන් වෙමින් පවතී.

**(ආ) නව රථගාල: ගිනි මැඩ පැවැත්වීමේ පද්ධතිය සහ භාණ්ඩ පරීක්ෂා කිරීමේ ස්කෑනර් යන්ත්‍රය**

නව රථගාලේ ගිනි මැඩපැවැත්වීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම ආරම්භ කර ඇති අතර එහි කටයුතු 2015 දෙවන කාර්තුවේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. භාණ්ඩ පරීක්ෂාව සඳහා යොදවා තිබූ ස්කෑනර් යන්ත්‍රය ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථාන නව රථගාලේ නැවත ස්ථාපිත කරන ලදී. මීට අමතරව මහ බැංකු මූලස්ථානයේ හා අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කරනු ලැබූ සියලු ගිනි නිවීමේ උපකරණ විධිමත් පදනමක් මත පරීක්ෂා කර, අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර ප්‍රතිස්ථාපනය කරන ලදී.

**(ඇ) ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය**

කොළඹ සහ කොළඹ අවට සීමාව තුළ පිහිටි මහ බැංකු පරිශ්‍ර අතර සහ මහ බැංකුවේ මුදල් ප්‍රවාහන කටයුතුවල දී

සන්නිවේදන කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය, බාධාවකින් තොරව අඛණ්ඩ සේවාවක් ලබාගැනීම් වස්, සම්පූර්ණයෙන්ම වැඩිදියුණු කර සියළු පැරණි ගුවන් විදුලි ඇමතුම් යන්ත්‍ර සඳහා නව ගුවන් විදුලි ඇමතුම් යන්ත්‍ර යොදවන ලදී.

**(ඈ) පිළිගැනීමේ කවුන්ටරය**

පහසුකම් කළමනාකරණ හා සන්නිවේදන දෙපාර්තමේන්තුවල සහාය ඇතිව මහ බැංකු ප්‍රධාන පිවිසුම අසළ පිහිටි පිළිගැනීමේ කවුන්ටරයට නව මුහුණුවරක් ලබා දීම සඳහා කටයුතු කළ අතර පිළිගැනීමේ නිලධාරී රාජකාරිය සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ දී ඉටු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවට පවරන ලදී.

**(ඉ) හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යෑමේ සැලැස්ම**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යෑමේ සැලැස්මේ පුහුණු ක්‍රියාවන් සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රියව සහභාගි විය.

### 25.2 පුහුණුවීම්

**(අ) ගිනි වැළැක්වීම, ගිනි නිවීම් සහ ප්‍රථමාධාර වැඩසටහන්**

මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද ගිනි සහායක නිලධාරීන් 90 දෙනෙකු සඳහා කොළඹ ගිනි නිවීමේ ඒකකය, ශාන්ත ජෝන් ගිලන් රථ සේවය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණය පිළිබඳ දින දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොළඹ ගිනි නිවීම් ඒකකය සමගින් ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයන් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී. තෝරාගන්නා ලද ආරක්ෂක නිලධාරීන් 6 දෙනෙකු මාලබේ (CINEC) සාගර විශ්ව විද්‍යාලයේ දී ගිනි නිවීමේ උසස් පාඨමාලාවකට සහභාගි කරවන ලදී.

**(ආ) කුසලතා හා දක්ෂතා ඔප්නැංවීම**

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතා හා දක්ෂතා ඔප්නැංවීම සඳහා වැදගත් ස්ථානවල ආරක්ෂාව සැපයීම, ප්‍රභූ ආරක්ෂාව සැපයීම, ආරක්ෂක පරිවාර රාජකාරි සහ මහජන සම්බන්ධතාවය යන විෂයයන් ඇතුළත් දින දෙකක නේවාසික වැඩමුළුවක් ජාතික වැවිලි කළමනාකාරිත්ව ආයතනයේ දී ආරක්ෂක නිලධාරීන් 30 දෙනෙකු සඳහා පවත්වන ලදී. තවද, විවිධ තාක්ෂණික සහ උසස් පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සඳහා මාණ්ඩලික නිලධාරීන් 7 දෙනෙකු සහ මාණ්ඩලික නොවන නිලධාරීන් 71 දෙනෙකු සහභාගි කරවන ලදී. මැලේසියාවේ පවත්වන ලද හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාම සැලසුම් කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දින දෙකක පාඨමාලාවක් සඳහා එක් මාණ්ඩලික නිලධාරියෙකු සහභාගි කරවන ලදී.

**(ඇ) අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගයෙන් සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි තැබීමේ පුහුණුවක් වර්ෂය අවසාන කාර්තුවේ දී ලබා දෙන ලදී.

## 26. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක) විසින් ප්‍රතිලාභීන් වෙත සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මෙම වසර තුළ දී ද සපයන ලදී. කා.සේ.ක. දෙපාර්තමේන්තුවේ කාර්යයන් තුළ කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය ක්‍රමය, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේව්‍ය දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සහ ආපනශාලා පහසුකම් සැපයීම ඇතුළත් වේ. සේවා නියුක්තිකයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ මුළු ලියාපදිංචි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,200 පමණ විය.

2014 වසර තුළ දී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් ණය, කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය, පරිගණක ණය හා වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 1,595 ක් ප්‍රදානය කරන ලදී. අයදුම්කරු විසින් අදාළ සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණන ඇතුළත ණය නිකුත් කිරීමට හැකි විය. ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂමව සේවා නියුක්තිකයන්ට ණය ලබා දීමට හැකි වී ඇත.

මහ බැංකු ආපනශාලාව මගින් බැංකු කාර්ය මණ්ඩලයට උදෑසන සහ දිවා ආහාර සැපයීම තවදුරටත් සිදු කරන ලද අතර, උදෑසන සහ දිවා ආහාර සඳහා නව ආහාර වර්ග ද, සවස් කාලය සඳහා කෙටි ආහාර වර්ග ද හඳුන්වා දෙන ලදී. තවද, දෙපාර්තමේන්තුව මගින් උදෑසන සහ සවස තේ/ඔසුපැන් ලබා දීමේ සේවයට අතිරේකව දියර කිරි සපයනු ලැබීය. දියර කිරි සහ ඔසු පැන් සඳහා ඇති ඉල්ලුම සලකා බැලීම සඳහා සමීක්ෂණයක් පැවැත්විණ. ඉදිරි 2015 වසර තුළ දී ආපනශාලා පහසුකම් තවත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු මූලික විධිවිධාන සකස් කරන ලදී.

සියලුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රතිපූරණය කරන ලද වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට 8 කින් ඉහළ ගොස් ඇත. පිළිගත් පෞද්ගලික ආරෝග්‍යශාලාවක් මගින් කාර්යාල වේලාවන් තුළ දී වෛද්‍ය සේවාවන් සපයන ලදී. තවද, සාධාරණ මිලකට

රසායනාගාර පරීක්ෂණ පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කෙරිණි. වෛද්‍යවරයාගේ ඉල්ලීම මත, වෛද්‍ය මධ්‍යස්ථානයට නව උපකරණ ලබා දෙන ලදී. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවා නියුක්තිකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පහක් සලකා බලන වර්ෂය තුළ දී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී.

## 27. සංඛ්‍යාන

2014 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් තම ප්‍රධාන කාර්යයන් වන, වඩා නවීන ආර්ථිකමිතික ආකෘති උපයෝගී කර ගනිමින් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය හා තක්සේරු කිරීම, මිල හා වැටුප් දර්ශක සකස් කිරීම සහ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සකස් කිරීම යනාදිය ඉටු කරන ලදී. පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම, මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ දී ඉවහල්වන අනාගත දත්ත එක්රැස් කිරීම සඳහා සමීක්ෂණ පැවැත්වීම, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ තුළින් දත්ත එක්රැස් කිරීම හා අවශ්‍ය පරිදි දත්ත සම්පාදනය කිරීම, ප්‍රකාශන හා පුවත්පත් නිවේදන මගින් තොරතුරු යාවත්කාලීනව නිකුත් කිරීම සහ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ දර්ශක අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවත්වා ගැනීමට ආයක වීම යනාදිය ද මෙම වසර තුළ දී සිදු කෙරිණි.

### 27.1 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පාරිභෝගික මිල උද්ධමනය සහ ආර්ථික වර්ධනය පිළිබඳව කෙටිකාලීන පුරෝකථන කරනු ලබන අතර, රටෙහි මුදල් ප්‍රතිපත්ති සැකසීම වඩාත් පහසු කිරීම සඳහා එය මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. උද්ධමනය කෙරෙහි බලපාන විචල්‍යයන්හි සිදු වී ඇති හා සිදුවේයැයි අපේක්ෂිත වෙනස්කම්වලට අනුරූපව උද්ධමන පුරෝකථන නිරන්තරවම යාවත්කාලීන කෙරේ. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) ඇතුළත් පාරිභෝගික භාණ්ඩ හා සේවාවන්හි මිල විචලනයන් පිළිබඳව දෙපාර්තමේන්තුව ක්‍රමවත්ව හා සමීපස්ථව නිරීක්ෂණය කළ අතර, එම මිල වර්ධනයන් විශ්ලේෂණය කරමින් මාසිකව පුවත්පත් නිවේදන නිකුත් කළේය.

විවිධ කාලරාමු සහිත උද්ධමන පුරෝකථන ක්‍රම ගණනාවක් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ලදී. කෙටිකාලීන උද්ධමන පුරෝකථනයන් සඳහා ප්‍රධාන වශයෙන්ම මෑතකාලීන මිල ප්‍රවණතා සහ වෙළඳපොළ වර්ධනයන් හා බැඳුණු අපේක්ෂිත කෙටිකාලීන මිල විචලනයන් පදනම් කර ගැනේ. මැදි හා දිගුකාලීන පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රමවේදයන් භාවිතා කෙරේ. ඉල්ලුම් හා සැපයුම් දෙඅංශයෙන්ම උද්ධමනය කෙරෙහි බලපාන නව විචල්‍යයන් උපයෝගී කර ගනිමින්, මෙම ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය 2014 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී.

ආර්ථිකයේ ආංශික සංයුතිය ද ඇතුළත් වන පරිදි එක් එක් උප අංශයන්ට අදාළ ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතා කරමින් දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) වාර්ෂිකව හා කාර්තුමය වශයෙන් පුරෝකථනය කරනු ලැබේ. මූර්ත අංශයේ ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකයේ උප අංශයන්ට අදාළ ආර්ථික දර්ශකයන් ද ආකෘතීන් මත පදනම් වූ පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රමවේදයන් ද පුරෝකථනයන්හි නිරවද්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ.

### 27.2 මිල හා වැටුප් දර්ශක ගණනය කිරීම

පළාත් නවය සඳහා වන පළාත්බද පාරිභෝගික මිල දර්ශක සහ සමස්ත දිවයිනම ආවරණය කරනු ලබන සංයුක්ත පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් මාසිකව සිදු කරන ලදී. පළාත් මට්ටමෙන් මිල විචලනයන් සන්සන්දනය කිරීම මෙම පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමෙහි ප්‍රධාන අරමුණ විය. මෙම දර්ශක සැකසීම සඳහා භාවිතා කෙරෙන දත්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ (දීප දත්ත) සහ අනෙකුත් විශ්වසනීය ද්විතීයික මූලාශ්‍රයන් වෙතින් ලබාගැනිණි.

ප්‍රාථමික වෙළඳපොළ මට්ටමෙහි නිෂ්පාදන සහ තොග වෙළඳ මිල ගණන්හි විචලනයන් මිනුම් කිරීම සඳහා තොග මිල දර්ශකය (තො.මි.ද.) ගණනය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කළේය. තො.මි.දර්ශකය සැකසීම සඳහා අවශ්‍ය දත්ත, දීප දත්ත වැඩපිළිවෙළ හරහා සහ අනෙකුත් අදාළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වෙතින් රැස්කෙරේ.

ආර්ථිකයෙහි වැටුප් සහ වේතනවල විචලනයන් තක්සේරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නව දර්ශක දෙකක් හඳුන්වා දෙන ලද අතර, වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කිරීම ද සිදු කරන ලදී. පසුගිය වසරවලදී මෙන්ම, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ද විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ද දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලදී. අවිධිමත් පෞද්ගලික අංශයෙහි කෘෂිකර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන උප අංශයන්හි වැටුප් විචලනයන්, දීප දත්ත වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරන ලද දෛනික වැටුප් තොරතුරු මත පදනම්ව විශ්ලේෂණය කරන ලදී. වැටුප් විචලනයන් පිළිබඳ විශ්ලේෂණ වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව සලකමින්, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සහ වැටුප් ව්‍යුහයන් වඩා පුළුල්ව නියෝජනය වන පරිදි, රාජ්‍ය අංශය සඳහා නව වැටුප් ප්‍රමාණ දර්ශකයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී. මීට අමතරව, අවධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් විචලනයන් මිනුම් කිරීම සඳහා ද දර්ශකයක් හඳුන්වා දෙන ලදී.

## 27.3 ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීම

සමස්ත ශ්‍රී ලංකාවේ සහ එහි එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා සංයුක්ත දර්ශකයක අවශ්‍යතාව ඉටුකර ගැනීමට 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, සමස්ත දිවයිනෙහි සහ එක් එක් පළාත්වල ආර්ථික හා සමාජීය සංවර්ධනයන් පිළිබිඹු කරන බහුමාන දර්ශකයක් වේ. මෙම දර්ශකය, ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජීය ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක තුනෙන් සංයුක්ත වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ගණනය කරනු ලබන අතර, අවසන් වරට ගණනය කර ඇත්තේ 2013 වසර සඳහාය.

## 27.4 පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම

2013 වසර සඳහා නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ද.දේ.නි. පාදක කොට ගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබිණි. මෙම ප.ද.දේ.නි. තොරතුරු පළාත් බද ආදායම් බෙදීයෑමේ විෂමතා අවම කිරීමට අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම සඳහා පළාත් අධිකාරීන්ට මෙන්ම මධ්‍යම රජයේ ජාතික සැලසුම්කරුවන්ට ද ප්‍රයෝජනවත් වේ.

## 27.5 සංඛ්‍යාන සමීක්ෂණ

වර්තමාන ආර්ථික වර්ධනයන් හඳුනාගැනීමට මෙන්ම ඉදිරි ප්‍රවණතා පුරෝකථනය සඳහා ද ඉවහල් වන ගුණාත්මක දර්ශකයන් තුළින් කෙටිකාලීන වෙළඳපොළ ප්‍රවණතා සහ ඉදිරි ව්‍යාපාරික වාතාවරණය කලින් හඳුනාගැනීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දෙවන කාර්තුවේ සිට ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. ඒ අනුව, මෙම සමීක්ෂණය ආර්ථිකයේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳව පූර්ව දැනුම් දීමේ දර්ශකයක් ලෙස ද ක්‍රියාකරනු ඇත. කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශයන් නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ඒකක මෙම සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. ද.දේ.නි. ට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් විනිශ්චයාත්මක නියැදිකරණය මගින් සමීක්ෂණයේ නියැදිය තෝරාගන්නා ලදී. මෙහිදී සම්මත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් තොරතුරු ලබාදෙන්නන්ගේ අභිමතය පරිදි සම්මුඛ සාකච්ඡා තුළින් මෙන්ම දුරකථන සංවාද මගින් ද දත්ත රැස්කරන ලදී. මෙම සමීක්ෂණය, එක් එක් කාර්තුවේ අවසන් සතිය තුළ දී හා ඊළඟ කාර්තුවේ පළමු සතිය තුළ දී පවත්වන ලදී. වසර තුළ දී සමීක්ෂණය අඛණ්ඩව තෙවරක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵල මත පදනම්ව ව්‍යාපාර තත්ත්වය, ලාභදායිත්වය, පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය, විකුණුම් හා ඉල්ලුම යන ව්‍යාපාර සමීක්ෂණ දර්ශකයන් ගණනය කර අදාළ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ගෝලීය තරගකාරිත්ව දර්ශකයේ (Global Competitiveness Index) ශ්‍රී ලංකාව සඳහා වන අගය වර්ධනය කර ගැනීම සඳහා එම සමීක්ෂණයෙන් ඇගයීමට ලක්කරන අංශයන්හි යම්කිසි වර්ධනයක් අවශ්‍ය මෙන්ම ප්‍රතිපත්ති සංශෝධන අවශ්‍ය අංශයන් හඳුනාගැනීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ලෝක ආර්ථික සංසදය (World Economic Forum) මගින් පවත්වනු ලබන විධායක නිලධාරීන්ගේ මතය පිළිබඳ සමීක්ෂණය (Executive Opinion Survey) ආකාරයේ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා ස්වාධීන සමීක්ෂණ ආයතනයක සේවය ලබාගන්නා ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ ප්‍රධාන අංශයන් ත්‍රිත්වයම නියෝජනය වන පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ආයතනයන් 150 ක් සහභාගි කරගනිමින් අගෝස්තු මස සිට ඔක්තෝබර් මස දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම සමීක්ෂණයෙන් ලත් ප්‍රතිඵල ප්‍රතිසංස්කරණය අවැසි අංශයන් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

ණය වෙළඳපොළ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වසරේ දෙවන භාගය තුළ දී පෞද්ගලික අංශයේ ණය පිළිබඳව සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. ඒ අනුව, ණය වෙළඳපොළේ ඉල්ලුම පිළිබඳ ප්‍රවණතා හඳුනාගැනීම සඳහා ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය ද ණය සැපයුම් ප්‍රවණතා හඳුනාගැනීමට ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය ද සැලසුම් කරන ලදී. ආර්ථිකයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. මෙම සමීක්ෂණයේ නියැදි රාමුව සේවක භාරකාර අරමුදල මගින් ලබාගත් ආයතන ලැයිස්තුවක් අනුව සකසන ලද අතර, නියැදි රාමුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ලෙස වෙන්කිරීමෙන් අනතුරුව සසම්භාවී ස්තෘත නියැදියක් තෝරාගන්නා ලදී. මෙහි දී, සම්මත ප්‍රශ්නාවලියක් පදනම් කර ගනිමින් සම්මුඛ සාකච්ඡා, දුරකථන සංවාද හෝ විද්‍යුත් තැපැල තුළින් දත්ත රැස්කිරීමට සැලසුම් කර ඇත. ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය, ඉලක්කගත සංගහනය වන රටෙහි සියලුම බැංකු ආවරණය කරමින් සැලසුම් කර ඇති අතර ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ දී භාවිතා කරන ලද ක්‍රමවේදයන්ම අනුගමනය කරමින් සම්මත ප්‍රශ්නාවලියක් ආශ්‍රිතව දත්ත එකතු කිරීමට අපේක්ෂිතය. 2015 වසරේ සිට අර්ධ වාර්ෂිකව මෙම සමීක්ෂණයන් සිදුකිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

පහළ යන බැංකු ණය පොලී අනුපාත හා 2014 වසරේ දී දක්නට ලැබුණු රත්රන් මිල උච්චාවචනයන් නිසා උකස්කරුවන්ට මුහුණ දීමට සිදු වූ මෑතකාලීන ව්‍යාපාරික ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් තැපැල් මාර්ගික සමීක්ෂණයක් දියත් කරන ලදී.

2006 වසරේ දී ආරම්භ කරන ලද උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් මාසිකව පවත්වන ලදී. මෙම සමීක්ෂණය මගින් මූල්‍ය ආයතන,

රාජ්‍ය අංශයේ ආයතන, පාසල් හා සිල්ලර වෙළඳසැල් ආවරණය වන පරිදි 300 ක් පමණ පිරිසකගේ ප්‍රතිචාර ලබා ගැනේ. විද්‍යුත් තැපැල හා සම්මුඛ පරීක්ෂණ හරහා මෙම තොරතුරු රැස්කිරීම සිදු කෙරේ. ප්‍රතිචාර දක්වන්නන් විසින් වර්තමාන උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12 ක කාලය තුළ දී අපේක්ෂිත උද්ධමනය පිළිබඳව ද ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. අදාළ මාසයේ සමීක්ෂණයේ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට වාර්තා කරනු ලැබිණි.

රටෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි මට්ටම් සහ උපනතීන් නිර්ණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය (APSES) පවත්වන ලදී. 2013 වසරේ APSES සමීක්ෂණයෙහි වාර්තා වූ පරිදි, පළාත් සභා හැරුණු විට 1,000 හෝ ඊට වැඩි සේවා නියුක්තියක් සහිත සියලුම මධ්‍යම රජයේ ආයතන, අර්ධ රාජ්‍ය ආයතන (කොළඹ, දෙහිවල සහ මහනුවර මහ නගර සභා ඇතුළත්ව) රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ කාර්තුමය සමීක්ෂණයේ (QPSES) නියැදිය වශයෙන් තෝරා ගැනේ. දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමේ දී රාජ්‍ය සේවා උප අංශය මගින් එකතු කළ අගය ඇස්තමේන්තු කිරීම සඳහා ප්‍රමුඛ දර්ශකයක් ලෙස, QPSES සමීක්ෂණයෙන් ලබාගන්නා තොරතුරු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබයි. 2014 වසරේ දී, සමීක්ෂණ තොරතුරු පදනම් කරගෙන වාර්ෂික හා කාර්තුමය විශ්ලේෂණ වාර්තා සකසන ලදී.

තවද, ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළඳපොළ පිළිබඳව එක්රැස් කළ තොරතුරු කම්කරු සබඳතා, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායීතාව ඉලක්ක කරගනිමින් සේවා නියුක්තිය, සේවා වියුක්තිය සහ විදේශ සේවා නියුක්තිය යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලදී.

## 27.6 දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ

දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ, දත්ත සමීක්ෂකයන් ලෙස ක්‍රියාකරන දිවයින පුරා විහිදුණු රජයේ පාසල් ගුරුවරුන්ගෙන් සමන්විත ජාලයක් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. මෙම දත්ත සමීක්ෂකවරුන් විසින් පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල හා මත්ස්‍ය නිෂ්පාදනවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනවල අපේක්ෂිත අනාගත නිෂ්පාදන මට්ටම් සතිපතා, මාස්පතා හා කාර්තුමය වශයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලබයි. මෙම ජාලයට අමතරව පිටකොටුව වෙළඳපොළ, මරඳගහමුල සහල් වෙළඳපොළ සහ දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානවලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස්කිරීම සඳහා ගුරුවරුන් නොවන සමීක්ෂකවරුන් සිව් දෙනෙකුගේ සේවය ද දීපදත්ත වැඩපිළිවෙළ සඳහා ලබා ගැනේ. උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථික ක්‍රියාකාරකම්හි ප්‍රසාරණය සළකා 2014 වසරේ දී මෙම පළාත්වල නව දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන හතරක් ස්ථාපනය කරන ලදී. මෙම වර්ධනයත් සමග මේ වන විට දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන 106 ක් ආවරණය කෙරේ.

මෙම වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරනු ලබන දත්ත, මිල දර්ශක ගණනය කිරීම, මිල විචලනයන් පුරෝකථනය කිරීම, ප්‍රතිපත්ති වෙනස් කිරීම් මගින් මිල මත ඇති කරන බලපෑම ඇගයීම සහ ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම වැනි විවිධ අරමුණු සඳහා යොදාගනු ලබයි. දත්ත සමීක්ෂකවරුන් විසින් වාර්තා කරනු ලබන දත්තවල නිරවද්‍ය බව හා කාලීන බව පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත් ස්ථානීය හා දුරස්ථ අධීක්ෂණයන් සිදුකරනු ලබයි. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගන්නා ලද වෙළඳපොළවලින් ඍජුවම රැස්කරනු ලබන මිල ගණන් සමග සැසඳීම මගින් මෙම දත්තවල නිරවද්‍යතාව තවදුරටත් තහවුරු කරගනු ලබයි. තෝරාගත් දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හරහා සිදුකරනු ලබයි.

මෑතකාලීනව ආර්ථිකය තුළ පැනනැගුණු ආර්ථික ක්‍රියාකාරකම් හා ඒ සමග බැඳුණු වෙළඳපොළ වර්ධනයන් ඇතුළත් වන පරිදි, යාවත්කාලීන කළ දත්ත රැස්කිරීමේ ලේඛන හඳුන්වාදීම මගින් වසර තුළ දී දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදී. එමෙන්ම වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාගැනීමේ අරමුණෙන් හා පරිශීලනය පහසුවන අයුරින් "පූර්ව අනතුරු ඇඟවීමේ" වැඩසටහන සම්බන්ධ දත්ත රැස්කිරීමේ ලේඛනය වසර තුළ දී සංශෝධනය කරන ලදී. දත්ත සමීක්ෂණය කිරීමේ දී මුහුණ දුන් අත්දැකීම් බෙදාහදා ගැනීමටත් හඳුනාගත් ප්‍රාදේශීය මිල වර්ධනයන්ගේ වෙනස්කම් පිළිබඳ ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමටත් වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමටත් සුපුරුදු පරිචය අනුව යමින් 2014 වසරේ දී කොළඹ, මාතර සහ අනුරාධපුර යන ස්ථානවල දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පැවැත්විණි. ආර්ථිකයේ වත්මන් වර්ධනයන් පිළිබඳ විශේෂ අධ්‍යාපනික සැසිද, මෙම සම්මන්ත්‍රණ වලට ඇතුළත් විය.

## 27.7 ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ දර්ශක අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවත්වා ගැනීම

### ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳව වන ශ්‍රේණිගත කිරීම (Doing Business Index)

2014 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් "ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව" පිළිබඳව වන ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පිහිටුවීම අරමුණු කරගනිමින් ප්‍රධාන කර්තව්‍යයන් කිහිපයක් ඉටු කරන ලදී. ඉදිරි වසර පහ ඇතුළත දී ව්‍යාපාර පහසුව පිළිබඳ ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාව වඩාත් ඉහළ ස්ථානයකට ගෙන ඒම සඳහා වන ප්‍රතිසංස්කරණ ඉලක්ක සකස් කිරීම සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් ඉහළ පෙළේ රැස්වීමක් සංවිධානය කිරීම එම කාර්යයන් අතර වේ.

මෙරටට පැමිණි ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ ලෝක බැංකුවේ දූත පිරිසට ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ දර්ශකයට අදාළ ක්ෂේත්‍රවල කටයුතු කරගෙන යන රාජ්‍ය සහ පෞද්ගලික අංශවල නිලධාරීන් සමග සාකච්ඡා කිරීම සඳහා පහසුකම් සලසා දීම ද සිදු කරන ලදී. සකස් කරන ලද ප්‍රතිසංස්කරණ ඉලක්ක සපුරාලීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මෙන්ම ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳව වන ශ්‍රී ලංකාවේ ශ්‍රේණිය සකස් කිරීමේ දී සලකා බලන විචල්‍ය පිළිබඳ අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ පිළිබඳව තොරතුරු ලෝක බැංකු කණ්ඩායමට කලට වේලාවට සැපයීම පිළිබඳව ද පාර්ශ්වකරුවන් 50 කට අධික ප්‍රමාණයක් සමග සාකච්ඡා පවත්වනු ලැබිණි. 2013/2014 කාලය තුළ දී ශ්‍රී ලංකාව - විදුලිය ලබාගැනීම, බදු ගෙවීම, ජාත්‍යන්තර වෙළෙඳාම සහ සුළු ආයෝජකයන් ආරක්ෂා කිරීම යන ක්ෂේත්‍ර තුළ නියාමන ප්‍රතිසංස්කරණ සිදු කර ඇති බව හඳුනාගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඊට පෙර වසරේ සිටි 105 වන ස්ථානයට සාපේක්ෂව, 2015 වසරේ දී ශ්‍රී ලංකාව ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳ දර්ශකයේ රටවල් 189 ක් අතුරින් 99 වන ස්ථානය දක්වා ඉහළට පැමිණ තිබුණි.

#### අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම්

ගෝලීය දර්ශක වන ලෝක ව්‍යාප්ත පාලන දර්ශක (Worldwide Governance Indicators), ගෝලීය තරගකාරිත්ව දර්ශකය (Global Competitiveness Index), ආර්ථික ස්වාධීනතා දර්ශකය (Index of Economic Freedom), දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index), මානව සංවර්ධන දර්ශකය (Human Development Index) සහ ලෝක ආර්ථික ස්වාධීන දර්ශකය (Economic Freedom of the World) අඛණ්ඩව නිරීක්ෂණය කරමින් මෙම දර්ශකයන්හි ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ස්ථානය පිළිබඳ තොරතුරු කළමනාකාරිත්වය වෙත දැනුම් දෙන ලදී. එසේම ඉහත සඳහන් දර්ශක සම්පාදක ආයතනයන් වෙත ශ්‍රී ලංකාව පිළිබඳ සාර්ව ආර්ථික තොරතුරු සතිපතා මෙන්ම මාසිකව ද සපයන ලදී.

### 27.8 සංඛ්‍යාන තොරතුරු බෙදාහැරීම

ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ශිෂ්‍යයන් හා මහජනතාවට සමාජ ආර්ථික දත්තවල මෑතකාලීන විකාශනය පිළිබඳ තොරතුරු පුළුල් පරාසයකින් ලබාදීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. මෙම වසර තුළ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශනයන් දෙකක් ප්‍රකාශයට පත් කළ අතර, "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2014 - XXXVI වෙළුම" තෙවන වතාවටත් භාෂා ත්‍රිත්වයෙන්ම 2014 අප්‍රේල් මස ප්‍රකාශයට පත්කරන ලද අතර, "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2014 - XXXVII වෙළුම" 2014 ජූනි මස ප්‍රකාශයට පත්කරන ලදී. ඊට අමතරව, 2014 වසරේ දී සතිපතා හා මාස්පතා ආර්ථික දර්ශක ද ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013 හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා යන ප්‍රකාශන සඳහා පරිච්ඡේද දෙකක් සපයන ලද අතර, මාසික විවරණිකාව සඳහා ද ක්‍රමවත් දායකත්වයක් දක්වනු ලැබිය. තවදුරටත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ලබාගත් තෝරාගත් භාණ්ඩවල මිල ගණන් සතිපතා ප්‍රතිපත්තිමය අරමුණු උදෙසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම ද සිදු කරන ලදී.

අදාළ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (StaNet) හා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම ද නිරන්තරයෙන් සිදු කරනු ලැබිණි. දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය වන ආර්ථික හා මූල්‍ය පර්ෂදය මගින් ලබා ගන්නා තොරතුරු ගබඩා කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා කළමනාකරණ පද්ධතියක් (Electronic Database Management System) සකස් කිරීම සඳහා අවශ්‍ය පියවර 2014 වසර තුළ දී ගනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය අවසානයේ දී, අභ්‍යන්තර ජාලය (Intranet) හරහා මෙම තොරතුරු පද්ධතිය මගින් තොරතුරු ලබා ගැනීමට අනෙකුත් දෙපාර්තමේන්තුවලට ද හැකි වනු ඇත.

## 28. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත වෙනුවට 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ප්‍රතිස්ථාපනය කිරීමත් සමඟ මුදල් ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 1988 වසරේ දී ස්ථාපනය කරන ලදී. මුදල් සමාගම් පනත අහෝසි කරමින් 2011.11.09 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිස්ථාපනය කරන ලද 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත මගින් වර්තමානයේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ කටයුතු පාලනය කරනු ලැබේ. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත බලාත්මක වීමත් සමඟ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය ද මෙම දෙපාර්තමේන්තුව යටතට පත්විය. කලින් කලට සිදු කරන එතැන් පරීක්ෂණ හා අඛණ්ඩ දුරස්ථ පරීක්ෂණ මගින් බලපත්‍රලාභී සමාගම් අධීක්ෂණය කිරීම, නියාමන අනුමැතින් ලබා දීම, නියාමන විචක්ෂණ අවශ්‍යතා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම අනවසරයෙන් පවත්වා ගෙන යන මුදල් ව්‍යාපාර විමර්ශනය කිරීම හා එම ආයතන පිළිබඳ නීතිමය පියවර ගැනීම, අනවසර මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම, මහජන පැමිණිලි සඳහා යොමු වීම සහ බැංකු නොවන මූල්‍ය අංශය හා අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නඩු කටයුතු සඳහා පහසුකම් සැලසීම බැංකු නොවන මූල්‍ය අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් විය. 2014 වසර අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 48 ක් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු 13 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින්, බලපත්‍රලාභී මුදල් සමාගම් 47 කින් සහ විශේෂිත කල්බදු මූල්‍ය සමාගම් 8 කින් සමන්විත ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 75 ක් පැවතිණ. මෙම බලපත්‍රලාභී මුදල් සමාගම් හා ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවල නම් මෙම වාර්තාව අවසානයේ දක්වා ඇත. 2014 වර්ෂයේ දී නිකුත් කරන ලද නියාමන විචක්ෂණ අවශ්‍යතා මෙම වාර්තාවේ තුන්වැනි කොටසෙහි දක්වා ඇත.

## 28.1 බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම

### (i) එතැන් පරීක්ෂණ

අවදානම් හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා ඇති විය හැකි අවදානම් අවම කිරීමට අවශ්‍ය සම්පත් ඇගයීම කේන්ද්‍ර කරගත් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයන් කලාවර්ථිත එතැන් පරීක්ෂණය සිදු කිරීමේ දී භාවිතා කෙරිණ. 2014 වර්ෂය තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් /විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 43 ක පරීක්ෂණ සිදු කරන ලදී. පරීක්ෂණ වාර්තා සහ මුදල් මණ්ඩලය අනුමත කරන ලද නිර්දේශ, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කාලසටහනක් පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්මක් සහිතව අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, සීමිත විෂය පථයක් තුළ දුර්වල අංශ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 9 ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

### (ii) දුරස්ථ පරීක්ෂණ

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් කාලාවර්ථිතව ඉදිරිපත් කරන ලද මූල්‍ය තොරතුරු පරීක්ෂා කිරීමෙන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව අඛණ්ඩ දුරස්ථ පරීක්ෂණ සිදු කෙරිණි. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අනතුරු කල්තියා හැඟවීමේ හා පසුවිපරම් කිරීමේ පද්ධති මගින් බලපත්‍රලාභී මුදල් සමාගම්හි ඇති විය හැකි අවදානම් හඳුනා ගත් අතර, එම අවදානම් අවම කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී. අධීක්ෂණ කටයුතු කිරීමේ පහසුව සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් මූල්‍යමය ශක්තිමත් භාවය අනුව ශ්‍රේණිගත කිරීම සඳහා අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය ද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, එතැන් පරීක්ෂණ වාර්තාවල ඇතුළත් කාලසටහනක් පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්ම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් එකඟ වූ කාලරාමුව තුළ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එහි ප්‍රගතිය කාර්තුමය වශයෙන් අගය කරන ලදී.

### (iii) මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2014 අයවැයේ දී අනුමත කරන ලද යෝජනාවට අනුව, ස්වශක්තිතාවයක් නොමැති කුඩා ආයතන ඉවත් කරමින් මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් /විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීමේ සහ අත්පත් කිරීමේ, නියාමනය හා සම්බන්ධ වැඩසටහන මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද සැලැස්ම වූයේ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ප්‍රමාණය 58 සිට 20 පමණ දක්වා අඩු කිරීමයි. ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන ඒකාබද්ධ කිරීම් හා අත්පත් කිරීම් සඳහා සහය වීමට, මහ බැංකුව අනුමත විගණන ආයතන මගින් සිදු කරනු ලබන ආයතනවල යථා තත්ත්ව පරීක්ෂණ හා තක්සේරුකරණය සම්බන්ධ වියදම් සඳහා මහ බැංකුව රුපියල් මිලියන 163 ක් වෙන් කරන ලදී. 2014 අවසානය වන විට ආයතන 39 කට අදාළව විගණන ආයතන 9 ක් ලබා දුන් එවන් සේවාවන් සඳහා මහ බැංකුව රුපියල් මිලියන 105 ක් යොදවා තිබුණි. ඒකාබද්ධ කිරීම් හා අත්පත් කිරීම්වලට සම්බන්ධ ආයතන සඳහා රජය විසින් බදු සහන ලබා දෙන ලදී. 2014 වර්ෂය තුළ දී, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 10 ක් සම්බන්ධ ඒකාබද්ධ කිරීම් හා අත්පත් කිරීම් කටයුතු සම්පූර්ණ වී ඇති අතර, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 22 ක් ඒ සම්බන්ධව ක්‍රියා කරමින් පවතී. එසේ වුවද, මෙම ඒකාබද්ධ කිරීමේ වැඩසටහන රජය විසින් පත් කරන ලද කමිටුවක් මගින් විමර්ශනය කරමින් පවතී.

### (iv) දුර්වල සමාගම්වල අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග

2008 වර්ෂයේ අවසාන කාලයේ දී සමූහ සමාගම් කෙරෙහි පැවති මහජන අවිශ්වාසය හේතුවෙන් ද්‍රවශීලතා අර්බුදවලට මුහුණ පෑමට සිදු වූ සමාගම් කිහිපයක ඒවායේ තැන්පතු වගකීම් ගෙවා දැමීම සඳහා එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට, සමීපස්ථව අධීක්ෂණයට භාජනය විය. වර්ෂය තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, කළමනාකරණ නියෝජිත හා මෙම සමාගම්වල ආයෝජනය කිරීමට කැමැත්තක් දක්වන ආයෝජකයන් සමඟ පැවති රැස්වීම මගින් දුර්වල සමාගම්වල ක්‍රියාකාරිත්වය සමීපස්ථව නියාමනය කරන ලදී. ප්‍රතිව්‍යුහගත කරන ලද බලපත්‍රලාභී මුදල් සමාගමකට ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රුපියල් බිලියන 6 ක අරමුදල් ආධාරයක් ලබා දුන් අතර, මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අලුතින් පත් කරන ලදී. තවද, තවත් දුර්වල මුදල් සමාගමකට එහි මව් සමාගම විසින් නව ප්‍රාග්ධනය යෙදවූ අතර ඉන්පසු අධ්‍යක්ෂ මණ්ඩලයද වෙනස් කිරීම්වලට භාජනය කරන ලදී.

## 28.2 නියාමන අනුමැතීන් ලබාදීම

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමට, පාලිත සමාගම්වල ආයෝජනය කිරීමට, ණයකර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට සහ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට නියාමන අනුමැතීන් ලබා දෙන ලදී. තවද, අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ නව පත්වීම් සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව අගය කිරීමෙන් පසු අනුමැතීන් ලබා දෙන ලදී. 2014 වසර තුළ දී නව ශාඛා 75 ක් විවෘත කිරීම සඳහා අනුමැතිය ලබා දුන් අතර, ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි විය. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සහ කොෂිබා ලීසිං කම්පැනි ලිමිටඩ් වෙත කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කර තිබූ බලපත්‍ර අවලංගු කරන ලදී. මුදල් ව්‍යාපාර පනත යටතේ නව බලපත්‍ර නිකුත් නොකෙරිණි.

### 28.3 විධානයන් සහ විචක්ෂණශීලී අවශ්‍යතාවයන් හඳුන්වා දීම

බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍ර සඳහා ගෙවිය හැකි උපරිම පොලී අනුපාත සීමාව සංශෝධනය කරන ලදී. මෙම සංශෝධනයට අදාළ තොරතුරු පළමු කොටසෙහි ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග යටතේ දක්වා ඇත.

### 28.4 අනවසරයෙන් පවත්වා ගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය

2014 වසර තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය යටතේ, අවසර නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරත වන පුද්ගලයන්/ආයතන 24 ක් සම්බන්ධව පරීක්ෂණ සිදු කෙරිණ. මුදල් මණ්ඩලය විසින් එක් ආයතනයක් අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරත වන ආයතනයක් ලෙස තීරණය කළ අතර, තවත් ආයතනයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති කාර්යාලය වෙත යොමු කරන ලදී. තවද, ආයතන 4 ක් අවසර නොලත් මුදල් ව්‍යාපාරවලට සම්බන්ධ වී නොමැති බව අනාවරණය වූ බැවින් එම ආයතනවල විමර්ශන කටයුතු අවසන් කරන ලදී.

### 28.5 දැනුම්වත් කිරීමේ වැඩසටහන්

අධීක්ෂණ හා විචක්ෂණ කරුණු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා මහ බැංකු අධිපතිගේ ප්‍රධානත්වයෙන්, බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ, කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විණ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියාමනයේ අනාගත දර්ශනයන්, නව මුදල් ව්‍යාපාර ආකෘතියක අවශ්‍යතාව, ආයතනික යහපාලනයේ වැදගත්කම සහ තොරතුරු පද්ධති කළමනාකරණය ඉලක්ක කර ගනිමින් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා වූ වාර්ෂික සමුළුව පවත්වන ලදී.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව අනවසර මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 20 ක් සහ ගුවන්විදුලි දැන්වීම් 18 ක් ප්‍රචාරය කරන ලදී. බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල නම් ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා 28,000 ක් පමණ මහජනයා අතර බෙදා දෙන ලදී. තවද, මහජනයා අතර මූල්‍ය සාක්ෂරතාව වැඩි කිරීම සඳහා තැන්පතු රැස් කිරීමට අවසර ලත් ආයතනවල නම් ලැයිස්තුවක් භාෂා තුනෙන්ම පුවත්පත්වල පළ කරන ලදී.

### 28.6 මහජන පැමිණිලි සඳහා යොමු වීම

බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂි කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව මහජනතාවගෙන් නැගෙන පැමිණිලි විසඳීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වන ලදී. එවැනි චෝදනා අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට යොමු කරන ලදී.

### 28.7 අසාර්ථක වූ මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නඩු කටයුතු සඳහා සහාය වීම

**(i) ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් වන ක්‍රියාකාරී සැලසුම**

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මත ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ තැන්පතු ආපසු ගෙවීම අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව සම්බන්ධ විය. ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ සුරක්ෂිත තැන්පතුකරුවන්ගේ තැන්පතු ආපසු ගෙවීම සඳහා මහ බැංකුව විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලසුම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2013.04.04 දින අනුමත කරන ලදී. තවද, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මහ බැංකුව විසින් මග පෙන්වීම, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ එම ප්‍රගතිය මුදල් මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් වාර්තා කිරීම සිදු කරන ලදී. ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ කටයුතු කළ අධ්‍යක්ෂවරුන්ගේ වත්කම් හඳුනා ගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පත් කරන ලද කමිටුව සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සාමාජිකයෙකු පත් කරන ලදී. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය සමඟ එම ආයතනය එහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්වූ අතර, එහි ප්‍රගතිය මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. 2014 අවසානය වන විට ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය තැන්පතු ආපසු ගෙවීමේ සැලැස්මෙහි අදියර I, II හා III සම්පූර්ණ කර තිබූ අතර, සුරක්ෂිත තැන්පත් හිමියන් 6,500 ක් අතර දළ වශයෙන් රුපියල් මිලියන 2,066.8 ක් බෙදා හැර තිබුණි.

**(ii) වෙනත් අනවසර මූල්‍ය ආයතන**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් හා එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනයන්හි තැන්පතුකරුවන්ට ඔවුන්ගේ තැන්පතු ආපසු ගෙවීම සඳහා පහසුකම් සැලසීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී.

**(iii)** මීට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වර්ෂය තුළ දී නඩු 14 ක් සම්බන්ධ උසාවි කටයුතු සිදු කළ අතර, එයින් නඩු 2 ක් අවසන් කරන ලදී.

## ඇමුණුම II-3

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම්

**නීති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන (2014 වර්ෂය අවසානයට)**

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. අසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
6. ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්
7. එම්සීඑස්එල් ෆිනෑෂියල් සර්විස් ලිමිටඩ්
8. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
9. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
10. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
12. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
13. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කැපිටල් එලයන්ස් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
18. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
19. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
20. ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
21. චිලව් ෆිනෑන්ස් පීඑල්සී
22. ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් පීඑල්සී
23. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්
24. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
25. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
26. ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්
27. දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
28. බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
29. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
30. බාට්ලීට් ෆිනෑන්ස් පීඑල්සී
31. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
32. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
33. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
34. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
35. යූ.බී. ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
36. රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ්)
37. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
38. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
39. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
40. සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
41. සියපත ෆිනෑන්ස් පීඑල්සී
42. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
43. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
44. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
45. සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී
46. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී*
47. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
48. සොෆ්ට් ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමනාකරණ නියෝජිතයකු විසින් කළමනාකරණය කෙරෙන අතර, ප්‍රතිව්‍යුහගත කෙරමින් පවතී. ඒ අතරතුර තැන්පතු රැස් කිරීම අත්හිටුවා ඇත.

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පීඑල්සී
2. එම්සීබී බැන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්ස
6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
7. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
8. මහජන බැංකු
9. යූනියන් බැන්ක් ඔෆ් කල්ම්බු පීඑල්සී
10. ලංකා බැංකුව
11. සම්පත් බැන්ක් පීඑල්සී
12. සෙලාන් බැන්ක් පීඑල්සී
13. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
2. ඩීඑෆ්සීසී බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
5. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
6. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
7. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
3. එස්එම්බී ලීසිං පීඑල්සී
4. ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්
5. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී
6. ලාෆ්ස් කැපිටල් ලිමිටඩ්
7. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
8. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්

**(ඈ) දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් සමාගම හැර ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්**